# ඇදහිල්ලෙහි

# අත්තිවාරම්

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


| | | |
|---|---|---|
| අත්පොත භාවිත කරන ආකාරය | . . . . . . | 3 |
| කණ්ඩායම් වැඩ සඳහා යෝජනා | . . . . . . | 4 |
| හැඳින්වීම | . . . . . . . . . | 5 |
| පාඨමාලාවෙහි අරමුණු | . . . . . . . . | 6 |
| 01. අත්තිවාරම් | . . . . . . . . | 7 |
| 02. මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම - I වෙනි කොටස | . . . . . | 22 |
| 03. මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම - II වෙනි කොටස | . . . . . | 29 |
| 04. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල | . . . . . | 42 |
| 05. බව්තිස්මයන් පිළිබඳ දේවධර්මය - I වෙනි කොටස | . . . | 56 |
| 06. බව්තිස්මයන් පිළිබඳ දේවධර්මය - II වෙනි කොටස | . . . | 68 |
| 07. අත් තැබීම | . . . . . . . . | 83 |
| 08. මළවුන්ගෙන් නැගිටීම - I වෙනි කොටස | . . . . . | 91 |
| 09. මළවුන්ගෙන් නැගිටීම - II වෙනි කොටස | . . . . . | 99 |
| 10. සදාකාලික විනිශ්චය | . . . . . . . | 112 |
| 11. සර්ව සම්පූර්ණත්වය | . . . . . . . | 130 |
| උපග්‍රන්ථය | . . . . . . . . . | 145 |
| ස්වයං-පරීක්ෂණ සඳහා පිළිතුරු | . . . . . . | 147 |

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඩමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ජා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජිවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

මොඩියුලය : නියෝජනය කිරීම
පාඨමාලාව : ඇදහිල්ලෙහි අත්තිවාරම්

# හැඳින්වීම

මෙම පාඨමාලාවෙහි විෂය වනුයේ කිතුනු ඇදහිල්ලෙහි මූලික දේවධර්මයන් වේ. දේවධර්මයන් යනු යම්කිසි විෂයක් පිළිබඳව ඉගැන්වීම් සමූහයකි. කිතුනු ඇදහිල්ලෙහි මූලික දේවධර්ම නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්ය: ඒවා බයිබලයෙහි වාර්තාගතකොට ඇත.

මෙම දේවධර්ම හෙබ්‍රෙව් පොතෙහි මෙලෙස ගොනුකොට ඇත:- එනම්,

> **ඒ නිසා මළ ක්‍රියාවල් ගැන පසුතැවිලිවීම ද දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීම ද බව්තීස්ම කිරීම් ගැනත් අත් තැබීම ගැනත් මළවුන්ගේ නැගිටීම ගැනත් සදාකාල විනිශ්චය ගැනත් ඉගැන්වීම් ද නැමැති අත්තිවාරමක් නැවත නොතබා ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර සම්පූර්ණවීමට පැමිණෙමු. දෙවියන්වහන්සේ ඉඩ දෙන සේක් නම්, අපි එසේ කරන්නෙමුව. (හෙබ්‍රෙව් 6:1-3)**

මෙම පදයෙහි ආත්මික අරමුණු දෙකක් අඩංගු වේ. එනම්,

> පළමුවැන්න, ඔබගේ ආත්මික ජීවිතය නිවැරදි අත්තිවාරමක් මත ගොඩනැගීමය. මෙම අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්ය.
>
> දෙවෙනි අරමුණ නම්, පරිපූර්ණත්වයට පැමිණීමය. පරිපූර්ණත්වය යනු ආත්මික පරිනතභාවයයි.

ජයග්‍රාහී කිතුනු ජීවිතයක් ගත කිරීමට අසමත්වීම සඳහා හේතු කාරණා දෙකක් ඇත:

> පළමුවැනි හේතුව නම්, කිතුනුවන් මෙන් ජීවත්වීමට උත්සාහ කරන සමහර අය නැවත - උත්පාදනය ලබා නොමැතිවීමය. ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මූලික ඉගැන්වීම අවබෝධ කරගෙන නොමැත. මෙලෙස අවබෝධයක් නොමැති කමින් ඔවුහු දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීමට අසමත් වෙති.
>
> අසමත්වීමට දෙවෙනි හේතුව නම්, ආත්මික පරිනතභාවයට නොපැමිණීම ය.

මෙම පාඨමාලාවෙහි පළමුවැනි අරමුණ වනුයේ නිසියාකාර ආත්මික අත්තිවාරමක් සඳහා අවශ්‍යවන කිතුනු ජීවිතයෙහි මූලික ඉගැන්වීම් (දේවධර්ම) ඔබ වෙත පිරිනැමීමය.

හෙබ්‍රෙව් 6:1-3 සඳහන් මූලික ඉගැන්වීම් හයක් සාකච්ජා කරනු ලැබේ:

- මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම
- දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
- බව්තිස්මයන් පිළිබඳ දේවධර්ම
- අත්තැබීම
- මළවුන්ගෙන් උත්ථානය
- සදාකාල විනිශ්චය

මෙම අත්තිවාරම් තුළ ඔබ ස්ථිර කළ පසු අපගේ දෙවන අරමුණ වන්නේ ඔබව ආත්මික පරිණතභාවය (පරිපූර්ණත්වය) කරා ගෙන යෑමය.

> **“දෙවියන්වහන්සේ ඉඩ දෙන සේක් නම් අපි එසේ කරමුව.”**

# පාඨමාලාවෙහි අරමුණු

මෙම පාඨමාලාව නිමකිරීමෙන් පසුව ඔබට :

- හෙබ්‍රෙව් 6:1-3 සඳහන් කිතුනු ඇදහිල්ලෙහි මූලික ඉගැන්වීම් (6) හය පැහැදිලි කිරීමට හැකිවෙනු ඇත.
- ඔබගේ පෞද්ගලික ජීවිතයෙහි හරියාකාර ආත්මික අත්තිවාරමක් පිහිටුවාගැනීමට හැකිවෙනු ඇත.
- ආත්මික පරිනතභාවය කරා ළඟාවිය හැකිය.

# පළමුවන පරිච්ඡේදය

## අත්තිවාරම්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය නිම කිරීමෙන් පසුව ඔබහට පහත සඳහන් දෑ ඉටුකළ හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීම
- නිවැරදි සහ වැරදි අත්තිවාරම් අතර වෙනස හඳුනාගැනීම
- නිවැරදි ආත්මික අත්තිවාරම් මත ගොඩනැගීමෙහි වැදගත්කම පැහැදිලි කිරීම
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේව නිවැරදි ආත්මික අත්තිවාරම ලෙස පිළිගැනීම
- නිවැරදි ආත්මික අත්තිවාරමක් ගොඩනැගීම සඳහා පියවර තුනක් නම් කිරීම

**ප්‍රධාන පදය:**

> **ඒ නිසා මළ ක්‍රියාවල් ගැන පසුතැවිලිවීම ද දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීම ද බව්තිස්ම කිරීම් ගැනත් අත් තැබීම ගැනත් මළවුන්ගේ නැගිටීම ගැනත් සදාකාල විනිශ්චය ගැනත් ඉගැන්වීම් ද නැමැති අත්තිවාරමක් නැවත නොතබා ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර සම්පූර්ණවීමට පැමිණෙමු. දෙවියන්වහන්සේ ඉඩ දෙන සේක් නම්, අපි එසේ කරන්නෙමුව. (හෙබ්‍රෙව් 6:1-3)**

### හැඳින්වීම

බයිබලය ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය ගොඩනැගිල්ලක් සැදීම හා සංසඳනය කොට දක්වයි.

> **නුඹලා දෙවියන්වහන්සේගේ ගොඩනැගිල්ලය. (1 කොරින්ති 3:9)**

සෑම ඇදහිලිවන්තයෙකුම ක්‍රිස්තුස්වහන්සේ තුළ අනෙකුත් ඇදහිලිවන්තයින් සමග සම්බන්ධ වීමෙන් සභාව සැදෙයි. බයිබලයේ සභාව ගොඩනැගිල්ලකට සමාන කරයි:

> **උන්වහන්සේ තුළ (යේසුස්වහන්සේ) නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට (සභාව එකමුතුව) ගොඩනගන ලද්දහුය. (එපීස 2:22)**

මනුෂ්‍යයෙක් මොනයම් හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී පළමුව හොඳ අත්තිවාරමක් දැමිය යුතුය. මෙය සෑම මනුෂ්‍යයෙක්ම පාහේ අවබෝධ කරගත් ස්වභාවික ප්‍රතිපත්තියක් බැවින් දෙවියන්වහන්සේ වඩා ශ්‍රේෂ්ඨ ආත්මික සත්‍යයක් ඉගැන්වීම සඳහා මෙම මූලධර්මය භාවිත කළසේක.

ඇදහිලිවන්තයෙකු හට යහපත් ආත්මික නිවසක් ගොඩනැගීම සඳහා නිසියාකාර අත්තිවාරමක් තිබිය යුතුය. එම අත්තිවාරම ගොඩනැගිලි ඉදිකරන්නාගේ සැලසුමට අනුකූලව දැමිය යුතු වේ. ප්‍රධාන ගොඩනගන්නා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැලැස්ම බයිබලයෙහි ඉදිරිපත් කොට දී තිබේ.

නියමාකාර ආත්මික අත්තිවාරමක ඇති වැදගත්කම මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කෙරේ. මෙම අත්තිවාරම පිළිබඳව බයිබලය උගන්වන්නාවූ මූලික ප්‍රතිපත්ති මෙහිදී ඉදිරිපත් කෙරේ.

## ගොඩනැගිල්ලෙහි පරමාර්ථය

ඔබගේ ආත්මික "ගොඩනැගිල්ලෙහි" පරමාර්ථය නම්, දෙවියන්වහන්සේ හට (වැඩ සිටීමට) වාසස්ථානයක් සැපයීමය. උන්වහන්සේගේ ආත්මය ඔබ තුළ වැඩ වසනු ඇත්තේ ඔබගේ ජීවිතය නිවැරදි අත්තිවාරමක් මත ගොඩනගා තිබුණහොත් පමණකි.

පාවුල් තුමා විමසා සිටිනුයේ:

> **නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කැන බවද නොදනිවුද? කියාය. (1 කොරින්ති 3:16)**
>
> **එබැවින් ඔබගේ ආත්මික ජීවිතය නිසි පරිදි ගොඩනැගීමට අවවාද කොට තිබේ: එකිනෙකා ඒ පිට ගොඩනගන්නේ කෙසේදැයි බලාගනීවා. (1 කොරින්ති 3:10)**

## අත්තිවාරම

දේවවචනයෙහි පවසන ආත්මික අත්තිවාරම:

### දේවවචනය මත පදනම් වී තිබේ:

> **දෙවියන්වහන්සේගේ [දේවවචනය] ස්ථිර අත්තිවාරම (පර්වතයක් ලෙස) පවත්නේය (2 තිමෝති 2:19)**

### එය යහපත් අත්තිවාරමකි:

> **මතු කාලයට යහපත් අත්තිවාරමක් තබාගන්ටත් ... (1 තිමෝති 6:19)**

### එය ධර්මිෂ්ඨකම මත පදනම් වී ඇත:

> **ධර්මිෂ්ඨයා සදහටම අත්තිවාරමක්ය. (හිතෝපදේශ 10:25)**

### එය සදාකාලිකය:

> **සැබවින් ජීවනය වූ ඒ ජීවනය අල්ලාගන්නා පිණිස මතු කාලයට යහපත් අත්තිවාරමක් තබාගන්ටත් ආඥාකරන්න. (1 තිමෝති 6:19)**

### එය මූලික මූලධර්ම දෙකක් මත පදනම් වේ:

> **ස්වාමින්වහන්සේ තමන්ගේ අය දන්නාසේකැයි ද ස්වාමින්වහන්සේගේ නාමය සඳහන් කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්වායි ද යන මුද්‍රාව ඇතිව දෙවියන්වහන්සේගේ ස්ථිර අත්තිවාරම පවත්නේය. (2 තිමෝති 2:19)**

අත්තිවාරම රැඳී පවතින්නාවූ මූලධර්ම දෙක නම්,

1. මුදනු ලැබූ ජනයා: ⇨ ස්වාමින්වහන්සේ තමාගේ අය දන්නා සේක.
2. මුදනු ලැබූවන් මෙන් ජීවත් වීම: ⇨ ස්වාමින්වහන්සේගේ නාමය සඳහන් කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්වා!

**එය නොසෙල්විය හැකි පර්වතයක් මත ගොඩනගා ඇත.**

> **ඔහු ගැඹුරට හාරා, පර්වතයක් පිට අත්තිවාරම් ලා, ගෙයක් සාදාගත් මනුෂ්‍යයෙකුට සමානය. ජලගැල්මක් පැමිණ සැඩපාර ඒ ගෙට ගැසූ නමුත් ඒක හොඳින් ගොඩනගා තිබූ බැවින් සොලවන්ට බැරිය. (ලූක් 6:48)**

**එම පර්වතය නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.**

> **වෙන පර්වතයක් නැත. අන් කිසිවෙකු ඇති බවක් නොදනිමි. (යෙසායා 44:8)**

ආත්මික ජීවිතය සඳහා එකම අත්තිවාරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේය:

> **මක්නිසාද දමා තිබෙන අත්තිවාරම හැර වෙන අත්තිවාරමක් දමන්නට කවරෙකුටවත් නුපුළුවන. ඒ අත්තිවාරම නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. (1 කොරින්ති 3:11)**

## අත්තිවාරම වූ යේසුස්වහන්සේ

ආත්මික ජීවිතයෙහි අත්තිවාරම වීමට යේසුස්වහන්සේව තෝරාගනු ලැබුවේ දෙවියන්වහන්සේ විසිනි:

> **බලව, මම අත්තිවාරමක් පිණිස ගලක් එනම් පරීක්ෂාකරන ලද ගලක් සවි අත්තිවාරමක් වූ අනර්ඝ කොනේ ගලක් සියොන්හි තබමි. (යෙසායා 28:16)**

ආත්මික ජීවිතයෙහි අත්තිවාරම මනුෂ්‍යයා විසින් සාදන ලද ප්‍රතිපත්ති මාලාවක් හෝ නිකායක් හෝ ආගමික වත්පිළිවෙතක් නොවේ. අත්තිවාරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

තමුන් කිතුනුවන් බව පවසා ගන්නා බොහෝ පුද්ගලයෝ තම ජීවිතයෙහි ශ්‍රේෂ්ඨ ආත්මික ගොඩනැගිලි ඉදි කිරීමට උත්සාහ දරති. ඔවුහු තම සභාවෙහි වැඩ සටහන්වල නියැලී ඉතා යහපත් කාර්යයන් බොහෝ ඉටු කරති. ඔවුන්ගේ ආත්මික ගොඩනැගිලිවල බාහිර පෙනුම ඉතා මනහරය. එනමුත් වැඩිකල් යාමට මත්තෙන් ඔවුන්ගේ ආත්මික ගොඩනැගිලි ගිලා බැස කැඩී බිඳී යයි. ඔවුහු අධෛර්යයට පත්ව, පරාජය වී, පාපයට වැටෙති. මෙයට හේතුව නම්, ඔවුහු වැරදි අත්තිවාරම් මත තම ගොඩනැගිල්ල ඉදිකිරීමට උත්සාහ දැරීම වේ.

ස්වාභාවික ගොඩනැගිල්ලක් දැරීම සඳහා නිසියාකාර අත්තිවාරමක් තිබිය යුතුවාක් සේම ඔබගේ ආත්මික ගොඩනැගිල්ල නිසිලෙස දැරීමට සවිමත් ආත්මික අත්තිවාරමක් තිබීම වැදගත්ය.

> **මක්නිසාද දමා තිබෙන අත්තිවාරම ඇර වෙන අත්තිවාරමක් දමන්ට කවරෙකුටවත් නුපුළුවන. ඒ අත්තිවාරම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.**
> **නුමුත් අත්තිවාරම පිට යමෙක් රන්, රිදී, අනර්ඝ ගල්, ලී, තෘණ, පිදුරු ගොඩනගන්නේ නම්, එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය. (1 කොරින්ති 3:11-13)**

"ක්‍රිස්තියානි" සේවාවන් යැයි කියනු ලබන සියලුම ක්‍රියා දෙවියන්වහන්සේ විසින් පරීක්ෂා කරනු ඇත. ඔබගේ ආත්මික ජීවිතයෙහි ආකෘතිය නියමාකාර අත්තිවාරමක් මත ඉදිකර තිබේදැයි පරීක්ෂා කර බලනු ඇත. ආත්මික ජීවිතයෙහි විනාශනොවී පවතින්නාවූ එකම ගොඩනැගිල්ල නම් යේසුස් ක්‍රිස්තුස් නමැති අත්තිවාරම මත ගොඩනැගුව පමණකි.

## අත්තිවාරමක ඇති වැදගත්කම

අත්තිවාරම් ඉතා වැදගත්ය. ගීතාවලියෙහි ලේඛකතැන මෙය අවබෝධ කරගත් බැවින් ඔහු මෙසේ විමසා සිටී:

> **අත්තිවාරම් විනාශ වුවහොත්, ධර්මිෂ්ඨයා කුමක් කළ හැක්කේද? (ගීතාවලිය 11:3)**

ස්වභාවික ලෝකයෙහි යම් ගොඩනැගිල්ලක අත්තිවාරම නිසියාකාරයෙන් දමා නොමැති වුවහොත් එම ගොඩනැගිල්ල කැඩී බිඳී යාමට හැකිය. ආත්මික ලෝකයෙහි ද මෙම ප්‍රතිපත්තිය සැබෑවකි. වැරදි අත්තිවාරමක ප්‍රතිඵලය ආත්මික ජීවිතයේ විනාශය විය හැකිය.

නියමාකාර ආත්මික අත්තිවාරමක ඇති වැදගත්කම බයිබලයෙහි හග්ගයි වාර්තා කොට ඇති සිද්ධිවලින් තහවුරු කරයි. ස්වභාවික ලෝකයෙහි ඉශ්රායෙල් ජනතාව ඉතා අඩු අස්වැන්නක් නෙලමින් සිටියහ. හග්ගයි ඔවුන්ට තමුන්ගේ මාර්ග විමසා බැලීමට පැවසීය.

> **නුඹලා බොහෝම වැපුරූ නමුත් එකතු කරගත්තේ ස්වල්පයක්ය. ... නුඹලාගේ මාර්ග සිතට ගනිල්ලා. ... නුමලා බොහෝමයක් ගැන බලාසිටියහුය; නමුත් ඒවා ස්වල්ප විය. (හග්ගයි 1:6, 7,9)**

මෙම ගැටළුව නිවැරදි කිරීම සඳහා ඔවුහු ස්වභාවික මෙන්ම ආත්මික ලෝකයෙහිත් නැවත ගොඩනැගීමක් සිදු කළ යුතු බව හග්ගයි පැවසීය.

ඉශ්‍රායෙල්වරු ස්වභාවික ලෝකයෙහි නැවත-ගොඩනැගීම කළ යුතු වූයේ ඔවුහු මේ වනතුරු ස්වාමින්වහන්සේගේ ගෘහය තැනීම අතපසු කර තිබූ බැවිනි. දෙවියන්වහන්සේ තම දේවමාළිගය ගොඩනැගීමට කළාවූ ආඥාව ඔවුහු පසෙක ලා තමුන්ගේම ගෘහයක් ගොඩනැගීමෙහි ද තමුන්ගේ කොටස සංවර්ධනය කිරීමෙහි ද නියැලී සිටියහ. එයටත් වඩා වැදගත් කාරණය වූයේ ඔවුහු වැරදි ආත්මික අත්තිවාරමක් මත තම ජීවිත ගොඩනැගීමය. ඔවුහු අපවිත්‍ර දෑතින් පූජා (යාගපත් ක්‍රියා) ඔප්පු කරමින් සිටියහ.

> **මේ සෙනග එසේමය, මේ ජාතිය ද එසේමය යි ස්වාමින්වහන්සේ කියනසේක; ඔවුන්ගේ අත්වල සියලු වැඩත් එසේමය, ඔවුන් එහි කරන දේත් අපවිත්‍රය. (හග්ගයි 2:14)**

නිවැරදි ක්‍රියා අපවිත්‍ර දෑතින් පිදු කල එය පිළිගනු නොලැබේ. ඔවුන්ගේ ජීවිත වල ආත්මික අත්තිවාරම වැරදි වූ බැවින් දෙවියන්වහන්සේගෙන් ඔවුහු ආශිර්වාද නොලැබුවෝය.

ස්වභාවික ලෝකයෙහි ස්වාමින්වහන්සේගේ ගෘහයෙහි අත්තිවාරම් නැවත ගොඩනැගිය යුතු බව හග්ගයි ඉශ්රායෙල් ජනතාවට දැන්වීය. එලෙසම ඔවුහු තම ජීවිත නිවැරදි ආත්මික අත්තිවාරමක් මත ගොඩනැගිය යුතු බව ද පැවසීය. ඉශ්‍රායෙල් ජනතාව නිවැරදි අත්තිවාරම මත ගොඩනැගීමට ඇරඹූ දින සිට දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කිරීමට ආරම්භ කළ සේක.

> **අද දවස පටන් මත්තට සිතට ගන්න. එසේය, ස්වාමින්වහන්සේගේ මාළිගාවේ අත්තිවාරම තැබූ දවසේ පටන් සිතට ගන්න. බීජ තවම අටුවෙහිද? එසේම මිදිවැලත් අත්තික්කා ගසත් තවම ඵල දුන්නේ නැත. අද පටන් මම නුඹලාට ආශිර්වාද කරන්නෙමි. (හග්ගයි 2:18-19)**

ඔබ නිවැරදි ආත්මික අත්තිවාරම් මත ගොඩනැගීමට ආරම්භ කරන දවසේ පටන් දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි සෑම අංශයකටම ආශිර්වාද කරනු ඇත.

## යේසුස්වහන්සේගේ දේවධර්මය

යහපත් ආත්මික අත්තිවාරම් මත ගොඩනැගීමට පවතින අවශ්‍යතාවය යේසුස්වහන්සේ අවධාරණය කොට ඉගැන්වූසේක. උන්වහන්සේ මෙම සත්‍යය පැහැදිලි කිරීම පිණිස ගෙවල් දෙකක් ගොඩනැගූ මනුෂ්‍යයන් දෙදෙනෙකු පිළිබඳ උපමා කතාවක් යොදා ගත්සේක. බයිබලය මෙම උපමාව ස්ථාන දෙකක වාර්තා කොට ඇත. ඉන් එකක් මතෙව් 7:24-29 ද අනෙක ලූක් 6:47-49 ද සඳහන් වේ. එම කොටස් දෙක සංසඳනය සඳහා පහතින් දී තිබේ.

**ලූක්**

මාගේ වචන අසා ඒවා පවත්වන අය කාට සමානදැයි නුඹලාට පෙන්වමි:

ඔහු ගැඹුරට හාරා, පර්වතයක් පිට අත්තිවාරම ලා, ගෙයක් සාදාගත් මනුෂ්‍යයෙකුට සමානය. ජල ගැල්මක් පැමිණ සැඩපාර ඒ ගෙට ගැසූ නුමුත්, ඒක හොඳින් ගොඩනගා තිබුණු බැවින් සොලවන්ට බැරිවිය.

**ලූක්**

නුමුත් අසා, නොකරන අය අත්තිවාරමක් නැතුව පොළොව පිට ගෙයක් සාදාගත් මනුෂ්‍යයෙකුට සමානය: සැඩපාර ඒ ගෙට ගැසුවේය, එවෙලේම ඒක වැටුණේය: ඒ ගෙයි විනාශය ද මහත් වියයි කීසේක.
(ලූක් 6:47-49)

**මතෙව්**

එහෙයින් යමෙක් මාගේ මේ වචන අසා ඒවා පිළිපදිද,

ඔහු පර්වතය පිට තමාගේ ගෙය සාදාගත් නුවණ ඇති මනුෂ්‍යයෙකුට සමාන කරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, හුළඟ හමා, ඒ ගෙට ගැසුවේය: එය පර්වතය පිට පිහිටා තිබුණු බැවින් නොවැටුණේය.

**මතෙව්**

යමෙක් මාගේ මේ වචන අසා, ඒවා පිළිනොපදිද, ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය දාසාගත් නුවණ නැති මනුෂ්‍යයෙකුට සමාන කරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, හුළඟ හමා, ඒ ගෙට ගැසුවේය: ඒක වැටුණේය. එහි වැටීම ද බලවත් විය.

යේසුස්වහන්සේ මේ වචන කියා නිමකළ කල්හි සමූහයෝ උන්වහන්සේගේ ඉගැන්වීම ගැන විස්මයට පත්වූවෝය. මක්නිසාද උන්වහන්සේ ඔවුන්ගේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඔවුන්ට ඉගැන්වූසේක.
(මතෙව් 7:24-29)

මෙම කොටසෙහි වැදගත් මූලධර්ම කිහිපයක් ඇතුළත් වේ.

## දේවධර්මය:

පළමුවැනි මූලධර්මය නම්, නියමාකාර අත්තිවාරමක් මත ගොඩනැගීම යේසුස්වහන්සේගේ ධර්මයෙහි (ඉගැන්වීමෙහි) අංගයකි. උන්වහන්සේගේ ඉගැන්වීම අසා, මහජනතාව “මවිතයට පත්වූ” බව මෙම කොටසෙහි සඳහන් වේ. එම ඉගැන්වීමෙහි එක් කොටසක් වූයේ හොඳ අත්තිවාරමක් මත ගොඩනැංවීම පිළිබඳව එතුමා පැවසූ කතන්දරයයි.

පාවුල්තුමා ද සඳහන් කරනුයේ අත්තිවාරම මත ගොඩනැංවීම ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මයෙහි අංගයක් බවය.

> **ඉගැන්වීම ද නමැති අත්තිවාරමක් නැවත නොතබා ... ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර ... (හෙබ්‍රෙව් 6:1)**

ඉන්පසුව පාවුල්තුමා යේසුස්වහන්සේගේ ඉගැන්වීම් ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

## නිවැරදි අත්තිවාරම:

යහපත් ආත්මික අත්තිවාරමක් ගොඩනැංවීම සඳහා පියවර ලූක් 6:47හි සඳහන් වේ. ඒවා නම්,

1. මා ළඟට ඇවිත් ...
2. මාගේ වචන අසා ...
3. ඒවා පවත්වන අය ...

මෙම පියවර තුනම අවශ්‍ය වේ. යේසුස්වහන්සේ වෙතට පැමිණීම පමණක් නොසෑහේ. ඔබ එතුමා පවසා ඇති දෙයට සවන්දිය යුතුය. එහෙත් පැමිණ ඇහුම්කන් දීම පමණක් නොසෑහේ. ඔබ පෞද්ගලිකව යම් ක්‍රියාවක් කළ යුතුය. කිසියම් පුද්ගලයෙකු හට යේසුස්වහන්සේ වෙතට පැමිණ, එතුමාට කීමට ඇති දේ අසා දැනගෙන, එයට ප්‍රතිචාර නොදක්වා සිටිය හැකිය.

> **මා කියන දේ නොකර, ස්වාමිනි, ස්වාමිනියි මට කියන්නේ මක්නිසාද? (ලූක් 6:46)**

ඔබ දේවවචනය දන්නා නමුත් එයට අනුකූලව ක්‍රියා නොකර සිටීමට හැකිය. ඔබ යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලට ප්‍රතිචාර දක්වන තුරා එතුමා සැබවින්ම ඔබගේ ස්වාමින්වහන්සේ නොවන සේක. යහපත් අත්තිවාරමක් දේවවචනය මත පදනම් විය යුතුය. යේසුස්වහන්සේ වෙතට පැමිණ, එතුමාගේ වචනය අසා, ඒ අනුව ක්‍රියාකළ තැනැත්තා ප්‍රඥාවන්තයෙකි. මෙම මනුෂ්‍යයා තම ජීවිතයෙහි ආත්මික අත්තිවාරම ස්ථායි ලෙස පවත්වා ගැනීමට වගබලාගත්තේය. ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නම් පර්වතය හා තමා අතර පැවති සියළුම බාධක ඉවත් කරමින් “ගැඹුරට හෑරුවේය”.

ඔබගේ ආත්මික ජීවිතය ගොඩනැගිය යුතු ආකාරය පෙන්වා දෙන සැලැස්ම නම් දේවවචනයයි. බයිබලය ඔබගේ ආත්මික අත්තිවාරම සඳහා සර්ව සම්පූර්ණ ආධිපත්‍යය හා සැලැස්ම ලෙස පිළිගත යුතුය. එයට හේතුව නම් ...

> **මක්නිසාද කිසි අනාගතවාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසිකලක නොපැමිණියේය. නමුත් මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය. (2 පේතෘස් 1:21)**

2 තිමෝති 3:16හි දෙවියන්වහන්සේගේ එළිදරව්වීමේ පරමාර්ථය දී තිබේ.

> **දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

බයිබලයෙහි යේසුස්වහන්සේගේ මූලික ධර්මය සඳහා උපදෙස් ඇතුළත්ව තිබේ. එම ඉගැන්වීම් පිළිපැදීමට අසමත් වීමෙහි දී නිවැරදි කිරීමටත් තරවටු කිරීමටත් අවශ්‍ය කාරණා එහි ඇතුළත්ය.

## වැරදි අත්තිවාරම:

වැරදි අත්තිවාරම මත ගොඩනැගූ මිනිසා හට දේවවචනය ඇසුන නමුත් ඔහු තමා ඇසූ දෙයට අනුව නිසි පෞද්ගලික ප්‍රතිචාරය නොදැක්වීය. ඔහු අඥානයෙකැයි නම් කෙරුන අතර අත්තිවාරමක් නොමැතිව ගොඩනැගූ කෙනෙකුට සමාන කෙරුනි (ලූක් 6:49). ඔහුගේ නිවස පර්වතය මත නොව වැලි මත ගොඩනගන ලදි (මතෙව් 7:27).

මනුෂ්‍ය චාරිත්‍රවාරිත්‍ර හා ආගමික ඇදහිලි මත තම ආත්මික ජීවිතය පදනම් කර ගන්නා විට ගොඩනැගිල්ල වැලිමත ගොඩනගයි. එයින් අදහස් කරන්නේ යහපත් ක්‍රියා, සභාවට සහභාගි වීම, ආගමික වත්පිළිවෙත් අනුගමනය කිරීමෙන් ඔබට ආත්මික විය හැකි යයි කල්පනා කිරීමය.

## ජීවිතයෙහි කුණාටු:

ගොඩනගන්නන් පිළිබඳ යේසුස්වහන්සේගේ කතාවෙන් තවත් ශ්‍රේෂ්ඨ සත්‍යයක් එළිදරව් වේ. ජීවිතයෙහි ස්වභාවය නම් කුණාටු සහිත වීමය. ජීවිතයෙහි නොයෙකුත් සිදුවීම් හේතුවෙන් පෞද්ගලික අර්බුද වලට මුහුණ දීමට සිදුවේ. ජීවිතයෙහිදී ඔබට මරණයට, රෝගවලට, ව්‍යසන වලට මුහුණ පෑමට සිදු වේවි. ඇදහිලිවතුන්ට පවා ප්‍රශ්න ගැටළු වලට මුහුණ දීමට සිදුවනු ඇත. ක්‍රියා 14:22හි අපට අනතුරු අඟවා ඇත්තේ, "අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල් වෙන්ට ඕනෑය" කියාය.

යේසුස්වහන්සේ පවසනුයේ:

> **ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නමුත් ධෛර්යවත් වෙයල්ලා. මම ලෝකයෙන් ජයගතිමි. (යොහන් 16:33)**

ජීවිතයෙහි කුණාටු වලින් බේරීමට කිසිවෙකුටවත් නොහැකිය. සෑම තැන්හිම වෙසෙන සෑම මනුෂ්‍යයන් හටම ජීවිතයෙහි නොයෙකුත් කුණාටු සහගත සිදුවීම් වලට, වාතාවරණයන්ට මුහුණ දීමට සිදුවේ. කුණාටු සියල්ලම එකමය. එහෙත් විවිධ මනුෂ්‍යයන් එයට ප්‍රතිචාර දක්වන ක්‍රමය වෙනස්ය: විවිධාකාරය. ඔබගේ ආත්මික ජීවිතය සඳහා නියමාකාර අත්තිවාරමක් නොතිබුණහොත් ඔබ කඩා වැටෙනු ඇත. වැලිමත ගොඩනැගූ නිවස මෙන් ඔබගේ කඩා වැටීම මහත් වනු ඇත. එහෙත් ඔබගේ ජීවිතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහ එතුමාගේ ඉගැන්වීම් නම් වන නිවැරදි අත්තිවාරම මත ගොඩනගා ඇත්නම්, කුණාටුවලට ඔබ සෙලවිය නොහැකි වනු ඇත.

> **මම පොළොව පමණක් නොව ස්වර්ගයත් තව වරක් කම්පා කරන්නෙමි.**
> **තව වරක් කී වචනයෙන් පෙන්වන්නේ නොසෙල්වෙන්නාවූ දේවල් පවතින පිණිස සෙලවෙන ඒවා සෑදූ දේවල් මෙන් පහකරන බවය. (හෙබ්‍රෙව් 12:26-27).**

සෙලවීමේ අත්දැකීම පැමිණි කල, සොලවනු ලැබීමට නොහැකි දෙය පමණක් ඉතිරි වනු ඇත. එහිදී නැගී සිටින අය නම්, නිවැරදි ආත්මික අත්තිවාරමක ගොඩනගා තැබූ අය වෙති.

## අත්තිවාරම් : මූලික අවශ්‍යතාවයක්

ස්වභාවික ලෝකයෙහි හොඳ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හොඳ අත්තිවාරමක් දැමීම මූලික අවශ්‍යතාවයකි. "මූලික අවශ්‍යතාවයක්" යනු "මුලින් කළ යුතු" එනම් ගොඩනැගීම ඇරඹීමට "පෙර" කළ යුතු කාරණාවකි. "සුපිරි ආකෘතිය" ගොඩ නැගීමට පෙර නිවැරදි අත්තිවාරමක් දැමීම අවශ්‍ය වේ. "සුපිරි ආකෘතිය" නම් අත්තිවාරම මත ගොඩ නගන දෙය වේ.

ආත්මික පරිණත භාවය සඳහාද නියමිත ආත්මික අත්තිවාරමක් දැමීම මූලික අවශ්‍යතාවයකි. හෙබ්‍රෙව් 6:1-3 දක්වා ඇති පරිදි අපහට නියමාකාර ලෙස ආත්මික අත්තිවාරමක් නොදමා සම්පූර්ණත්වය කරා ළඟා විය නොහැකි බව පෙන්වා දෙයි. ආත්මික පරිණත භාවය නම්, ආත්මික අත්තිවාරම මත ගොඩ නගා ඇති අති ස්වාභාවික ගොඩනැගිල්ලය. එබැවින් ඔබගේ අත්තිවාරම වැරදි නම්, ඔබ ඒ මත ගොඩනැගූ සුපිරි ගොඩනැගිල්ල ද නොපවතිනු ඇත. එසේම ඔබ කිසිම දිනක ආත්මික පරිණත භාවයට ද ළඟා නොවනු ඇත.

පහත සඳහන් පාඩම ඔබහට ඔබගේ ආත්මික අත්තිවාරමෙහි අංගයන් විය යුතු කාරණා පැහැදිලි කර දෙනු ඇත. ගෙවල් දෙක ගොඩනැගූ මනුෂ්‍යයන්ගේ උපමා කතාවලින් පැහැදිලි වූ පරිදි එම ඉගැන්වීම් පිළිබඳ දැන සිටීම පමණක් නොසෑහේ. ඔබ දේව වචනය කෙරෙහි පෞද්ගලික ප්‍රතිචාරයක් දක්වා ඔබගේ ආත්මික ජීවිතයෙහි අත්තිවාරම දැමීම සඳහා එම සත්‍යයන් භාවිතා කරගත යුතුය.

ඔබ දේව වචනයට ප්‍රතිචාර නොදක්වන්නේ නම්, ඔබ ද ප්‍රේරිත යාකොබ් විස්තර කරන මනුෂ්‍යයා වැනිය:

> **නුමුත් නුඹලාම රවටා ගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙයල්ලා.**
> **මක්නිසාද යමෙක් වචනය අසන නුමුත් එය පිළිපදින්නේ නැත්නම්, ඔහු කැඩපතකින් තමාගේ ස්වභාවික මුහුණ බලන මනුෂ්‍යයෙකුට සමානය.**
> **මක්නිසාද, ඔහු තමාම බලාගනිමින් සිට අහක්ව ගිය කල, තමා කෙබඳු මනුෂ්‍යයෙක්ව සිටියේදැයි එවෙලේම මතක නැති කරයි.**
> **නුමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගෙන, මතක නැති කරන අසන්නෙක් නොවී, ක්‍රියාකරන කෙනෙක්ව, එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ ක්‍රියා කිරීමෙහිදී ආශිර්වාද ලබන්නේය. (යාකොබ් 1:22-25)**

ඔබගේ ආත්මික ජීවිතය නිවැරදි අත්තිවාරම මත ගොඩනැගීමට ආරම්භ කළ දින සිට දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කිරීමට අරඹන බව මතක තබාගන්න.

පහත සඳහන් පාඩම් වලදී ඔබ ඉගෙනීමට යන්නාවූ මූලික ප්‍රතිපත්ති කිහිපයක් නම්:

- මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම
- දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
- බව්තීස්මය
- අත් තැබීම
- මළවුන්ගෙන් උත්ථානය
- සදාකාලික විනිශ්චය

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. හෙබ්‍රෙව් 6:1-3 දක්වා සඳහන් කර ඇති මූලික අත්තිවාරම් දේවධර්ම හය මොනවාද?

3. ඔබහට ආත්මික පරිණත භාවය කරා ළඟාවීමට උපකාර වන්නේ කුමක්ද?

4. ලූක් 6:47හි සඳහන් පරිදි නිවැරදි ආත්මික අත්තිවාරමක් ගොඩනැංවීම සඳහා අනුගමනය කළ යුතු පියවර 3 මොනවාද?

5. දෙවියන්වහන්සේ විසින් දමා ඇති ආත්මික අත්තිවාරම කවුද?

(පරීක්ෂණයට පිළිතුරු මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදයට පසුව සඳහන් කර ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

බයිබලයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් (ධර්මය) සහ එකම ජීවමාන සත්‍ය වූ දෙවියන්වහන්සේගේ වචන ඇතුළත් වේ. එහි ඔබගේ ආත්මික ජීවිතය නිවැරදි අත්තිවාරමක් මත ගොඩනැගිය හැකි ක්‍රමය පැහැදිලි කර දෙයි.

දේව වචනය පිළිබඳව පහත සඳහන් පදවල ඇතුළත් කාරණා අධ්‍යයනය කොට ඒවා සාරාංශ ගත කරන්න.

**බයිබලය දේව වචනයයි**

2 තිමෝති 3:14-17

2 පේතෘස් 1:19-21

හෙබ්‍රෙව් 1:1

1 කොරින්ති 2:13

1 තෙසලෝනික 2:13

යොහන් 5:39

**බයිබලය සදාකාලිකය**

මතෙව් 24:35

යෙසායා 40:8

**බයිබලය අපගේ ආත්මික ජීවිත පදනම් කරගැනීම සඳහා ස්ථාපිත ප්‍රමිතියකි**

ගීතාවලිය 119:89

# දෙවන පරිච්ඡේදය

## මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම - 1 වෙනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය නිමකිරීමෙන් අනතුරුව ඔබ හට පහත සඳහන් කාරණා කළහැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- "මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම" අර්ථ දැක්වීමට
- පාපයෙහි මූලාරම්භය පැහැදිලි කිරීමට
- බයිබලයෙහි පාපය සඳහා භාවිතා කර ඇති විවිධ නාම හඳුනා ගැනීමට

**ප්‍රධාන පදය:**

**සියල්ලෝම පව්කොට දේව මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

### හැඳින්වීම

ඇදහිලිවන්තයෙකු තමාගේ ආත්මික ජීවිතය ගොඩනැගිය යුතු ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් වූ මූලධර්ම හෙබ්‍රෙව් 6:1-3 අන්තර්ගත වේ. මෙම මූලධර්ම කිතුනු ඇදහිල්ලෙහි "අත්තිවාරම්" ලෙස හැඳින්වේ. කිතුනු ඇදහිල්ල රැඳී පවතිනුයේ එම මූලධර්ම මතය. එම මූලධර්ම අතුරින් පළමුවැන්න "මළ ක්‍රියාවලින් පසුතැවිලිවීමය".

### පසුතැවිලිවීම

"පසුතැවිලිවීම" යන වචනයෙහි මූලික අර්ථය නම්, මනසෙහි ඇතිවන්නාවූ වෙනස් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස බාහිර ක්‍රියාකාරකම් වල වෙනසක් ඇතිවීමය.

සමහරු පසුතැවිලිවීම හැගීම් ^චිත්තවේග& හා එකට සම්බන්ධකොට දක්වති. ඔවුහු පසුතැවිලිවීම කඳුළු සැලීම, වැරදි ක්‍රියා හා සිතුවිලි පිළිබඳ දුක සිතීම වැනි කාරණා සමඟ සම්බන්ධකර දක්වති. පසුතැවිලිවීම හැගීමක් නොවේ. එය තීරණයකි. සමහර අවස්ථාවලදී හැගීම් සැබවින්ම පසුතැවිලිවීම හා සමග බැඳී පවතී. එනමුත් සමහර අවස්ථාවලදී මනුෂ්‍යයෙකු ඉතා දුකින් බොහෝ කඳුළු හෙලූ නුමුත් ඔහු සැබවින්ම පසුතැවිලි නොවී සිටිය හැකිය.

තවත් සමහරු පසුතැවිලිවීම විශේෂ ආගමික අවශ්‍යතාවයක් සපිරීම හා සමග සම්බන්ධකොට දක්වති. සමහරවිට මෙය "වරදට වන්දි ගෙවීම" ලෙසද හඳුන්වති. මෙවැනි ආගමික වූ "වන්දි ගෙවීම්" බොහෝ සේ ඉටු කළත් කෙනෙකු සැබවින්ම බයිබලීය අර්ථයට අනුව කිසිවිටකත් පසුතැවිලි නොවී සිටිය හැකිය.

සැබෑ පසුතැවිල්ල නම්,මනසෙහි වෙනස්වීමකි. එම මනසෙහි ඇතිවූ වෙනස්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස තමාගේ බාහිරින් කරන ක්‍රියාවල වෙනසක් ඇතිවේ. බාහිර වෙනස්වීම නම්, පාපයෙන් හැරී, ඉවත් වී, දෙවියන්වහන්සේ හා ධර්මිෂ්ඨකම වෙතට යොමුවීමය. මෙලෙස "හැරී ඉවත්වීම" දැනටම මනසෙහි අභ්‍යන්තරයෙහි සිදු වී ඇති වෙනස පෙන්නුම් කර දෙයි.

සාරාංශයක් ලෙස දැක්වීම: බයිබලීය පසුතැවිලිවීම නම්, අභ්‍යන්තරිකව මනසෙහි ඇතිවන්නාවූ වෙනසක ප්‍රතිඵලය ලෙස බාහිරයෙන් පාපයෙන් හැරී ඉවත් වී ඒ වෙනුවට දෙවියන්වහන්සේ සහ ධර්මිෂ්ඨකම වෙතට යොමුවීමකි.

## නිෂ්ප්‍රයෝජන පසුතැවිලිවීම

බයිබලයෙහි "පසුතැවිලිවීම" යන පදය වෙනස් අයුරින් භාවිතා කොට ඇති කොටස් කිහිපයක් ඇත.

**යූදස් :**

මතෙව් 27:3-4හි යූදස් ඉස්කාරියෝත්, යේසුස්වහන්සේව මරණයට පත්කිරීමට නියමව සිටි බව දැනගත් කල ක්‍රිස්තුස්වහන්සේ පාවාදීමෙන් තමා කළා වූ කාර්යය පිළිබඳව ඔහු පසුතැවිලි වූ බව පවසයි:

> **එවිට උන්වහන්සේ පාවාදුන් යූදස් උන්වහන්සේ වරදට පත්කරනු ලැබූ බව දැක, පසුතැවිලිව, රිදී මිල තිහ නායක පූජකයන් ද වැඩිමහල්ලන් ද ළඟට නැවත ගෙනවුත්: නිදොස් ලේ පාවාදීමෙන් මම පව්කෙළෙමියි කීවේය. (මතෙව් 27:3-4)**

මෙහිදී භාවිතා කොට ඇති ග්‍රීක පදය වෙනසක් ගෙන දෙන අරුතින් භාවිතාකොට තිබෙන පසුතැවිලිවීම පදයම <u>නොවේ</u>. බොහෝවිට මනුෂ්‍යයෝ වැරදි අර්ථකථනයක් දෙමින් පසුතැවිල්ල ලෙසට දක්වන පදයකි. බොහෝ භාෂාවල වචන සඳහා අර්ථයන් එකකට වඩා තිබේ. බයිබලය ලියන ලද භාෂාව සම්බන්ධයෙන් ද මෙය සත්‍යයකි. බයිබලයෙහි "පසුතැවිලිවීම" යන වචනයට එක් අර්ථයකට වඩා ඇත. මෙම ජේදයෙහි යූදස් සම්බන්ධයෙන් භාවිතාකොට ඇති වචනය හැඟීම් , දුක හා සංකාව සනිටුහන් කරන ලතවීමකට සමානය.

යූදස් තමා කළාවූ දෙය පිළිබඳව දුක් වූ නමුත් බයිබලීය අර්ථයෙන්ම පසුතැවිලිවීම අත් නොදුටුවේය. ඔහුගේ ක්‍රියාවෙහි වෙනසක් ඇතිවන පරිදි තමාගේ මනසින් තීරණයක් නොගත්තේය. ඔහු තම පාපයෙහිම නොකඩවා පැවතී සිට අවසානයෙහි ගෙල වැල ලා ගත්තේය.

**ඒසව් :**

මෙම අවාසානාවන්ත වැරැද්ද කළා වූ තවත් අයෙක් නම් ඒසව්ය. ඒසව් සුප් පිඟානකට
තමා හට දෙවියන්වහන්සේ දී තිබූ කුළුඳුල්කමේ උරුමය විකිණීමෙන් පව් කළේය. බයිබලය මෙය වාර්ථා කරමින්:

> **මක්නිසාද පසුව ඔහු ආශිර්වාදය උරුම කරගන්ට කැමති වුන නමුත් ඔහු එපා කරනු ලැබූ බව නුඹලා දනිහුය; මක්නිසාද ඔහු කඳුලෙන් යුක්තව ඕනෑකමින් එය සෙවූ නමුත් වෙනස් කිරීමට ඉඩක් ලැබුණේ නැත. (හෙබ්‍රෙව් 12:17)**

ඒසව් තමාගේ කුළුඳුල්කම සුප් පිඟානකට හුවමාරු කරගත්තේය. ඒසේ කිරීමෙන් ඔහුගේ කුළුඳුල්කම සමග ඔහුට දෙවියන්වහන්සේගෙන් හිමිවන්නාවූ සියලු ආශිර්වාද සහ පොරොන්දු ඔහු ප්‍රතික්ෂේප කළේය.

පසවූ, ඒසව් තමා කළ දෙය පිළිබඳව කණගාටු විය. ඔහු මහත් හඬකින් හැඬූ අතර ශෝකයෙන් කඳුළු වැගිරවූයේය. එනමුත් දැඩි චිත්ත ආවේග පසුතැවිලි වූ බවට ඔප්පුවක් නොවේ. ඒසව් සැබවින්ම පසුතැවිලි නොවීය. ඔහුගේ කුළුඳුල්කම අහිමිවීම ගැන ඔහු දුක්වූ අතර නැවත එය හිමිකරගැනීමට ආශා විය. ඔහුගේ "පසුතැවිලිවීම" පිළිගනු නොලැබූයේ යමක් පිළිබඳව ලතැවීම හා නියම පසුතැවීම අතර විශාල වෙනසක් පවතින බැවිනි.

## මළ ක්‍රියාවන්

පසුතැවිලිවීමෙහි නියම අර්ථය වටහාගැනීමට නම් අපි පසුතැවිලි විය යුතු කුමකින්දැයි තේරුම් ගත යුතු වෙමු. "මළ ක්‍රියාවන්" මොනවාදැයි අප වටහාගත යුතු වෙමු. "මළ ක්‍රියාවන්" නම්, දෙවියන්වහන්සේගෙන් තොරව කෙනෙකුගේ ජීවිතයෙහි සිදුකරන ක්‍රියාවන්ය. මෙම ක්‍රියාවන් වැරදි ක්‍රියා හෝ ස්වයං-ධර්මිෂ්ඨකමේ ක්‍රියා විය හැකිය.

බයිබලය මේවා "පාප" නමින් හඳුන්වයි. පාපය ඇතිකරන මූලිකම දෙය නම් ආත්මාර්ථකාමී බවයි. එය දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට එරෙහිව තමාටම ප්‍රේම කරගැනීමයි. තමාටම ප්‍රේම කරගන්නා මිනිසා "තමාගේම මාර්ගයෙහි" හැසිරෙයි.

**අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළා වී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව (යෙසායා 53:6).**

යේසුස්වහන්සේ මිනිසාගේ පාපය උදෙසා මිය ගියේ එතුලින් මිනිසා හට:

**උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ, ජීවත් වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැගුටුණාවූ තැනැන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය කියාත්, අපි නිශ්චයකොට කියමුව. (2 කොරින්ති 5:15)**

ඔබ මෙම ආත්මාර්ථකාමී මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම තුළින් පෙන්නුම් කරනුයේ සත්‍ය වූ එකම දෙවියන්වහන්සේගේ වැඩ විසීම ඔබ පිළිගන්නා බවත්, ඔබ පව්කරුවෙකු බව ඔබ වටහාගත් බවත් පාපයට සමාව අයදින බවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ ඔබහට සපයා ඇති ගැළවීමේ සැලසුම ඔබ පිළිගන්නා බවත්ය.

## පාපයෙහි ආරම්භය

මනුෂ්‍යයා මැවීමට පෙර "නපුර" පැවතින. පාපය ආරම්භ කරන ලද්දේ ලුසිෆර් නොහොත් සාතන් විසිනි. බයිබලය වාර්තාකරන පරිදි ලුසිෆර් යනු දෙවියන්වහන්සේ විසින් මුලින්ම සම්පූර්ණත්වයෙන් මවන ලද විශේෂ දේවදූතයෙකි. ලුසිෆර් දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසීමක් හේතුවෙන් පාපයට භාජනය විය. එම පාපය හේතුවෙන් ලුසිෆර් ස්වර්ගයෙන් නෙරපනු ලදුව පොළොවට හෙළන ලදි:

**අලුයම් පුත්‍රය, නුඹ ස්වර්ගයෙන් වැටුන හැටි! ජාතීන් හෙළාදැමුවාවූ නුඹ බිමට සිඳ දමනු ලැබූ හැටි !නුඹ සිත තුළ සිතාගෙන: මම ස්වර්ගයට නැගී මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකාවලට උඩින් තබා, උතුරේ ඉතා දුර සීමාවල තිබෙන රැස්වීමේ කන්ද කන්ද පිට හිඳ ගන්නෙමි. මම වළාකුල් මුදුන් පසුකොට ඉහළ නගින්නෙමි: මහෝත්තමයාණන්ට සමානවන්නෙමියි කියෙහිය (යෙසායා 14:12-14)**

**නුඹ පියාපත් විදහාගෙන සිටින අභිෂේක ලත් කෙරුබයෙක් වූයෙහිය. මම නුඹ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ කන්දෙහි සිටෙවුවෙමි ...**
**නුඹ මවනු ලැබූ දා පටන් නුඹ තුළ අධර්මිෂ්ඨකම සම්බ වෙන තුරු නුඹේ මාර්ගවල නුඹ සම්පූර්ණව සිටියෙහිය ... එබැවින් පියාපත් විදහාගෙන සිටින කෙරුබිනි, මම නුඹ ගිනි ඇවිලෙන ගල් අතරෙන් නැති කළෙමි. (එසකියෙල් 28:14-16)**

පොළොවෙහි වෙසෙමින් ලුසිෆර් (පසුව සාතන් නමින් ප්‍රසිද්ධියට පත්) දෙවියන්වහන්සේට එරෙහිව කැරලිගැසීම දිගටම පවත්වාගෙන ගියේය. දෙවියන්වහන්සේ පළමුවැනි මිනිසා සහ කාන්තාව මැවූ කල (ආදම් සහ ඒවා) ලුසිෆර් ඒ දෙදෙනාව ද දෙවියන්වහන්සේට එරෙහිව පව් කිරීමට පෙළඹවූහ. මෙම කැරලිකාර මුරණ්ඩුකම "මිනිසාගේ වැටීම" ලෙස ද සමහරවිට නම් කෙරේ. එයට හේතුව නම් මිනිසා දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමේ සිට පහතට වැටීමය. උත්පත්ති දෙවන තුන්වන පරිච්ඡේදවල ඔබට මේ පිළිබඳව කියවිය හැකිය.

පාපයෙහි දඬුවම ආත්මික හා ශාරීරික මරණය වනු ඇති බව දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට කලින් අනතුරු අඟවා තැබුසේක. ආත්මික මරණය නම් දෙවියන්වහන්සේ සමග ඔවුනට පැවති සම්බන්ධතාවය අහිමිවීමය. ශාරීරික මරණය නම්, ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ ශරීරය මිය යෑමය. ආදම් සහ ඒවාගේ පාපය හේතුකොටගෙන සියලු මනුෂ්‍යයන් කෙරෙහි පාපය ඇතිවිය.

**එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොටගෙන පාපයත් පාපය කරණකොටගෙන මරණයත් ලෝකයට ඇතුල්වුණාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණය ද පැමුණුනේය. (රෝම 5:12)**

පළමු මිනිසාගේ සහ ස්ත්‍රියගේ වැටීම හේතුවෙන් සියලු මිනිස් සංහතිය වෙත පාපය පැමිණියේය. එහි තේරුම නම්, උපදින සෑම කෙනෙකුම මූලික පාප ස්වභාවය උරුම කරගෙන ඉපදෙන බවය.

ශාරීරික ගතිපැවතුම් උරුමයෙන් පරම්පරාවට හිමිවන්නාක් මෙන්ම මූලික පාපයෙහි ස්වභාවික ගුණාංග ද ආත්මිකව උරුම වෙමින් පවතී. සෑම මනුෂ්‍යයෙකුම පව්කොට ඇති බැවින් ආත්මික හා ශාරීරික මරණයෙහි දඬුවම ගෙවිය යුතුය.

ලෝකයෙහි පවතින සියලුම නපුර සඳහා සාතන් වගකිව යුතුය. සාතන් දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසීම තවමත් පවත්වාගෙන යන්නේ මනුෂ්‍යයාව පව්කිරීමට පරීක්ෂාවට ලක්කිරීම තුළිනි. මනුෂයයාගේ හදවත, මනස සහ ප්‍රාණය උදෙසා ආත්මික ලෝකයෙහි නිරන්තර සටනක් පවතී.

සෑම මනුෂ්‍යයෙකුම මූලික පාපිෂ්ඨ ස්වභාවය උරුමයෙන්ම හිමිකරගෙන සිටිති. සෑම මනුෂයෙකුම තමාගේ පාපිෂ්ඨ ස්වභාවය හේතුවෙන් දෙවියන්වහන්සේට එරෙහිව මුරණ්ඩුවීමට පෙළඹෙන කල පව් කරති.

> **නුමුත් එක එක මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන කල්හි ද පොලඹවනු ලබන කල්හි ද පරීක්ෂා කරනු ලබයි. එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය වදන්නිය. පාපයද සම්පූර්ණ වූ කල්හි මරණය උපදවයි. (ජාකොබ් 1:14-15)**

සියල්ලෝම පව්කොට ඇත. නමුත් දෙවියන්වහන්සේ පාපයෙහි වන්දියෙන් ගැළවීමට මාර්ගයක් සපයා දී ඇත. ඔබගේ මළ ක්‍රියාවලින් පසුතැවිලි වීමෙන් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ පෞද්ගලික ගැළවුම්කරුවාණන් ලෙස පිළිගැනීමෙන් ඔබගේ පාපයෙහි වන්දියෙන් “ගැළවීම” ලැබිය හැකිය.

## පාපය සඳහා ඇති නම්

බයිබලය පාපය සඳහා විවිධ නම් භාවිතා කරයි:

### පාපය :

> **ඈ පුත්‍රයෙකු වදන්නිය: උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න: මක්නිසාද තමන්ගේ සෙනග ඔවුන්ගේ පාපවලින් ගළවන්නේ උන්වහන්සේය ... (මතෙව් 1:21)**

“පාපය” යන වචනයෙහි සැබෑ අර්ථය නම්, නිවැරදි ඉලක්කය අතපසු වී වැරැද්දක් කිරීමය. එය ඉලක්කයට වෙඩි තබා වෙඩිල්ල අයාලේ යෑම වැනිය. එය දෙවියන්වහන්සේ ඔබ උදෙසා තබා ඇති සර්ව සම්පූර්ණ දේවසැලැස්මට අඩුවෙන් අත්පත් කරගැනීමකි. ඔබ එළැඹිය යුතු ඉහළ මට්ටමට නොපැමිණ මගින් නතරවීමකි.

### නපුර :

> **මක්නිසාද ඇතුළතින් එනම්, මනෂ්‍යයන්ගේ නපුරු සිතිවිලි ... (මාර්ක් 7:21)**

නපුර නම් අයහපත්, නොවටිනා, දූෂ්‍ය වූ, දුෂ්ඨ, සදාචාරාත්මකය පාපිෂ්ඨ වූ යන්නය.

### දුෂ්ඨකම :

දුෂ්ඨකම නම් වැරදි දේ කිරීමට මනසින් අධිෂ්ඨානය කරගෙන සිටීමය. එය ධර්මිෂ්ඨකමට, සාධාරණත්වයට, සත්‍යට හා යහපත්කමට තැකීමක් නොකරන මානසික තත්වයයි.

> **ලෝකාන්තිමයේදී එසේම වන්නේය. දේවදූතයෝ නික්ම ඇවිත්, ධර්මිෂ්ඨයන් කෙරෙන් දුෂ්ඨයන් වෙන්කොට ... (මතෙව් 13:49)**

### අපරාධය :

අපරාධය නම්, නීතිය කැඩීමකි. එය මනුෂ්‍යයෙක් තමාට අයිති නැති ස්ථානයට ඇතුළුවීම, තහනම් කලාපයකට ඇතුළුවීම, හරි හා වැරදි අතර මැදියෙන් පවතින සීමාව ඉක්මවා යෑම වැනිය.

**එසේවී නම් ව්‍යවස්ථාව කිමෙක්ද? ඒක වනාහි පොරොන්දුව ලැබූ ඒ බීජය එනතුරු දේවදූතයන් ලවා ... (ගලාති 3:19)**

## අධර්මිෂ්ඨභාවය :

මෙයින් අර්ථවත් වනුයේ අසාධාරණකම, වැරැද්ද, බොරුව, අපරාධය සහ වංචනික බවය.

**සියලු අධර්මිෂ්ඨකම් පාපයය ... (1 යොහන් 5:17)**

## අදේවභක්තික :

අදේවභක්තික යනු දෙවියන්වහන්සේ සම්පූර්ණයෙන්ම නොසලකා හැර වංකවීම හා දුෂ්ඨවීමය. එය දෙවි කෙනෙක් වැඩ නොසිටිනවාක් සේ හැසිරීමය. අදේවභක්තික කම දෙවිකෙනෙක් මෙලොව නැතැයි සිතන අදේවවාදයට වඩා හාත්පසින්ම වෙනස්ය. අදේවභක්තික කම නම්, දෙවිකෙනෙකු සිටින බව දැනගෙන එතුමාව හෝ එතුමාගේ අණපනත් ගණනකට නොගෙන නොසලකා හැරීමය.

**මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින් වළක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියට ද අධර්මිෂ්ඨකමට ද විරුද්ධව ... (රෝම 1:18)**

**අපරාධය :**

අපරාධය නම්, නීතියක් පිළිනොපැද සිටීම හෝ නීතිය කැඩීමෙන් නීතියක් නැතිවාක් මෙන් හැසිරීමය.

**... අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව පලයල්ලා යයි ඔවුන්ට කියන්නෙමි (මතෙව් 7:23)**

**අකීකරුකම :**අකීකරුකම යනු කීකරුකමෙහි විරුද්ධ පදය වේ. එහි අර්ථය නම්, දෙවියන්වහන්සේ හා එතුමාගේ අණපනත් නොසලකා සිටීමය.

**මක්නිසාද එක මනුෂ්‍යයාගේ අකීකරුකම කරණකොටගෙන බොහෝ දෙනා පව්කාරයන් කරනු ලැබුවා සේම ... (රෝම 5:19)**

**අනවසරයෙන් ඇතුළුවීම:**

අනවසරයෙන් ඇතුළුවීම නම්, නිවැරදි මාවත අතහැර දමා හරි තැන සිට වැරදි තැනට සීමාවන් පසුකර අනවසරයෙන් පියනැගීමය. එය ඔබට අයිති නැති අනුන්ගේ ඉඩමකට අනවසරයෙන් ඇතුළුවීම හා සමානය.

**නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල උන්වහන්සේ නුඹලා ජීවත් කළසේක. (එපීස 2:1)**

## හැඳින්වීමක් පමණයි

මෙම පරිච්ඡේදය මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම නම් විෂයට හැඳින්වීමක් පමණි. ඔබ පසුතැවිලිවීමේ අර්ථ දැක්වීම ඉගෙන ගෙන ඇත, පාපයට ඇති අනෙකුත් නම් හා එහි අර්ථ දැක්වීම් මෙන්ම පාපයෙහි මූලාරම්භය පිළිබඳව ඉගෙන ගෙන ඇත.

ඊළඟ පරිච්ඡේදයෙහිදී ද ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි පළමු මූලධර්මය වන මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම නම් විෂය තවදුරටත් සාකච්ඡාවට භාජනය කෙරෙනු ඇත.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. "මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම" අර්ථ දක්වන්න.

3. බයිබලයෙහි පාපය සඳහා භාවිතාකොට ඇති වෙනත් වචන නවයක් ලියන්න.

4. මිනිස් වර්ගයාගෙන් කී දෙනෙකු පව්කරුවෝද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් පදයක් ඉදිරිපත් කරන්න.

5. පාපයෙහි මූලාරම්භය විස්තර කරන්න.

6. පලකට නැති පසුතැවිලිවීම් කළාවූ බයිලයෙහි සඳහන් මනුෂ්‍යයන් දෙදෙනෙකු නම් කරන්න.

__________ සහ __________

(පරීක්ෂණයට පිළිතුරු මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදයට පසුව සඳහන් කර ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදයෙහිදී අප පාපයෙහි මූලාරම්භය පිළිබඳවත් එයට දී ඇති බයිබලීය නාම අර්ථදැක්වීමත් සාකච්ඡා කළෙමු. දෙවියන්වහන්සේ පාපය ලෙසට සලකනුයේ කුමක්ද? පාපය නම්, දෙවියන්වහන්සේගේ අණපනත් ඕනෑම දෙයක් කඩකිරීමය.

> **පව්කරන සෑම දෙනම නොපනත්කමද කරති. පාපය නම් නොපනත්කමය.**
> **(1 යොහන් 3:4)**

දෙවියන්වහන්සේගේ ආඥා බයිබලයෙහි වාර්තාගත කොට තිබේ. උන්වහන්සේගේ ආඥාවලට අමතරව අප වැළකී සිටිය යුතු විශේෂිත පාප දෙවියන්වහන්සේ ඉදිරිපත් කොට තිබේ.

## ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් කර ඇති පාප

නව ගිවිසුමෙහි විශේෂ ලෙස සමහර පාප සඳහන් කර ඇති අතර ඒවායෙහි මූලාරම්භය, එම පාපවලට හිමිවන විශේෂ විනිශ්චය යනාදිය විස්තර කරයි. පහත සඳහන් බයිබලි පාඨයන්ට අනුව පාප වර්ග 103 ක් සඳහන් වේ. සමහර පාප එක වරකට වඩා ලේඛණගත වී ඇත. එම පාප නම්:

- හදවතින් නික්මීවිත් අපවිත්‍ර කරන්නාවූ පාප හතක් : මතෙව් 15:18-20
- හදවතින් නික්මීවිත් අපවිත්‍ර කරන්නාවූ පාප දහතුනක් : මාර්ක් 7:21-23
- දෙවියන්වහන්සේගෙන් විනිශ්චය ගෙන දෙන්නාවූ පාප වර්ග විසි තුනක් : රෝම 1:29-32
- ඇදහිලිවතුන් හට කළ නොහැකි පාප හතක් : රෝම 13: 13, 14
- ඇදහිලිවතුන් සමාගම් පැවැත්විය නොයුතු පාප හයක් : 1 කොරින්ති 5:9-11
- දේවරාජ්‍යයට ඇතුල්වීම වළකාලන පාප දහයක් : 1 කොරින්ති 6:9, 10
- දේවරාජ්‍යයට ඇතුල්වීම වළකාලන තවත් පාප දහ හතක් : ගලාති 5:19-21
- දේවඋදහස ගෙනදෙන හා දේවරාජ්‍යයට ඇතුළුවීම වළකාලන පාප හතරක් : එපීස 5:5-6
- ඇදහිලිවතුන් හැරී ඉවත්ව යා යුතු පාප එකොළහක් : 2 කොරින්ති 12:20-21
- ගැළවීම නොලද අය පිවත්වන නමුත් ඇදහිලිවතුන් එලෙස ජීවත්විය යුතු නැති පාප නවයක්: එපීස 4:17-19
- ඇදහිලිවතුන් අතර පැවතිය යුතු නැති පාප හයක් : එපීස 5:3-4
- ඇදහිලිවතුන් අත්හැර දැමිය යුතු පාප නවයක් : එපීස 4:25, 28, 29, 31
- ඇදහිලිවතුන් ඉවත්කළ යුතු පාප හයක් : කොලොස්සි 3:8, 9
- ඇදහිලිවතුන් සහමුලින් උදුරා දැමිය යුතු දෙවියන්වහන්සේගේ උදහස ගෙනදෙන පාප හයක්: කොලොස්සි 3:5-6
- ආඥා දෙන ලද්දේ මෙම පාප දාහතර නිසාය : 1 තිමෝති 1:9-10
- ඇදහිලිවතුන් හැරී ඉවත්විය යුතු පාප දහ නවයක් : 2 තිමෝති 3:1-5
- ඇදහිලිවතුන් ගැළවීම ලබා තිබෙන පාප නවයක් : තීතස් 3:3-5
- ඇදහිලිවතුන් අත්හැර දැමිය යුතු පාප පහක් : 1 පේතෘස් 2:1
- තවදුරටත් ඇදහිලිවතුන්ගේ ජීවිත වල තිබිය නොයුතු මාංශයේ පාප හතක් : 1පේතෘස් 4:2-4
- ගිනිවිලට නියම කරන පාප අටක් : එළිදරව් 21:8
- ශුද්ධ නුවරට හා ජීවනයේ වෘක්ෂයට ලඟාවීම වළකාලන පාප හයක් : එළිදරව් 22:14

# තුන්වන පරිච්ඡේදය

## මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම - II වෙනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය නිම කිරීමෙන් පසුව ඔබහට පහත සඳහන් කාරණා ඉටුකළ හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- පසුතැවිලිවීමේ වැදගත්කම පැහැදිලිකිරීමට
- මනුෂ්‍යයන්ව පසුතැවිලිවීමට පොළඹවනු ලබන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- පසුතැවිලිවීම හා සම්බන්ධ කරුණු හතරක් නම්කිරීමට
- දෙවියන්වහන්සේ වෙතට හැරීම අර්ථ දැක්වීමට
- දෙවියන්වහන්සේ වෙතට හැරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට
- ධර්මිෂ්ඨකරනු ලැබීම අර්ථ දැක්වීමට
- "ගැළවීම ලද" යන්නෙහි අර්ථය පැහැදිලි කිරීමට
- අකීකරු පුත්‍රයාගේ උපමාව ඇසුරින් පසුතැවිලිවීම හා දෙවියන්වහන්සේ වෙතට හැරීම පැහැදිලි කරදීමට

**ප්‍රධාන පදය:**

> **පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට කැඳවන්ට මම නාවෙමියි කීසේක. (ලූක් 5:32)**

### හැඳින්වීම

"මළ ක්‍රියා" පාපය ලෙසට අර්ථ දැක්වූ අතර පාපයෙහි මූලාරම්භය සොයා බැලුවෙමු. ආදම් සහ ඒවාගේ මූලික පාපය මුළු මිනිස් සංහතිය දූෂ්‍ය කළ ආකාරයත් එම පාපිෂ්ඨ ස්වභාවය මුළු මිනිස් සංහතිය උරුම කරගත් ආකාරයත් ඉගෙන ගත්තෙමු. සෑම මනුෂ්‍යයෙක් තුළම පවතින මෙම පාපිෂ්ඨ ස්වභාවය හේතුවෙන් සැබවින්ම පාපිෂ්ඨ ක්‍රියා කිරීමට යොමු වන ආකාරය ද ඉගෙන ගත්තෙමු.

මෙම පරිච්ඡේදයෙහිදී අපි මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම නම් පළමුවෙහි අත්තිවාරම් මූලධර්මය ඉගෙන ගනිමු.

### පසුතැවිලිවීම

මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම නම් "යමෙකුගේ අභ්‍යන්තරයෙහි එනම්, මනසෙහි ඇතිවන වෙනසක ප්‍රතිඵලයක් ලෙසට එම පුද්ගලයාගේ බාහිර ක්‍රියාකාරකම් වල එනම්, පාපයෙන් හැරී ඉවත් වී දෙවියන්වහන්සේ සහ ධර්මිෂ්ඨකම වෙතට යොමුවීම" වේ. දෙවියන්වහන්සේ ඉදිරියේ පසුතැවීම ලෙස ක්‍රියා 20:21 දක්වයි. පසුතැවිලිවීමෙහිදී ඔබ ඔබගේම පාපයන් එනම්, මළ ක්‍රියාවලින් ඉවත් වී දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ඇත. පසුතැවීම නම්, ඔබගේ පාපය ප්‍රතික්ෂේප කොට දෙවියන්වහන්සේ සමග සහභාගිකමට ඇතුළුවීමට ගන්නාවූ පෞද්ගලික තීරණයකි. පව්කරුවාගේ හදවතෙහි, මනසෙහි සහ ජීවිතයෙහි වෙනසක් ඇති කරනුයේ දෙවියන්වහන්සේගේ බලයෙනි.

> **එසේ වී නම්, දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය. (ක්‍රියා 11:18)**

පසුතැවිලිවීම දෙවියන්වහන්සේගෙන් ලැබෙන ත්‍යාගයකි.

**පශ්චාත්තාපයත් පව්කමාවත් දෙන අධිපතියෙක් ද ගැළවුම්කාරයෙක් ද වන පිණිස දෙවියන්වහන්සේ තමන්ගේ දකුණතින් උන්වහන්සේ (යේසුස්වහන්සේ) උසස් කළ සේක. (ක්‍රියා 5:31)**

පසුතැවිලිවීමෙහි හැඟීම් (චිත්තාවේග) කිසියම් ලෙසට සම්බන්ධතාවයක් දැක්විය හැකි නමුත් එය හැඟීමක් නොව මළ ක්‍රියාවලින් පසුතැවීමට ගන්නාවූ තිරණයකි. ඔබ දැනටම ඉගෙන ගෙන ඇති පරිදි පාපය උදසා දුක්වීම, කඳුළු සැලීම යනාදිය නොසෑහේ. ඒ සමග බාහිරයෙන් ක්‍රියාකාරකම් වල වෙනසක් සිදුවන පරිදි අභ්‍යන්තරයෙන් වෙනස්වීමට තිරණයක් ගැනීම ඇතුළත් වේ.

## පසුතැවිලිවීමේ වැදගත්කම

පසුතැවිලිවීම ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි මූලික පදනම් සත්‍යයක් ලෙස පිළිගැනීමට හේතු සාධක කිහිපයක් ඇත.

### දෙවියන්වහන්සේ එය අණ කළසේක :

**... දෙවියන්වහන්සේ නොබලා හැරිය නුමුත් සියළු මනුෂ්‍යයන්ට හැමතැන්හි පසුතැවිලිවෙන්ට දැන් අණ කරන සේක. (ක්‍රියා 17:30)**

### ආත්මික මරණයෙන් වැළකීම සඳහා එය අවශ්‍ය වේ :

**පසුතැවිලි නුණොත් නුඹලා සියල්ලෝම එසේම විනාශ වන්නෝය. (ලූක් 13:3)**

### සදාකාල ජීවනය සඳහා එය අවශ්‍යය :

පසුතැවිලිවීම තුළින් මරණයේ දඬුවම ඉවත්වන අතර සදාකාලික ජීවනය හිමි වේ.

**එසේවී නම්, දෙවියන්වහන්සේ අන්‍යජාතීන්ටත් ජීවනය පිණිස වූ පශ්චාත්තාපය දුන්සේකැයි කීවෝය. (ක්‍රියා 11:18)**

### පව්සමාව සඳහා එය අවශ්‍යය :

ඔබ පසුතැවිලි වන තුරු දෙවියන්වහන්සේ හට ඔබගේ පාපයට සමාව දිය නොහැක:

**පේතෘස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා. (ක්‍රියා 2:38)**

### දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා එය අවශ්‍යය :

**එතැන් පටන් යේසුස්වහන්සේ: පසුතැවිලිවෙයල්ලා: මක්නිසාද ස්වර්ගරාජ්‍යය ලංවී තිබේය කියා දේශනා කරන්ට පටන්ගත් සේක. (මතෙව් 4:17)**

### සියළු දෙනා සඳහා දෙවියන්වහන්සේගේ ආශාව මෙය වේ :

සදාකාලිකව දෙවියන්වහන්සේගෙන් වෙන්වී ආත්මික මරණය අත්විඳිමෙන් කිසිවෙකු සිටිනු දැකීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ.

**නුමුත් සියල්ලන්ම පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව නුඹලා කෙරෙහි බොහෝකල් ඉවසන සේක. (2 පේතෘස් 3:9)**

### යේසුස්වහන්සේ මෙලොවට පැමිණීමට හේතුව එයයි :

**පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට කැඳවන්ට මම නාවෙමියි කීසේක. (ලූක් 5:32)**

## කිතුබැතියන් පසුතැවිලිවනවාද?

පළමුවෙනි වතාවට පසුතැවිලිවීමකදී පාපිෂ්ඨ මිනිසා තමාගේ වැරදි වලින් හැරී නිවැරදි දේ කිරීම, ශුභාරංචි පණිවිඩය පිළිගැනීම සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය ඇදහිලිවන්තයෙකු වීම සිදුවේ. ඉන්පසුව එම පුද්ගලයා සර්ව සම්පූර්ණත්වය කරා යන ගමන් මගෙහි (පසුව පාඩමකදී මේ පිළිබඳව අධ්‍යයනය කරනු ඇත) ඇදහිලිවන්තයෙකු ලෙස සිටියදීම සමහරවිට ඔහුගේ පැරණි පාපිෂ්ඨ හැසිරීම් කරා නැවත වැටෙන්නට හැකිය. බයිබලිය වාර්තාවනට අනුව ඇදහිලිවන්තයෙකු පව් කළ සැමවිටම ඔහු පසුතැවිලි විය යුතුය.

### කොරින්තිවරු :

කොරින්තිය නැමැති නගරයෙහි විසූ ඇදහිලිවන්තයින්ට පසුතැවිලිවීමට සිදුවිය.

> **නුඹලා ශෝකයට පමුණුවනු ලැබූ නිසා නොව පසුතැවිලිවීම සඳහා නුඹලා ශෝකයට පමුණුවනු ලැබූ බැවින් දැන් ප්‍රීතිවෙමි ... (2 කොරින්ති 7:9)**

> **මක්නිසාද මා ආ කල යම් විධියකින් නුඹලා මා කැමති ආකාර නොවන බවත්, මා නුඹලා කැමති ආකාර නොවන බවත් පෙනේදෝ කියාද, යම් විධියකින් විවාද, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, කේලාම්, කනට කෙඳිරීම්, උඩඟුකම්, කෝලාහල පවතිනවා ඇද්දෝ කියාද මා නැවත ආ කල මාගේ දෙවියන්වහන්සේ නුඹලා ඉදිරියෙහි මා යටත්කරන සේකැයි කියාද මේ දක්වා පව්කොට තමුන් කළ අපිරිසිදුකමද වේශ්‍යාකමද සල්ලාලකමද ගැන පසුතැවිලි නුවූ බොහෝ දෙනා උදෙසා මට වැලපෙන්ට වේදෝ කියාද භයවෙමි. (2 කොරින්ති 12:20-21)**

### එපීසවරු :

එපීසයෙහි විසූ ඇදහිලිවතුනට පසුතැවෙන ලෙස ඉල්ලීමක් කෙරිනි.

> **එබැවින් නුඹලා වැටී සිටින්නේ කොතැනින්දැයි සිහිකොට, පශ්චාත්තාපව, පළමු ක්‍රියාවන් කරන්න. (එළිදරව් 2:5)**

### පර්ගමම්හි කිතුනුවන් :

පර්ගමම්හි ඇදහිලිවතුන් හට දෙවියන්වහන්සේ පවසා සිටියේ:

> **එබැවින් පශ්චාත්තාප වෙයන්න: නැතහොත් මම ඉක්මනින් නුඹ ළඟට ඇවිත් මාගේ මුඛයේ කඩුවෙන් ඔවුන්ට විරුද්ධව සටන් කරන්නෙමි. (එළිදරව් 2:16)**

### සාර්දිස්හි කිතුනුවන් :

> **එබැවින් නුඹලා ලැබුවේ කෙසේද ඇසුවේ කෙසේදැයි සිහිකර, ඒ දේ පවත්වා පසුතැවිලි වෙයන්න. (එළිදරව් 3:3)**

### ලවෝදිකයේ කිතුනුවන් :

> **මම ප්‍රේමකරන සියල්ලන්ට තරවටු කොට දඬුවම් කරමි. එබැවින් නුඹ ජ්වලිතව සිට පශ්චාත්තාප වෙයන්න. (එළිදරව් 3:19)**

පාපයක් ඇති සැමවිටම පසුතැවිලිවීම අවශ්‍ය වේ.

> **අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියළු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහාන් 1:8-9)**

## පසුතැවිලිවීමේ පණිවිඩය

ගැළවීම උදෙසා පසුතැවිලිවීම අවශ්‍ය බැවින් දෙවියන්වහන්සේ පසුතැවිලිවීමේ පණිවිඩය ජනතාව වෙතට ළඟාකරවීමට විශේෂ සැලැස්මක් යෙදූ සේක. අළුත් ගිවිසුමෙහි පසුතැවිලිවීමට කැඳවීම යොහන් බව්තිස්තගේ මෙහෙයත් සමග ආරම්භ විය.

> **ස්වාමින්වහන්සේගේ මාර්ගය පිළියෙළ කරව්, උන්වහන්සේගේ මාවත් සමතලා කරව් යයි වනාන්තරයේ හඬගසන්නෙකුගේ ශබ්දයය ...**
> **යොහන් ආවේය. ඔහු වනාන්තරයෙහිදී බව්තීස්ම කරමින් පව්කමාව පිණිස පසුතැවිල්ලේ බව්තීස්මය ප්‍රකාශ කළේය. (මාර්ක් 1:3-4)**

මෙසියස්වහන්සේගේ (යේසුස්වහන්සේ) එළිදරව් වීම පිණිස පසුතැවිලිවීමේ සේවය අවශ්‍ය විය. ඉශ්‍රායෙල් හට නැවත වරක් පසුතැවිලිවී දෙවියන්වහන්සේ වෙතට හැරීම සඳහා කැඳවීමක් ලැබෙන තුරු යේසුස්වහන්සේට එළිදරව් විය නොහැකි විය. යේසුස්වහන්සේ දේශනා කළාවූ පළමුවන පණිවිඩය පසුතැවිලිවීම විය.

> **යොහාන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කරමින්,**
> **කාලය සම්පූර්ණ විය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය. පසුතැවිලි වී ශුභාරංචිය අදහාගනිල්ලායයි කීසේක. (මාර්ක් 1:14-15)**

මුල් කාලීන සභාවෙහි ඇදහිලිවන්තයෝ පසුතැවිලිවීම දේශනා කළහ:

> **ඔව්හු පිටත්ව ගොස්: පසුතැවිලි වෙයල්ලා යයි දේශනා කළෝය. (මාර්ක් 6:12)**
> **... දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත් අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ගැන යුදෙව්වරුන්ට හා ග්‍රීක්වරුන්ට සාක්ෂි දුනිමි. (ක්‍රියා 20:21)**

අද දින පවා ලොව මුළුල්ලෙහි ජනතාව උදෙසා පසුතැවිලිවීමේ පණිවිඩය ප්‍රචාරය කිරීමෙහි වගකීම ඇදහිලිවන්තයා සතු වේ. යේසුස්වහන්සේ තම ගෝලයන්ට අවසාන උපදෙස් දෙමින් පැවසුයේ ...

> **... ජෙරුසලමේ පටන් සියළු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. (ලූක් 24:47)**

## මනුෂ්‍යයාව පසුතැවිලිවීමට යොමුකරවනුයේ කුමක්ද?

පසුතැවීම, ක්‍රිස්තියානි ඇදහිල්ල රඳා පවත්නා මූලික අත්තිවාරමක් බැවින් මනුෂ්‍යයාව පසුතැවිලිවීමට යොමු කරවනුයේ කුමක්දැයි අපි දැනගත යුතු වෙමු. ඔබ ලොව මුළුල්ලෙහි පසුතැවිලිවීමේ පණිවිඩය ප්‍රචලිත කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයෙක් නම්, මනුෂ්‍යයාව තමාගේ මළ ක්‍රියාවලින් පසුතැවිලිවීමට යොමුකරවන, පොළඹවන ක්‍රමය ඔබ දැන සිටිය යුතු වෙයි.

### දෙවියන්වහන්සේගේ යහපත්කම :

දේවභක්තිකයෙකු නොවන පුද්ගලයෙකු මත පවතින දේව ආශිර්වාදය ඔහුගේ ජීවිත රටාව දෙවියන්වහන්සේ අනුමත කිරීමක් ලෙසට වරදවා වටහා නොගන්න. දෙවියන්වහන්සේගේ යහපත්කම ස්වාමින්වහන්සේ මනුෂ්‍යයාව එතුමා වෙතට හරවා ගැනීමට ආරාධනා කිරීම සඳහා භාවිතා කරන්නාවූ එක් මාර්ගයකි.

> **... දෙවියන්වහන්සේගේ යහපත්කම පවතින බව නොදැන, උන්වහන්සේගේ යහපත්කමේද ක්ෂාන්තියේද ඉවසීමේද බහුලත්වය සුළුකොට සිතා, නුඹේ සිතේ මුරණ්ඩුකමෙන්ද පසුතැවිලි නොවන සිතින්ද ...? (රෝම 2:4-5)**

### දේශනාකිරීම :

දේව වචනය දේශනා කිරීම තුළින් මනුෂ්‍යයාව පසුතැවිලිවීමට යොමු කරවයි.

> **නිනිවයේ මනුෂ්‍යයෝ මේ පරම්පරාවට විරුද්ධව විනිශ්චයේදී නැගිට එය වරදට පත්කරන්නෝය. මක්නිසාද යෝනාගේ දේශනා කිරීමෙන් ඔව්හු පසුතැවිලි වූවෝය. (මතෙව් 12:41)**

### ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීම :

දේව වචනය දේශනා කරන කල ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණ පසුතැවිලිවීමට ලැබෙන්නාවූ ආරාධනය ජනතාව අසා, පිළිගෙන, ප්‍රතිචාර දක්වයි.

> **මක්නිසාද මම පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් කැඳවන්ට නාවෙමියි කීසේක. (මතෙව් 9:13)**

### පිය වූ දෙවියන්වහන්සේ :

පියාණන්වහන්සේ, යේසුස්වහන්සේ වෙතට යොමු නොකරන කිසිවෙකුටවත් තමා වෙතට පැමිණිය නොහැකි බව උන්වහන්සේ පැවසූසේක. මනුෂ්‍යයාව පසුතැවිලිවීමට යොමුකරවනුයේ දෙවියන්වහන්සේය.

> **මා එවූ පියාණන්වහන්සේ විසින් අඳිනු ලැබූ කෙනෙකුට මිස වෙන කිසිවෙකුට මා ළඟට එන්ට බැරිය. (යොහන් 6:44)**

### තරවටුව :

තරවටුව මිනිසාව පසුතැවීමට යොමුකරවයි. තරවටුව යනු දේව වචනයෙන් ලබා දෙන්නාවූ නිවැරදි කිරීමය.

> **... නුඹේ සහෝදරයා පව් කළොත් ඔහුට තරවටු කරපන්න; ඔහු පසුතැවිලි වේ නම්, ඔහුට කමා වෙයන්න. (ලූක් 17:3)**

### දේවභක්තික ශෝකය :

ඔබ ඉගෙන ගත් පරිදි පසුතැවිලිවීමට සමහරවිට හැඟීම් (චිත්තාවේග) ඇතුළත් විය හැකිය. ස්වභාවික හැඟීම් පමණක් සත්‍ය පසුතැවිලිවීමක් නොවන අතර දේව භක්තිකව ඇතිවන හැඟීම් සත්‍ය පසුතැවීමකට යොමු කරනු ඇත.

> **මක්නිසාද දේවකැමැත්තට එකඟ වූ ශෝකයෙන් තැවෙන්ට කාරණක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය. (2 කොරින්ති 7:10)**

## පසුතැවීම සමග සම්බන්ධ වූ කාරණා

පසුතැවිලිවීම හා බැඳි කරුණු කිහිපයක් බයිබලයෙහි දක්නට ලැබේ.

### ඇදහිල්ල :

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල පසුතැවීම කෙරෙහි බලපායි. හෙබ්‍රෙව් 6හි එය ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි දෙවන අත්තිවාරම් ප්‍රතිපත්තිය ලෙස හඳුන්වා දෙයි. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල මළ ක්‍රියාවලින් පසුතැවීම සමග එකට යා යුතුය.

> **... පසුතැවිලි වී ශුභාරංචිය අදහාගනිල්ලා යයි කීසේක. (මාර්ක් 1:15)**

**... දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ... (ක්‍රියා 20:21)**

කිතුනු ඇදහිල්ලෙහි දෙවන අත්තිවාරම් ප්‍රතිපත්තිය ලෙසට “දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල” පිළිබඳව මීළඟ පරිච්ඡේදයෙහිදී වැඩි විස්තර අධ්‍යයනය කරනු ඇත.

## බව්තිස්මය :

කෙනෙකුගේ අභ්‍යන්තරයෙහි ඇති වූ වෙනසක් බාහිරයෙන් සංකේතවත් කිරීමක් විලසින් බව්තිස්මයෙහිදී පසුතැවිලිවීම ඇතුළත් විය යුතුය.

**... නුඹලාගේ පාපයත් මකාදමනු ලබන පිණිස ද පශ්චාත්තාපව හැරියල්ලා. (ක්‍රියා 3:20)**

හෙබ්‍රෙව් 6 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් පරිදි බව්තිස්මය කිතුනු ඇදහිල්ලෙහි අත්තිවාරම් ප්‍රතිපත්ති වලින් එකක් බැවින් එම ධර්මය පසුව පරිච්ඡේදයකදී ඔබ ඉගෙන ගනු ඇත.

**ක්‍රියා :**

මනුෂ්‍යයෙකුගේ ක්‍රියා එනම්, බයිබලය හඳුන්වන පරිදි ඵල වලින් එම මනුෂ්‍යයා තුළ සැබවින්ම වෙනසක් ඇතිවුවාදැයි ප්‍රකට වෙයි.

**... අන්‍යජාතීන්ටත්, පසුතැවිලිව දෙවියන්වහන්සේ වෙතට හැරී, පසුතැවිල්ලට සුදුසු ක්‍රියාවන් කරන්ට කියා ප්‍රකාශ කෙළෙමි. (ක්‍රියා 26:20)**

**... පසුතැවිල්ලට සුදුසු ඵල උපදවාපල්ලා. (මතෙව් 3:8)**

සැබෑ පසුතැවිලිවීමකට පසුව වෙනස් විය යුතු ක්‍රියාවන් ලෙසට “ක්‍රියාවන්” හා “ඵල” හඳුන්වා දිය හැකිය.

## දෙවියන්වහන්සේ වෙතට හැරීම :

**නුඹලාගේ පාපයන් කමාකරනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරියල්ලා. (ක්‍රියා 3:20)**

දෙවියන්වහන්සේ වෙතට හැරීම පසුතැවීමට සම්බන්ධ බැවින් ඔබ හැරීම වටහාගත යුතුය.

## දෙවියන්වහන්සේ වෙතට හැරීම

දෙවියන්වහන්සේ වෙතට හැරීම යනු “වෙනතකට යොමුවීමය”. බයිබලීය පසුතැවිලිවීම හා සම්බන්ධව හැරීම යන වදන භාවිත කරන විට එහි අරුත වනුයේ “වැරදි මාර්ග වලින් හැරී නිවැරදි මාර්ගය වෙතට යොමුවීම” යන්නය.

**ඔහු ඉශ්‍රායෙල් පුත්‍රයන්ගෙන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ වෙතට හරවන්නේය. (ලූක් 1:16)**

**ලිද්දායෙහිද ෂාරොනෙහිද විසූ සියල්ලෝ ඔහු දැක, ස්වාමින්වහන්සේ වෙතට හැරුණෝය. (ක්‍රියා 9:35)**

**ස්වාමින්වහන්සේගේ හස්තය ඔවුන් සමග වූයේය. විශ්වාස කළාවූ විශාල ගණනක් ස්වාමින්වහන්සේ වෙතට හැරුණෝය. (ක්‍රියා 11: 21)**

“ දෙවියන්වහන්සේ වෙතට හැරීම” යනු පාපයෙහි අන්ධකාරයෙන් ඉවත් වී දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නමැති ආලෝකය දෙසට යොමු වීමය.

**... ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද ... (ක්‍රියා 26:18)**

එනම්, යක්ෂයාගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරීමය.

> **... සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට ද හැරෙන ලෙස ... (ක්‍රියා 26:18)**

එනම්, ලෞකික ද, කෙරෙන් ආත්මික ද, කෙරෙහි යොමුවීමය.

> **... නුඹලා මේ නිශ්ඵල දේ වලින් දුරුව, ... ජීවමාන වූ දෙවියන්වහන්සේ වෙතට හැරෙන පිණිස ... (ක්‍රියා 14:15)**

එනම්, බොරු දෙවිවරුන් කෙරෙන් ඉවත් වී සත්‍ය වූ ජීවමාන වූ දෙවියන්වහන්සේ වෙතට හැරීමය.

> **... නුඹලා ජීවමාන වූ සැබෑ වූ දෙවියන්වහන්සේට මෙහෙකරන පිණිස ද ... නුඹලා දේවතා රූප කෙරෙන් දෙවියන්වහන්සේ වෙතට හැරෙන හැටිත් ...**
> **(1 තෙසලෝනික 1:9, 10)**

## දෙවියන්වහන්සේ වෙතට හැරීමෙහි වැදගත්කම

දෙවියන්වහන්සේ වෙතට හැරීම පසුතැවිලිවීම හා සමගම ඒකාබද්ධව පැවතිය යුතුය. ඔබ වැරදි දෙයින් නිවැරදි දෙයට හැරිය යුතු වන්නේ ...

### එය දේවරාජ්‍යයට ඇතුළුවීම සඳහා අවශ්‍ය බැවිනි :

> **නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නුණොත්, කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නහුය. (මතෙව් 18:3)**

### එය ආත්මික මරණයෙන් බේරා දෙන බැවිනි :

> **පව්කාරයෙකු තමාගේ මාර්ගයේ මුළාවෙන් හරවා ගන්න තැනැත්තා ප්‍රාණයක් මරණයෙන් ගළවා, පව් රාශියක් වසන බව ඔහු දැනගනීවා. (යාකොබ් 5:20)**

### එය පව් මකාලීම සඳහා අවශ්‍ය බැවිනි :

අපගේ පාපය දෙවියන්වහන්සේගේ වාර්තා වල ලියැවී තිබේ. අප පසුතැවිලි වී හැරීම ලැබූ කල එම පව් මකාදමනු ඇත.

> **... නුඹලාගේ පාපයන් මකාදමනු ලබන පිණිසද පශ්චාත්තාපව හැරියන්න. (ක්‍රියා 3:20)**

## අකීකරු පුත්‍රයා

පසුතැවිලිවීම සහ දෙවියන්වහන්සේ වෙතට හැරීම විදහා දැක්වීම සඳහා ඉතාමත්ම සුදුසු උදාහරණය නම්, යේසුස්වහන්සේ පැවසූ අකීකරු පුත්‍රයාගේ කතාවය. එම කතාව ලූක් 15:11-24 කියවා බලන්න. මෙම යෞවනයා ඔහුගේ පියා සහ නිවෙස අතහැර දුරස්තර රටකට ගොස්, තමා සන්තක සියල්ල පාපයෙහි යෙදී නාස්ති කළේය.

මෙම යෞවනයාට ක්‍රමයෙන් තමා සිටින තත්වය අවබෝධ විය. ඔහු බඩගිනිව, හුදකලාව, වැරහැලි ඇඳගෙන, රැකියාව විලසින් ඌරන් බලා ගැනීම කළේය. ඉන්පසු ඔහු වැදගත් තීරණයක් ගත්තේය. “මම නැගිට, මාගේ පියා වෙතට යන්නෙමි” යි කීවේය. ඔහු මෙලෙස අභ්‍යන්තරයෙන් ගත්තාවූ තීරණය බාහිරයෙන් ඔහුගේ ක්‍රියාකලාපයෙහි වෙනසක් ඇති කළේය. ඔහු තම පියාගෙන් සමාව යැදීම පිණිස පිටත්ව ගියේය.

### පසුතැවිලිවීම ... මනසෙහි සිදුවන වෙනස :

ලූක් 15:17-19 කියවන්න. යෞවනයා හට තමාගේ පාපිෂ්ඨ තත්වය වැටහුනි. ඔහු තමාගේ පියාගේ නිවසට යාමටත් තමාගේ පාපය පිළිබඳව පසුතැවීමටත් තීරණය කළේය. මෙය පසුතැවිලිවීමෙහි

උදාහරණයකි. එනම්, අභ්‍යන්තරයෙන් ගන්නා වූ තීරණයක ප්‍රතිඵලය ලෙසට බාහිර ක්‍රියාකාරකම් වල වෙනසක් සිදුවීමය.

## දෙවියන්වහන්සේ වෙතට හැරීම ... තීරණය මත ක්‍රියාකිරීම :

ලූක් 15:20හි මෙම යෞවනයා නැගිට තමාගේ පරණ ජීවිතය හැර දමා අළුත් ජීවිතයක් ආරම්භ කිරීම පිණිස තම පියා වෙතට හැරී ගිය ආකාරය පවසයි. මෙය හැරීම ලැබීමය.

## අකීකරු මනුෂ්‍යයෝ

මනුෂ්‍යයාගේ පාපිෂ්ඨ ස්වභාවය තුළ එක් එක් මනුෂ්‍යයා තම පියා ලෙසට දෙවියන්වහන්සේ කෙරෙහිත් තම නිවස ලෙස ස්වර්ගය දෙසටත් පිටුපායි. ඔහු ගන්නා සෑම පියවරක්ම පාහේ දෙවියන්වහන්සේගෙන් ඈතට යන පියවරක් වන අතරම ආත්මික මරණය නොහොත් දෙවියන්වහන්සේගෙන් වෙන්වීමට ළංවන පියවරකි.

මනුෂ්‍යයා විසින් ගතයුතු ප්‍රධාන තීරණයක් ඇත. ඔහු "සිහි බුද්ධිය එළඹවා" තමා සිටින ආත්මික තත්වය වටහාගත යුතුය. තමාගේ ආත්මික ජීවිතයෙහි දිශාව වෙනස් වන අයුරින් ඔහු තීරණයක් ගත යුතු වේ. ආත්මික දිශාව වෙනස් කිරීම හේතුවෙන් ඔහුව තම පාපයෙන් හරවා දෙවියන්වහන්සේ වෙතට යොමුකරවනු ලබයි. මෙය නිසියාකාර ආත්මික අත්තිවාරමක් ගොඩනැගීමෙහි පළමු පියවර වේ.

## ධර්මිෂ්ඨ කරනු ලැබීම සහ ගැළවීම

පසුතැවිලිවීම හා සම්බන්ධ වූ බයිබලයෙහි භාවිතා වන තවත් වචන දෙකක් ඇත. එම පද දෙක නම්, "ධර්මිෂ්ඨකරනු ලැබීම" හා "ගැළවීම" ය. දෙවියන්වහන්සේ සියළු මිනිස් සංහතියෙහි විනිශ්වයකරුවාණෝය. ඔබ ඔබගේ "මළ ක්‍රියා" වල ජීවත් වන කල (පාපයෙහි) එතුමා ඉදිරියෙහි ඔබ වරදකරුවෙකු වේ.

> **අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිශ්වය කරනු ලැබ සිටියි.**
> **විනිශ්වය නම් මේය - ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නුමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය. (යොහන් 3:18-19)**

ඔබගේ පාපිෂ්ඨ මාර්ගයෙන් හැරීමට පසුතැවිලි වී තීරණයක් ගත් කල දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවයක් පිහිටුවාගැනීමට එය ඉවහල් වේ. දෙවියන්වහන්සේ ඉදිරියෙහි මෙලෙස නිවැරදි ස්ථානගතවීම හෝ නිවැරදි සම්බන්ධතාවය දැරීම "ධර්මිෂ්ඨකරනු ලැබීම" ලෙසට නම් කෙරේ.

> **නුඹලා කීකරුකම පිණිස දාසයන් කොට යමකට නුඹලාම භාර දෙන්නහු ද එය මරණයට පමුණුවන්නාවූ පාපය වේවා, ධර්මිෂ්ඨකමට පමුණුවන්නාවූ කීකරුකම වේවා, නුඹලා කීකරු වන එකම දාසයන් වන බව නොදනිවුද?**
> **එහෙත් නුඹලා පාපයේ දාසයන්ව සිටි නමුත් යම් ඉගැන්වීම් ක්‍රමයකට නුඹලා භාර දෙන ලද ද ඊට සිතින්ම කීකරු වී,**
> **පාපයෙන් නිදහස් කරන ලදුව, ධර්මිෂ්ඨකමේ දාසයන් වූ බැවින් දෙවියන්වහන්සේට ස්තුති වේවා. (රෝම 6:16-18)**

පාපයෙහි වන්දිය නම් ශාරීරික හා ආත්මික මරණය වේ. යේසුස්වහන්සේ කුරුසියෙහි මිය ගිය කල උන්වහන්සේ මුළු මිනිස් සංහතියෙහි පාපය උදෙසා වන්දිය ගෙවූ සේක.

> **අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදත්තාවූ උන් වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට [දෙවියන්වහන්සේ] සැලැස්වූ සේක. (2 කොරින්ති 5:21)**

යේසුස්වහන්සේ ඔබගේ පාපයෙහි වන්දිය ගෙවීම උදෙසා මියගිය බව පිළිගෙන, පසුතැවිලි වී, උන්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගතහොත්, එවිට ඔබ සදාකාලව දෙවියන්වහන්සේගෙන්

වෙන්වී අපායට යාමට හෝ ආත්මික මරණයට පත් නොවනු ඇත. ඔබගේ (ශාරීරික) භෞමික ශරීරය මිය යනු ඇතත් ඔබ සදාකාලික ජීවනය කරා නැවත-උත්ථාන කරනු ලැබේ. එය හැකි වනුයේ අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත උත්ථානය හේතුවෙනි. ඔබව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවයකට රැගෙන එනු ඇත. එය ධර්මිෂ්ඨකරනු ලැබීම වේ.

> **එබැවින් ඔවුහු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබෙන මිදීම කරණකොටගෙන නොමිලයේ ධර්මිෂ්ඨකරනු ලබන්නෝ වෙති. (රෝම 3:24)**

> **එබැවින් ඊටත් වඩා ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලැබූ අපි උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ උදහසෙන් ගළවනු ලබන්නෙමුව. (රෝම 5:9)**

> **එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨකරනු ලැබූ, අපේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය ඇතිව සිටිමු. (රෝම 5:1)**

ඔබ පසුතැවිලි වී, ඔබගේ ගැළවුම්කරු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් කල පාපයේ ජීවිතයකින් හා පාපයේ දඬුවමින් ඔබව මුදනු ලැබේ.

> **සැබවක් සැබවක් නුඹලාට කියමි - මාගේ වචනය අසා, මා එවූ තැනැන්වහන්සේ අදහන්නාට සදාකාල ජීවනය තිබේ. ඔහු විනිශ්චයට පත් නොව, මරණය කෙරෙන් ජීවනයට පැමිණ සිටියි. (යොහන් 5:24)**

“ගැළවීම ලැබීම” ලෙසට බයිබලය හඳුන්වනුයේ එම සංසිද්ධිය වේ. ගැළවීම ලැබීමෙහි අරුත එයයි.

දෙවියන්වහන්සේගේ ආශාව නම් සියළු මනුෂ්‍යයන් දේව උදහසට ලක් නොවී, එය අත්නොදැක, ඒ වෙනුවට ගැළවීම හිමි කරගැනීමය.

> **මක්නිසාද දෙවියන්වහන්සේ උදහසට නොව අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ගැළවීම ලබාගැනීමට අප නියම කළ සේක. (1 තෙස. 5:9-10)**

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය.**
> **මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහන් 3:16-17)**

## සාරාංශය

දෙවන සහ තුන්වන පරිච්ඡේද වලදී උගත් කරුණු මීළඟ පිටුවෙහි වගුවක් ලෙස ඉදිරිපත් කොට ඇත.

ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි සියළුම අත්තිවාරම් ප්‍රතිපත්ති එකිනෙකට සම්බන්ධව පවතින බව මතක තබා ගැනීම වැදගත් වේ. මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් වෙන් කළ නොහැකිය. අපි මීළඟ පරිච්ඡේදයෙහිදී එම විෂය අධ්‍යයනය කරමු.

පාපයෙහි මූලාරම්භය: ලුසිෆර් (සාතන්)
දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසීම
ඔහු මනුෂ්‍යයාව පාපයට යොමු කරවීය. එහි
ප්‍රතිඵලය වූයේ

මනුෂ්‍යයාගේ වැටීම (ආදම් සහ ඒව)

එහි ප්‍රතිඵලය වූයේ

සියළු මනුෂ්‍යයන් පාපිෂ්ඨ ස්වභාවය උරුමකොටගෙන සිටීම සහ
එහි ස්වභාවය හේතුවෙන් තනි තනිව පව් කිරීම

පාපය යොමු කරනුයේ:

ආත්මික මරණය
ශාරීරික මරණය

කුරුසිය මත යේසුස්වහන්සේ මෙම වන්දිය ගෙවූ බැවින්,
පාපිෂ්ඨ මිනිස්සු ධර්මිෂ්ඨකරනු ලැබුවෝය:

මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම (අභ්‍යන්තර තීරණය)
එය යොමු කරනුයේ

හැරීම ලැබීම
(බාහිර වෙනස්වීමක්)

එහි ප්‍රතිඵලය වූයේ

ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාපිෂ්ඨ මිනිසා ධර්මිෂ්ඨකරනු ලැබීම
සහ
පාපයෙන් හා පාපයෙහි වන්දියෙන් මුදවාගනු ලැබූ ජීවිතය එනම්, ගැළවීම ලැබීමය

## ස්වයං-පරීක්ෂණය

1. ගැළවීම ලැබීම සඳහා පසුතැවිලිවීම වැදගත් වීමට හා අවශ්‍ය වීමට හේතු කාරණා හතක් සඳහන් කරන්න.

2. මනුෂ්‍යයන් හට පසුතැවිලිවීම සලස්වන්නාවූ හේතු කාරණා හයක් සඳහන් කරන්න.

3. ගැළවීම අර්ථ දක්වන්න.

4. අකීකරු පුත්‍රයාගේ උපමාව ඇසුරින් පසුතැවීම හා හැරීම ලැබීම විස්තර කරන්න.

5. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

6. බයිබලයෙහි පසුතැවිලිවීම සමග සම්බන්ධ කොට දක්වන්නාවූ කාරණා 4ක් නම් කරන්න.

7. කිතුබැතියෝ පසුතැවිලි වෙනවාද? ____________________

8. කිතුබැතියෝ පවා පසුතැවිලිවීම අවශ්‍ය බව පෙන්වා දෙන බයිබලීය උදාහරණ තුනක් ඉදිරිපත් කරන්න.

9. ධර්මිෂ්ඨකරනු ලැබීම අර්ථ දක්වන්න.

10. "ගැළවීම ලැබීම" යන්නෙහි තේරුම කුමක්ද?

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදයෙහි පසුතැවිලිවීම, හැරීම සහ ධර්මිෂ්ඨකරනු ලැබීම සාකච්ඡා කළෙමු.

මෙම ඉතා වැදගත් පද පිළිබඳව අධ්‍යයනය තවදුරටත් කරගෙන යාමට පහත සඳහන් පද භාවිතා කරන්න.

**දෙවියන්වහන්සේ වෙතට හැරීම :**

මතෙව් 18:3
ක්‍රියා 3:19
ගීතාවලිය 19:7

**ධර්මිෂ්ඨකරනු ලැබීම :**

ක්‍රියා 13:39
රෝම 2:13; 3:4, 20, 24, 28; 4:2, 25; 5:1, 16, 18; 8:30
1 කොරින්ති 6:11
ගලාති 2:16-17; 3:8, 11, 24
තීතස් 3:7
යාකොබ් 2:21-25

**පසුතැවිලිවීම :**

මතෙව් 3:2, 8, 11; 4:17; 9:13; 11:20-21; 12:41
මාර්ක් 1:4, 15; 2:17; 6:12
ලූක් 3:3, 8; 5:32; 11:32; 13:3, 5; 15:7, 10; 17:3, 4; 24:47
ක්‍රියා 2:38; 3:19; 5:31; 8:22; 17:30; 26:20; 5:31; 11:18; 13:24; 19:4; 20:21
රෝම 2:4
2 කොරින්ති 7:8-10
2 පේත්‍රැස් 3:9
එළිදරව් 2:5, 16; 3:3, 19

# හතරවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කළ හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඇදහිල්ල අර්ථ දැක්වීමට
- ඇදහිල්ලෙහි විවිධාකාර මාදිලි හඳුනාගැනීමට
- "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" යන වාක්‍යාංශය අර්ථ දැක්වීමට
- දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල වැදගත් මන්ද කියා පැහැදිලි කිරීමට
- ඇදහිල්ල වැඩි කරගත හැකි ක්‍රමය පැහැදිලි කිරීමට

**ප්‍රධාන පදය:**

> **නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේ ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවන්නා විසින් උන්වහන්සේ විද්‍යමාන බවත්, උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය.** (හෙබ්‍රෙව් 11:6)

### හැඳින්වීම

මූලික අත්තිවාරම් ධර්මයන්හි දෙවැන්න "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" නම් වේ. "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" යන්නෙන් ඔබ දෙවියන්වහන්සේ කෙරෙහි දක්වන ආකල්පය නිරූපනය කරයි. සමහරු දෙවියන්වහන්සේට ද්වේෂ කොට එතුමාට එරෙහිව කැරළි ගසති. අනෙක් අය එතුමාට බිය වෙති. ඔබගේ ආකල්පය විය යුත්තේ එතුමා කෙරෙහි ඇදහිල්ලේ ආකල්පයකි.

අවංක ලෙස හැරීමක් සඳහා ඇදහිල්ල හා පසුතැවීම යන කාරණා දෙකම ඇතුළත්ය. පාපය ප්‍රතික්ෂේප නොකර දෙවියන්වහන්සේ වෙතට හැරීම සැබෑ පසුතැවීමක් නොවේ. ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේ වෙතට නොහැරී පාපය ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ කිරීම අවසන් වනුයේ අසමත් භාවයෙනි. ගැළවීම නොලද පුද්ගලයන් සඳහා පාවුල්ගේ සේවාව වූයේ:

> **දෙවියන්වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ගැන යුදෙව්වරුන්ට හා ග්‍රීකවරුන්ට සාක්ෂි දුනිමි.** (ක්‍රියා 20:21)

පසුතැවිලිවීම හා දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ගැළවීම සඳහා අවශ්‍ය වේ.

### අර්ථ දැක්වීම

ඇදහිල්ල නම් විශ්වාසය සහ යම් දෙයක් කෙරෙහි නිසැකකම රැඳවීමය. විශ්වාසය නම් සැකයකින් තොරවීමය. දෙවියන්වහන්සේ හා සම්බන්ධව යෙදීමේදී "ඇදහිල්ල, විශ්වාසය හා නිසැකකම" යන වචන තුනෙන්ම අර්ථවත් වනුයේ එකම කාරණාවය. බයිබලය ඇදහිල්ල අර්ථවත් කරනුයේ:

> **ඇදහිල්ල නම් බලාපොරොත්තු වන දේවල් ගැන සහතිකය යඃ නොදක්නා දේවල් ගැන ඔප්පුවය.** (හෙබ්‍රෙව් :)

මෙය සවිස්තරාත්මකව සඳහන් කළහොත් :

> **ඇදහිල්ල යනු අප අපේක්ෂා කරන්නාවූ කාරණාව පිළිබඳ නිසැකකම, ස්ථිරත්වය හා ඔප්පුවය. එය දෑනට අපට නොපෙනෙන කාරණාව පිළිබඳ සහතිකයක් සහ සත්‍යවීම පිළිබඳ**

**නිසැක භාවයකි. ඇදහිල්ල නම් තවමත් අපගේ පංචේන්ද්‍රියන්ට ග්‍රහණය නොවී ඇති කාරණා සැබෑ ලෙසම පිළිගැනීමය. (හෙබ්‍රෙව් 11:1)**

ඇදහිල්ල අපහට අනාගතය සඳහා පොරොන්දු වී ඇති කාරණා සත්‍ය වන බවට නිසැකකමක් සහ නොදුටු කාරණා සැබෑ වන බවට ස්ථිරත්වයක් සපයා දෙයි.

## බලාපොරොත්තුව :

ඇදහිල්ල බලාපොරොත්තුවට වඩා වෙනස්ය. බලාපොරොත්තුව නම්, අනාගතයෙහි කාරණා පිළිබඳ අපේක්ෂාවක් හෝ ආශාවක් ඇතිව සිටීමේ ආකල්පයකි. ඇදහිල්ල නම් ඔබට තවමත් දක්නට නොලැබුනත් යමක් නියත වශයෙන්ම ඔබ සතුවන බවට විශ්වාසයයි. බලාපොරොත්තුව මනසෙහි ද ඇදහිල්ල හදවතෙහි ද රැඳී පවතී.

**නුමුත් දවාලට අයිති වූ අපි ඇදහිල්ල හා ප්‍රේමය නමැති ළයවැස්මත් ගැළවීමේ බලාපොරොත්තුව නමැති ආරක්ෂක තොප්පියත් පැළඳගෙන මත් නොවී සිටිමු.**
**(1 තෙසලෝනික 5:8)**

මෙම පදයෙහි ඇදහිල්ල හදවත පෙදෙස හා සම්බන්ධිත ළය වැස්මක් ආශ්‍රිතව පෙන්වා දෙයි. බලාපොරොත්තුව හිස හා සම්බන්ධිත ආරක්ෂක තොප්පියක්ය.

බලාපොරොත්තුව අනාගතය පිළිබඳව මනසින් අපේක්ෂා සහගතව සිටීමකි. ඇදහිල්ල දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය නිපදවන්නාවූ හදවතෙහි තත්වයකි.

**මක්නිසාද මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහාගන්නේය ... (රෝම 10:10)**

ඔබගේ මනසින් පමණක් ශුභාරංචිය පිළිගැනීම නොසෑහෙයි. මෙය සත්‍ය වූ ශුද්ධ ලියවිල්ලට එකඟ වූ ඇදහිල්ල නොවන අතර ඔබගේ ජීවිතයෙහි වෙනසක් ද ඇති නොකරයි. සත්‍ය වූ ශුද්ධ ලියවිල්ලට එකඟ වූ ඇදහිල්ල නම්, හදවතින් විශ්වාස කිරීමය. එමගින් සැමවිටම ජීවිතයෙහි වෙනසක් ඇතිවේ. එහි ප්‍රතිඵලය වනුයේ වර්තමානයෙහි කිසියම් අත්දැකීමක් ලැබීම මිස අනාගතයෙහි යමක් බලාපොරොත්තුව සිටීම නොවේ.

## හේතු ඵල වාදය :

සමහර ආගම් වලින් උගන්වන පරිදි "පදාර්ථයට ඉහළින් මනස ක්‍රියා කිරීම" නොහොත් "හේතු ඵල වාදය" ඇදහිල්ල නොවේ. හේතු ඵල වාදයෙන් උගන්වන පරිදි භෞමික වූ පදාර්ථමය වූ ලෝකයෙහි පවතින සියළුම ගැටළු ජයගැනීමට මිනිසාට තම මනස, සාධක හා අධිෂ්ඨාන ශක්තිය භාවිතා කර හැකිවනු ඇත. මෙම ඉගැන්වීම් මිනිසා වටා කේන්ද්‍රියව පවතී. එහිදී රැඳී සිටිනුයේ, දෙවියන්වහන්සේ කෙරෙහි නොව ස්ව ශක්තිය කෙරෙහිය. "හේතු ඵල වාදය" දේව වචනය මත පදනම් වුවක් නොවේ.

ඇදහිල්ල දෙවියන්වහන්සේ තුළ කේන්ද්‍රිය වුවක් මිස මිනිසා තුළ කේන්ද්‍රිය වුවක් නොවේ. එය මිනිසා තමාගේම ස්වයං ප්‍රයත්නයෙන් නිපදවන්නක් නොව දෙවියන්වහන්සේගෙන් ලැබෙන දීමනාවකි.

# ඇදහිල්ලෙහි මාදිලි

ඇදහිල්ලෙහි විවිධ මාදිලි ඇත.

## ස්වාභාවික ඇදහිල්ල :

මෙය නම්, දැනටම ස්ථිර ලෙස ස්ථායි බවට ඔප්පු වී ඇති කාරණා කෙරෙහි දක්වන ස්වභාවික විශ්වාසය වේ. උදාහරණ ලෙස ඔබ වාඩි වී සිටින පුටුවට ඔබව දැරීමට හැකි යයි ඔබ තුළ ඇති විශ්වාසය. මෙය "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" නොවේ. එය ඔබ වටා ඇති සමහර දේවල් විශ්වාස කටයුතු බව අත්දැකීමෙන්ම ඔබ දන්නා බැවින් ස්වභාවයෙන්ම ඇතිවන ඇදහිල්ලකි.

අප "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" යනුවෙන් පවසන කල අර්ථවත් වනුයේ පහත සඳහන් ආකාරයෙහි ඇදහිල්ලකි. එනම්,

## පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල :

> **මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි: එසේ වී නුමුත් මම ජීවත් වෙමි: නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත් වන ජීවිතය මට ප්‍රේම කළාවූ, මා උදෙසා තමන්ම පාවා දුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි.**
> (ගලාති 2:20)

පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල, හැරීම ලැබූ පසු ඇදහිලිවන්තයා හට ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීමට උපකාර කරනු ඇත. මෙම අධ්‍යයනයෙහි අවසාන පරිච්ඡෙදයෙහිදී සම්පූර්ණත්වයට ළඟාවීම සාකච්ජා කරනු ඇත. එහිදී පවිත්‍ර කිරීම පිළිබඳ වැඩි විස්තර ඉගෙනීමට හැකි වෙනු ඇත.

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල සඳහා පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල එනම්, ඔබට ශුද්ධ ජීවිතයක් ගත කළහැකි බව විශ්වාස කිරීම ඇතුළත්ය. ඔබට මෙය ඔබගේම ස්වකීය ශක්තියෙන් කළ නොහැකි නුමුත් ඔබ තුළ වාසය කරන්නාවූ දෙවියන්වහන්සේගේ බලයෙන් කළ හැකිය.

## ආරක්ෂක ඇදහිල්ල :

ඔබගේ ආත්මික සතුරා වන සාතන්ට එරෙහිව නැගී සිටීමට ආරක්ෂා වීමට යොදාගත හැකි එක් ආයුධයක් නම් ඇදහිල්ලය.

> **ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා. එයින් නපුරාගේ සියලූ ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන් වන්නේය. (එපීස 6:16)**

ඔබගේ සිතට අවිශ්වාසයේ "ඊතල" එවීමෙන් සාතන් ඔබට පහර දීමට උත්සාහ කරනු ඇත. එවන් අවස්ථාවන්හිදී පහරදීම් වලට එරෙහිව දෙවියටන්වහන්සේ කෙරෙහි පවතින ඔබගේ ඇදහිල්ල ආත්මික ආරක්ෂාව සපයනු ඇත.

## ගළවන්නාවූ ඇදහිල්ල :

> **එබැවින් අපි ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබ අපේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය ඇතුව සිටිමු. (රෝම 5:1)**

දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල සත්‍ය පසුතැවිල්ල සමග මුසු වූ විට එය ගළවන්නාවූ ඇදහිල්ල වේ. ගැළවීම නම්, ශුභාරංචි පණිවිඩය දැනගෙන එය විශ්වාස කොට, පෞද්ගලිකව පිළිගැනීම වේ. ගළවන්නාවූ ඇදහිල්ල උදෙසා දෙවියන්වහන්සේ කෙරෙහි පෞද්ගලික ප්‍රතිචාරයක් දැක්වීම අවශ්‍යවේ. වෙනයම් කෙනෙකු වෙනුවෙන් තවත් පුද්ගලයෙකු හට ප්‍රතිචාර දැක්විය නොහැකිය. තම තමා ශුභාරංචියට පෞද්ගලිකව දක්වන ස්වකීය ප්‍රතිචාරය අනුව කිසියම් කෙනෙකු ගැළවීම ලබනු ඇත.

ඇදහිල්ල සත්‍ය සාධකයකි. මනුෂ්‍යයා හට ගැළවීම ලැබීමට හැකියාව ලබා දෙන පිණිස එය දෙවියන්වහන්සේගෙන් හිමිවන ත්‍යාගයකි.

> **මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය.**
> (එපීස 2:8)

ඇදහිල්ල ක්‍රියාවකි. සෑම පුද්ගලයෙකු හටම දෙවියන්වහන්සේ විසින් දී තිබෙන ඇදහිල්ල මත එම පුද්ගලයා ක්‍රියා කළ යුතුය. දෙවියන්වහන්සේ කෙරෙහි ඔබගේ ඇදහිල්ල දැක්වීම ඇදහිල්ලෙන් උන්වහන්සේ වෙත පෙන්වන ප්‍රතිචාරයෙහි ක්‍රියාවය.

"දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" ඔබ අත්විඳ ඇදහිලිවන්තයෙකු වූ පසුව, ඇදහිල්ලේ ආත්මික ඵල සහ ඇදහිල්ලේ දීමනා යන දෙවර්ගයම ඔබ තුළ උන්වහන්සේ කෙරෙහි පවතින

ඇදහිල්ල වර්ධනය කිරීමට ක්‍රියාත්මක වනු ඇත. ඇදහිල්ලේ දීමනාව හා එල පිළිබඳ සවිස්තරාත්මකව භාවස්ට්ටයිම් ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් ප්‍රකාශිත “ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය” නම් පොතෙහි විස්තර කෙරේ.

## වැරදි ලෙස ස්ථානගත කළාවූ ඇදහිල්ල

ඔබ අධ්‍යයනය කරන්නාවූ දේවධර්මය හඳුන්වනුයේ “දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල” නමිනි. එය පොදුවේ ඇදහිල්ල නොව යොමු වූ ඇදහිල්ලකි. ඔබහට වැරදි ලෙස යොමු වූ ඇදහිල්ලක් තිබිය හැකිය. එවන් වැරදි ලෙස යොමු වූ ඇදහිල්ල ... ස්ථානගත විය හැකි ස්ථාන නම්,

**ස්වභාවික ආයුධ :**

**මාගේ දුන්න විශ්වාස නොකරන්නෙමි, මාගේ කඩුව ද මා නොගළවන්නේය. (ගීතාවලිය 44:6)**

**ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් :**

**අධිපතින් කෙරෙහිවත් පිහිට විය නොහැකි මනුෂ්‍ය පුත්‍රයා කෙරෙහිවත් විශ්වාස නොතබව්. (ගීතාවලිය 146:3)**

**තමා කෙරෙහි :**

**තමාගේම සිත කෙරෙහි විශ්වාස තබන්නා අඥානයෙක්ය. එහෙත් නුවණින් හැසිරෙන්නා ගැළවෙන්නේය. (හිතෝපදේශ 28:26)**

**රූප / පිළිම :**

**රූප කෙරෙහි විශ්වාස කරන්නාවූ, නුඹලා අපේ දෙවිවරු යයි පිළිම වලට කියන්නාවූ අය පස්සට හරවනු ලබන්නෝය. බොහෝ සෙයින් ලජ්ජාවට පත් වන්නෝය. (යෙසායා 42:17)**

**බොරු අනාගතවක්තෘවරු :**

**... බොරු වචන විශ්වාස නොකරල්ලා ... මෙන්න, නුඹලා ප්‍රයෝජන නොවන බොරු වචන කෙරෙහි විශ්වාස කරගන සිටින්නහුය. (යෙරෙමියා 7:4, 8)**

**ස්වභාවික බලය :**

**සමහරු රථ කෙරෙහි ද සමහරු අශ්වයන් කෙරෙහි ද විශ්වාස කෙරෙති. නුමුත් අපි අපේ දෙවි වූ ස්වාමීන්ගේ නාමය සඳහන් කරන්නෙමුව. (ගීතාවලිය 20:7)**

**වස්තුව :**

**දෙවියන්වහන්සේගේ තමාගේ ශක්තිය කොට නොගත්තාවූ තමාගේ බොහෝ වස්තු කෙරේ විශ්වාසය තැබුවාවූ තමාගේ දුෂ්ටකමෙහි බලවත් වූ මනුෂ්‍යයා මේ යයි කියන්නෝය. (ගීතාවලිය 52:7)**

**මිතුරන් :**

**මාගේ භෝජනයෙන් කෑවාවූ මාගේ හිතේසි මිත්‍රයා මට විරුද්ධව විලුඹ එසවීය. (ගීතාවලිය 41:9)**

ඇදහිල්ල තිබූ පමණින් එය නොසෑහෙයි. ඔබගේ ඇදහිල්ල වැරදි ස්ථානගත කිරීමකට ලක්විය හැකිය. සත්‍ය ඇදහිල්ල නම්, නියත ලෙස යොමු වූවකි. එනම්, "දෙවියන්වහන්සේ වෙතට යොමු වූ ඇදහිල්ල"ය.

## ඇදහිල්ලෙහි වැදගත්කම

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල අවශ්‍ය වීමට හේතු දෙකක් ඇත. එනම්:

### එය ගැළවීම උදෙසා අවශ්‍යය :

දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල අවශ්‍ය වීමට පළමුවන හේතුව නම්, එය නොමැතිව ඔබට ගැළවීම ලබා ගැනීමට නොහැකි වීමය.

> **අදහන්නාවූ බව්තිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. (මාර්ක් 16:16)**
>
> **මක්නිසාද, ඇදහිල්ල කරණකොටගෙන ඒ ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. (එපීස 2:8)**
>
> **මග අසල ඒවා නම් වචනය ඇසූ අයය; එකල ඔවුන් අදහා නොගැළවෙන පිණිස යක්ෂයා ඇවිත් ඔවුන්ගේ සිත්වලින් වචනය උදුරා ගන්නේය. (ලූක් 8:12)**

### එය නොමැතිව ඔබහට දෙවියන්වහන්සේ ප්‍රසන්න කළ නොහැකිය :

ඇදහිල්ල වැදගත් වන්නාවූ දෙවන කාරණය නම්, එය නොමැතිව ඔබට දෙවියන්වහන්සේ ප්‍රසන්න කළ නොහැකි වීමය.

> **නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද, දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනැය. (හෙබ්‍රෙව් 11:6)**

## ඇදහිල්ලේ මට්ටම්

බයිබලයෙහි පෙන්නුම් කරදෙන පරිදි ඇදහිල්ලෙහි විවිධ මට්ටම් හෝ තල පවති. තමා සතු ඇදහිල්ල භාවිතා නොකළ ජනතාව පිළිබඳ කතා කරමින් යේසුස්වහන්සේ ඔවුන්ව "ඇදහිලි නැති" (මතෙව් 17:17) අය ලෙස ප්‍රකාශ කළ සේක. එසේම "මද ඇදහිලි ඇති" අය (මතෙව් 6:30; 8:26; 14:31; ලූක් 12:28) සහ මහත් ඇදහිල්ලක් දැරූ අය (මතෙව් 8:10; 15:28; ලූක් 7:9) පිළිබඳව පැවසූ සේක.

බයිබලයෙහි අපට පවසන පරිදි සෑම මනුෂ්‍යයෙකු හටම දෙවියන්වහන්සේ ත්‍යාගයක් දී ඇති ප්‍රමාණයට අනුව කිසියම් ඇදහිල්ලක් පවති.

> **... දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදාදුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස ... (රෝම 12:3 )**

ඔබ ගැළවීම ලබනුයේ ඇදහිල්ලෙන් බැවින් සෑම ඇදහිලිවන්තයෙකු තුළම කිසියම් ඇදහිල්ලක් පවති.

> **මක්නිසාද, ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. (එපීස 2:8)**

## ඇදහිල්ල වැඩිකරගත හැකි ක්‍රමය

පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල ඔබහට ශුද්ධ ජීවිතයක් ගතකිරීමට හැකියාව ලබා දෙයි. වර්ධනය වූ ඇදහිල්ල ඔබහට සම්පූර්ණත්වය කරා ළඟාවීමට සහාය දෙයි. ආරක්ෂක ඇදහිල්ල ඔබව සාතන්ගේ පහරදීම් වලින් සුරකියි. ඔබගේ ඇදහිල්ල වැඩිදියුණු කරගතහොත් ඔබගේ ආත්මික

ආරක්ෂාවේ බලඇණිය ද වැඩි දියුණු වනු ඇත. ඇදහිල්ල වැඩිකරගත හැකි ක්‍රමය බයිබලය අපට පවසයි.

> **මෙසේ ඇසීමෙන් ඇදහිල්ල ද, ක්‍රිස්තුස්වහන්සේගේ වචනයෙන් ඇසීම ද පැමිණෙන්නේය. (රෝම 10:17)**

දේව වචනය ඇසීම තුළින් දෙවියන්වහන්සේ කෙරෙහි ඔබගේ ඇදහිල්ල වැඩි වේ. පළමු කොට ඔබ පාපය පිළිබඳ පසුතැවිලි වී යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගැනීම සඳහා දේව වචනයට සවන් දිය යුතුය. ගලවනු ලබන්නාවූ ඇදහිල්ල පැමිණෙනුයේ දේව වචනය අසන්නට ලැබීමෙනි.

ඔබ ගැළවීම ලද පසුව බයිබලයට අනුකූලව දේශනා සහ ඉගැන්වීම් තුළින් ඔබගේ ඇදහිල්ල තවදුරටත් වර්ධනය වනු ඇත. ඔබට දේව වචනය වැඩිපුර අසන්නට ලැබෙන ප්‍රමාණයට ඔබගේ ඇදහිල්ලද වැඩි ප්‍රමාණයකින් වර්ධනය වනු ඇත. ඇදහිල්ල වැඩි ප්‍රමාණයකින් හිමි වීමත් සමග ඔබහට සාතන් විසින් ගෙන එන පහරදීම් වලින් ආරක්ෂා වී සිටීමටත් ශුද්ධ වූ ජීවිතයක් ගතකිරීමටත් පහසු වනු ඇත.

ඇදහිල්ල සුළු ප්‍රමාණයක් වුවද ඉතා ප්‍රබලය.

> **උන්වහන්සේ කියන සේක: නුඹලාගේ ඇදහිල්ලේ මදිකම නිසාය, සැබවක් නුඹලාට කියමි - අබ ඇටයක් පමණ ඇදහිල්ල නුඹලාට ඇත්නම්, මේ කන්දට කථාකොට මෙතැනින් අහක්ව එතැනට යවයි කිවත් ඒක යන්නේය: කිසිවක් නුඹලාට බැරි නොවන්නේ යයි කීසේක. (මතෙව් 17:20)**

ඔබහට සුළු ප්‍රමාණයක හෝ ඇදහිල්ලක් ඇත්නම් කළ නොහැකි කිසිවක් නොමැත.

## ඇදහිල්ල සහ ක්‍රියා

ඇදහිල්ල දෙවියන්වහන්සේගෙන් ලැබෙන ත්‍යාගයකි. එය ක්‍රියාකාරකම් තුළින් වැඩිකරගත නොහැකිය. ඇදහිල්ලෙන් යන්නෙන් අප අදහස් කරනුයේ, "ඔබ විශ්වාස කරන දෙය" වේ. ක්‍රියාකාරකම් යන්නෙන් අදහස් කරනුයේ, "ඔබ කරන දෙයයි". බයිබලය උගන්වන පරිදි,

> **මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය.**
> **කිසිවෙක් පාරට්ටුකර නොගන්න පිණිස ඒක ක්‍රියාවලින් නොවේ. (එපීස 2:8-9)**

ඇදහිල්ල නම් විශ්වාස කිරීම සඳහා දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නාවූ දීමනාවය. මෙයින් අදහස් කරන්නේ ඔබගේ ක්‍රියාවන් (ඔබ කරන දෑ) වැදගත් නොවන බව නොවේ . පළමුකොට දෙවියන්වහන්සේගෙන් ලැබෙන දීමනාවක් ලෙසට ඇදහිල්ල හිමි වේ. ඉන්පසුව ඔබගේ ඇදහිල්ල සත්‍යයද නැද්ද කියා බැලීමට ක්‍රියාව පැමිණේ (ඔබ කරන දෑ). යාකොබ් ලියා ඇත්තේ,

> **මාගේ සහෝදරයෙනි, තමාට ඇදහිල්ල ඇතැයි යමෙක් කියන නුමුත් ක්‍රියාවල් නැත්නම් මොන ප්‍රයෝජනයක්ද? ඒ ඇදහිල්ල නිසා ඔහුට ගැළවෙන්ට පුළුවන්ද?**
> **සහෝදරයෙක් නොහොත් සහෝදරියක් ඇඳුම් නැතිව දවස්පතා කෑම නැතුව සිටිද්දී,**
> **නුඹලාගෙන් යමෙක් සමාදානයෙන් පලයල්ලා, උනුහුම් වෙයල්ලා, කෑම කා තෘප්තියට පැමිණියල්ලා යයි ඔවුන්ට කියනවා මිස ශරීරයට ඕනෑ දේවල් නොදෙනවා නම්, මොන ප්‍රයෝජනයක්ද?**
> **එසේම ඇදහිල්ල ක්‍රියා නැතුව තනියම තිබේ නම්, මැරිලාය.**
> **එසේය, යමෙක් කථාකොට: නුඹට ඇදහිල්ල තිබේ, මට ක්‍රියාවල් තිබේ. ක්‍රියා නැතුව නුඹේ ඇදහිල්ල මට පෙන්වාපන්න, මම මාගේ ක්‍රියාවලින් මාගේ ඇදහිල්ල පෙන්වන්නෙමියි කියනවා ඇත. (යාකොබ් 2:14-18)**

ඔබගේ ක්‍රියාකාරිකම් ... ඔබ ජීවත්වන ක්‍රමය, ඔබ අවට සිටින අයගේ අවශ්‍යතාවයනට ඔබ ප්‍රතිචාර දක්වන ආකාරය ... ඔබගේ ඇදහිල්ලෙහි සත්‍යතාවය පිළිබඳ පරීක්ෂණයකි.

යාකොබ් ඇදහිල්ල හා ක්‍රියා අතර පවතින සම්බන්ධතාවය මනුෂ්‍යයෙකුගේ සිරුර හා ආත්මය අතර ඇති සම්බන්ධත්වයට සන්සන්දනය කරයි. මනුෂ්‍යයෙකු මිය ගිය කල ඔහුගේ ආත්මය ශරීරයෙන් වෙන්වී යන බව බයිබලය උගන්වයි. යාකොබ් පවසන්නේ:

> **මක්නිසාද ආත්මය නැති ශ×රය මැරී තිබෙන්නාක් මෙන්ම ක්‍රියාවලින් වෙන් වූ ඇදහිල්ල ද මැරී තිබේ. (යාකොබ් 2:26)**

ඔබගේ ක්‍රියා ඔබ තුළ ඇති ජීවමාන ඇදහිල්ල පිළිබිඹු කරයි.

> **මක්නිසාද ධර්මිෂ්ඨයා ඇදහිල්ල කරණකොටගෙන ජීවත්වන්නේය. (ගලාති 3:11)**

## ඇදහිල්ල පිළිබඳ උදාහරණයක්

හෙබ්‍රෙව් 11 වෙනි පරිච්ජේදයෙහි ශ්‍රේෂ්ඨ ඇදහිලිවතුන්ගේ නම් ලැයිස්තුවක් සඳහන් කර ඇත. එනමුත් බයිබලයෙහි සඳහන් කර ඇති පරිදි "විශ්වාස කරන්නාවූ සියළු මනුෂ්‍යයන්ගේ පියා" ලෙසට විරුදාවලි ලද එක් මනුෂ්‍යයෙක් සිටී (රෝම 4:11). ඔහුගේ නම ආබ්‍රහම්ය.

කිතුනුවෝ, විශ්වාසවන්ත වූ ආබ්‍රහම්ගේ පියසටහන් ඔස්සේ හැසිරෙන (රෝම 4:12) අය වන අතර ඔව්හු ආබ්‍රහම්ගේ දරුවන් ලෙසට හඳුන්වනු ලැබේ (ගලාති 3:7). ආබ්‍රහම් සතුව තිබූ දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල හේතුවෙන් ඔහු ධර්මිෂ්ඨ කරනු ලැබිය.

> **ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළේය. එය ධර්මිෂ්ඨකම කොට ඔහුට ගණන් ගනු ලැබුවේය කියා තිබෙන ලියවිල්ල සම්පූර්ණ වුයේය. (යාකොබ් 2:23)**

පාවුල් හට, දෙවියන්වහන්සේ කෙරෙහි දක්වන ඇදහිල්ල විදහා දැක්වීමට අවශ්‍ය කල ඔහු ආබ්‍රහම්ව උදාහරණයක් ලෙස භාවිතා කළේය.

> **ඉතින් ඔහුට එය ගණන් ගන්නා ලදැයි ලියනු ලැබුවේ ඔහු නිසා පමණක් නොව අප නිසාත්ය.**
> **මක්නිසාද අපේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ කෙරෙහි අදහන්නාවූ අපටත් එය ගණන් ගනු ලබන්නේය.**
> **උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබූ සේක. (රෝම 4:23-25)**

පාවුල් පවසා සිටියේ ආබ්‍රහම්ගේ ඇදහිල්ල ඔහුව ධර්මිෂ්ඨ කරනු ලැබූ බව වාර්තා කරන ලද්දේ ඔහු උදෙසා පමණක් නොවන බවය. එය වාර්තාකොට තැබුයේ අප ද ශුභාරංචි පණිවුඩය විශ්වාස කිරීම තුළින් ධර්මිෂ්ඨ කරනු ලැබිය හැකි බව පෙන්වා දීමටය.

ආබ්‍රහම් ඇදහිල්ලෙහි උදාහරණයක් වීමට හේතු පහත සඳහන් කරන පරිදි වේ. එනම්,

### ඔහුට වචනය ඇසුනි :

ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ පොරොන්දුවට සවන් දුනි.

> **මක්නිසාද ආබ්‍රහම්ට හෝ ඔහුගේ වංශයට හෝ ලෝකය උරුමවන්නේය යන පොරොන්දුව ව්‍යවස්ථාව කරණකොටගෙන නොව ඇදහිල්ලේ ධර්මිෂ්ඨකම කරණකොටගෙන වුයේය.**
> **පොරොන්දු වූ දේ ඉෂ්ට කරන්ට උන්වහන්සේට පුළුවන කියා නිසැකව විශ්වාස කළේය. (රෝම 4:13, 21)**

### ඔහු වචනය විශ්වාස කළේය :

ඔහුට දෙවියන්වහන්සේගේ පොරොන්දු අසන්නට ලැබුණා පමණක් නොව ඔහු එය විශ්වාස කළේය.

**නුඹේ වංශය මෙසේ වන්නේ කියා ලියා තිබෙන ලෙස ආබ්‍රහම් බොහෝ ජාතීන්ගේ පියා වන පිණිස බලාපොරොත්තු වීමට ඉඩ නැති තැන බලාපොරොත්තුවෙන් විශ්වාස කළේය. (රෝම 4:18)**

**නුඹලා උන්වහන්සේ නුදුටු නමුත් උන්වහන්සේට ප්‍රේම කරන්නහුය. දැන් උන්වහන්සේ නොදකින නුමුත් නුඹලා උන්වහන්සේ කෙරෙහි අදහා, නුඹලාගේ ඇදහිල්ලේ තීන්දුව වන නුඹලාගේ ආත්ම ගැලවීම ලබමින් කියා නිමකළ නොහැකි වූ තේජසින් පූර්ණ වූ ප්‍රීතියකින් ප්‍රීතිවන්නහුය. (1 පේතෘස් 1:8-9)**

## ඔහු තමාගේ බලාපොරොත්තු විරහිත තත්වයෙන් හැරී ආවේය :

දේව වචනය ඇසීමෙහි ප්‍රතිඵලයක් ලෙසට ආබ්‍රහම්ගේ ජීවිතයෙහි වෙනසක් ඇතිවිය.

**නුඹේ වංශය මෙසේ වන්නේය කියා තිබෙන ලෙස ආබ්‍රහම් බොහෝ ජාතීන්ගේ පියා වන පිණිස බලාපොරොත්තු වීමට ඉඩ නැති තැන බලාපොරොත්තුවෙන් විශ්වාස කළේය. ඔහු (අවුරුදු සියයක් පමණ වයස්ගතව සිටියදී) ඇදහිල්ලෙන් දුර්වල නොවී තමාගේම ශරීරය මළ බව හා සාරාගේ කුසය මළ බවත් සිතා ඇදහිල්ල නැතිකම කරණකොටගෙන චංචල නොවී ... (රෝම 4:18-19)**

පාපයෙහි විනාශ වී සිටින ස්ත්‍රී, පුරුෂයන් මෙන් ආබ්‍රහම් ද ස්වභාවික ලෝකයෙහි බලාපොරොත්තු සුන් වූ තත්වයක පසුවිය. බොහෝ ජාතීන්ගේ පියා වීමෙහි පොරොන්දුව සත්‍ය විය හැක්කේ දෙවියන්වහන්සේ තුළින්ම පමණකි. මන්ද ආබ්‍රහම් සහ සාරා දරුවන් බිහිකිරීමට අසමත් ලෙස මහළුව සිටියහ.

ගැළවීම හිමිවනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණකි. පොරොන්දුව හිමිකරගත හැකි වෙනයම් මාර්ගයක් නැත. එය හිමිකරගත හැක්කේ එතුමාගේ ගැළවීමෙහි සැලසුම කෙරෙහි ඇදහිල්ලෙන් පමණයි.

**ඇදහිල්ල කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය කරන පිණිසත් නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට, (එපීස 3:17)**

## ඔහු පොරොන්දුව සත්‍ය කරුණක් ලෙස පිළිගත්තේය :

**දෙවියන්වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව, දෙවියන්වහන්සේට ගෞරව කරමින් පොරොන්දු වූ දේ ඉෂ්ට කරන්ට උන්වහන්සේට පුළුවන. (රෝම 4:20)**

මෙය දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල වේ.

## අප උදෙසා ආදර්ශයකි

ආබ්‍රහම් දෙවියන්වහන්සේ කෙරෙහි දැක්වූ ඇදහිල්ල ඔබහට අනුගමනය කිරීම සඳහා යහපත් ආදර්ශයකි. ඔබ කළ යුතු වන්නේ,

- දෙවියන්වහන්සේගේ වචනය අසන්න.

- දේව වචනය විශ්වාස කරන්න.

- ඔබගේ බලාපොරොත්තු විරහිත තත්වයෙන් වෙනස් වන්න (මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම හේතුවෙන් වෙනස් වීම).

- දෙවියන්වහන්සේගේ පොරොන්දුව සත්‍ය කරුණක් ලෙස පිළිගන්න. උන්වහන්සේගේ පොරොන්දුව නම් යේසුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ වෙතට පසුතැවිල්ලෙන් හා ඇදහිල්ලෙන් පැමිණි කල ධර්මිෂ්ඨ කරනු ලබන බවය.

## ස්වයං-පරීක්ෂණය

1. "ඇදහිල්ල" අර්ථ දක්වන්න.

2. පහත සඳහන් මාදිලියේ ඇදහිල්ල අර්ථ දක්වන්න.

   ස්වභාවික ඇදහිල්ල :

   ගැළවීම සපයන ඇදහිල්ල :

   පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල :

   ආරක්ෂක ඇදහිල්ල :

3. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තැබීමට අවශ්‍ය වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

4. ඔබහට දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල වැඩිකරගත හැක්කේ කෙසේද?

5. මතකයෙන් ප්‍රධාන පදය ලියන්න.

6. ආබ්‍රහම්, ඇදහිල්ල සඳහා යහපත් උදාහරණයක් වීමට හේතු හතරක් සඳහන් කරන්න.

7. ඇදහිල්ල බලාපොරොත්තුවෙන් වෙනස් වන්නේ කෙසේද?

8. ඇදහිල්ල හා "හේතු ඵල වාදය" අතර වෙනස කුමක්ද?

9. ඇදහිල්ල හා ක්‍රියා අතර වෙනස කුමක්ද?

10. "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" යන්නෙහි තේරුම කුමක්ද?

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ජේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඇදහිල්ල සඳහා භාවිතා කරන වෙනත් වචනයක් නම් "විශ්වාසය" වේ. දාවිත් ගීතාවලිය පොතෙහි විශ්වාසය පිළිබඳ බොහෝ කරුණු ලිවීය. දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා දාවිත් "විශ්වාසය" ලෙසට නම් කළාවූ පහත සඳහන් කොටස් භාවිතා කරන්න.

## වැරදි ලෙස ස්ථානගත කළ විශ්වාසය

පහත සඳහන් පාඨයන් අධ්‍යයනය කරන්න. සපයා ඇති ඉඩ ප්‍රමාණයෙහි දාවිත් පැවසූ ලෙස විශ්වාසය රැඳවිය **නොයුතු** කුමක් තුළදැයි ලියන්න.

**පාඨය** **විශ්වාස නොකරන්න ...**

ගීතාවලිය 20:7 ________________________________________

ගීතාවලිය 41:9 ________________________________________

ගීතාවලිය 44:6 ________________________________________

ගීතාවලිය 49:6 ________________________________________

ගීතාවලිය 52:7 ________________________________________

ගීතාවලිය 115:8 ________________________________________

ගීතාවලිය 118:8-9 ________________________________________

ගීතාවලිය 135:17-18 ________________________________________

ගීතාවලිය 146:3 ________________________________________

## නියමාකාරයෙන් භාවිතා කළාවූ ඇදහිල්ල

ගීතාවලිය පුරාම දාවිත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට දිරි ගන්වා ඇත. එසෙම් දෙවියන්වහන්සේට සම්බන්ධ කාරණා කෙරෙහි විශ්වාසය රැඳවීමට ඔහු දිරිගන්වයි. පහත සඳහන් පාඨ අධ්‍යයනය කරන්න. දෙවෙනි තීරයෙහි දාවිත් පවසන අයුරින් තම විශ්වාසය රැඳවීමට සුදුසු දේ සඳහන් කරන්න.

**පාඨය** **විශ්වාසය තබන්න ...**

ගීතාවලිය 33:21 ________________________________________

ගීතාවලිය 36:7 ________________________________________

ගීතාවලිය 13:5 ________________________________________

ගීතාවලිය 52:8 ________________________________________

ගීතාවලිය 57:1 ________________________________________

ගීතාවලිය 61:4 ________________________________________

ගීතාවලිය 78:22 ________________________________________

ගීතාවලිය 91:4 ________________________________________

ගීතාවලිය 119:42 ________________________________________

**විශ්වාස කළ යුතු අවස්ථාවන් ...**

ගීතාවලිය 56:3 ________________________________________

### විශ්වාස කිරීමේ ප්‍රයෝජන

දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙහි ප්‍රයෝජන රාශියක් දාවිත් සඳහන් කරයි. පහත සඳහන් පාඨ අධ්‍යයනය කරන්න. සපයා ඇති තීරුවෙහි දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමෙන් ලබන ප්‍රයෝජන සඳහන් කරන්න.

**පාඨය** **දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමේ ප්‍රයෝජන ...**

ගීතාවලිය 25:2 ________________________________________

ගීතාවලිය 25:20 ________________________________________

ගීතාවලිය 26:1 ________________________________________

ගීතාවලිය 28:7 ________________________________________

ගීතාවලිය 31:1 ________________________________________

ගීතාවලිය 31:6 ________________________________________

| පාඨය | දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමේ ප්‍රයෝජන ... |
| --- | --- |
| ගීතාවලිය 31:19 | ________________ |
| ගීතාවලිය 32:10 | ________________ |
| ගීතාවලිය 33:21 | ________________ |
| ගීතාවලිය 34:8 | ________________ |
| ගීතාවලිය 34:22 | ________________ |
| ගීතාවලිය 37:5 | ________________ |
| ගීතාවලිය 37:40 | ________________ |
| ගීතාවලිය 40:3 | ________________ |
| ගීතාවලිය 2:12 | ________________ |
| ගීතාවලිය 5:11 | ________________ |
| ගීතාවලිය 7:1 | ________________ |
| ගීතාවලිය 9:10 | ________________ |
| ගීතාවලිය 16:1 | ________________ |
| ගීතාවලිය 17:7 | ________________ |
| ගීතාවලිය 21:7 | ________________ |
| ගීතාවලිය 22:4 | ________________ |
| ගීතාවලිය 22:5 | ________________ |
| ගීතාවලිය 22:8 | ________________ |
| ගීතාවලිය 40:4 | ________________ |
| ගීතාවලිය 56:4 | ________________ |
| ගීතාවලිය 56:11 | ________________ |
| ගීතාවලිය 57:1 | ________________ |
| ගීතාවලිය 64:10 | ________________ |
| ගීතාවලිය 71:1 | ________________ |
| ගීතාවලිය 73:28 | ________________ |

**පාඨය** **දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමේ ප්‍රයෝජන ...**

ගීතාවලිය 84:12 ________________________________________

ගීතාවලිය 86:2 ________________________________________

ගීතාවලිය 112:7 ________________________________________

ගීතාවලිය 119:42 ________________________________________

ගීතාවලිය 125:1 ________________________________________

ගීතාවලිය 141:8 ________________________________________

ගීතාවලිය 143:8 ________________________________________

ගීතාවලිය 144:2 ________________________________________

## දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීමෙහි ප්‍රතිඵල

දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීමේ ප්‍රතිඵලය දාවිත් හඳුන්වා දෙයි.

**පාඨය** **දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකිරීමේ ප්‍රතිඵල ...**

ගීතාවලිය 32:10 ________________________________________

ගීතාවලිය 55:23 ________________________________________

ගීතාවලිය 78:21-22 ________________________________________

## විශ්වාස කිරීම පිළිබඳ දාවිත්ගේ ඉතිහාසය

දාවිත් තමා කෙතරම් කාලයක් දෙවියන්වහන්සේ විශ්වාස කර ඇතිදැයි පවසයි.

ගීතාවලිය 71:5 “................................ වයස පටන් .................................... ”

## අමතර බයිබල් පාඨ

පහත සඳහන් බයිබල් පද දාවිත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම පිළිබඳ ලියූ තවත් පද කිහිපයකි. එම පද අධ්‍යයනය කරන්න. සපයා ඇති තීරුවෙහි එම පද එකිනෙක ඔබගේ වචනයෙන් සාරාංශ කොට ලියන්න.

**පාඨය** **සාරාංශය**

ගීතාවලිය 31:4 ________________________________________

ගීතාවලිය 4:5 ________________________________________

ගීතාවලිය 11:1 ________________________________________

# පස්වන පරිච්ඡේදය

## බව්තීස්මයන් පිළිබඳ දේව ධර්මය - I වැනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ජේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- නව ගිවිසුමෙහි සඳහන් කර ඇති බව්තීස්ම වර්ග හතරක් හඳුනාගැනීමට
- "බව්තීස්මය" යන පදය අර්ථ දැක්වීමට
- ක්‍රිස්තියානි බව්තීස්මයෙහි ඇති වැදගත්කම පැහැදිලි කිරීමට
- ක්‍රිස්තියානි බව්තීස්මය අපේක්ෂා කරන අය විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් සඳහන් කිරීමට

**ප්‍රධාන පදය:**

> **මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තීස්ම කරමි. නමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද නුඹලා බව්තීස්ම කරන සේක. (මතෙව් 3:11)**

### හැඳින්වීම

හෙබ්‍රෙව් 6 පදයෙහි සඳහන් තුන්වන මූලික අත්තිවාරම් දේවධර්මය නම් බව්තීස්මයන් පිළිබඳවය.

හෙබ්‍රෙව් 6:2හි "බව්තීස්ම කිරීම්" බහුවචනයෙන් සඳහන් වේ. එය "බව්තීස්ම කිරීම් [බහු වචන] පිළිබඳ දේව ධර්මය" මිස "බව්තීස්මය [ඒක වචන] පිළිබඳ දේව ධර්මය" නොවේ. මින් අදහස් වනුයේ, ක්‍රිස්තියානි ඇදහිල්ලේ සම්පූර්ණ දේව ධර්මය සඳහා එක් බව්තීස්මයකට වඩා අඩංගු වන බවය.

### බව්තීස්ම හතරක්

නව ගිවිසුම බව්තීස්ම හතරක් සඳහන් කරයි. ඒවා නම්,

- ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විඳීමේ බව්තීස්මය
- යොහන්ගේ බව්තීස්මය
- ක්‍රිස්තියානි බව්තීස්මය
- ශුද්ධාත්මයාණන් තුළ බව්තීස්මය

මෙම පරිච්ජේදය මින් පළමුවන බව්තීස්ම තුන සාකච්ජා කරයි. ඊළඟ පරිච්ජේදයෙහිදී ශුද්ධාත්ම බව්තීස්මය සාකච්ජා කරන්නෙමු.

### අර්ථ දැක්වීම

බයිබලයෙහි සඳහන් වන "බව්තීස්මය" යන පදයෙහි අර්ථය වනුයේ යමක් සම්පූර්ණයෙන්ම ගිල්වීම හෝ පෙඟවීමය.

### ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විඳීමේ බව්තීස්මය

අළුත් ගිවිසුමෙහි ඇති එක් බව්තීස්මයක් අපි දුක් විඳීමේ බව්තීස්මය ලෙස නම් කරමු. මෙය යේසුස්වහන්සේ විසින් කතා කළාවූ බව්තීස්මයකි. එනම්,

**නමුත් මට බව්තිස්මයක් ලබන්ට තිබේ. ඒක ඉෂ්ට වෙනතුරු කොපමණ ගාවිනාවෙන් යුක්තවෙම්ද? (ලූක් 12:50)**

මෙම බව්තිස්මය පිළිබඳව නැවත වතාවක් මාර්ක් 10:38හි සෙබදීගේ පුත්‍රයන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දකුණු පසින් හා වම් පසින් හිඳ ගැනීමේ ගෞරවය ඉල්ලා සිටි කල සඳහන් වේ. යේසුස්වහන්සේ පිළිතුරු දෙමින් පැවසුවේ, "නුඹලා ඉල්ලන්නේ කුමක්දැයි නුඹලා නොදන්නහුය. මා බොන කුසලානෙන් බොන්ට හෝ මා ලබන බව්තිස්මයෙන් බව්තිස්ම කරනු ලබන්ට හෝ නුඹලාට පුළුවන්ද,"යි ඇසූසේක. යේසුස්වහන්සේ මෙහිදී අදහස් කළේ සියළු මනුෂ්‍යයන්ගේ පව් උදෙසා තමා විඳීමට නියම වී තිබූ මරණය හා වේදනාවිඳීම පිළිබඳවය. උන්වහන්සේ දුක් වේදනාවන්හි ගිලීමටත් සොහොන් ගෙයක තැන්පත් කරනු ලැබීමටත් අළුත් සිරුරකින් යුක්තව නැගිටුවනු ලැබීමටත් නියමව සිටි සේක.

## යොහන්ගේ බව්තිස්මය

යොහන්ගේ බව්තිස්මය පසුතැවිලිවීමෙහි පණිවුඩය හා සම්බන්ධ වූ වතුර බව්තිස්මයකි. යොහන් බව්තිස්ත සෙකරියා හා එලිසබෙත් යන යුවලට භාස්කමකින් බිහි වූ දරුවෙකි (ලූක් 1). දෙවියන්වහන්සේට ඔහුගේ ජීවිතය උදෙසා විශේෂ සැලැස්මක් විය. ඔහු යේසුස්වහන්සේගේ "පෙරමග දූතයා" ලෙස සේවය කිරීමට යොදාගත් පුද්ගලයාය.

**එසේය දරුව, නුඹ මහෝත්තමයාණන්ගේ අනාගතවක්තෘ යයි කියනු ලබන්නෙහිය:**
**මක්නිසාද නුඹ ස්වාමින්වහන්සේගේ මාර්ග පිළියෙළ කරන්ට, උන්වහන්සේගේ සෙනගට පව් කමාවීමෙන් ලැබෙන ගැළවීම දන්වන්ට උන්වහන්සේට පෙරටුව යන්නෙහිය.**
**(ලූක් 1:76-77)**

"පෙරමග දූතයා" යනු ඉදිරියෙන් ගොස් මග සාදන්නාය. යොහන් බව්තිස්ත යේසුස්වහන්සේට පෙරටුව ගොස් ඉශ්‍රායෙල් ජනතාවට පසුතැවිලිවීමේ පණිවුඩය දේශනාකොට බව්තිස්මය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ මිදුම්කරු මෙසියස් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමට මං පෑදිය යුතු විය.

**මම (යොහන් බව්තිස්ත) වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තිස්ම කරමි. නුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය ... උන්වහන්සේ ශුද්ධාත්මයෙන් ද ගින්නෙන් ද නුඹලා බව්තිස්ම කරනසේක. (මතෙව් 3:11)**

යොහන් බව්තිස්තගේ සේවය නව ආත්මික යුගයක ආරම්භය විය.

**ව්‍යවස්ථාවද අනාගතවක්තෘහුද යොහන් දක්වා පැවතුණෝය. එතැන් පටන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරනු ලැබේ. සියල්ලෝද බලෙන් ඊට ඇතුල්වෙති. (ලූක් 16:16)**

යොහන්ගේ කාලයට පෙර ජනතාව ව්‍යවස්ථාව යටතෙහි ජීවත්වූහ. අනාගතවක්තෘවරු හා පූජකයෝ එම ව්‍යවස්ථාව ජනතාවට වටහාදුන් ආත්මික නායකයන් ලෙස කටයුතු කළහ. දේව මාලිගයෙහි දෙවියන්වහන්සේගේ අභිමුවට ළඟාවීමේ අයිතිය පැවතියේ පූජකවරුනට පමණකි. ඔව්හු මනුෂ්‍යයා හා දෙවියන්වහන්සේ අතර මැදිහත්කරුවන් ලෙස සිටිමින් දෙවියන්වහන්සේ අණකර ඇති පරිදි පාප පූජා ඔප්පු කළහ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමත් සමග මේ සියල්ල වෙනස් විය. උන්වහන්සේගේ ජීවිතය, මරණය සහ නැවත නැගිටීම තුළින් යේසුස්වහන්සේ සියළු මනුෂ්‍යයන් හට දෙවියන්වහන්සේට ළඟාවීමට හැකියාව සපයා දුන්සේක. යේසුස්වහන්සේ දැන් පාපිෂ්ඨ මිනිසා සහ ධර්මිෂ්ඨ වූ දෙවියන්වහන්සේ අතර මැදිහත්කාරයාණෝ ලෙසින් සේවය කරන සේක.

යොහන් ජනතාවගෙන් කාරණා දෙකක් අපේක්ෂා කළේය. ඒවානම්, පසුතැවිලිවීම හා පව් ප්‍රසිද්ධියේ පාපොච්චාරණය කිරීමය. දෙවියන්වහන්සේ දුන්නාවූ මෙම අවශ්‍යතා දෙක ඉටුකිරීමට කැමැති වූවන් යොහන් ප්‍රසිද්ධියේ සාක්ෂියක් ලෙසට යෝර්දාන් ගඟෙහි බව්තිස්මය කළේය. එය ඔව්හු තමුන්ගේ පාප උදෙසා පසුතැවිලි වූ බව බාහිරයෙන් පෙන්වීමට සලකුණක් විය.

යොහන්ගෙන් බව්තිස්මය ලබාගැනිමට පැමිණි සමහර ආගමික නායකයන්ව බව්තිස්ම කිරීමට ඔහු ප්‍රතික්ෂේප කළේය. ඔහු ප්‍රකාශ කර සිටියේ තමාගෙන් බව්තිස්මය ලැබීමට පෙර ඔව්හු නියමාකාර වෙනසක් ඇතිවූ බවට සාක්ෂි දැකීමක් අවශ්‍ය බවය.

**නමුත් ඔහු තමාගෙන් බව්තිස්මය ලබන පිණිස ඵරිසිවරුන්ගෙන් ද සද්දිසිවරුන්ගෙන් ද බොහෝ දෙනෙකු එනවා දැක ඔවුන්ට කථාකොට: පොළොං වංශය, පැමිණෙන උදහසින් පලායන්ට නුඹලාට අවවාද කළේ කවුද?**
**පසුතැවිල්ලට සුදුසු ඵල උපදවාපන්න.** (මතෙව් 3:7-8)

යොහන් විසින් බව්තිස්මය කරනු ලැබීමට පෙර පසුතැවිලිවීම හා පාපය අත්හැරීම කරුණු දෙක සම්පූර්ණ වී තිබිය යුතු විය. "පසුතැවිලිවීම හා පව්කමාව පිණිස බව්තිස්මය ලැබීම" යන්නෙන් අදහස් වුයේ වතුර බව්තිස්මයෙන් පසුව මේ ක්‍රියා දෙක සිදුවූ බව නොවේ. බව්තිස්මය වනාහි බව්තිස්ම ලැබූ අය දැනටම අත්දැක තිබූ පසුතැවීම හා පව්සමාව ලැබීම බාහිරයෙන් ස්ථිර කරමින් පෙන්නුම් කිරීමකි.

## ක්‍රිස්තියානි බව්තිස්මය

අප "ක්‍රිස්තියානි බව්තිස්මය" ලෙසට හඳුන්වන කරුණ වඩා හොඳින් විස්තර කෙරෙන ජේදය නම් යේසුස්වහන්සේගේ බව්තිස්මය සඳහන් වන කොටසය. එනම්,

**එකල යේසුස්වහන්සේ යොහන්ගෙන් බව්තිස්මය ලබන පිණිස ගලිලයේ සිට යොර්දානයට ආසේක.**
**නුමුත් යොහන් උන්වහන්සේ වළක්වමින් ඔබගෙන් බව්තිස්මය ලබන්ට මට යුතු තිබියදී ඔබ මා වෙතට එනසේක් දැයි කීවේය.**
**යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින්: දැනට ඉඩහරින්න. මක්නිසාද මෙසේ සියලු ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන්ට අපට සුදුසුයයි කීසේක. එවිට ඔහු උන්වහන්සේට ඉඩහැරියේය.**
**යේසුස්වහන්සේ බව්තිස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුනු සේක. බලව, අහස උන්වහන්සේට විවර විය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවා ද උන්වහන්සේ දුටු සේක.**
**තවද, මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය.** (මතෙව් 3:13-17)

යේසුස්වහන්සේ යොහන්ගෙන් බව්තිස්මය ලැබුවේ එතුමා පාපයෙන් පසුතැවිලි වූ බවට සාක්ෂියක් ලෙස නොවේ. මන්ද එතුමාට පාපොච්චාරණය කිරීමට පාපයක් නොවූ බැවිනි. යේසුස්වහන්සේ බව්තිස්මය ලැබුවේ "සියළු ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන පිණිස"ය. උන්වහන්සේ තම ශ්‍රාවකයන් සියළු දෙනා හට අනුගමනය කිරීමට ධර්මිෂ්ඨ උදාහරණයක් පිහිට වූ සේක.

## ළදරුවන් බව්තිස්මය

යේසුස්වහන්සේ ළදරුවෙකු ලෙස බව්තිස්ම කරනු නොලැබූ සේක. උන්වහන්සේ බිළිඳෙකුව සිටි අවදියේ එතුමාගේ දෙමව්පියෝ ස්වාමින්වහන්සේ වෙතට එතුමා පුදකරන පිණිස යෙරුසලමට රැගෙන ආවෝය. එනමුත්, බව්තිස්මය නොකරන ලදි (ලූක් 2:22). යේසුස්වහන්සේ කරන දෙය කුමක්ද කියාත් එය කිරීමට හේතුව කුමක්ද කියාත් දැනගන්නා තුරු උන්වහන්සේ බව්තිස්මය නොලබන ලදි.

බිළිඳුන් බව්තිස්ම නොකළ යුතුය. දරුවන්ව ස්වාමින්වහන්සේට ඔප්පු කරමින් කැප කිරීමත් අත්තැබීම මගින් ආශිර්වාද කිරීමත් කළ හැකිය. එනමුත් ඔවුන් කරන දෙය තේරුම් යන තුරු, ඒ සඳහා බයිබලිය සුදුසුකම් සම්පූර්ණ කරන තුරු බව්තිස්ම නොකළ යුතුය. මෙම අවබෝධය ලැබෙන නියමිත වයසක් නොමැත. එය එක් එක් ළමයාගේ මානසික සහ ආත්මික වර්ධනයට අනුව වෙනස් වේ.

## ඉසිනවාද ගිල්වනවාද?

සමහර සභාවල වතුර ඉසීමෙන් බව්තිස්මය කරනු ලැබේ. තවත් සමහරු සම්පූර්ණයෙන්ම වතුරෙහි ගිල්වති. යේසුස්වහන්සේ බව්තිස්මය ලැබූ කල උන්වහන්සේ වතුරට බැස එයින් ගොඩ වී

ආ සේක. බයිබලයෙහි "බව්තිස්මය" යන පදයේ අ[1]:h yd යේසුස්වහන්සේ ලද බව්තිස්මය සලකා යේසුස්වහන්සේ යොර්දාන් නදියෙහි මුළුමනින්ම ගිලුනු බව අප නිගමනය කළ යුතු වන්නෙමු.

යේසුස්වහන්සේ බව්තිස්ම කිරීමට ඉඩහැරීම තුළින් දේව කැමැත්තට කීකරු වීම බාහිරයෙන් පෙන්නුම් කළ සේක. මෙම කීකරුකමේ ක්‍රියාව තුළින් උන්වහන්සේ දේව සැලැස්ම සම්පූර්ණ කළ සේක. ඇදහිලිවතුන් බව්තිස්මය ලබන කල ඇදහිල්ලෙන් ඔව්හු අභ්‍යන්තරයෙහි ලබා තිබෙන ධර්මිෂ්ඨකම බාහිරයෙන් සංකේතවත් කරති.

## බව්තිස්මය සඳහා අවශ්‍ය සුදුසුකම්

යොහන්ගෙන් බව්තිස්ම වීමට අපේක්ෂා කළ අය විසින් සම්පූර්ණ කළ යුතු වූ ආත්මික කොන්දේසි කීපයක් විය. එසේම, ක්‍රිස්තියානි බව්තිස්මය ලැබීමට සතුටු අය විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා කිහිපයක් පවතී.

### උපදෙස් :

බව්තිස්මය සඳහා අවශ්‍ය වන පළමුවන සුදුසුකම ඉදිරිපත් කරනු ලැබුවේ යේසුස්වහන්සේ විසිනි.

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න.**
> **පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්ම කරන්න.**
> **මා විසින් නුඹලාට අණකළ සියල්ල පවත්වන්ට ඔවුන්ට උගන්වන්න.** (මතෙව් 28:19-20)

නව ඇදහිලිවතුන්ට ඉගැන්වීමට යේසුස්වහන්සේ දෙවරක් අණකොට තිබේ. බව්තිස්මයට පෙර හා පසුව ඔවුනට ඉගැන්විය යුතුය. පව්කරුවන් ඇදහිලිවන්තයන් බවට පත්වීමට නම් ඔව්හු පළමුකොට ශුභාරංචිය අසා පිළිගත යුතුය.

> **එකල ඔහුගේ වචනය පිළිගත් අය බව්තිස්ම කරනු ලැබුවෝය.** (ක්‍රියා 2:41)
>
> **ඔව්හු ඒ අසා, ස්වාමි වූ යේසුස්වහන්සේගේ නාමයට බව්තිස්ම කරනු ලැබුවෝය.** (ක්‍රියා 19:5)
>
> **... ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියක් අපේ වචන අසාගන සිටියාය. පාවුල් විසින් කියන ලද කාරණා ... ඈද ඇගේ ගෙයි වැසි සියල්ලන් ද බව්තිස්ම කරනු ලැබුවෝය.** (ක්‍රියා 16:14-15)

බව්තිස්මය ලැබීමට පෙර ඇදහිලිවන්තයෝ එහි අර්ථය වටහාගැනීම පිණිස සෑහෙන පමණ උපදෙස් හා ඉගැන්වීම් ලැබිය යුතු වේ. බව්තිස්මයෙන් පසුව පරිනත කිතුනුවන් බවට පත්වීම සඳහා තවදුරටත් උපදෙස් ලැබිය යුතුය. පාවුල් මෙය "සම්පූර්ණත්වය කරා ළඟාවීම" යනුවෙන් හඳුන්වයි (හෙබ්‍රෙව් 6).

### පසුතැවිලිවීම :

බව්තිස්මය ගැන දෙවන අවශ්‍යතාවය නම් පව් ගැන පසුතැවිලිවීමය. පේතෘස් පෙන්තකොස්ත දින ඔහුගේ දේශනාවෙන් මෙය අවධාරණය කළේය.

> **ඔව්හු ඒ අසා, ඇනින ලද සිත් ඇතිව, සහෝදරයෙනි අප විසින් මක්කරන්ට ඕනෑදැයි පේතෘස්ගෙන් ද අනික් ප්‍රේරිතයන්ගෙන් ද ඇසුවෝය.** (ක්‍රියා 2:37)
>
> **පේතෘස්: නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තිස්මය ලබන්න. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබනනහුය.** (ක්‍රියා 2:38)

පාපය ඒත්තු ගැනීම පමණක් නොසෑහෙන බව මතක තබා ගන්න. ඒ අනුව ක්‍රියා කළ යුතුය. පේතෘස් දුන් ආඥා දෙක නම්, පසුතැවිලි වී බව්තිස්මය ලබන්න යනුවෙනි. පසුතැවිලිවීම බව්තිස්මයට පෙර සිදුවේ.

### විශ්වාසය :

බව්තිස්මය ලැබීමට අවශ්‍ය තුන්වන කාරණාව නම් විශ්වාසය නොහොත් ඇදහිල්ලය.

> **උන්වහන්සේ ඔවුන්ට කියන සේක් :නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න.**
> **අදහන්නාවූ බව්තිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය. නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වදට පත් කරනු ලබන්නේය. (මාර්ක් 16:15-16)**

මෙලෙස විශ්වාස කිරීමේ අවශ්‍යතාව මනාව පැහැදිලි කරදෙන්නාවූ කථාවක් නම් ජෙරුසලමහි සිට ගාසා දක්වා ගමන් කරමින් සිටි ඉතියෝපිය මිනිසා සහ පිලිප්ගේ හමුවීමය (ක්‍රියා 8). ඉතියෝපිය මිනිසා යෙසායාගේ පොත කියවමින් සිටිනු පිලිප්ට ඇසුණි. ඔහු ගොස් ඉතියෝපියයාගේ රථයට ගොඩවී ශුභාරංචිය පැහැදිලි කරදුනේය. ඔව්හු ගමන යමින් සිටියදී වතුර ඇති තැනක් පසුකර ගියහ. ඉතියෝපියයාගේ ඉල්ලිම මත ඔහුගේ ඇදහිල්ලේ ප්‍රකාශයට අනුව පිලිප් ඔහුව බව්තිස්ම කළේය.

> **ඔව්හු මාර්ගයේ යද්දී වතුර තිබෙන තැනකට පැමිණුණහ. නපුංසකයා කථාකොට මෙන්න වතුර තිබේ. බව්තිස්ම කරනඅ ලබන්ට මට කවර බාධාවක් තිබේද කියා රථය නවත්වන්ට අණ කළේය.**
> **පිලිප් කථාකොට: නුඹ නුඹේ මුළු සිතින් අදහන්නෙහිනම් එසේ පුළුවනැයි කීය. ඔහු උත්තර දෙමින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව මම අදහමියි කීවේය.**
> **එවිට පිලිප්ද නපුංසකයාද දෙදෙනම වතුරට බැස්සෝය. පිලිප් ඔහුව බව්තිස්ම කළේය. (ක්‍රියා 8:36-38)**

පිලිප් නපුංසකයා හට කථාකොට “නුඹ නුඹේ මුළු සිතින් අදහන්නෙහි නම් එසේ ඔබව බව්තිස්මය කිරීමට පුළුවනැය” පැවසිය. නපුංසකයා පිළිතුරු දෙමින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව මම අදහමියි පැවසිය. ක්‍රිස්තියානි බව්තිස්මය අපේක්ෂා කරන සෑම කෙනෙකුම පළමුකොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවට තම ඇදහිල්ල ප්‍රකාශ කළ යුතුය.

## දෙවියන්වහන්සේ කෙරෙහි යහපත් හෘද සාක්ෂිය :

ක්‍රිස්තියානි බව්තිස්මය සඳහා අවශ්‍ය හතරවන සුදුසුකම නම්, දෙවියන්වහන්සේ කෙරෙහි යහපත් හෘද සාක්ෂියක් ඇතිව සිටීමය. ජේතෘස් වතුර බව්තිස්මය නැවට ඇතුළුවීම හේතුවෙන් විනිශ්චයෙන් ගැළවුනාවූ නෝවා හා ඔහුගේ පවුලේ අය ලද අත්දැකීමට සමාන කරයි.

> **නව තිබෙන බව්තිස්මයේ වතුරෙන් එනම්, මාංශයේ කිලිටුකම පහත් කිරීමෙන් නොව, යහපත් හෘදය සාක්ෂියකින් දෙවියන්වහන්සේ සෙවීමෙන් දැන් නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන ගැළවෙන්නහුය.**
> **(1 ජේතෘස් 3:21)**

බව්තිස්මයෙහි අරුත කිසියම් ශාරීරික පවිත්‍රකිරීමක් ගැබ්වී ඇතැයි යන මතය ජේතෘස් බැහැර කර දමයි. ඔහු පවසන පරිදි බව්තිස්මයෙහි කොන්දේසිය නම් ඇදහිලිවන්තයා තම සිතෙහි දෙවියන්වහන්සේ කෙරෙහි දරන සම්බන්ධතාවය පමණකි. ඔහු එය “දෙවියන්වහන්සේ කෙරෙහි යහපත් හෘද සාක්ෂිය” ලෙස හඳුන්වයි.

## බව්තිස්මය ලබන කාලය

යම් කිසිවෙකු බවතිස්මය සඳහා සුදුසු වීමට නම් නිසියාකාර උපදෙස් ලබා, පසුතැවිලි වී, විශ්වාස කොට දෙවියන්වහන්සේ කෙරෙහි යහපත් හෘද සාක්ෂියක් දැරිය යුතු වේ. මේ සියල්ල සපුරාලීම සඳහා ගත වන කාල සීමාව එක් එක් පුද්ගලයා අනුව වෙනස් වනු ඇත.

සමහර සභාවල බව්තිස්මය සඳහා සූදානම් වීමට සති ගණනක හෝ මාස ගණනක උපදෙස් පන්ති පවත්වති. බයිබලයෙහි සඳහන් පරිදි පෙන්තකොස්ත දින තුන්දහසක් දෙනා බව්තිස්මය ලැබූහ. බව්තිස්මයට පැය කිහියකට පෙර ඔව්හු උන්වහන්සේ මෙසියස් වහන්සේ හෝ දේව පුත්‍රයා බව විශ්වාස නොකොට එතුමාව ප්‍රතික්ෂේප කළ නොඇදහිලිවන්තයෝ වූහ. පේතෘස්ගේ දේශනාවේ අවසානය සහ බව්තිස්මය අතර මුල් උපදෙස් දීම සඳහා පැවති ඉඩකඩ පැය කිහිපයකට වඩා වැඩි විය නොහැකිය.

> **එකල ඔහුගේ වචනය පිළිගත් අය බවතිස්ම කරනු ලැබුවෝය. ඒ දවසේදී තුන්දාහක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතු කරන ලද්දෝය. (ක්‍රියා 2:41)**

පිලිප් ඉතියෝපිය නපුංසකයා හට ශුභාරංචිය දේශනා කළ එම දවසෙහිම ඔහුව බව්තිස්මය කළේය.

## සාරාංශ කිරීමක්

මුල්කාලීන සභාවෙහි බව්තිස්මය හා සම්බන්ධව ක්‍රියාකළ ආකාරය වූයේ,

1. බව්තිස්මයට පෙර ඔව්හු ශුභාරංචියෙහි මූලික කාරණා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය, මරණය හා නැවත නැගිටීම පිළිබඳව ඉගැන්වූහ.

2. ඔව්හු මෙම කාරණා බව්තිස්මය නම් ක්‍රියාව හා පැවති සම්බන්ධතාවය පෙන්වා දුන්හ.

3. ඔව්හු නව ඇදහිලිවන්තයාගේ පසුතැවිලිවීම, ඇදහිල්ලේ ප්‍රකාශනය පිළිබඳ අවබෝධය කෙසේදැයි සොයා බලා, ස්ථිර කරගත් පසුව ඒ හා සමගම වතුර බව්තිස්මයට යොමු කළහ.

4. බව්තිස්මයෙන් අනතුරුව අළුත් ඇදහිලිවතුන් හට ආත්මික වර්ධනය සඳහා තවදුරටත් උපදෙස් ලබාදුනි.

## ක්‍රිස්තියානි බව්තිස්මයෙහි ඇති සුවිශේෂීභාවය

ක්‍රිස්තියානි බව්තිස්මයෙහි ඇති සුවිශේෂීභාවය පහත සඳහන් බයිබල් පාඨයෙන් එළිදරව් වේ.

> **එසේවී නම් කුමක් කියමුද? අනුග්‍රහය බොහෝ වන පිණිස පාපයෙහි පවතිමුද? එසේ නොවේවා. පාපයට මළාවූ අපි තවත් එහි කෙසේ ජීවත් වෙමුද?**
>
> **නොහොත් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බව්තිස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බවතිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටින්නහුද?**
>
> **එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවාසේම අපිත් ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස මරණය තුළට බව්තිස්මය කරණකොටගෙන උන්වහන්සේ සමග තැන්පත් කරනු ලැබුවෙමුව. (රෝම 6:1-4)**

ඔබ පසුතැවිලි වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගත් කල ඔබගේ පැරණි ජීවිතයට හා පාපයට මරණය සිදුවේ. ඉන්පසු දෙවියන්වහන්සේ උදෙසා ජීවත්වන්නාවූ නව ධර්මිෂ්ඨකමේ ජීවිතයක් අළුතින් බිහිවේ.

> **එලෙස නුඹලා පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගනිල්ලා.**

**එබැවින් නුඹලා නුඹලාගේ මරණීය වූ ශරීරයේ තෘෂ්ණාවලට කීකරු වන ලෙස පාපය එහි අධිපතිකම් නොකෙරේවා.**
**නුඹලා ව්‍යවස්ථාව යටතෙහි නොව අනුග්‍රහය යටතෙහි සිටින බැවින් පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය.** (රෝම 6:11, 12, 14)

ක්‍රිස්තියානි වතුර බව්තීස්මය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම සංකේතවත් කරන්නකි. ඔබ වතුර නමැති "සොහොන" තුළට ගිලීමෙන් සංකේතවත් කරනුයේ පාපයට මිය යාමය. වතුරෙන් එළියට ඒම නව ජීවනයක් සහිතව දෙවියන්වහන්සේ උදෙසා ධර්මිෂ්ඨව ජීවත් වීමට අළුත් ආකාරයෙන් නැවත නැගිටීම සංකේතවත් කරයි.

මෙලෙස දෙවියන්වහන්සේ උදෙසා නව අයුරින් ජීවත්වීමට උත්ථාන කරනු ලැබූ ඇදහිලිවන්තයා එම ජීවිතය තමාගේම ශක්තියෙන් නොගෙවනු ඇත. එම නව ජීවිතය ගෙවනු ඇත්තේ දෙවියන්වහන්සේගේ බලයෙනි. එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මරණින් උත්ථාන කළාවූ බලයෙනි (එකොළොස්වෙනි පරිච්ඡේදයෙහිදී අප නව ජීවිතයක ජීවත්වීම පිළිබඳ සවිස්තරාත්මකව ඉගෙන ගනිමු). බව්තීස්මයෙහි බලපෑම රඳා පවතිනුයේ එය ලබන තැනැත්තාගේ පසුතැවිලිවීම හා ඇදහිල්ල මතය. මෙයින් තොරවූ බව්තීස්මය වටිනා කමින් තොර වේ.

සත්‍ය ක්‍රිස්තියානි බව්තීස්මය යන්නෙහි අරුත අපි යේසුස්වහන්සේ තුළට බව්තීස්ම කරනු ලැබීම මිස කිසියම් සභාවකට හෝ නිකායකට බව්තීස්මය කරනු ලැබීම නොවේ.

**මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්මය කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ පැළඳගත්තෝය.** (ගලාති 3:27)

## බව්තීස්මයන් : ප්‍රතිවිරුද්ධතා

යොහන්ගේ බව්තීස්මය සහ ක්‍රිස්තියානි බව්තීස්මය යන දෙකම වතුරෙහි ගිල්වීම මගින් සිදුවුවද එම දෙක අතර වෙනසක් පැවතිනි. පාවුල් එපීස නුවර සංචාරය කරන කල යොහන් බව්තීස්තගේ ගෝලයෝ කණ්ඩායමක් ඔහුට හමුවිය. ඔව්හු පසුතැවිලි වීමේ පණිවිඩය අසා බව්තීස්මය ලබා තිබූ නමුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය පිළිබඳව කිසිවක් අසා නොතිබුණි.

**තවද අපොල්ලොස් කොරින්තියෙහි සිටියදී පාවුල් ඉහළ පළාත් මැදින් ගොස්, එපීසයට ඇවිත් සමහර ගෝලයන් සම්බව, නුඹලා අදහාගත් කල ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබුවහුද්‍යි ඔවුන්ගෙන් ඇසුවේය. ඔව්හු: නැත, ශුද්ධාත්මයාණන්වහන්සේ ඇති බවත් නොඇසීමුයයි කීවෝය.**
**එසේ වී නම්, නුඹලා මොන බව්තීස්මයක් ලැබුවහුද්‍යි ඔහු ඇසුවේය. යොහන්ගේ බව්තීස්මය යයි ඔව්හු කීවෝය.**
**පාවුල් කථාකොට: යොහන් පසුතැවිල්ලේ බව්තීස්මයෙන් බව්තීස්ම කොට සෙනගට කථාකරමින්, තමාට පසුව එන තැනැන්වහන්සේ කෙරෙහි එනම් යේසුස්වහන්සේ කෙරෙහි අදහාගන්නා ලෙස සෙනගට කීවේයයි කීහ.**
**ඔව්හු ඒ අසා, ස්වාමිවූ යේසුස්වහන්සේ නාමයට බව්තීස්ම කරනු ලැබුවෝය.** (ක්‍රියා 19:1-5)

පාවුල් ශුභාරංචිය පහදා දුන් පසු මෙම ජනයා එය පිළිගෙන නැවත බව්තීස්මය ලැබුවෝය. මෙවර ඔව්හු ස්වාමීන් වූ යේසුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලැබූහ. මෙම උදාහරණයෙන් යොහන්ගේ බව්තීස්මය හා ක්‍රිස්තියානි බව්තීස්මය එකිනෙකින් වෙනස් වූවක් බව අපට පෙන්වා දෙයි. යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීමට පසුව යොහන්ගේ බව්තීස්මය තවදුරටත් පිළිනොගැණින. යොහන්ගෙන් බව්තීස්මය ලද අය නැවතත් ක්‍රිස්තියානි බව්තීස්මය ලැබුවෝය.

යොහන්ගේ පණිවිඩය ඉශ්‍රායෙල් ජනතාවගේ හදවත ඔවුන්ගේ මෙසියස්වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගැනීම පිණිස සූදානම් කළේය. බව්තීස්මය තුළින් ඔව්හු තමන්ගේ පාපවලට පසුතැවිලි වූ බවත් පැමිණෙන්නාවූ මෙසියස්වහන්සේව විශ්වාස කරන බවත් බාහිරයෙන් ප්‍රකාශ කළෝය.

යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීමෙන් පසුව ජනතාව පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයට බව්තීස්ම කළහ. එසේ කිරීමෙන් ඔව්හු තමුන් ශුභාරංචි පණිවිඩය පිළිගත් බව හා එමගින් ජීවිත වෙනස් වූ බව බාහිරයෙන් විදහා දැක්වූහ. යේසුස්වහන්සේ මෙම බව්තීස්මය ලැබීමට අණ කළසේක.

**එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා. (මතෙව් 28:19)**

ක්‍රිස්තියානි බව්තිස්මය සහ යොහන්ගේ බව්තිස්මය අතර වෙනස නම් ක්‍රිස්තියානි බව්තිස්මය පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද සම්පූර්ණ ආධිපත්‍යය යටතේ සිදුවිය යුතු වීමය.

යොහන්ගේ බව්තිස්මය මෙවන් අයුරින් සම්පූර්ණ ආධිපත්‍යය යටතේ සිදුකළ නොහැකි විය. එය පැමිණෙන්නාවූ මෙසියස්වහන්සේ පිළිබඳ ඇදහිල්ල ප්‍රකාශ කිරීමේ හා පසුතැවිලිවීමේ බව්තිස්මයක් පමණක් විය. ක්‍රිස්තියානි බව්තිස්මය දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කරන ලද මිදීමේ සැලසුම පිළිගනිමින් ප්‍රකාශ කරන්නාවූ බව්තිස්මයකි.

## බව්තිස්මයෙහිදී ප්‍රකාශිත වචන

වතුර බව්තිස්මය සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා අපි සාකච්ඡා කළ අතර එය වතුරෙහි ගිල්වීමෙන් සිදුකළ යුතු බව නිසැක ලෙස නිගමනය කළෙමු. තවත් එක් ප්‍රශ්නයක් ඇත. එනම්, බව්තිස්මය කරන අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතු වචන මොනවාද? යන්නය.

යේසුස්වහන්සේ ප්‍රකාශ කළේ “පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද” නාමයට බව්තිස්ම කරන්න කියාය. බොහෝ පූජකවරු මෙම වචන එයාකාරයෙන්ම බව්තිස්මයෙහිදී භාවිතා කරති. ශුද්ධ ලියවිල්ලට අනුව මෙය නිවැරදිය. එසේම බව්තිස්මයෙහිදී ස්වාමී වූ යේසුස්වහන්සේගේ නාමය පමණක් භාවිතා කිරීමද සෑහේ. ගෝලයෝ මෙලෙස කළ බව බයිබලය සඳහන් කරයි.

**මක්නිසාද ඔවුන් ස්වාමී වූ යේසුස්වහන්සේගේ නාමයට බව්තිස්මය කරනු ලැබුවෝය. (ක්‍රියා 8:16)**

**ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔවුන් බව්තිස්ම කරනු ලබන්ට අණ කළේය. (ක්‍රියා 10:48)**

**ඔව්හු ඒ අසා, ස්වාමී වූ යේසුස්වහන්සේගේ නාමයට බව්තිස්මය කරනු ලැබුවෝය. (ක්‍රියා 19:5)**

යේසුස්වහන්සේ තම ගෝලයන්ට බව්තිස්ම කිරීමෙහිදී නාමයන්ට (බහුවචන) බව්තිස්ම කරන ලෙස පැවසුයේ නැත. එතුමා පැවසුයේ “පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද” නාමයට (ඒකවචන) එනම්, ත්‍රිත්වයේ දෙවිඳුන්ගේ පුද්ගල නාමයට බව්තීස්ම කරන ලෙසය.

පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමය “ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්” යන නාමය වේ.

**මක්නිසාද උන්වහන්සේ තුළ (දේවත්වය තුළ) දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය. (කොලොස්සි 2:9)**

අප ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්ම ලබන බව බයිබලය උගන්වයි.

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බව්තිස්ම ලැබුවාවූ අපි සියල්ලන් උන්වහන්සේගේ මරණයට බව්තිස්මය ලැබූ බව නුඹලා නොදැන සිටින්නහුද? (රෝම 6:3)**

සමහර නිකායන් බව්තිස්මයෙහිදී පවසන්නාවූ වචන පිළිබඳ බොහෝ ප්‍රතිවිරුද්ධ මත දරයි. ඔව්හු එක් වදන් මාලාවක් නිවැරදි බවත් අනෙක වැරදි බවත් පවසති. එහෙත් බයිබලයට අනුව “ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයට” හෝ “පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයට” ක්‍රිස්තියානි බව්තිස්මය කිරීම පිළිගත හැකිය. මෙම වදන් මාලාවන් දෙකෙහි කිසිම ඝට්ටනයක් නැත. දෙකම ත්‍රිත්වය පිළිබඳව යොමුවීමකි.

එබැවින් බව්තීස්මයෙහිදී ඒකීයභාවය රැකීම සඳහාත් බයිබලයට එකඟවීම සඳහාත් පහත සඳහන් ප්‍රකාශනය භාවිතා කිරීමට සුදුසු සේ යෝජනා කරමු.

> "ඔබගේ ඇදහිල්ලේ ප්‍රකාශනයට අනුව පියවූ දෙවියන්වහන්සේගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබව ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළට බව්තීස්ම කරමි".

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. “බව්තිස්මය” අර්ථ දක්වන්න.

3. ක්‍රිස්තියානි බව්තිස්මය වැදගත් වූයේ ඇයි?

4. ක්‍රිස්තියානි බව්තිස්මය අපේක්ෂා කරන අය සපුරාලිය යුතු සුදුසුකම් හතර මොනවාද?

5. නව ගිවිසුමෙහි සඳහන් වන බව්තීස්ම විධි හතර මොනවාද?

6. නව ගිවිසුමෙහි පසුතැවිලි වී විශ්වාස කළාවූ පව්කරුවන් බව්තීස්ම කළේ කෙතරම් කාලයකට පසුවද?

7. යොහන්ගේ බව්තිස්මය හා ක්‍රිස්තියානි බව්තිස්මය අතර වෙනසක් පවතින බව සනාථ කිරීමට බයිබල් කොටසක් ලියන්න.

8. ළදරුවන්ට වතුර බව්තිස්මය ලබා දිය යුතුද?

9. ළදරුවකු හට වතුර බව්තීස්මය ලබා ගැනීමට අවසර දිය යුතු වයස සීමාව කුමක්ද?

______________________________________________________________________

10. පහත සඳහන් ප්‍රකාශය <u>සත්‍යය</u> නම්, එය ඉදිරියෙන් <u>ස</u> යන්නද <u>අසත්‍යය</u> නම්, <u>අ</u> යන්නද සඳහන් කරන්න.

අ. ඔබ බව්තීස්මය ලබා සිටියේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයට නම් ඔබ නැවතත් පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයට බව්තීස්ම කළ යුතු වේ ________

ආ. බයිබලයට අනුව "බව්තීස්ම" යන වදනේ අරුත වතුර ඉසීම නොව වතුරෙහි ගිල්වීමය _________

ඇ. ඔබ බව්තීස්මය ලැබීමට පෙර බව්තීස්මයෙහි අර්ථය අවබෝධ කරගත යුතුවේ ________

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදයෙහිදී අප බව්තීස්මය නම් ධර්මය ඉගෙන ගන්නෙමු. මෙම විෂය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරගැනීම සඳහා පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් අධ්‍යයනය කරන්න.

මතෙව් 3:6, 7, 11-16; 11:11-12; 14:2; 16:4; 20:22-23; 21:25

මාර්ක් 1:4, 5, 8, 9; 10:38-39; 11:30; 16:16

¨ක් 3:3,7,12,16,21; 7:29-30; 12:50; 20:4

යොහන් 1:25-28, 33; 3:22-23, 26; 4:1-2; 10:40

ක්‍රියා 1:5, 22; 2:38, 41; 8:12, 13, 16, 36, 38; 9:18; 10:37, 47-48; 11:16; 13:24; 18:8, 25; 19:3, 4, 5; 22:16

රෝම 6:3-4

1 කොරින්ති 1:13-16; 10:2; 12:13; 15:29

ගලාති 3:27

එපීස 4:5

කොලොස්සි 2:12

1 පේතෘස් 3:21

හෙබ්‍රෙව් 6:2

# හයවන පරිච්ඡේදය

## බව්තීස්මයන් පිළිබඳ දේව ධර්මය - II වැනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ සමහරක් පැහැදිලි කිරීමට
- ශුද්ධාත්ම බව්තිස්මය ලබන ක්‍රමය පැහැදිලි කිරීමට
- ශුද්ධාත්ම බව්තිස්මයෙහි බාහිර ශාරීරික සලකුණ නම් කිරීමට
- ශුද්ධාත්ම බව්තිස්මයෙහි සත්‍ය සාක්ෂි හඳුනාගැනීමට
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල සහ දීමනා හඳුනාගැනීමට

**ප්‍රධාන පදය:**

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යොරුසලමෙහි ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙහිදී ඔබ “බව්තීස්මය” යන වචනය අර්ථදැක්වීම හා නව ගිවිසුමෙහි සඳහන් බව්තිස්ම වර්ග හතරින් තුනක්ම අධ්‍යයනය කළෙහිය. ඔබ යේසුස්වහන්සේ අත් විඳි වේදනාවේ බව්තිස්මය පිළිබඳවත් යොහන් බව්තිස්තගේ බව්තිස්මය පිළිබඳවත් ක්‍රිස්තියානි වතුර බව්තිස්මය පිළිබඳවත් ඉගෙන ගත්තෙහිය. මෙම පරිච්ඡේදයෙහිදී හතරවන බව්තිස්මය වන ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය* පිළිබඳව අධ්‍යයනය කරමු.

### ශුද්ධාත්මයාණන්වහන්සේගේ පොරොන්දුව

යේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී ස්වර්ගයට යාමට පෙර තම ගෝලයන් හට වැදගත් උපදෙස් කිපයක් දුන්සේක.

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

යේසුස්වහන්සේ පොරොන්දු වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේය. මීට පෙර යේසුස්වහන්සේ මේ පිළිබඳව තම ගෝලයන්ට පවසා තිබුණි.

> **මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි. එවිට උන්වහන්සේ නුඹලා සමග සදාකල්ම සිටින පිණිස වෙන සැනසිලිකාරයෙකු නුඹලාට දෙනසේක.**
> **ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේ පිළිගන්ට ලෝකයාට බැරිය. මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය. මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටින සේක. නුඹලා තුළෙහි සිටින සේක.**
> **නුඹලා අනාථව නාරින්නෙමි. (යොහන් 14:16-18)**

---

* මෙම පරිච්ඡේදයෙන් ශුද්ධාත්මයාණන් පිළිබඳ ධර්මයෙහි හැඳින්වීම පමණක් වන අතර වැඩිදුර අධ්‍යයනය සඳහා හාවස්ට් ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සකසන ලද “ශුද්ධාත්මයාණන්ගේ සේවය” පොත අධ්‍යයනය කරන්න.

## ශුද්ධාත්මයාණන්ගේ පරමාර්ථය

ශුද්ධාත්මයාණන්ගේ පරමාර්ථ වලින් වැදගත් එකක් ඔබ දැන් කියවූ කොටසෙහි ඇතුළත් වේ. එනම්, ඇදහිලිවතුන්ට සහනය සපයන පිණිස වේ. බයිබලයෙහි මීට අමතරව ඇදහිලිවන්තයා හට ශුද්ධාත්මයාණෝ සපයන තව බොහෝ කාරණා සඳහන් වේ. ඒවානම්, ශුද්ධාත්මයාණෝ ඔබව,

- පූර්ණකොට බව්තීස්මය කරනු ඇත: ක්‍රියා 2:4
- ඔබ තුළ වාසය කරනු ඇත: 1 කොරින්ති 6:19
- ඔබව දෙවියන්වහන්සේ සමග හා අනෙකුත් ඇදහිලිවතුන් සමග එකමුතු කරනු ඇත: 1 කොරින්ති 6:17
- ඔබ උදෙසා යාච්ඤා කරනු ඇත: රෝම 8:26
- මගපෙන්වනු ඇත: යොහන් 16:13
- ඔබට හා ඔබ තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය පෙන්වනු ඇත: රෝම 5:5
- ඔබව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන කරනු ඇත: 2 කොරින්ති 3:18
- බයිබලීය සත්‍යයන් එළිදරව් කරදෙනු ඇත: 1 කොරින්ති 2:10
- උගන්වනු ඇත: යොහන් 14:26
- සැබෑ නමස්කාරය සඳහා ඔබව පොළඹවනු ඇත: යොහන් 4:24
- ශක්තිමත් කරනු ඇත: එපීස 3:16
- පුබුදුවනු ඇත: රෝම 8:11
- පවිත්‍ර කරනු ඇත: 2 තෙසලෝනික 2:13-14
- වෙනස් කරනු ඇත: තීතස් 3:5
- ඔබ වැරදි කරන කල ඒත්තු ගන්වනු ඇත: යොහන් 16:8-11
- ගැළවීමෙහි නිසැක භාවය ලබා දෙනු ඇත: රෝම 8:16
- නිදහස සපයා දෙනු ඇත: රෝම 8:2
- ඔබ තුළින් කථා කරනු ඇත: මාර්ක් 13:11
- දෙවියන්වහන්සේගේ බලය විදහා දක්වනු ඇත: 1 කොරින්ති 2:4
- සාක්ෂි දැරීමට බලය ලබාදෙනු ඇත: ක්‍රියා 1:8
- නමස්කාරය සඳහා පොළඹවනු ඇත: යොහන් 4:24

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩවිසීමෙහි සාක්ෂිය

ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේට බොහෝ පරමාර්ථ ඇත. එනමුත් කිතුනුවෙකු තුළ ශුද්ධාත්ම බව්තීස්මයෙහි ප්‍රධාන පරමාර්ථය හා සාක්ෂිය වනුයේ ඔහුව ශුභාරංචිය උදෙසා බලවත් සාක්ෂිකරුවෙකු කිරීමය.

> **ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. ... නුඹල පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම වීමේ සාක්ෂිය පේතෘස්ගේ ජීවිතයෙහි සැනෙකින්ම දක්නට ලැබුණි. පෙන්තකොස්ත දිනට පෙර පේතෘස් බියගුළු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොදන්නා බව පැවසිය. එහෙත් ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්මය ලද පසුව නැගී සිට බලවත් වූ ශුභාරංචි දේශනයක් ඉදිරිපත් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 3000ක් දෙනා ගැළවීම ලැබුවෝය. මුල් කාලීන සභාවෙහි ශුද්ධාත්මයාණන්ගේ බලය හේතුකොටගෙන ලොව මුළුල්ලේ ශුභාරංචිය ව්‍යාප්ත විය. ක්‍රියා පොත ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලවත් වූ ක්‍රියාවල සාක්ෂියෙහි වාර්තාවය.

## ශුද්ධාත්ම බව්තීස්මය

නව ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ හා සම්බන්ධව “බව්තීස්මය” යන්න යෙදී ඇති බයිබල් කොටස් හතක් තිබේ. මෙයින් හතරක් ශුභාරංචියෙහි සඳහන් පරිදි යොහන් බව්තීස්තගේ වදන් වේ.

> **මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තීස්ම කරමි. නමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙන යන්ටවත් නොවටිමි.**

**උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද නුඹලා බව්තීස්ම කරන සේක. (මතෙව් 3:11)**

**මම නුඹලා වතුරෙන් බව්තීස්ම කළෙමි. නුමුත් උන්වහන්සේ නුඹලා ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම කරන සේක. (මාර්ක් 1:8)**

**මම වනාහි වතුරෙන් බව්තීස්ම කරමි. නුමුත් මට වඩා බලවන්තයා එන සේක. උන්වහන්සේගේ වහන්වල පටිය මුදන්ටවත් මම නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද නුඹලා බව්තීස්ම කරන සේක. (ලූක් 3:16)**

**මම උන්වහන්සේ නැඳින සිටියෙමි. නුමුත් වතුරෙන් බව්තීස්ම කරන්ට මා එවූ තැනැන්වහන්සේම මට කථාකොට: ආත්මයාණන් යමෙකු පිට බැස නවතිනවා නුඹ දකින්නෙහිද ශුද්ධාත්මයෙන් බව්තීස්ම කරන්නේ උන්වහන්සේ යැයි මට කීසේක. (යොහන් 1:33)**

යේසුස්වහන්සේ ශුද්ධාත්ම බව්තීස්මය පිළිබඳ කථාකළ සේක.

**යොහන් වතුරෙන් බව්තීස්ම කළේය. නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්ම කරනු ලබනුනහුයයි කීසේක. (ක්‍රියා 1:5)**

කොර්නේලියස්ගේ නිවසෙහි සිදුවූ කාරණා පිළිබඳව පැවසීමෙහිදී පේතෘස්, යේසුස්වහන්සේගේ වචන උපුටා දැක්වීය.

**එකල: යොහන් වතුරෙන් බව්තීස්ම කෙළේය. නුඹලා ශුද්ධාත්මයෙන් බව්තීස්ම ලබන්නහුයයි ස්වාමින්වහන්සේ කී වචනය මට මතක් විය. (ක්‍රියා 11:16)**

පාවුල් ද ශුද්ධාත්මයාණන්වහන්සේ හා සම්බන්ධව “බව්තීස්මය” යන පදය භාවිතා කළේය.

**මක්නිසාද යුදෙව්වරු නොහොත් ග්‍රීක්වරු වෙත්වා, දාසයෝ නොහොත් නිර්දාසයෝ වෙත්වා, අපි සියල්ලෝම එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව. (1 කොරින්ති 12:13)**

“තුළට බව්තීස්මය කිරීම” යන පදය ශුද්ධාත්මය බව්තීස්මය පිලිබදව හා ක්‍රිස්තියානි වතුර බව්තීස්මය පිලිබදව සමානව යොදා තිබේ. මෙම සිදුවීම් දෙකෙහිදීම බව්තීස්මය, අභ්‍යන්තර තත්වයක් බාහිරයෙන් විදහා දැක්වීමක් පමණක් වේ.

පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණෝ ස්වර්ගයේ සිට පැමිණ ගෝලයන්ව සහමුලින්ම ශුද්ධාත්මයෙන් නැහැවූ සේක (බව්තීස්මය කළ සේක). පේතෘස් පවසනුයේ මෙම අත්දැකීම දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉටුවීමක් බවය. එනම්, “අවසාන කාලයෙහිදී ... මාගේ ආත්මය සියළු මාංශය කෙරෙහි වගුරුවන්නෙමි”. මෙම පොරොන්දුව ජෝවෙල් 2:28හි සඳහන් වේ.

## භෞතික සලකුණ

ශුද්ධාත්මයාණෝ පියවි ඇසින් දැකිය නොහැකිය. යේසුස්වහන්සේ එතුමාව සුළඟට සමාන කොට දැක්වූ සේක.

**හුළඟ කැමති තැනට ගසයි. එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේ ද කියාවත් කොතැනට යන්නේ කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේම යයි කීසේක. (යොහන් 3:8)**

සුළඟ පියවි ඇසින් දැකිය නොහැකි නමුත් එමගින් සිදුවන දෑ දැකීමට හා ඇසීමට හැකිය. සුළඟ හමන කල පොළොවෙහි දූවිලි ඇවිස්සෙයි, ගස් වැල් එක් දිශාවකට නැවෙයි, කොළ සෙලවෙයි, මුහුදේ රැළ ඝෝෂා කරයි, අහසේ වළාකුළු පාවී යයි. මේ සියල්ල සුළඟෙහි භෞතික සලකුණු වේ. ශුද්ධාත්මයාණෝ ද එලෙසම වේ. උන්වහන්සේ දැකිය නොහැකි නුමුත් එමගින් ඇතිවන බලපෑම් එනම්, ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාවෙහි ප්‍රතිඵල අපට දැකීමට, ඇසීමට පුළුවන.

සෙනග ශුද්ධාත්ම බව්තීස්මය ලද කල සිදුවූ කාරණා පිළිබඳව නව ගිවිසුමහි ස්ථාන තුනක සඳහන් කර ඇත.

## පෙන්තකොස්ත දින :

පෙන්තකොස්ත දින සිදුවූ කාරණා ක්‍රියා 2:2-4 දක්වා වාර්තාකොට තිබේ.

> **තද සුළඟක් හමන්නාක් මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන උන්නාවූ මුළු ගෙය පිරුණේය.**
> **ගිනි වැනි වූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය: එය ඔවුන් එක් එක්කෙනා කෙරෙහි පිහිටුණේය.**
> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථා කරන්ට පටන් ගත්තෝය. (ක්‍රියා 2:2-4)**

## කොර්නේලියස්ගේ නිවස :

පේතෘස්, කොර්නේලියස් නම් පුද්ගලයෙකුට හා ඔහුගේ නිවැසියන්ට ශුභාරංචිය දේශනා කළ විට සිදු වූ සිද්ධිය ක්‍රියා 10:44-46 දක්වා වාර්තාකොට තිබේ.

> **පේතෘස් මේ වචන කථා කරද්දී වචනය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පහළ වූ සේක. පේතෘස් සමග ආවාවූ චර්මඡේදිත ඇදහිලිවන්තයෝ අන්‍ය ජාතීන් කෙරෙහිත් ශුද්ධාත්ම දීමනාව වගුරුවනු ලැබූ බැවින් විස්මිත වූවෝය. මක්නිසාද ඔවුන් අන්‍ය භාෂා වලින් කථා කරනවාත් දෙවියන්වහන්සේ වර්ණනා කරනවාත් ඔවුන්ට ඇසුණේය.**
> **(ක්‍රියා 10:44-46)**

## එපීසයෙහිදී හැරීම ලැබූවෝ :

ක්‍රියා 19:6හි එපීසයෙහිදී ගැළවීම ලද පළමුවන කණ්ඩායමට සිදු වූ දෙය පැහැදිලි කරදෙයි.

> **පාවුල් ඔවුන් පිට අත් තැබූ කල ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණි සේක. ඔව්හු අන්‍ය භාෂාවලින් කථා කරමින් අනාගත වාක්‍ය කිවෝය (ක්‍රියා 19:6)**

මෙම සිදුවීම් තුනම සන්සන්දනය කර බැලීමේදී අපට පෙනී යන එක් පොදු භෞතික ලකුණක් ඇත. එනම්, ශුද්ධාත්ම බව්තීස්මය ලද සියලු දෙනාම අන්‍ය භාෂාවලින් කථාකළෝය. මීට අමතරව ශුද්ධාත්මයාණන්ගේ සුවිශේෂී වූ සලකුණු දැකිය හැකි වුවද එම අවස්ථා තුනෙහිම එකම ලෙසට සිදුවී නැත.

පෙන්තකොස්ත දින මහත් සුළඟක් හමන්නාක් මෙන් ශබ්දයක් ද දිව් වැනි වූ ගිනි දළු දැකිය හැකි විය. එහෙත් එම සලකුණු අනෙක් අවස්ථා දෙකෙහි දර්ශනය නොවීය.

එපීසයෙහිදී නව ඇදහිලිවන්තයෝ අනාගත වාක්‍ය පැවසූහ. එහෙත් මෙවන් දෙයක් පෙන්තකොස්ත දින හෝ කොර්නේලියස්ගේ නිවසෙහිදී සිදු වූ බවට වාර්තා වී නොමැත.

කොර්නේලියස්ගේ නිවසෙහිදී කොර්නේලියස් සහ ඔහුගේ නිවැසියෝ අත්දුටු ලෙස ගෝලයෝ නිරීක්ෂණය කළ එකම බාහිර සලකුණ නම් ඔව්හු අන්‍ය භාෂා වලින් කථා කිරීම පමණකි. මෙම භෞතික සලකුණ ඔව්හු ශුද්ධාත්මයාණන් බව්තීස්ම ලැබූ බවට සාක්ෂියක් ලෙස ගෝලයෝ පිළිගත්හ.

එබැවින් ඉහත සඳහන් ශුද්ධ ලියවිලි වාර්තා වලට අනුව කිසියම් පුද්ගලයෙකු ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් අන් භාෂා වලින් කථා කරයි නම්, ඔහු ශුද්ධාත්ම බව්තීස්මය ලබා ඇති බවට නිගමනය කරමු.

# අන් භාෂා

"අන් භාෂා" සලකුණ මනුෂ්‍යයන් දන්නාවූ භාෂාවක් විය හැකිය. පෙන්තකොස්ත දින සිදුවුයේ මෙය වේ. එනම්,

> **බලව, මේ කථාකරන සියල්ලෝ ගලීලයෝ නොවෙද්ද?**
> **අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් ඔවුන් කථාකරනවා කෙසේ අසමුද?**
> **(ක්‍රියා 2:7-8)**

"අන්‍ය භාෂාව" මිනිසා නොදන්නාවූ භාෂාවක් විය හැකිය. මෙය "නොදන්නා භාෂාවක්" යනුවෙන් හඳුන්වයි.

> **මක්නිසාද අන් භාෂාවකින් කථා කරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථා කරන්නේය: ඔහු ආත්මයෙන් රහස් කථා කරන නුමුත් කාටවත් තේරෙන්නේ නැත.**
> **(1 කොරින්ති 14:2)**

## අන් භාෂා දීමෙහි පරමාර්ථය

ශුද්ධාත්ම බව්තිස්මය තුළින් ඇදහිලිවන්තයෙකු හට ලැබෙන "අන් භාෂා" සඳහා බොහෝ පරමාර්ථ තිබේ" 1 කොරින්ති 14 වෙනි පරිච්ඡේදයෙහි අන් භාෂා දීමනාව ක්‍රියාත්මක වීමට හේතු කිහිපයක් හඳුන්වා දෙයි. ඒවා නම්,

- දෙවියන්වහන්සේට යාච්ඤාවක්: 2 පදය
- ස්වයං- වර්ධනය : ආත්මික වර්ධනය ගොඩනැංවීම හෝ ප්‍රචලිත කිරීම: 4 පදය
- පරිවර්තනය කළ විට එය සභාව දිරිගන්වයි: 12 පදය
- මැදිහත්කාරකම: 14 පදය (රෝම 8:26-27 බලන්න)
- නොඇදහිලිවන්තයන් හට සලකුණකි: 22 පදය
- අනාගතකිම සම්පූර්ණ වීමකි: 21 පදය (යෙසායා 28:11-12 බලන්න)
- ප්‍රශංසාව: 15, 17 පද

## එරෙහිවීම්

සමහරු අන්‍ය භාෂවෙන් කතාකිරීමේ සලකුණට විරෝධතාවය පාති. ඔව්හු ඉදිරිපත් කරන්නාවූ විරෝධතා කිහිපයක් පහත සඳහන් වේ.

### සෑම කිතුබැතියෙකුම සතුව ශුද්ධාත්මයාණෝ සිටිති :

සාමාන්‍යයෙන් සුලභව දක්නට ඇති පොදු විරෝධතාවයක් නම් සෑම කිතුබැතියෙකුම දෙවියන්වහන්සේ වෙතට හැරීම ලැබීමෙහිදී ශුද්ධාත්මයාණෝ ලබන බැවින් ශුද්ධාත්ම බව්තිස්මය නම් අමතර අත්දැකීමක් අවශ්‍ය නොවන බවය.
එනමුත් නව ගිවිසුමෙහි සඳහන් වන සත්‍ය ඇදහිලිවතුන් වූ ජනතාවගේ අත්දැකීම සලකා බලන්න.

ප්‍රේරිතයෝ තම පාප පිළිබඳව පසුතැවිලි වී යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බව විශ්වාස කළෝය. ඔව්හු උන්වහන්සේගේ මරණය, මිහිදන් කිරීම හා නැවත නැගිටීම පෞද්ගලිකව අත්දුටු අතර එයට සාක්ෂිකරුවෝ වූහ. එම කාරණා සත්‍ය බවට ඔව්හු පිළිගත්හ.
යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනුගාමිකයන්ට පැවසුයේ:

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවති සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

එලෙසම උන්වහන්සේ මෙසේ පැවසූ සේක: එනම්,

> **යොහන් වතුරෙන් බව්තිස්ම කළේය: නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්ම කරනු ලබන්නහුයයි කීසේක. (ක්‍රියා 1:5)**

පොරොන්දු වූ ප්‍රකාර ශුද්ධාත්ම බව්තීස්මය පෙන්තකොස්ත දින ඉටු විය.

> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථා කරන්ට පටන් ගත්තෝය. (ක්‍රියා 2:4)**

ප්‍රේරිතයෝ අවංක ඇදහිලිවන්තයන් වූ නමුත් පෙන්තකොස්ත දින දක්වා ඔව්හු ශුද්ධාත්මයෙන් පූර්ණ වී (බව්තීස්මය ලබා) නොසිටියහ. සමාරියේ සෙනග ශුභාරංචිය දේශනා කරනු අසා තිබුණි. ඔව්හු විශ්වාස කොට බව්තීස්මය ලබා තිබුණි. එහෙත් ඔව්හු ශුද්ධාත්මයාණෝ ලබා නොසිටියහ.

> **සමාරියයන් දෙවියන්වහන්සේ වචනය පිළිගත් බව යෙරුසලමේ සිටියාවූ ප්‍රේරිතයෝ අසා පේතෲස් සහ යොහන් ඔවුන් ළඟට යැවුවෝය.**
>
> **ඔව්හු එහි ගොස් ඔවුන්ට ශුද්ධාත්මය ලැබෙන ලෙස ඔවුන් උදෙසා යාච්ඤා කළෝය.**
>
> **මක්නිසාද ඔවුන් ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයට බව්තීස්ම කරනු ලැබුවා මිස. ශුද්ධාත්මය ඒ වනතුරු ඔවුන්ගෙන් කිසිවෙකු කෙරෙහි පැමිණ තිබුණේ නැත.**
>
> **ප්‍රේරිතයන් ඔවුන් කෙරෙහි අත් තැබූ කල ඔවුන්ට ශුද්ධාත්මය ලැබුණේය. (ක්‍රියා 8:14-17)**

සමාරියෙහි ජනතාව ගැළවීම ලැබුවේ පිලිප්ගේ සේවාව තුළිනි. ඔව්හු ශුද්ධාත්මය ලැබුවේ පේතෲස් සහ යොහන්ගේ සේවාව තුළිනි. ගැළවීම ලැබීම සහ ශුද්ධාත්මය බව්තීස්මය ලැබීම එකිනෙකට වෙනස් වූ අත්දැකීම් දෙකක් විය.

පාවුල් එපිසයට ගොස් එහි ජීවත් වූ "ගෝලයෝ" කණ්ඩායමක් හමු වූ අවස්ථාව ක්‍රියා 19:1-6 ට විස්තර කරයි. පාවුල් මෙහිදී ඇසූ පළමුවන ප්‍රශ්නය වූයේ: "ඔබ විශ්වාස කළ පසු ශුද්ධාත්මයාණෝ ලැබුවෝද?" යන්නය. මනුෂ්‍යයා ගැළවීම ලැබූ මොහොතේ ඔහුට ශුද්ධාත්මය ද ලැබේ නම්, පාවුල් මෙවැනි ප්‍රශ්නයක් ඇසීම මෝඩ කමක් වනු ඇත. එනමුත් ඔහු මෙලෙස ප්‍රශ්න කිරීම මගින් පැහැදිලි වන්නේ මනුෂ්‍යයෝ ශුද්ධාත්ම බව්තීස්මය නොලැබ, ක්‍රිස්තුන්වහන්සේගේ ඇදහිලිවතුන් වන බවය. එමෙන්ම යම් පුද්ගලයෙකු දෙවියන්වහන්සේ වෙතට හැරීම ලබන අවස්ථාවෙහිදීම ශුද්ධාත්ම බව්තීස්මය ලැබුවද, ඒවා වෙනස් අත්දැකීම් දෙකක් වේ.

ශුද්ධාත්මයාණන්ගේ සේවය සදාකාලයේ පටන් ක්‍රියාත්මක වී පවතී. පැරණි ගිවිසුමෙහි සඳහන් වන ලෙස ඉශ්‍රායෙල්හි ආත්මික නායකයන් මතට ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩිසේක. එලෙසම ශුද්ධාත්මයාණන්වහන්සේ පාපිෂ්ඨ මනුෂ්‍යයාව ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒම උදෙසා පව්කරුවා තුළ ක්‍රියා කරනු ඇත.

එහෙත් එය ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීමට වඩා වෙනස්ය. යේසුස්වහන්සේ ඒ බව පැහැදිලි කරමින් මෙලෙස පැවසූ සේක.

> **ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේය. උන්වහන්සේව පිළිගන්ට ලෝකයාට බැරිය: මක්නිසාද ලෝකයා උන්වහන්සේව දකින්නේවත් අඳුනන්නේවත් නැත. නුඹලා උන්වහන්සේව අඳුනන්නහුය: මක්නිසාද උන්වහන්සේ නුඹලා සමග නැවති සිටින සේක. (යොහන් 14:17)**

ශුද්ධාත්මයාණන්වහන්සේ ඒ වන විට ගෝලයන් සමග සිටි නුමුත් ගෝලයන් <u>තුළ</u> නොවූ සේක. ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වූයේ [බව්තීස්මය ලැබුයේ] පෙන්තකොස්ත දිනයේදීය. ශුද්ධාත්මයාණෝ පව්කරුවා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඇද ගැනීම සඳහා පව්කරුවා <u>සමග</u> සිටී. එහෙත් එය ඇදහිලිවන්තයා <u>තුළ</u> සිටීම හා කිසිසේත් සමාන නොවේ.

පැරණි ගිවිසුම් යුගයෙහි ඉශ්‍රායෙල්හි ආත්මික නායකයන් සමග ශුද්ධාත්මයාණන්වහන්සේ සිටිසේක. එහෙත් ඔවුන් තුළ නොවීය. පැරණි ගිවිසුම් යුගයේ සහ නව ගිවිසුම් යුගයේදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවාවන් අතර පවතින වෙනස මෙයයි.

## සියලු දෙනාම අන් භාෂා කථා කරයිද? :

අන්‍ය භාෂාවට එරෙහිව පවතින තවත් විරෝධතාවයක් හට ගන්නේ 1 කොරින්ති 12:30හි පාවුල්තුමා ඇසූ ප්‍රශ්නයක් වැරදි ලෙස වටහා ගැනීම හේතුවෙනි. එහිදී ඔහු විමසා සිටියේ, "සියල්ලෝම අන් භාෂා වලින් කථා කරන්නෝද?" කියාය. ඔහුගේ ප්‍රශ්නයට පිළිතුර වනුයේ, "නැත, සියල්ලෝම අන් භාෂා කථා නොකරති" යන්න වේ.

නමුත් පාවුල් මෙතනදී කථා කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්ගෙන් බව්තිස්මය ලැබීමේ අත්දැකීම පිළිබඳව නොවේ. මෙහිදී සාකච්ඡාවට භාජනය වූයේ සභාවෙහිදී ඇදහිලිවන්තයා හට භාවිතා කළ හැකි වූ ශුද්ධාත්ම දීමනා පිළිබඳවය.

> **ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති.**
>
> **මෙසේ දෙවියන්වහන්සේ පළමුකොට ප්‍රේරිතයන්ද දෙවනුව අනාගතවක්තෘවරුන්ද තුන්වෙනුව ගුරුවරුන්ද ඊළඟට ආශ්චර්ය කරන්නන්ද පසුව සුව කිරීමේ දීමනාද උපකාරද ආණ්ඩුවද නා නා වර්ග භාෂාද සභාවෙහි පිහිට වූ සේක. (1කොරින්ති 12:27-28)**

පාවුල් කථාකරනුයේ සභා සාමාජිකයන් විසින් භාවිතා කළ හැකි වූ දීමනාවන් පිළිබඳවය. මෙලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ සපයන්නාවූ එක් දීමනාවක් නම් "නා නා වර්ග භාෂාවන්ය". එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය යටතෙහි සභාව උදෙසා විශේෂ පණිවුඩ ලබා දීමට භාවිතා විය. ශුද්ධාත්ම බව්තිස්මයෙහිදී සියලුම දෙනා අන් භාෂා දීමනාවෙහි සලකුණ ලබන නමුත් සියලුම දෙනා හට "විවිධ භාෂාවන්" ගේ විශේෂ දීමනාව හිමි නොවේ.

## බිය :

සමහර ඇදහිලිවන්තයෝ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්මය ලැබීමෙහි අත්දැකීම නොසොයති. එයට හේතුව ඔවුන් තුළ පවතින බිය නිසා වේ. එම බිය නම් දෙවියන්වහන්සේගෙන් නොවන අත්දැකීමක් ඔවුන්ට ලැබේවි යන බියයි. බයිබලය පවසන්නේ:

> **ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා, එවිට නුඹලාට සම්බ වේ; තට්ටු කරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ;**
> **මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ; සොයන්නාට සම්බ වේ; තට්ටු කරන්නාට දොර හරිනු ලැබේ.**
> **නුඹලා අතරෙන් කවර මනුෂ්‍යයෙක් තමාගේ පුත්‍රයා රොටියක් ඉල්ලන්නේ නම්, ඔහුට ගලක් දේද? නොහොත් ඔහු මත්ස්‍යයෙකු ඉල්ලන්නේ නම්, ඔහුට සර්පයෙකු දේද? මෙසේ නපුරු වූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දන්නහු නම්, කොපමණ වැඩියෙන් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ නොදෙන සේක්ද? (මතෙව් 7:7-11)**

ඇදහිලිවන්තයෙක් දෙවියන්වහන්සේගෙන් දීමනාවක් අපේක්ෂා කළහොත් ඕනෑම යහපත් භෞමික පියෙකු සේම දෙවියන්වහන්සේත් එම ඇදහිලිවන්තයා හට නපුරු වූ දෙයක් සපයන්නේ නැත.

## හැඟීම්බර අත්දැකීමක් :

අන් භාෂාවට එරෙහිව පවතින තවත් චෝදනාවක් නම් එය හැඟීම්බර අත්දැකීමක් බවය. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්මය ලබා ඇති බොහෝ ඇදහිලිවන්තයෝ තමුන්ගේම හැඟීම් හා ප්‍රතික්‍රියා එම අත්දැකීමට මුසු කොට එය අවධාරණයට ලක් කරති. මිනිසා හැඟීම් සහිතවූ ජීවියෙකි. කෙනෙකු දෙවියන්වහන්සේ වෙතට හැරීම ලැබූ කල ඔහුගේ හැඟීම් ඉවත් වන්නේ නැත. ඔහුට තවදුරටත් ප්‍රීතිය හා ශෝකය දැනෙනු ඇත.

දෙවියන්වහන්සේ වෙතට හැරීම තුළින් මිනිසා මෙතෙක් පාපයේ පාලනයට යටත්ව පැවති හැඟීම් වලින් නිසහස් වේ. එම හැඟීම් දෙවියන්වහන්සේ නමස්කාර කරන පිණිස යොමු කරයි. ශුද්ධ ලියවිල්ලෙහි "ප්‍රීතිය" යන වචනය ශුද්ධාත්මයාණන්වහන්සේට ඉතා සමීප ලෙස සම්බන්ධ කර දක්වයි. ක්‍රියා 13:52හි අප දකින ආකාරයට "ගෝලයෝ වනාහි ප්‍රීතියෙන්ද ශුද්ධාත්මයෙන්ද පූර්ණ වූහ".

සමහර පුද්ගලයෝ ස්වභාවයෙන්ම අනෙක් අයට වඩා හැඟිම්බර බැවින් ශුද්ධාත්ම බව්තිස්මයෙහිදී ඔවුන් ලබන ප්‍රීතිය සමග ඉතාමත්ම හැඟුම්බර ලෙස ප්‍රතික්‍රියා කරති. ඔව්හු සමහරවිට ශබ්ද නැගීමටත් සිනහාසීමටත් සමහරවිට ශාරීරිකව කිසියම් වින්දනයක් ලැබීමටත් හැකියාව ඇත. එනමුත් මෙම හැඟුම්බර අත්දැකීම් ශුද්ධාත්ම බව්තිස්මය ලද බවට සලකුණක් නොවේ. ස්ථිර කරන්නාවූ සලකුණ නම් අන් භාෂාවෙන් කථා කිරීමය.

ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්මය ලැබීම සඳහා සිනහාවීම, කෑ ගැසීම හෝ නැටීම වැනි හැඟීම් විදහා දැක්වීම අවශ්‍ය නොවේ. කිසියම් පුද්ගලයෙකු මෙම අත්දැකීමෙහිදී ලබන්නාවූ ප්‍රීතිය සමග ප්‍රතික්‍රියා කරනුයේ කෙලෙසද කියා තීරණය වනුයේ ඔහුගේ ස්වාභාවික හැඟුම්බර ආකාරයට අනුකූලවය.

ශුද්ධාත්මයාණන්වහන්සේට ප්‍රීතිමත්ව හැඟිම්බරව ප්‍රතික්‍රියා දක්වන අයව අප විවේචනය නොකළ යුතුය. දෙවියන්වහන්සේ සමග බලවත් අත්දැකීම් ලද බොහෝ පුද්ගලයෝ හැඟිම්බර අන්දමින් ප්‍රතික්‍රියා දක්වා ඇති බව බයිබලය පවසයි. මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේ ඉදිරියෙහි වෙව්ලූ බවද මුනින් වැටුනු බවද මොරගැසූ බවද ප්‍රීතියෙන් පූර්ණ වූ බවද උන්වහන්සේ ඉදිරියෙහි නැටූ බවද සඳහන් වේ.

විවිධ ක්‍රීඩා ඉසව් නරඹන කල මිනිසුන්ගේ ප්‍රතිචාර දැක්වීම බැලීමට වටී. සමහරු කෑගසති, සිනහවෙති, උඩ පනිති, ක්‍රීඩාව පිළිබඳ තමාගේ උද්යෝගය විවිධාකාරයෙන් විදහා දක්වති. එසේනම් අපගේ ජීවිත වලට විවිධ පරමාර්ථ ඉටු කරන්නාවූ ශුද්ධාත්ම දීමනාව පිළිබඳ අප කෙතරම් උද්යෝගිමත් විය යුතු නොවෙමුද? ශුද්ධාත්මයාණන්වහන්සේ අපහට මහත් ප්‍රීතියක් ගෙන දේ: මුළු ලොවම ශුභාරංචියෙන් දිනාගන්නා පිණිස අවශ්‍ය බලයෙන් අපව සන්නද්ධ කරන සේක.

ගීතිකාකරු දාවිත් මෙයට එකඟ වේ. ඔහු දෙවියන්වහන්සේට නමස්කාරය ප්‍රීතියේ, මහත් හඬේ හා හැඟිම්බර කරුණක් ලෙස පෙන්වා දෙයි.

> **එව්, ස්වාමීන්ට ගායනා කරමු. අපේ ගැළවීමේ පර්වතයට ප්‍රීති ඝෝෂා පවත්වමු.**
> **අපේ ගැළවීමේ පර්වතයට ප්‍රීති ඝෝෂා පවත්වමු. ස්තුති දෙමින් උන්වහන්සේ ඉදිරියට පැමිණෙමු. ගීතිකාවලින් උන්වහන්සේට ප්‍රීති නාද පවත්වමු.**
> **මක්නිසාද ස්වාමින්වහන්සේ මහත් දෙවි කෙනෙක්ය. (ගීතාවලිය 95:1-3)**
>
> **හොරණෑ ශබ්දයෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්. රබානෙන් හා නැටීමෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්.**
> **වීණා තතින් හා නළාවෙන් උන්වහන්සේට ප්‍රශංසා කරව්.**
> **මහත් ශබ්ද දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව්. උස් රාව් දෙන අත්තලින් උන්වහන්සේට ප්‍රශංසා කරව්.**
> **හුස්ම ඇති සියල්ලෝම ස්වාමින්ට ප්‍රශංසා කෙරෙත්වා. ස්වාමින්ට ප්‍රශංසා කරව්.**
> **(ගීතාවලිය 150:3-6)**

ශුද්ධාත්මය බව්තිස්මය ඔබව නුසුදුසු දෙයක් කිරීමට හෝ ඔබගේ පාලනයෙන් තොර යමක් කිරීමට සලස්වයි කියා ඔබ බිය විය යුතු නැත. බයිබලය පවසන ආකාරයට

> **ධර්මවාක්‍යය කියන්නන්ගේ ආත්ම ධර්මවාක්‍ය කියන්නන්ට යටත්ව තිබේ. (1 කොරින්ති 14:32)**

මෙහි අර්ථය නම් දෙවියන්වහන්සේ ලබා දෙන ඕනෑම දීමනාවක් එය භාවිතා කරන පුද්ගලයාගේ ප්‍රඥාවන්ත පාලනයට යටත්ව පවතින බවය. දෙවියන්වහන්සේ කිසිවිටක නුසුදුසු දෙයක් නොකරන සේක. එයට හේතුව නම්,

> **මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය.**
> **(1 කොරින්ති 14:33)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

යේසුස්වහන්සේ තම අනුගාමිකයන් හට ලෝකාන්තිමය දක්වා ශුභාරංචි පණිවිඩය ගෙන යාමේ වගකීම පවරා ගිය සේක. මෙම කාර්යය සම්පූර්ණ කිරීමට ශුද්ධාත්මයාණෝ බලය සපයා දෙනු

ඇත. මෙම "බලයෙහි" එක් අංශයක් වනුයේ ඔවුන්ට කාර්යක්ෂම අයුරින් සේවය කිරීම සඳහා ශුද්ධාත්මයාණෝ ඇදහිලිවතුන්ට ලබාදෙන විශේෂ දීමනාවන්ය.

මෙම ආත්මික දීමනා ස්වභාවික තලෙන්ත නොවේ. ස්වභාවික දක්ෂතා හෝ තලෙන්ත කෙනෙකුගේ උපතේදී උරුම කරගනෙ එන හෝ ජීවිත කාලයේදී ස්වභාවික ප්‍රයත්නයක් මගින් සංවර්ධනය කරගන්නා හැකියාවන්ය. එම ස්වාභාවික හැකියාවන් ද සභාවෙහි සේවාව සඳහා භාවිත කළ හැකිය. එනමුත් එම හැකියාවන් ආත්මික දීමනාවලට වෙනස් වේ.

ආත්මික දීමනා පැමිණෙන්ගේ ශුද්ධාත්මයාණන් තුළිනි. ඒවායෙහි පරමාර්ථය නම්,

> **එසේ දුන්නේ ඇදහීමේද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත් සම්පූර්ණ පුරුෂ කමටත් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත්;**
> **අප සියල්ලන් පැමිණෙන තෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය.**
> **තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන් ද ප්‍රයෝගයෙන් ද රැවටිලි සහිත උපාමාරුවෙන් ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඇත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින් හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. (එපීස 4:12-15)**

මෙම කොටසින් එළිදරව් කර දෙන පරිදි ආත්මික දීමනා තිබෙන්නේ :

- ශුද්ධවන්තයින් සම්පූර්ණ කරන පිණිස
- සේවයෙහි ක්‍රියාවන් ව්‍යාප්ත කරන පිණිස
- කිතුබැතියාව හා සභාව වර්ධනය වන පිණිසත්ය.

මෙම දීමනාවන් ලැබීමේ අවසාන අරමුණ වනුයේ අපි සියලු දෙනා:

- ඇදහිල්ලෙහි එකමුතුවීම
- ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපගේ දැනුම වර්ධනය කරගැනීම
- ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආකෘතිය ලෙසට ගෙන සර්ව සම්පූර්ණත්වයට සංවර්ධනය වීම
- ස්ථායි තත්වයට එනම්, බොරු ඉගැන්වීම් වලින් රැවටීමට ලක් නොවීම
- ක්‍රිස්තුස්වහන්සේ තුළ ආත්මිකව පරිනත වීම

සියලුම දීමනා නූතන ඇදහිලිවන්තයන් උදෙසා නොවන බව සමහර සභා වල උගන්වති. ඔව්හු උගන්වන ආකාරයට භාස්කම් කිරීම හා අන් භාෂාවලින් කතාකිරීම වැනි ප්‍රබල දීමනා අයිති මුල් කාලීන සභාවට පමණක් ලෙසිනි.

ඔවුන්ගේ චෝදනාවට ඇති පිළිතුර මෙයයි: ස්වාමින්වහන්සේ සේවා දීමනා සභාවට කිසියම් පරමාර්ථයන් ඉටුකිරීම උදෙසා දුන්සේක. එලෙස දුන්නාවූ පරමාර්ථයන් සම්පූර්ණ වනතුරු උන්වහන්සේ එම දීමනා ආපසු නොගන්නා සේක. අපගේ සියලුම සභා එකමුතු කමින් සිටීද? අපට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව සම්පූර්ණ දැනීමක් තිබේද? අපි සියලු දෙනාම සම්පූර්ණත්වයෙන්, ස්ථායි ලෙස පරිණත භාවයෙන් ගමන් කරන්නේද? අප අපගේ සභාවලට බොරු ඉගැන්වීම කාවැද්දීම සම්පූර්ණයෙන්ම නතර කොට තිබේද?

මෙම සියලු ප්‍රශ්න සඳහා පිළිතුර "නැත" යන්නය. සේවා දීමනාවල් දීමට හේතු වූ පරමාර්ථයන් සියල්ලම ඉටුවී අවසාන නැත. එනිසා දෙවියන්වහන්සේ එම පරමාර්ථ ඉටුකිරීම සඳහා දුන්නාවූ සියලුම දීමනා අද ද ක්‍රියාත්මකව පවතී. එසේම බයිබලය පවසන පරිදි "දෙවියන්වහන්සේගේ දීමනාද කැඳවීමද වෙනස් නොවන්නේය" (රෝම 11:29). එහි අර්ථය නම්, දෙවියන්වහන්සේ තමාගේ මනස වෙනස් කරගෙන තමා දුන්නාවූ කැඳවීමක්වත් දීමනාවක්වත් නැවත නොගන්නා බවය.

ශුද්ධාත්මයාණන්වහන්සේ සෑම ඇදහිලිවන්තයෙකු හටම අවම වශයෙන් එක් ආත්මික දීමනාවක්වත් දෙන සේක (1 පේතෘස් 4:10; එපීස 4:7; 1 කොරින්ති 12:7). එනිසා අප සතු ආත්මික දීමනාව සොයාගෙන එය සභාවෙහිදී භාවිතා කිරීම වැදගත් වේ. ශුද්ධාත්මයාණන් තුළින් ඇදහිලිවතුන් හට

සැපයෙන ආත්මීන දීමනා පිළිබඳ පැහැදිලි කරදෙන බයිබල් කොටස් නම්, රෝම 12:1-8, 1 කොරින්ති 12:1-31, එපීස 4:1-16 සහ 1 පේතෘස් 4:7-11 වේ*.

## ශුද්ධාත්මයාණන්ගේ ඵල

බයිබලයෙහි "ආත්මික ඵල" නමින් හඳුන්වන්නාවූ ගුණාංග ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයා තුළ වර්ධනය කරදෙයි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල යනු ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළින් පෙන්නුම් වන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවය වේ. දෙවියන්වහන්සේ අපේක්ෂාව නම්, සියලුම ඇදහිලිවන්තයන්ගේ ජීවිත තුළින් සියලුම ඵල විදහා දැක්වෙනු දකින්නට ලැබීමය.

> **නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්- ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම,**
> **මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. (ගලාති 5:22-23)**

ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ මෙම ගුණාංග ජර්ධනය කරවීම ශුද්ධාත්මයාණන්වහන්සේගේ තවත් එක් ක්‍රියාවකි.

## ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගැනීම

ශුද්ධාත්ම බව්තිස්ය හිමිකරගැනීම සඳහා බයිබලීය උපදෙස් මාලාවක් පහතින් දැක්වේ.

### පසුතැවිලිවී බව්තීස්මය ලබාගන්න :

මෙය ඔබව ආත්මිකව යමක් හිමිකරගැනීමේ තත්වයක පිහිටුවාලයි.

> **පේතෘස්, නුඹලා සියල්ලෝම පසුතැවිලිව පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබාපල්ලා. එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

### එය ඔබට බව විශ්වාස කරන්න :

> **මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමී වූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවනසේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත් යයි කියා ... (ක්‍රියා 2:39)**

### එය හිමිකරගැනීමට ආශා වන්න :

> **මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස්වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින්: යමෙකුට පිපාස ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ.**
> **මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක.**
> **උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. මක්නිසාද යේසුස්වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණි බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙන ලද්දේය. (යොහන් 7:37-39)**

### එය දීමනාවක් බව වටහාගන්න :

---

* භාවස්ට් ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් ප්‍රකාශිත "ශුද්ධාත්මයාණන්ගේ සේවය" නම් පොතෙහි දීමනා හා ඵල පිළිබඳව සවිස්තරව උගන්වයි. එය ඇදහිලිවතුන් හට තමාගේ දීමනා සොයා ගැනීමටත් ඒවා වර්ධනය කරගැනීමටත් එමගින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහිදී කාර්යක්ෂම අයුරින් ක්‍රියා කිරීමටත් උපකාර වන අයුරින් ලියැවී ඇත.

ශුද්ධාත්මයාණන්වහන්සේ දැනටම දී ඇත. එතුමා පෙන්තකොස්ත දින සභාවට දෙන ලදි. එය දීමනාවක් බැවින් එය හිමිකරගැනීමට ඔබ කිසිවක් කළ යුතු නොවේ.

> **... ශුද්ධාත්ම දීමනාව ... (ක්‍රියා 2:38)**
>
> **නුඹලාගෙන් මේක පමණක් දැනගන්ට කැමැත්තෙමි. එනම්, නුඹලා ආත්මයාණන්වහන්සේ ලැබුවේ ව්‍යවස්ථාවේ ක්‍රියා කරණකොටගෙනද? නොහොත් ඇදහිල්ලේ පණිවිඩය කරණකොටගෙනද? නුඹලා මෙපමණ අඥානද?**
> **ඉඳින් නුඹලාට ආත්මයාණන්වහන්සේ දෙන්නාවූ නුඹලා අතරෙහි ආශ්චර්යයන් කරන්නාවූ තැනැන්වහන්සේ එසේ කරන්නේ ව්‍යවස්ථාවේ ක්‍රියාවලින්ද? නොහොත් ඇදහිල්ලේ පණිවිඩය කරණකොටගෙනද?**
> **මෙසේ කළේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ආබ්‍රහම්ගේ ආශිර්වාදය අන්‍යජාතීන් කෙරෙහි පැමිණෙන පිණිසත් ඇදහිල්ල කරණකොටගෙන අප විසින් ආත්මයාණන්වහන්සේ නැමති පොරොන්දුව ලබාගන්නා පිණිසත්ය. (ගලාති 3:2, 5, 14)**

ශුද්ධාත්ම දීමනාව පිළිබඳව දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කිරීමට අරඹන්න.

## දෙවියන්වහන්සේට අවනත වන්න :

ඔබ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් එතුමාව නමස්කාර කිරීමේදී ඔබ හට ශුද්ධාත්මයාණන් දෙන භාෂාව කතා කරන්ට බය නොවන්න. ඔබ හඬ නගා දෙවියන්වහන්සේව ප්‍රශංසා කරන අතර පළමුව ඔබගේ තොල් ගොත ගසන්නාක් මෙන් දැනේවි. එවිට ඔබගේ දිව ශුද්ධාත්මයාණන්වහන්සේට අවනත වීමට ඉඩහරින්න. උන්වහන්සේ ඔබ තුළින් ඔබ නොදන්නාවූ භාෂාවක් කතා කරාවි. මෙය ශුද්ධාත්ම බව්තිස්මයෙහි සංකේතය වේ.

> **එසේය, උන්වහන්සේ වියවුල් තොල්වලින් ද වෙන භාෂා වලින් ද මේ සෙනගට කථා කරනවා ඇත. (යෙසායා 28:11)**
>
> **ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට දුන් පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන් ගත්තෝය. (ක්‍රියා 2:4)**

## අනෙකුත් ඇදහිලිවන්තයන්ගේ යාච්ඤාව අයැද සිටින්න :

අත් තැබීම මගින් (ක්‍රියා 8, 9, 19) හෝ අත් තැබීම නොමැතිව (ක්‍රියා 2, 4, 10) ශුද්ධාත්මය ලැබිය හැකිය. මෙම බයිබල් කොටස් කියවා බලා ආත්මයෙන් පූර්ණ වූ ඇදහිලිවතුන් හට ඔබට ශුද්ධාත්ම බව්තිස්මය ලැබීමට උපකාර කළ හැක්කේ කෙසේදැයි ඉගෙන ගන්න.

## ස්වයං-පරීක්ෂණය

1. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ පරමාර්ථ කිහිපයක් මොනවාද?

2. ශුද්ධාත්ම බව්තීස්මය ලැබීම සඳහා උපදෙස් හයක් නම් කරන්න.

3. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

4. ශුද්ධාත්ම බව්තීස්මය ලැබීමේ බාහිර සලකුණ කුමක්ද?

5. ශුද්ධාත්ම බව්තීස්මය ලබා ඇති බව ඔප්පු වන සත්‍ය සාක්ෂිය කුමක්ද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට බයිබල් පාඨයක් ගෙනහැර දක්වන්න.

6. ආත්මයාණන්ගේ “ඵල” යන පදයෙහි අර්ථය කුමක්ද?

7. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි තිබිය යුතු ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල නවය නම් කරන්න.

8. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවල පරමාර්ථ කිහිපයක් මොනවාද?

9. මෙම ප්‍රකාශය අසත්‍ය මන්ද? "ශුද්ධාත්මයාණන්වහන්ගේ සියලුම දීමනා නූතන යුගයේ අපට නොවේ, සමහර දීමනා අයත් වූයේ මුල් කාලීන සභාවට පමණකි"

10. අන් භාෂා සලකුණට එරෙහිව ජනතාව අතර පවතින ප්‍රධාන විරෝධතා හතරක් නම් කරන්න.

11. ශුද්ධ ලියවිලි පදනම මත මෙම එක් විරෝධතාවයක්වත් පිළිගත හැකිද?

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදයෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තීස්මය ඇසුරින් ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව අධ්‍යයනය කළෙමු.

පහත සඳහන් සැකිල්ලට අනුව ඔබගේ අධ්‍යයනය ඉදිරියට ගෙන යන්න.

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ ස්වභාවය

| | |
|---|---|
| - උන්වහන්සේට දෙවියන්වහන්සේ යයි නම් කරනු ලැබේ: | ක්‍රියා 5:3-4 |
| - සර්ව වාසි- උන්වහන්සේ සැමතැනම වැඩ වසන සේක: | ගීතා 139:7 |
| - සර්වඥ- උන්වහන්සේ සැම දෙයක්ම දන්නා සේක: | 1 කොරින්ති 2:10-11 |
| - සර්ව බලධාරී- උන්වහන්සේ සියලු බලයෙන් යුක්තය: | ක්‍රියා 1:8 |
| - සදාකාලික - උන්වහන්සේ සදාකාලයටම පවති: | හෙබ්‍රෙව් 9:14 |
| - පියාණන්වහන්සේ, පුත්‍රයාණන් හා සමානය: | මතෙව් 3:16-17 |

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ පුද්ගල භාවය

| | |
|---|---|
| - උන්වහන්සේ සතුව මනසක් ඇත: | රෝම 8:27 |
| - එම මනස ප්‍රඥාවන්තය: | 1 කොරින්ති 2:10-11 |
| - උන්වහන්සේ මිනිසාගේ මනස සොයාබලන සේක: | 1 කොරින්ති 2:10 |
| - උන්වහන්සේ සතුව කැමැත්තක් පවතී: | 1 කොරින්ති 12:11 |
| - උන්වහන්සේ අවසර දීම මෙන්ම නොදීම තුළින් මග පෙන්වන සේක: | ක්‍රියා 16:6-7, 10 |
| - උන්වහන්සේ කථාකරන සේක: | ක්‍රියා 8:29 |
| - උන්වහන්සේ ප්‍රේමකරන සේක: | රෝම 15:30 |
| - උන්වහන්සේ දුක්වන සේක: | එපීස 4:30 |
| - උන්වහන්සේ මැදිහත්කාරකම් කරන සේක: | රෝම 8:26 |

## සංවේදී ස්වභාවය

ශුද්ධාත්මයාණන්වහන්සේ ඉතා සංවේදී ස්වභාවයක් උසුලයි. එබැවින් අප ශුද්ධාත්මයාණන්වහන්සේට පහත සඳහන් කාරණා නොකිරීමට වගබලා ගත යුතුය.

| | |
|---|---|
| - ශුද්ධාත්මයාණන්වහන්සේට බොරු කීම: | ක්‍රියා 5:3-4 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේට ප්‍රතිරෝධය දැක්වීම: | ක්‍රියා 7:51 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේව නිහඬ කිරීම: | 1 තෙසලෝනික 5:19 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේට දුක්දීම: | ගීතාවලිය 78:40 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේට අවමන් කිරීම: | හෙබ්‍රෙව් 6:4-6 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේ පීඩාවට පත්කිරීම: | යෙසායා 63:10 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේට අපහාස කිරීම: | මතෙව් 12:31-32 |

## ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති නාම හා නිල

ශුද්ධාත්මයාණන්වහන්සේට දී ඇති නාම හා නිල මගින් එතුමාගේ ස්වභාවය පිළිබඳවත් පරමාර්ථ පිළිබඳවත් ඔබ හට වැඩි අවබෝධයක් ලැබෙනු ඇත. උන්වහන්සේ හඳුන්වා ඇත්තේ:

| | |
|---|---|
| - දෙවියන්වහන්සේගේ ආත්මය: | 1 කොරින්ති 3:16 |
| - ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මය: | රෝම 8:9 |
| - සදාකාලික ආත්මය: | හෙබ්‍රෙව් 9:14 |
| - සත්‍යතාවයේ ආත්මය: | යොහන් 16:13; 14:26 |
| - අනුග්‍රහයේ ආත්මය: | හෙබ්‍රෙව් 10:29 |
| - ජීවනයේ ආත්මය: | රෝම 8:2 |
| - මහිමයේ ආත්මය: | 1 පේතෘස් 4:14 |
| - ප්‍රඥාවේ හා එළිදරව්වේ ආත්මය: | එපීස 1:17 |

- සැනසිලිදායකයාණෝ: යොහන් 14:26
- පොරොන්දුවේ ආත්මය: ක්‍රියා 1:4-5
- ශුද්ධකමේ ආත්මය: රෝම 1:4
- ඇදහිල්ලේ ආත්මය: 2 කොරින්ති 4:13
- පුත්‍රකමට සාදාගැනීමේ ආත්මය: රෝම 8:15

## ශුද්ධාත්මයාණන්ගේ සංකේත

පහත සඳහන් සංකේත බයිබලයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ සංකේතවත් කිරීමට භාවිතා කොට තිබේ.

- පරවියා යොහන් 1:32
- තෙල් ලූක් 4:18
- වතුර යොහන් 7:37-39
- මුද්‍රාව එපීස 1:13
- සුළඟ යොහන් 3:8
- ගංගාව යොහන් 7:38-39
- ගින්න : සංකේතවත් කරනුයේ,
    - දෙවියන්වහන්සේගේ අභිමුඛය: නික්මයාම 3:2
    - අනුමැතිය: ලෙවීකථාව 9:24
    - ආරක්ෂාව: නික්මයාම 13:21
    - පවිත්‍රත්වය: යෙසායා 6:1-8
    - ශුද්ධාත්ම දීමනාව: ක්‍රියා 2:3
    - විනිශ්චය හෙබ්‍රෙව් 12:29

# හත්වන පරිච්ඡේදය

## අත් තැබීම

### අරමුණු

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- අත් තැබීම අර්ථ දැක්වීමට
- පරණ ගිවිසුමෙහි අත් තැබීම සඳහාවූ පරමාර්ථය
- අලුත් ගිවිසුමෙහි අත් තැබීම සඳහාවූ පරමාර්ථය
- අත් තැබීමේ සේවය කිරීමට තිබිය යුතු සුදුසුකම් නම් කිරීමට

### ප්‍රධාන පදය

> **එහෙයින් ඔවුහු ස්වාමීන්වහන්සේ තුළ නිර්භීතලෙස කථා කරමින් බොහෝ කලක් නැවතී සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් හාස්කම්ද පුදුමද කරවමින් ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දරූ සේක.** (ක්‍රියා 14:3)

## හැඳින්වීම

ක්‍රිස්තියානි ඇදහිල්ලේ අත්තිවාරම් වල හතරවන මූලධර්මය නම් අත් තැබීමය. අත් තැබීම නම් එක් පුද්ගලයෙකු විශේෂිත ආත්මික පරමාර්ථයකින් යුතුව තවත් පුද්ගලයෙකුගේ සිරුර මත තම අත් තැබීම වේ. මෙම අත් තැබීම සාමාන්‍යයෙන් යාච්ඤාව හෝ අනාගත වාක්‍ය පැවසීම සමඟ මුසු වේ.

## පැරණි ගිවිසුම් වාර්තාව

පැරණි ගිවිසුමෙහි පහත සඳහන් පරමාර්ථ සඳහා අත් තැබීම සිදුකරන ලදී. ඒවා නම්:

1. ආත්මික ආශිර්වාදය හෝ ආධිපත්‍ය බලය පැවරීම සඳහා (පැවරීම යනු අත් තබන පුද්ගලයාගෙන් කිසියම් ආත්මික දෙයක් අත් තැබීමට ලක්වූ පුද්ගලයා කෙරෙහි ගලා යන බවය.)

2. දෙවියන්වහන්සේගෙන් ලැබූ කිසියම් ආශිර්වාදයක් හෝ ආධිපත්‍ය බලයක් ප්‍රසිද්ධියේ සනාථ කිරීම පිණිස.

3. විශේෂ සේවාවක් සඳහා දෙවියන්වහන්සේට කැප කිරීම පිණිස.

මෙම අත් තැබීමේ පරමාර්ථයන් පැරණි ගිවිසුමෙහි උදාහරණ තුනකින් පෙන්වා දිය හැක.

### ඉශ්‍රායෙල්

ආත්මික ප්‍රයෝජනයක් උදෙසා අත් තැබීම සිදුකළ පළමුවෙනි වාර්තාව සඳහන් වනුයේ උත්පත්ති 48 හිය. යෝසෙප් තමාගේ පුතුන් දෙදෙනා වන ඒප්‍රායිම් හා මනස්සේ තම පියාගෙන් ආශිර්වාද ලබන ලෙස ඔහු වෙතට රැගෙන ආවේය.

> **ඉශ්‍රායෙල් තමාගේ දකුණත දිගුකොට බාලයා වූ ඒප්‍රායිම්ගේ ඉස පිට ද මනස්සේ කුළුදුලා නමුත් තමාගේ වමත මනස්සේගේ ඉස පිටද දැනගනම අත් හරවමින් තැබුවේය.**
> **(උත්පත්ති 48:14)**

යාකොබ් ඔහුගේ ආශිර්වාදය තම මුණුබුරන් දෙදෙනා වෙත අත් තැබීම මගින් පවරා දුන්නේය.

## ලෙවීවරු :

ලෙවීවරු දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල් සභාවෙහි ආත්මික නායකයන් ලෙස සේවය කිරීමට කැපකොට තබන ලදී. මෙම නිලය තුළ ඔවුහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි ජනතාව නියෝජනය කළහ. ලෙවීවරු පිට ජනතාව අත් තැබීමෙන් පෙන්නුම් කරනු ලැබුවේ දෙවියන්වහන්සේ ඉදිරියෙහි ලෙවීවරු සතු ආධිපත්‍ය බලය සනාථ කිරීමකි.

> **නුඹ ලෙවීවරුන් ස්වාමින්වහන්සේ ඉදි×පිට කැඳවා ගත යුතුය. ඉශ්‍රායෙල් පුත්‍රයෝද තමුන්ගේ අත් ලෙවීවරුන් පිට තබත්වා. (ගණන් 8:10)**

## මෝසෙස් :

මෝසෙස් තමාගේ මිහිපිට සේවාව අවසාන කිරීමට ආසන්නව සිටියදී, ඉශ්‍රායෙල් උදෙසා නව නායකයෙක් පත් කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

> **ස්වාමින්වහන්සේ මෝසෙස්ට කථා කොට ආත්මය ඇති මනුෂ්‍යයෙක් වන නූන්ගේ පුත්‍රවූ යෝෂුවා කැඳවා නුඹේ අත ඔහු පිට තබන්න;**
> **පූජකවූ එලෙයාසර් සහ මුළු සභාව ඉදිරියෙහි ඔහු සිටුවා ඔවුන්ගේ ඇස් ඉදිරියෙහි ඔහුට අණක් දීපන්න.**
> **ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාව ඔහුට කීකරුවන පිණිස නුඹට ඇති ගරුතරකමෙන් කොටසක් ඔහු කෙරෙහි තබාපන්න.**
> **මෝසෙස් ස්වාමින්වහන්සේ තමාට අණකළ ලෙස කොට යෝෂුවා කැඳවාගෙන පූජකවූ එලෙයාසර් සහ මුළු සභාව ඉදිරියෙහි සිටුවා, තමාගේ අත් ඔහු පිට තබා ස්වාමින්වහන්සේ මෝසෙස් ලවා කියෙවූ ලෙස අණක් ඔහුට දුන්නේය. (ගණන් කථාව 27:18-20, 22-23)**

මෙලෙස යෝෂුවා මත අත් තැබීමෙහි ප්‍රතිඵලය ද්විතිය කතා පොතෙහි සඳහන් වේ.

> **මෝසෙස් තමාගේ අත් නූන්ගේ පුත්‍රවූ යෝෂුවා පිට තැබූ බැවින් ඔහු ප්‍රඥාවේ ආත්මයෙන් පූර්ණ වූයේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝද ඔහුට කීකරුවී ස්වාමින්වහන්සේ මෝසෙස්ට අණ කළ ලෙස කළෝය. (ද්විතිය කථාව 34:9)**

මෝසෙස් යෝෂුවා මත අත් තැබීම යෝෂුවාට මෙන්ම මුළු ඉශ්‍රායෙල් ජන සමූහයටම වැදගත් විය. මෙම ක්‍රියාව තුළින් මෝසෙස් හට දෙවියන්වහන්සේ දී තිබූ ප්‍රඥාව හා ගෞරවයෙන් කොටසක් යෝෂුවාට පවරා දුනි. එසේම මෝසෙස්, ඉශ්‍රායෙල් ජනතාව කෙරෙහි දෙවියන්වහන්සේ තෝරාගත් නව නායකයා යෝෂුවා බව සනාථ කළේය.

# නව ගිවිසුම් වාර්තාව

නව ගිවිසුම අත් තැබීමේ පොදු පරමාර්ථ පහක් ඉදිරිපත් කරයි.

## අධි ස්වභාවික සලකුණු :

යේසුස්වහන්සේ තම සේවයෙහි අත් තැබීම සිදුකළ සේක.

> **එහිදී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුව කළා මිස වෙන කිසි බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට නොහැකි වූයේය. (මාර්ක් 6:5)**

**ඉර බසින කල අනේකාකාර රෝග වලින් පීඩිතවූ රෝගකාරයන් ඇති සියල්ලෝම උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනාවෝය. උන්වහන්සේ ඔවුන් එකිනෙකා පිට අත් තබා, ඔවුන් සුවපත් කළ සේක.** (ලූක් 4:40)

**එකෙණෙහිම ඈ කෙළින් වී දෙවියන්වහන්සේට ප්‍රශංසා කළාය.** (ලූක් 13:13)

යේසුස්වහන්සේ තම මිහිපිට සේවය අවසාන කරමින් ගෝලයන්ට කළ කථාවෙහිදී ශුභාරංචිය හා බැඳුනු අධි ස්වභාවික සලකුණු නම් කළ සේක.

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්; ඔවුහු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නෝය. අන් භාෂාවලින් කථා කරන්නෝය; සර්පයින් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුහු සුවය ලබන්නෝයයි කීසේක.** (මාර්ක් 16:17-18)

මෙහි සඳහන් වු එක් අධි ස්වභාවික සළකුණක් නම් අත් තැබීම මගින් දෙවියන්වහන්සේ රෝගීන් සුව කිරීම හා භාස්කම් සිදු කිරීම වේ. මාර්ක් 16:17-18 පෙන්නුම් කරනුයේ ක්‍රිස්තුස්වහන්සේගේ භෞමික සේවාවෙන් පසුවද මෙම ක්‍රියාකාරකම් තව දුරටත් පවත්වාගෙන යා යුතු බවය.

ශාරීරිකව රෝගාතුර වුවනට සුවය ලබා දීම උදෙසා යේසුස්වහන්සේගේ නාමයෙන් අත් තැබීම සිදු කරනු ලැබේ. රෝගියා මත අත් තබන පුද්ගලයා දෙවියන්වහන්සේගේ අධි ස්වභාවික සුවකිරීමේ බලය රෝගියා මතට මුදා හරී. සමහර අවස්ථාවන්හිදී රෝගියා හට තම සිරුරේ දෙවියන්වහන්සේගේ බලය දැනෙන්නට පුළුවන. තවත් සමහර අවස්ථාවල සිරුරට විශේෂ හැඟීමක් දැනීමක් නොලැබේ. ඉන් අදහස් වන්නේ රෝගය සුව නොවන බව නොවේ. අත් තැබීම දෙවියන්වහන්සේගේ වචනයට කීකරුකමේ හා ඇදහිල්ලේ ක්‍රියාවකි. එහි කාර්යක්ෂමභාවය හැඟීම මත රැඳී නොපවතී.

රෝගියා සුවවන්නාවූ කාලය විවිධාකාර විය හැක. සමහර විට රෝගියා මත අත් තැබූ සැණකින්ම සම්පූර්ණ සුවය හිමි වේ. සමහර විට සුවය ක්‍රමානුකූලව කාලයක් පුරා පැමිණෙනු ඇත (මාර්ක් 8:22-25). සුවය අපේක්ෂාවෙන් පැමිණෙන අය සඳහා මේ පිළිබඳව නිවැරදි උපදෙස් දීම වැදගත් වේ. එනම් තම සුවය තහවුරු වන තුරු ඇදහිල්ලෙන් සිටීමෙහි ඇති වැදගත් කම ය (මෙම විෂය පිළිබඳ වැඩි විස්තර "සිරුර සඳහා සටන" නම් හාවස්ට් ටයිම් පොතෙහි ඇතුලත් වේ).

ඇදහිලිවන්තයන් අත්තැබීමේ සේවාව තුළින් දෙවියන්වහන්සේ පුදුමාකාර සුවකිරීම් හා අධි ස්වභාවික පුදුම හා ලකුණු ඉටු කිරීම තුළින් තම වචනය තහවුරු කළ ආකාරය ක්‍රියා පොතෙහි විස්තර කොට තිබේ.

**එහෙයින් ඔවුහු ස්වාමින්වහන්සේ තුළ නිර්භිත ලෙස කථා කරමින් බොහෝකලක් නැවති සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් භාස්කම්ද පුදුම ද කරවමින්, ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දැරූ සේක.** (ක්‍රියා 14:3)

**තවද ප්‍රේරිතයන්ගේ අත්වලින් බොහෝ භාස්කම්ද පුදුමද සෙනඟ අතරේ කරන ලද්දේය. ඔවුන් සියල්ලෝ එක්සිත්ව සාලමොන්ගේ ධර්ම මණ්ඩපයෙහි සිටියෝය.** (ක්‍රියා 5:12)

**අනනියස් පිටත්ව ගොස්. ගෙට ඇතුල්වී ඔහු පිට අත් තබා: සහෝදරවූ සාවුල්, නුඹ පෙනීම ලබන පිණිසද ශුද්ධාත්මයෙන් පූර්ණ කරනු ලබන පිණිස ද ස්වාමින්වහන්සේ, එනම් නුඹ ආවාවූ මාර්ගයෙහිදී නුඹට පෙණුනාවූ යේසුස්වහන්සේ මා එවූසේකැයි කීවේය.** (ක්‍රියා 9:17)

**දෙවියන්වහන්සේ පාවුල්ගේ අත්වලින් අපුරුවූ ආශ්වර්යයන් කෙරෙවූ සේක.** (ක්‍රියා 19:11)

**තවද පබ්ලියස්ගේ පියා උණෙන් සහ රක්තාතිසාරයෙන් පීඩිතව ඔත්පළව උන්නේය. පාවුල් ඔහු උන්තැනට ගොස් යාච්ඤා කොට ඔහු පිට අත් තබා ඔහු සුව කෙළේය.** (ක්‍රියා 28:8)

## ශුද්ධාත්ම බව්තිස්මය :

අත් තැබීමෙහි තවත් පරමාර්ථයක් නම් ශුද්ධාත්ම බව්තිස්මය ලැබීම උදෙසාය. ක්‍රියා පොතෙහි මනුෂ්‍යයන් ශුද්ධාත්ම බව්තිස්මය ලද අවස්ථා පහක් පිළිබඳ උදාහරණ සඳහන් වේ. ඉන් පළමුවැන්න ගෝලයෝ යෙරුසලමේ උඩුමහල් මැදුරේදී, පෙන්තකොස්ත දින ලද අත්දැකීමය. මෙය ක්‍රියා 2:1-4 ඔබට කියවිය හැකිය. අනෙකුත් උදාහරණ නම් සමාරියෙහි නව කිත=බැතියන් ක්‍රියා 8:14-20; තාර්සස්හි සාවුල් ක්‍රියා 9:17; කොර්නේලියස් හා ඔහුගේ පවුලේ අය ක්‍රියා 10:44-46; සහ එපිසයෙහි ගෝලයෝ ක්‍රියා 19:1-6 වෙති.

මෙම අවස්ථාවලින් තුනකදීම ශුද්ධාත්ම බව්තිස්මය අපේක්ෂා කළ අය වෙත බව්තිස්මය ලැබුණේ අනෙක් ඇදහිලිවතුන්ගේ අත් තැබීම හේතුකර ගෙනය.

ක්‍රියා 8:17 පවසන පරිදි, "ප්‍රේරිතයන් ඔවුන් කෙරෙහි අත් තැබූ කලල ඔවුන්ට ශුද්ධාත්මය ලැබුණේය".

- දමස්කයෙහිදී, අනනියස් සාවුල්ට පෙනීම ලැබෙන පිනිසත් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්මය ලබන පිණිසත් ඔහු පිට අත් තැබීය.

- එපිසයෙහිදී පාවුල් සේවය කළාවූ ගෝලයෝ ශුද්ධාත්ම බව්තිස්මය ලැබුවේ පාවුල් ඔවුන් පිට අත් තැබූ පසුවය.

මනුෂ්‍යයෝ ශුද්ධාත්ම බව්තිස්මය ලබන එකම ක්‍රමය අත් තැබීම මගින් පමණක් නොවේ. යෙරුසලමෙහි උඩුමහල් මැදුරෙහි සහ කොර්නේලියස්ගේ නිවැසියෝ කිසිවෙකු විසින් අත් නොතබාම ශුද්ධාත්ම බව්තිස්මය අත්දැකීම ලදහ. එනමුත් මෙම උදාහරණවල පදනම අනුව ශුද්ධාත්ම බව්තිස්මය ලබාගැනීම පිනිස අත් තැබීම ශුද්ධ ලියවිල්ලට එකඟ වේ.

## ආත්මික දීමනා මුදාහැරීම :

අත් තැබීමේ තවත් එක් පරමාර්ථයක් නම් ආත්මික දීමනා ලබාදීමය. පාවුල් තිමෝතිට ලියමින්:

> **වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙන ලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න. (1 තිමෝති 4:14)**

පාවුල් තිමෝතිගේ ආත්මික අත්දැකීම පිළිබඳව පවසමින්:

> **ඒ කාරණය නිසා මාගේ අත්තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදු කරන හැටියට නුඹට සිහි කරමි. (2 තිමෝති 1:6)**

තිමෝති හට දෙවියන්වහන්සේ දී තිබූ සේවය සම්පූර්ණ කිරීම පිණිස අත් තැබීමේ සේවය හා මුසුවූ අනාගතකීම තුළින් මඟපෙන්වීම, දිරිගැන්වීම හා ශක්තිමත් කිරීම ඔහුට සපයන ලදී.

## ක්‍රිස්තියානි සේවකයන් සේවයෙහි පිහිටුවීමට :

අත් තැබීමෙහි තවත් එක් පරමාර්ථයක් නම් ක්‍රිස්තියානි සේවකයන් සේවයෙහි පිහිටුවීම සඳහාය. "පිහිටුවීම" යනු අනුමැතිය ලබාදීම, පැවරීම, හෝ කාර්යයක් සඳහා පිටත්කර හැරීම යනුයි. අන්තියෝකියෙහි ආත්මික නායකයෝ ස්වාමීන්වහන්සේ කෙරෙහි රැඳී සිටි අතර ...

> **ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස් ද සාවුල් ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන් කරපල්ලායයි කීසේක.**
> **එවිට ඔවුහු නිරාහාරයෙන් හිඳ යාච්ඤාකොට ඔවුන් පිට අත් තබා, ඔවුන් පිටත්කරහැරියෝය. මෙසේ ඔවුහු ශුද්ධාත්මයාණන් විසින් යවන ලදුව සිලූකියට බැසගොස් එහිදී නැව් නැගී කුප්‍රසට ගියෝය. (ක්‍රියා 13:2-4)**

බයිබලය පෙන්වා දෙන පරිදි දෙවියන්වහන්සේ ප්‍රසිද්ධියේ සභා නායකයන් තුළින් ප්‍රකාශයට පත් කිරීමට පෙර පෞද්ගලිකව පාවුල් හා බාර්ණබස්ට ඔවුහු දෙවියන්වහන්සේ උදෙසා කළ යුතු සේවාව පිළිබඳව කථාකොට තිබුණි. එබැවින් ප්‍රසිද්ධියේ එළිදරව්වීම ඔවුහු දැනටම ලබා තිබූ කැඳවීම සනාථ කිරීමකි.

සභා නායකයෝ පාවුල් හා බාර්ණබස්ව ක්ෂණයකින් සේවය සඳහා පිටත් කර හැරියේ නැත. ඔවුහු නිරාහාරව යාච්ඤා කිරීමට කාලය ගත්හ. මෙම දෙදෙනා පිටත්කර හැරියේ සභානායකයන් ඔවුන් පිට අත් තැබීමෙන් අනතුරුවය.

පාවුල් තිමති මත අත්තබා ඔහුව සේවයෙහි පිහිටුවිය.

> **ඒ කාරණය නිසා මාගේ අත්තැබීම කරණකොටගෙන නුඹ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ දීමනාව පුබුදු කරන හැටියට නුඹට සිහිකරවමි.** (2 තිමෝති 1:6)

අත්තබා ක්‍රිස්තියානි සේවකයන් සේවයේ පිහිටුවීම මිෂනාරිවරුන් හා දේවගැතිවරුන් සඳහා භාවිතා නොකරන ලදි. පළමු උපස්ථායකයන් පත්කිරීමේදී අත්තබා යාච්ඤා කිරීම සිදු කරන ලදි (ක්‍රියා 6:1-6).

> **ඔවුන් ප්‍රේරිතයන් ඉදිරියෙහි සිටෙවුවෝය. ඔවුහු යාච්ඤාකොට ඔවුන් පිට අත් තැබුවෝය.** (ක්‍රියා 6:6)

යෙරුසලමෙහි සභාවෙහි මෙම සේවකයන් දෙදෙනා තෝරා පත් කරගත් නිලය පසු කලෙක "උපස්ථායක" පදවිය ලෙස ප්‍රසිද්ධ විය. උපස්ථායකයින් තෝරා පත්කර ගැනීමේ ක්‍රමය ක්‍රියා 6:3-6 දක්වා පෙන්වාදී තිබේ. ප්‍රේරිතයෝ ජනතාවට එම තනතුර සඳහා මනුෂ්‍යයන් තෝරා ගැනීමේ වගකීම භාර කළහ.

මෙලෙසෙ තෝරාගත් මනුෂ්‍යයන් ප්‍රේරිතයන් ඉදිරියට ගෙන ආ කල ඔවුහු මත අත් තබා යාච්ඤා කළහ. මෙයින් ඔවුහු එම නිලය දැරීමට සුදුසු අය ලෙස පිළිගත් බව ප්‍රේරිතයෝ පෙන්නුම් කළහ. එසේම ඔවුන් වෙත පවරන ලද ක්‍රියාව ඉටු කරන පිණිස දෙවියන්වහන්සේ වෙතට ඔවුන් කැප කළහ. එම කාර්යය උදෙසා අවශ්‍ය වන ආත්මික ප්‍රඥාව ප්‍රේරිතයන්ගේ අත් තැබීම තුළින් උපස්ථායකයන් වෙත මුදා හරින ලදි.

## බිළිඳුන් කැපකිරීම :

කුඩා බිළිඳුන් බව්තිස්මය කිරීම ශුද්ධ ලියවිල්ලට එකඟ නොවේ. එයට හේතුව බව්තිස්මය සඳහා අවශ්‍ය වන සුදුසු කමක් වූ පසුතැවිලිවීමට හෝ අදහා ගැනීමට බිළිඳුන්ට නොහැකි බැවිනි. එනමුත් අත් තැබීම තුළින් බිළිඳුන්ව දෙවියන්වහන්සේට කැප කොට, දේව ආරක්ෂාව, මඟපෙන්වීම හා ආශිර්වාදයට භාර කළ හැකිය.

**"උන්වහන්සේ ඔවුන් වඩාගෙන, ඔවුන් පිට අත් තබා ඔවුන්ට ආශිර්වාද කළ සේක".** (මාර්ක් 10:16)

## විශේෂ අනතුරු ඇඟවීමක්

අත් තැබීම පිළිබඳව අලුත් ගිවිසුම ප්‍රවේසම් වන ලෙස අනතුරු ඇඟවීමක් කරයි.

> **ඉක්මන්වී කිසිවෙකු කෙරෙහි අත් නොතබන්න.** (1 තිමෝති 5:22)

ඔබ කිසියම් කෙනෙකු මත අත් තැබීමේදී හෝ වෙනයම් කෙනෙකු ඔබ මත අත් තැබීමේදී ආත්මික හුවමාරුවක් සිදුවන බැවින් මෙම ක්‍රියාවෙහිදී ප්‍රවේසම්වීම නුවණට හුරුය. ඔබ මත අත් තබන්නා ආත්මිකව සුදුසුකම් ලත් අයෙකු නොවේ නම් එම අත් තැබීම වලංගු නොවේ. ආත්මික වූ ප්‍රයෝජන අන් අය වෙත මුදාහැරීමට අත් තැබීමට සුදුසුකම් ඇති අය කවුදැයි බයිබලය ඉතා පැහැදිලිව පෙන්වා දෙයි.

## ඇදහිලිවතුන් :

ඇදහිලිවතුන් හට අනෙක් අය වෙත අත් තැබිය හැකිය.

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්... ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔවුන් සුවය ලබන්නෝයයි කීසේක.** (මාර්ක් 16:17-18)

සත්‍යය ඇදහිලිවන්තයාගේ සුදුසුකම් මීට පෙර පරිච්ඡේදයකදී මළ ක්‍රියාවලින් පසුතැවිලිව දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල රැඳවීම පාඩම් වලදී ඉගෙන ගත්තෙමු.

## ප්‍රේරිතයෝ සහ ගෝලයෝ :

> **... සීමොන් ද ප්‍රේරිතයන්ගේ අත් තැබීම කරණකොටගෙන ශුද්ධාත්මය ලැබෙන බව දැක...** (ක්‍රියා 8:18)
>
> **අනනියස් පිටත්ව ගොස් ... ඔහු පිට අත් තබා ... ශුද්ධාත්මයෙන් පූර්ණ කරනු ලබන පිණිස ...** (ක්‍රියා 9:17)

ප්‍රේරිතයෝ සහ ගෝලයෝ යනු දෙවියන්වහන්සේ පත් කළාවූ අල්ලේප ලත් මනුෂ්‍යයෝ වෙති. ඔවුහු පරිණත වූ ඇදහිලිවතුන් වන අතර නායකත්වයෙහි සුදුසුකම්ලත් උදාහරණවත් මනුෂ්‍යයෝ වූහ.

## වැඩිමහල්ලන් :

> **... වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතිව ...** (1 තිමෝති 4:14)

වැඩිමහල්ලන් සඳහා ඇති උසස් ප්‍රමිතීන් 1 තිමෝති 3:1-7 සහ තිතස් 1:6-9 දක්වා සඳහන් වේ.

### සාරාංශය

නව ගිවිසුමෙහි සඳහන් අත් තැබීමේ පරමාර්ථ පහ නම්:

- අධි ස්වභාවික සලකුණු
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය
- ආත්මික දීමනා මුදා හැරීම
- ක්‍රිස්තියානි සේවයට අණ ලැබීම
- ළදරු කැපකිරීම

අත් තැබීම වටහාගෙන එය ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. මන්ද යේසුස්වහන්සේ එය සභාවෙහි පැවැත්විය යුතු පුරුද්දක් ලෙසට පෙන්වා දුන් බැවිනි.

අද දවසේ බොහෝ සභාවල දක්නට නොලැබෙන එක් වැදගත් ආත්මික සේවා පුරුද්දක් නම් අත් තැබීමය. එනමුත් ...

- සෑම ඇදහිලිවන්තයෙකුම සුවය හා භාස්කම් උදෙසා අන් අය වෙත අත් තැබීම ක්‍රියාත්මක කළහොත් එමගින් ශුභාරංචිය ව්‍යාප්තවීම කෙරෙහි ඇතිවන මහත් බලපෑම සලකා බලන්න.

- සෑම ඇහිලිවන්තයෙකුම ආත්මික දීමනා මුදාහැරීම සඳහාත් නිරන්තරයෙන් ක්‍රිස්තියානි සේවය සඳහා සේවකයන් කැපකොට අණදීම කිරීම සඳහාත් අත් තැබීම නොකඩවා සිදු කළහොත් එය ශුභාරංචිය පතල කිරීම කෙරෙහි ඇතිකරන බලපෑම සලකා බලන්න.

## ස්වයං පරීක්ෂණය

1. අත් තැබීම සඳහා පැරණි ගිවිසුමෙන් උදාහරණ තුනක් ලියන්න

____________________ ____________________

____________________

2. අලුත් ගිවිසුමෙහි පෙන්වා දී ඇති අත් තැබීමේ පරමාර්ථ 5 නම් කරන්න.

____________________ ____________________

____________________ ____________________

____________________

3. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

________________________________________

4. යේසුස්වහන්සේ ස්වර්ගයට ගිය පසුවත් අත් තැබීමේ සේවය දිගටම පවත්වාගෙන යා යුතු බව පෙන්නුම් කරන බයිබල් පදයක් ලියන්න.

________________________________________

5. "අත් තැබීම" අර්ථ දක්වන්න.

________________________________________

6. "අත් තැබීම" සිදුකිරීමට සුදුසුකම් ලත් අය ලෙස බයිබලය පෙන්වා දෙනුයේ කවුරුන්ද?

__________, __________ සහ __________, __________

7. පහත සඳහන් ප්‍රකාශන සත්‍ය නම් <u>ස</u> අකුරද අසත්‍ය නම් <u>අ</u> අකුරද වාක්‍යයට ඉදිරියෙන් ලියන්න.

   අ. අත් තැබීමක් සිදුකිරීමේදී බලය දැනෙන්නේ නැත්නම් එය සාර්ථක නොවේ __________
   ආ. ක්‍රිස්තියානි සේවකයන් අණ කිරීම සඳහා අත් තැබීම භාවිත කළ හැකිය __________
   ඇ. බයිබලය උගන්වන්නේ ඕනෑම කෙනෙකුට වෙනයම් කෙනෙකු පිට අත් තැබිය හැකි බවය __________
   ඈ. කෙනෙකු හට ශුද්ධාත්ම බව්තිස්මය ලැබිය හැකි එකම ක්‍රමය අත් තැබීම මගින් පමණකි __________
   ඉ. අත් තැබීම තුළින් ආත්මික දීමනා මුදාහැරිය හැක __________
   ඊ. ළදරුවන් මත අත් තැබීම සිදුනොකළ යුතුය. මන්ද ඔවුනට එය අවබෝධ නොවන බැවිනි __________

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

යේසුස්වහන්සේගේ භෞමික සේවාව යුගයෙහිදී එතුමා සිදුකළ හාස්කම් අධ්‍යයනය කරන්න. උන්වහන්සේ ආත්මික ආශිර්වාද මුදා හැරීම සඳහා අත් තැබීම කළ අවස්ථා සහ කළ ආකාරය බලන්න.

**මළවුන් නැවත ජීවනයට ගෙන ඒම**

| | |
|---|---|
| යායිරස්ගේ දුව : | මතෙව් 9:18-19, 23-25 |
| වැන්දඹුවගේ පුත්‍රයා : | ලූක් 7:11-15 |
| ලාසරස් : | යොහන් 11:1-44 |

**සුවකිරීම් :**

| | |
|---|---|
| ලාදුරු රෝගියා : | මතෙව් 8:2-3 |
| සියයකට මුලාදෑනියාගේ සේවකයා : | මතෙව් 8:5-13 |
| පේතෘස්ගේ නැන්දම්මා : | මතෙව් 8:14-15 |
| ගදරීනයන් : | මතෙව් 8:28-34 |
| අංශභාග රෝගියා : | මතෙව් 9:2-7 |
| මහලේ රෝගී ස්ත්‍රිය : | මතෙව් 9:20-22 |
| අන්ධයෝ : | මතෙව් 9:27-31 |
| ගොළු- ආවේශවූ මිනිසා : | මතෙව් 9:32-33 |
| වියළි අතක් ඇති මිනිසා : | මතෙව් 12:10-13 |
| අන්ධ, ගොළු ආවේශ වූ මිනිසා : | මතෙව් 12:22 |
| කානාන් ස්ත්‍රියගේ දියණිය : | මතෙව් 15:21-28 |
| මීමැස්මොර පිරිමි ළමයා : | මතෙව් 17:14-18 |
| අන්ධ මිනිස්සු : | මතෙව් 20:29-34 |
| ගොළු බිහිරි මිනිසා : | මාර්ක් 7:31-37 |
| අශුද්ධ ආත්ම ආවේශවූ මිනිසා : | මාර්ක් 1:23-26 |
| බෙත්සයිදාවේ අන්ධයා : | මාර්ක් 8:22-26 |
| කුදු ස්ත්‍රිය : | ලූක් 13:11-13 |
| දිය උදර රෝගියා : | ලූක් 14:1-4 |
| කුෂ්ඨ රෝගීන් දසදෙනා : | ලූක් 17:11-19 |
| මල්කස්ගේ කන : | ලූක් 22:50-51 |
| නිලධාරියාගේ පුත්‍රයා : | යොහන් 4:46-54 |
| බෙත්සයිදාවේ රෝගියා : | යොහන් 5:1-9 |
| උපතින් අන්ධව සිටි මිනිසා : | යොහන් 9 |

(යේසුස්වහන්සේ තම හාස්කම් සඳහා ඒකාකාරී ක්‍රමයක් භාවිත නොකළ සේක. දෙවියන්වහන්සේ තම වචනය තහවුරු කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කොට හාස්කම්ද ලකුණුද සිදු කරන සේක. අත් තැබීම එතුමා භාවිත කරන්නාවූ ක්‍රම අතුරින් එකක් පමණකි.)

# අටවන පරිච්ඡේදය

## මළවුන්ගෙන් නැගිටීම - I වැනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "නැවත නැගිටීම" අර්ථ දැක්වීමට
- අතීත, වර්තමාන හා අනාගත නැවත නැගිටීම් අතර වෙනස හඳුනා ගැනීම
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිලිවන්තයා සතු වර්තමාන නැවත නැගිටීම පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේගේ අතීත කාල නැවත නැගිටීම පැහැදිලි කිරීම

**ප්‍රධාන පදය:**

> **යේසුස්වහන්සේ: නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත් වන්නේය. ජීවත්ව සිටින කවුරු නුමුත් මා කෙරෙහි අදහන්නේද ඔහු කිසි කලෙකත් නොනසින්නේය. (යොහන් 11:25-26)**

### හැඳින්වීම

ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි තවත් මූලික අත්තිවාරම් දේව ධර්ම දෙකක් තිබේ. ඒවා නම්, මළවුන් නැවත නැගිටීම සහ සදාකාල විනිශ්චය වේ. මෙම ඉතිරි දේව ධර්ම දෙකෙහිදී බයිබලය අපව වර්තමාන කාලය එළිදරව් කිරීමට එපිටට ගෙනගොස් සදාකාලික අනාගතය එළිදරව් කර දෙයි.

මැවීමේ කාර්යය තුළින් දෙවියන්වහන්සේ දැන් පවතින ලෝකය බිහිකොට අතීත, වර්තමාන සහ අනාගත ලෙසින් කාල පරිච්ඡේද ඇති කළසේක (උත්පත්ති 1). කිසියම් දිනක දෙවියන්වහන්සේ මෙම පවතින ලෝකය අවසානයකට ගෙන එන අතර අප දන්නා පරිදි කාලය නවතිනු ඇත.

බයිබලය එළිදරව් කර දෙන පරිදි ලෝකය මුළුමනින්ම දෙවියන්වහන්සේ නියම කළාවූ විශේෂ මොහොතක කාලයේ අවසානය පැමිනෙනවා ඇත. මෙලෙස ලෝකාන්තිමයේදී ලොවෙහි නොයෙකුත් සිදුවීම් ඇති වන්නේය. එම සිදුවීම් වන්නාවූ නියමිත මොහොත දන්නේ දෙවියන්වහන්සේ පමණකි.

සෑම පුද්ගලයෙකු හටම "කාලය තවත් නොපවතින්නාවූ" මොහොතක් පැමිනේ. එය අපගේ භෞමික ජීවිත කාලයෙහි අවසානය වේ. එහිදී අපි ජීවිත කාලයෙන් පිටතට පා තබා සදාකාලයට පා නගනු ඇත. සෑම පුද්ගලයෙකුගේම භෞමික ජීවිතයෙහි අවසානය එම තැනැත්තාගේ කාලයෙහි අවසානය වේ.

ලෝකාන්තිමය හා සදාකාලය පිළිබඳ බැඳී පවතින අභිරහස් කිහිපයක් ඇති නමුත් බයිබලය ඒ පිළිබඳව පැහැදිලි නොකරයි. නුමුත් "මළවුන්ගේ නැගිටීම" නම් දේව ධර්මය අවසාන කාලය පිළිබඳව හා ඉන්පසු ඇති සදාකාලය පිළිබඳ තොරතුරු සපයයි.

මෙම පරිච්ඡේදය මළවුන් නැවත නැගිටීම පිළිබඳ ධර්මය හඳුන්වා දෙයි. අළුත් ගිවිසුමෙහි සඳහන් වන අතීත, වර්තමාන හා අනාගත නැවත නැගිටීම් මෙම ඡේදයේදී අර්ථ දැක්වෙන අතර ඉන් අතීත හා වර්තමාන නැවත නැගිටීම පිළිබඳව සාකච්ඡා වේ. ඊළඟ පරිච්ඡේදයෙහි අනාගත උත්ථානය පිළිබඳව සාකච්ඡා වනු ඇත.

### අර්ථ දැක්වීම

"නැවත නැගිටීම" යන පදයෙහි අර්ථය නම් නැගිටීම හෝ නැගිටුවනු ලැබීම යනුයි. එනම්, මළවුන්ගෙන් නැගිටීමට හෝ නැගිටුවනු ලැබීමට සැලසීමය.

## නැවත නැගිටීම් තුන

නව ගිවිසුමෙහි හඳුන්වා දෙන නැවත නැගිටීම් තුනක් වේ. එනම්,

අතිත කාල: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

වර්තමාන කාල: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින ඇදහිලිවන්තයෝ ආත්මික නැවත නැගිටීම

අනාගත කාල: සොහොන් ගෙවල්වල සිටින සියලු දෙනාගේ අනාගත නැවත නැගිටීම

## නැවත නැගිටුවන්නා

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටුවනු ලැබුවේ දෙවියන්වහන්සේගේ බලයෙනි.

> **... ක්‍රිස්තුස්වහන්සේව උන්වහන්සේ නැගිටෙවුසේකැයි ද අප උන් වහන්සේ ගැන සාක්ෂි දුන් බැවින්, (1 කොරින්ති 15:15)**

යේසුස්වහන්සේ තුළින් ඇදහිලිවන්තයා වර්තමාන ආත්මික නැවත නැගිටීම අත්දකියි. උන්වහන්සේ තුළින් සොහොන් ගෙවල් වල සිටින අයගේ අනාගත නැවත නැගිටීමද සිදුවනු ඇත.

යේසුස්වහන්සේ නැගිටුවන්නා බව බයිබලය සනාථ කරයි. මළවුන් උත්ථාන කළ හැකි තැනැත්තා එතුමාය.

> **යේසුස්වහන්සේ: නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත් වන්නේය. (යොහන් 11:25)**

> **එසේම පළමුවෙනි මනුෂ්‍යයා වූ ආදම් ජීවමාන ප්‍රාණයක් වුණේ යයි ලියා තිබේ. අන්තිම ආදම් [යේසුස්වහන්සේ] ජීවනදායක ආත්මයක් විය. (1 කොරින්ති 15:45)**

> **මරණය නැතිකර ජීවනයත් අමරණ භාවයත් ශුභාරංචිය කරණකොටගෙන එළිදරව් කළාවූ අපගේ ගැළවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ඒ කරුණාව දැන් ප්‍රකාශ වී තිබේ. (2 තිමෝති 1:10)**

## අතිත කාල: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

### පැරණි ගිවිසුම් අනාගතවාක්‍යය :

පැරණි ගිවිසුම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සියළු මනුෂ්‍යයන්ගේ පාප උදෙසා විඳින මරණය හා උත්ථාන වීම පිළිබඳව කලින් ප්‍රකාශ කොට තිබුණි. දාවිත්, යේසුස්වහන්සේගේ උත්ථාන වීම පිළිබඳව සඳහන් කරයි.

> **එහෙයින් ඔහු අනාගතවක්තෘ කෙනෙක්ව ඔහුගේ වංශයෙන් කෙනෙකු ඔහුගේ සිංහාසනය පිට හිඳුවනසේකැයි දෙවියන්වහන්සේ දිවුරුමකින් ඔහුට දිවුළ බව දැනගත්තෝය.**
> **ඔහු මෙය කලින් දැක, ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම ගැන කථාකරමින් ...**
> **(ක්‍රියා 2:30-31)**

යේසුස්වහන්සේගේ භූමදානයෙන් පසුව දින තුනකින් නැවත නැගිටීම පිළිබඳව බොහෝ බයිබල් පද තහවුරු කරයි.

> **නුමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින සේක්මය ... (1 කොරින්ති 15:20)**

> **සබත් දවස නිමවන්ට ළංව සතියේ පළමුවෙනි දවසට එළිවෙන වේලේහි මග්දලායේ මරියාද අනික් මරියාද සොහොන් ගෙය බලන්ට ගියෝය.**

**දේවදූතයා ඒ ස්ත්‍රීන්ට කථා කරමින්: භය නොවෙල්ලා: මක්නිසා කුරුසියෙහි ඇණ ගසන ලද යේසුස්වහන්සේව නුඹලා සොයන බව දනිමි.**
**උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කීලෙසම නැගිටුණුසේක. වරෙල්ලා ස්වාමීන්වහන්සේ උන් ස්ථානය බලා ඉක්මනින් ගොස්,**
**උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුණුසේක කියා උන්වහන්සේගේ ගෝලයන්ට කියාපල්ලා ... (මතෙව් 28:1, 5-7)**

මෙම පරිච්ඡේදය අවසානයෙහි සපයා ඇති "වැඩිදුර අධ්‍යයනය සඳහා" කොටසෙහි යේසුස්වහන්සේගේ උත්ථානය සනාථ කරන තව බොහෝ බයිබල් පද ඇත.

## දර්ශනය වීම් :

යේසුස්වහන්සේගේ උත්ථානයෙන් පසු උන්වහන්සේ බොහෝ දෙනෙකුට දර්ශනය විය.

**උන්වහන්සේ වද වින්ද පසු සතලිස් දවසක් අතරතුරේ ඔවුන්ට පෙනෙමින්ද දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන කාරණා කියමින්ද බොහෝ ඔප්පු සාක්ෂි වලින් තමන්ම ජීවමානව ඔවුන්ට ප්‍රකාශ වූ සේක. (ක්‍රියා 1:3)**

**කේපස්ටද පසුව දොළොස් දෙනාටද පෙනුණ බවත්ය. ඉන්පසු උන්වහන්සේ එකවිටම පන්සියයකට වඩා සහෝදරයන්ට පෙනුණුසේක. ඔවුන්ගේ වැඩිදෙනා මේ දක්වා සිටිති. සමහරු සැතපුණෝය. ඉන්පසු උන්වහන්සේ යාකොබ්ටද පසුව සියලු ප්‍රේරිතයන්ටද පෙනුණුසේක. (1 කොරින්ති 15:5-8)**

## නැවත නැගිටි එතුමාගේ සිරුර :

නැවත නැගිටීමෙන් පසුව ජීවමානව වැඩ විසූ යේසුස්වහන්සේ තමා පෙර සිටි තැනැත්තාම බවත් සැබවින්ම කුරුසිපත් වුයේත් දැන් සිරුරක් සහිතව නැවත නැගිට සිටින්නේත් තමාම බව ඔප්පු කිරීමට මනා සාක්ෂි ඉදිරිපත් කළසේක. එහි සැබෑ සාක්ෂිය වුයේ උන්වහන්සේගේ ඇණ සිදුරු කැළැල් හා හෙල්ලෙන් ඇන කළාවූ තුවාල කැළැල් දෑත්, දෙපා හා ඇලයෙහි තිබීමය.

අනෙකුත් ආකාරයන්ගෙන් උන්වහන්සේගේ සිරුර වැදගත් විප[1]යාසයන්ට භාජනය වී තිබුණි. එය තවදුරටත් තාවකාලික සිරුරක් භාජනය වන්නාවූ සීමාවලට කොටු වී නොතිබුණි. දැන් එතුමාට රිසි පරිදි දර්ශනය වීමටත් අතුරුදහන් වීමටත් හැකියාව තිබුණි. උන්වහන්සේට වසා ඇති දොරටුවලින් ඇතුළුවීමටත් මිහිතලයේ සිට ස්වර්ගයටත් සැරිසැරීමට හැකි විය (යොහන් 20:19).

යේසුස්වහන්සේ තම මරණය හා උත්ථානයට පෙර, ඉශ්‍රායෙල්හි ආගමික නායකයන් හා පැවති කතාබහකදී මෙසේ පැවසූ සේක. එනම්,

**යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: මේ මාළිගාව කඩාදමාපල්ලා. එවිට තුන් දවසකින් එය නැගිටුවන්නෙමියි කීසේක.**
**යුදෙව්වරු කථාකොට: මේ මාළිගාව ගොඩනැගීමට සතළිස් අවුරුද්දක් ගතවිය. නුඹ ඒක තුන් දවසකින් නැගිටුවන්නෙහිදැයි කීවෝය.**
**නුමුත් උන්වහන්සේ කථාකළේ තමන්ගේ ශරීරය නමැති මාළිගාව ගැනය. (යොහන් 2:19-21)**

යේසුස්වහන්සේ කථාකළේ යෙරුසලමෙහි තිබූ දේවමාළිගය පිළිබඳව නොවේ. උන්වහන්සේ තම සිරුර දේවමාළිගය ලෙස සලකා කථා කළසේක. යේසුස්වහන්සේගේ මරණය හා භූමදානයෙන් පසුව, සිරුර ආලේප කිරීම සඳහා ස්ත්‍රීහු සොහොන් ගෙයට ඇතුළු වූ විට "ස්වාමිවූ යේසුස්වහන්සේගේ සිරුර එහි සම්බ නොවීය" (ලූක් 23:55-24:3). යේසුස්වහන්සේ තම ගෝලයන්ට දර්ශනය වූ කල තම සිරුරෙහි වූ ඇණ ගැසූ තුවාල කැළලි හා හෙල්ලයෙන් ඇනීමෙන් ඇති වූ කැළලි අත ගා බැලීමට ගෝලයන්ට ඉඩහළ සේක. එමගින් උන්වහන්සේම බව හඳුනාගැනීමට, ඔප්පුකිරීමට හැකිවිය.

**ඔවුන් මෙසේ කථාකරමින් සිටියදී උන්වහන්සේ ඔවුන් මැද සිට: නුඹලාට සමාදානය වේවයි කීසේක. නුමුත් ඔව්හු ත්‍රස්තව, භයපත්ව ආත්මයක් පෙනුණෝ යයි සිතුවෝය. උන්වහන්සේ ඔවුන්ට කථාකොට: නුඹලා කැළඹෙන්නේ මක්නිසාද? නුඹලාගේ සිත්වල ශංකා හටගන්නේ**

මක්නිසාද? මාගේ අත් පා බලා ඒ මම ම බව දැනගන්න. මා අතගා බලාපන්න. මක්නිසාද මස් හා ඇට මට තිබේ. නුඹලාට පෙනෙන ලෙස ආත්මයකට නැතැයි කීසේක. (ලූක් 24:36-40)

එකල උන්වහන්සේ තෝමස්ට කථාකොට: නුඹේ ඇඟිල්ල මෙහි දිගුකොට මාගේ අත් බලාපන්න. නුඹේ අත දිගුකොට මාගේ ඇලයෙහි බහාපන්න. අවිශ්වාස නොකොට විශ්වාස කරපන්නැයි කීසේක. තෝමස් උත්තර දෙමින්: මාගේ ස්වාමිනි, මාගේ දෙවියනියි උන්වහන්සේට කීවේය. (යොහන් 20:27-28)

## උත්ථානවීමෙහි වැදගත්කම :

ක්‍රිස්තියානි ඇදහිල්ල කෙරෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන් කෙරෙන් උත්ථානවීම මෙතරම් වැදගත් වන්නේ ඇයි?

මළවුන්ගෙන් නැගිටීමක් නැත්නම්, ක්‍රිස්තුස්වහන්සේත් නැගිටුවනු නොලැබූසේක.
ඉඳින් ක්‍රිස්තුස්වහන්සේ නැගිටුවනු නොලැබූසේක් නම්, අපගේ දේශනා කිරීම් නිශ්ඵලයඃ නුඹලාගේ ඇදහීමත් නිශ්ඵලය. (1 කොරින්ති 15:13-14)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වීම කෙරෙහි විශ්වාස කිරීම සත්‍ය ඇදහිලිවන්තයෙකු වීම සඳහා අවශ්‍ය වේ.

කුමක්හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ යයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. (රෝම 10:9)

පාවුල් සුභාරංචි පණිවිඩයෙහි අංගයක් ලෙසට යේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථානවීම ඉදිරිපත් කළේය.

තවද සහෝදරයෙනි, මම නුඹලාට දේශනා කළාවූ, නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි.
මා නුඹලාට ප්‍රකාශ කළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහුනම්, කුමන වචනවලින් එය නුඹලාට දේශනා කළෙම්දැයි දන්වමි.

නැත්නම් නුඹලා නිශ්ඵල ලෙස ඇදවහුය. ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි. එනම්, ලියවිලි වල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත් ලියවිලි වල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත් ... ය. (1 කොරින්ති 15:1-4)

උත්ථානවීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවට සනාථ කරයි.

අපගේ පියවූ දෙවියන්වහන්සේගෙන්ද ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද අනුග්‍රහයත් සමාදානයත් නුඹලාට වේවා. ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද ශුද්ධකමේ ආත්මය ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූ සේක. (රෝම 1:4-5)

උත්ථානවීම යේසුස්වහන්සේ මවන ලද සියල්ලට ඉහළින් උසස්ව සිටින බව සනාථ කරයි.

උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා, සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා, සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළසේක. ඒ සභාව නම්, සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණ කරන තැනැන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයය.
(එපීස 1:20-23)

උත්ථානවීම ඇදහිලිවන්තයන් ධර්මිෂ්ඨකරනු ලැබීම සනාථ කරයි.

> **උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ අප ධර්මිෂ්ඨකොට ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබුසේක. (රෝම 4:25)**

උත්ථානය, මරණය පරාජය වූ බව අර්ථවත් කරයි.

> **එහෙයින් දරුවන් ලේ හා මාංසයට පංගුකාරයන්ව සිටින නිසා උන්වහන්සේත් එම ආකාරයෙන් ඒවාට පංගුකාරයෙක් වූ සේක. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරණකොටගෙන බල නැතිකොට ... (හෙබ්‍රෙව් 2:14)**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය හේතුකොටගෙන ඇදහිලිවතුන්ද නව සිරුරකින් යුක්තව උත්ථාන කරනු ඇත.

> **මෙන්න, නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින් ඇසිපිය හෙළන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව. මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය. එකල මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය. අපිද වෙනස්කරනු ලබන්නෙමුව.**
> **(1 කොරින්ති 15:51-52)**

> **සියලු දේ පවා තමන්ට යටත් කරන්ට පුළුවන් වූ බලය ලෙස, උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමානවන පිණිස ඒවා වෙනස් කරනවා ඇත. (පිලිප්පි 3:21)**

මළවුන්ගෙන් උත්ථානවීම පිළිබඳව අපි මීළඟ පරිච්ඡේදයෙහිදී තවදුරටත් අධ්‍යයනය කරමු. උත්ථාන මගින් ඇදහිලිවන්තයා හට නව ජීවන සැපයුමක් හිමි වේ.

> **අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. මක්නිසාද අන්තිම කාලයෙහි එළිදරව්වෙන්ට සූදානම්ව තිබෙන ගැළවීමට දෙවියන්වහන්සේගේ බලයෙන් ඇදහිල්ල කරණකොටගෙන ආරක්ෂා කරනු ලබන්නාවූ ...**
> **(1 පේත්‍රුස් 1:3)**

## වර්තමාන කාල : ඇදහිලිවතුන්ගේ උත්ථානය

බයිබලය වර්තමානයෙහි ඇදහිලිවන්තයන්ගේ නැවත නැගිටීම පිළිබඳව කථා කරයි. එහි අර්ථය නම් වරක් පාපය නිසා ආත්මිකව මැරී සිටි අය දැන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හේතුවෙන් ආත්මිකව ජීවමාන වී ඇති බවය.

> **නුඹලා නුඹලාගේ වරද සහ පාප කරණකොටගෙන මැරී සිටි කල, උන්වහන්සේ නුඹලා ජීවත් කළසේක. පෙර කාලයේ නුඹලා මේ ලෝකයේ ව්‍යවහාරය ලෙසත් අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියාකරන්නාවූ ආත්මය වන ආකාශයේ බලයේ අධිපතියාගේ කැමැත්තේ හැටියටත් ඒවායෙහි හැසුරුණහුය. ඔවුන් අතරේ අප සියල්ලෝද වරක් අපේ මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින් මාංසයටත් සිතටත් කැමති දේ කරමින් ස්වභාවෙන් අනික් අය මෙන් උදහසේ දරුවෝව සිටියෙමුව. නුමුත් දෙවියන්වහන්සේ දයාවෙන් පොහොසත්ව සිටිසේක් ...**
> **(එපීස 2: 1, 5)**

> **අපට ප්‍රේමයෙන් අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල්හි පවා ක්‍රිස්තුස්වහන්සේ සමග අප ජීවත් කර නුඹලා ගැළවී සිටින්නේ අනුග්‍රහයෙන් උන්වහන්සේ සමග අප නැගුටුවා, නුඹලාගේ වරදවල මාංසයේ අචර්මඡේදයෙහිද මැරී සිටියාවූ නුඹලා උන්වහන්සේ සමග ජීවත් කරවූ සේක. එසේය, උන්වහන්සේ අපේ සියලු වරද අපට කමා කළසේක. (කොලොස්සි 2:13)**
> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම්, ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

## උත්ථානවීමෙහි බාහිර සලකුණ :

වතුර බව්තීස්මය, ඇදහිලිවන්තයා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ පැරණි පව්කාර ජීවිතයට මිය ගිය බවත් ආත්මිකව උත්ථාන වූ බවත් බාහිරයෙන් සංකේතවත් කරන එක් ක්‍රමයකි. ඇදහිලිවන්තයාගේ ආත්මික නැවත නැගිටීම තහවුරු වනුයේ වතුර බව්තීස්මයෙන් පමණක්ම නොවේ. එය ඔහු තම අලුත් ජීවිතය ගතකරන ආකාරයෙන් ද වේ.

> **එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණකොටගෙන මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවාසේම අපිත් ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස මරණය තුළට බව්තීස්ම කරණකොටගෙන උන්වහන්සේ සමග තැන්පත් කරනු ලැබුවෙමු. මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධ වී සිටිමු නම්, උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වන්නෙමුව. (රෝම 6:4, 5)**

## මෙම උත්ථානවීමෙහි සාක්ෂි :

යේසුස්වහන්සේ තම උත්ථානවීම පිළිබඳ බොහෝ සාක්ෂි ඉදිරිපත් කළසේක. එයට ඇතුල් වූ සාක්ෂි නම්: හිස් වූ සොහොන, දේවදූතයන්ගේ පණිවිඩය සහ උත්ථානයෙන් පසුව එතුමා බොහෝ දෙනෙකුට පෙනෙන පිණිස දර්ශනය වීම වේ. එසේම ඇදහිලිවන්තයෙකුගේ ආත්මික නැවත නැගිටීම  තහවුරු කරන්නාවූ සාක්ෂි බොහෝය. එම සාක්ෂි වලට ඇතුළත් කරුණු මෙසේය. එනම්,

## - පාපයට මැරී අලුත් ජීවිතයක් බිහිවීම :

ආත්මික උත්ථානය සිදුවනුයේ පාපයට මිය යාමෙනි. ඇදහිලිවන්තයා මෙතෙක් ජීවත් වූ ආකාරයට තවදුරටත් ජීවත් නොවනු ඇත. ඔහු ලෝකයෙහි පවතින දුෂ්ඨ දෙයට මිය ගොස් යේසුස්වහන්සේ තුළ ජීවමාන වී සිටී.

> **එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගන්න. (රෝම 6:11)**

## - අලුත් ස්වාමියෙක් :

ආත්මික උත්ථානය මගින් යේසුස්වහන්සේ මින්පසු ඔබ ජීවිතයෙහි ස්වාමියා බවට පත්වේ. එබැවින් ඔබ තමා වෙනුවෙන්ම ජීවත් නොවී, එතුමාට සේවය කරන පිණිස ජීවත් වනු ඇත.

> **උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ, ජීවත් වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී ඔවුන් වෙනුවට මැරී නැවත නැගුටුණාවූ තැනැන්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය කියාත්, අපි නිශ්චයකොට කියමුව. (2 කොරින්ති 5:15)**

## - ජීවිතයට අලුත් පරමාර්ථයක්

ආත්මික උත්ථානය තුළින් ජීවිතයට අලුත් පරමාර්ථයක් ලැබේ. තාවකාලික වූ ලෞකික දෑ කෙරෙහි එනම්, භෞතික වාසි, ජීවිත අපේක්ෂා යනාදිය වෙනුවට ඇදහිලිවන්තයාගේ අවධානය සදාකාලික දෑ කෙරෙහි යොමු වනු ඇත.

> **ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ සමග නැගුටුවන ලද්දහු නම්, උසස් තැන්හි තිබෙන දේවල් සොයන්න. එහි ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ වැඩ හිඳින සේක. පොළොවේ තිබෙන දේ නොව උසස් තැන්හි තිබෙන දේම සලකන්න. (කොලොස්සි 3:1-2)**

### සාරාංශය

අලුත් ගිවිසුමෙහි සඳහන් නැවත නැගිටීම් තුනෙන් දෙකක් නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අතීත කාල උත්ථානයත්, ඇදහිලිවතුන්ගේ වර්තමාන ආත්මික උත්ථානයත්ය. අනෙක් එක නම්, සියලුම මිය ගිය අය අනාගතයෙහි සොහොන් වලින් උත්ථාන කිරීමය. මීළඟ පරිච්ඡේදයෙහිදී අප එය සාකච්ඡා කරනු ඇත.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

___

___

2. "නැවත නැගිටීම" අර්ථ දක්වන්න.

___

___

3. අලුත් ගිවිසුමෙහි සඳහන් වන උත්ථාන තුන් වර්ගය කුමක්ද?

   අතීත කාල: ___

   වර්තමාන කාල: ___

   අනාගත කාල: ___

4. පහත සඳහන් එක් එක් කාරණය තහවුරු කිරීමට බයිබල් පදය බැගින් සපයන්න.

   යේසුස්වහන්සේගේ උත්ථානය පිළිබඳ පැරණි ගිවිසුම අනාගත පැවසූ බව : ___
   යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බව : ___
   උන්වහන්සේගේ උත්ථානයෙන් පසුව එතුමා ජනතාවට දර්ශනය වූ බව: ___
   එතුමාට එම සිරුරම තිබූ නමුත් සීමාවීම් නොතිබූ බව : ___

5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීම විශ්වාස කිරීම වැදගත් වන්නේ ඇයි?

___

___

6. "ඇදහිලිවතුන්ගේ වර්තමාන කාල ආත්මික උත්ථානය" යන්නෙන් තේරුම් යන්නේ කුමක්ද?

___

___

7. මෙම පරිච්ඡේදයෙහිදී සාකච්ඡා කළාවූ ඇදහිලිවන්තයාගේ ආත්මික උත්ථානයෙහි සාක්ෂි මොනවාද?

   ___ ___ ___

8. ඇදහිලිවන්තයාගේ ආත්මික උත්ථානය සංකේතවත් කරන බාහිර ක්‍රියාව කුමක්ද?

___

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

**යේසුස්වහන්සේගේ උත්ථානය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරගැනීම සඳහා පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.**

**උන්වහන්සේගේ උත්ථානය පිළිබඳ ප්‍රධාන කාරණා පහත සඳහන් කොටස් වල සඳහන් වේ.**

**මතෙව්** 28
**මාර්ක්** 16
**ලූක්** 24
**යොහන්** 20

**යේසුස්වහන්සේගේ උත්ථානය පිළිබඳ අමතර තොරතුරු පහත සඳහන් පද වල සඳහන් වේ.**

**ක්‍රියා** 1:22; 2:24, 32; 3:15, 26; 4:10, 33; 5:30; 10:40, 41; 13:30-33, 34, 37; 17:18, 32

**රෝම** 1:4; 4:24; 6:5; 8:11, 34

1 **කොරින්ති** 6:14; 15:12-58

2 **කොරින්ති** 4:14

**ගලාති** 1:1

**පිලිප්පි** 3:10

**එපීස** 1:20

1 **තෙසලෝනික** 1:10

2 **තිමෝති** 2:8

1 **පේතෘස්** 1:3

# නවවන පරිච්ඡේදය

## මළවුන්ගෙන් නැගිටීම - II වැනි කොටස

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මළවුන් අනාගතයෙහි උත්ථානයවීම පැහැදිලි කිරීමට
- ධර්මිෂ්ඨයන් හා අධර්මිෂ්ඨයන් අතර උත්ථානයෙහි වෙනස පැහැදිලි කිරීමට
- යේසුස්වහන්සේගේ මරණය හා උත්ථානය මනුෂ්‍ය ප්‍රාණයෙහි ඉරණම තීරණය කිරීම කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කිරීමට

**ප්‍රධාන පදය:**

> **මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව. (1 තෙසලෝනික 4:16-17)**

### හැඳින්වීම

මීට පෙර ජේදයෙහිදී "උත්ථානය" යන පදය අර්ථ දැක්වූ අතර අලුත් ගිවිසුමෙහි සඳහන් වන උත්ථානයන් තුන හඳුනා ගත්තෙමු. යේසුස්වහන්සේගේ අතීත කාල උත්ථානයත්, ඇදහිලිවන්තයාගේ වර්තමාන කාල උත්ථානයත් සවිස්ථර ඉගෙන ගත්තෙමු.

මෙම පරිච්ඡේදයෙන් සොහොන් ගෙවල් වල සිටින සියලුම අයගේ අනාගත උත්ථානය පැහැදිලි කරයි. අනාගත කාල උත්ථානය එකිනෙකින් වෙනස් වූ උත්ථාන දෙකක් වනු ඇත. ධර්මිෂ්ඨයන් උදෙසා එක් උත්ථානයක් ද අධර්මිෂ්ඨයන් උදෙසා තව උත්ථානයක්ද වේ. එලෙසම මෙම පරිච්ඡේදය යේසුස්වහන්සේගේ මරණය හා උත්ථානය මනුෂ්‍යයාගේ ප්‍රාණයෙහි ඉරණම කෙරෙහි බලපෑ අන්දම විස්තර කරයි.

මෙම පරිච්ඡේදය අනාගතය පිළිබඳ කාරණා සාකච්ඡා කරන බැවින් ලෝකාන්තිමය හා සදාකාලය පිළිබඳ අනාගතකිම් සම්බන්ධව ගනුදෙනු කරනු ඇත. ඔබ බයිබලයෙහි අනාගතවාක්‍ය පිළිබඳව එතරම් හුරුවක් නොමැති අයෙක් නම්, මෙම පාඩමෙහි ඇතුළත් "වැඩිදුර අධ්‍යයනය සඳහා" කොටස පුනරීක්ෂණය කර බලන්න. එහි දේව වචනයෙහි එළිදරව් කර දී ඇති පරිදි අනාගත සිදුවීම් වල සැකිල්ලක් සපයයි.

### අනාගත කාල: සොහොන් ගෙවල්වල සිටින සියලු දෙනාගේ අනාගත නැවත නැගිටීම

සියලුම මනුෂ්‍යයන් පිළිබඳව බයිබලය කාරණා දෙකක් එළිදරව් කරදෙයි. එනම්,

1. සියලුම දෙනා මළවුන්ගෙන් උත්ථානවීම අත්දකිනු ඇත.
2. සියලුම දෙනා සදාකාලික විනිශ්චය අත්දකිනු ඇත.

අනාගත උත්ථානවීම සම්බන්ධයෙන් යේසුස්වහන්සේ පවසනුයේ:

> **මේ ගැන මවිත නොවෙල්ලා. මක්නිසාද සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ, යහපත්කම් කළාවූ ජීවනයේ නැවත නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත නැගිටීමටත් පිටත්ව එන්නෝය. (යොහන් 5:28-29)**

ප්‍රේරිත වූ පාවුල් ද මෙම උත්ථානය පිළිබඳව ලියමින්:

> **මක්නිසාද ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය. (1 කොරින්ති 15:22)**

ආදම්ගේ මුල් පාපය හේතුවෙන් සියලු මනුෂ්‍යයන් කෙරෙහි මරණය පැමිණියේය. යේසුස්වහන්සේගේ මරණය හා උත්ථානය හේතුවෙන් සියලු මනුෂ්‍යයන් ශාරීරිකව මියගොස් පසුව උත්ථානය කරනු ලැබේ.

## උත්ථානය බලනොපාන්නාවූ විශේෂ අවස්ථා

මිය ගිය නොමැති කිසිවෙකුට මළවුන්ගෙන් නැවත නැගිටවීමක් අවශ්‍ය නොවේ.

පාවුල් ලියන්නේ:

> **මෙන්න, නුඹලාට රහසක් කියමි. අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව. නුමුත් අන්තිම හොරණෑව පිඹින කල මොහොතකින් ඇසිපිය හෙළන ක්ෂණයකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමුව.**
> **මක්නිසාද හොරණෑව පිඹිනු ලබන්නේය. එකල මළාහු නොදිරන ස්වභාවයෙන් යුක්තව නැගුටුවනු ලබන්නෝය. අපිද වෙනස්කරනු ලබන්නෙමුව.**
> **මක්නිසාද දිරන සුලු වූ මේක නොදිරන බවට පැමිණෙන්ට ඕනෑය. මරණීය වූ මේක අමරණ භාවයට පැමිණෙන්ට ඕනෑය. (1 කොරින්ති 15:51-53)**

පාවුල් "අපි සියල්ලෝම නොසැතපෙන්නෙමුව" කියා පැවසීමේදී ඔහු අදහස් කළේ ක්‍රිස්තුස්වහන්සේ තම සභාව උදෙසා නැවත පැමිණීමෙහිදී ජීවත්ව සිටින සියලු සත්‍ය ඇදහිලිවතුන් පිළිබඳවය.

එම ඇදහිලිවතුන් කිසිකලෙක මරණය අත් නොවිඳිනු ඇත. ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ව ඔසවා ගනු ඇත. ඔව්හු සොහොන් ගෙවල් වලින් පිට වී ආවාවූ කිතුනුවන් හා එකතු වනු ඇත.

## මළවුන්ගේ ඉරණම

යම්කෙනෙකුගේ ශාරීරික මරණය හා නැවත නැගිටීමට අතරතුර සිදුවන බොහෝ කාරණා පිළිබඳව බයිබලය කිසිවක් එළිදරව් නොකරයි. නමුත් කාරණා තුනක් පැහැදිලිය. එනම්,

1. මරණයෙහිදී සිරුර ආත්මය හා ප්‍රාණයෙන් වෙන්වේ. ශාරීරික වූ සිරුර සොහොනෙහි තැන්පත් කරනු ලබන අතර ප්‍රාණය හා ආත්මය සදාකාලයට පැවතේ.

2. ධර්මිෂ්ඨ වූ අයගේ ආත්ම හා ප්‍රාණ එක ස්ථානයකටත් අධර්මිෂ්ඨ වූ අයගේ ආත්ම හා ප්‍රාණ වෙනත් ස්ථානයකටත් යයි.

3. යේසුස්වහන්සේගේ මරණයෙන් පසු හා ඊට පෙර සිට ධර්මිෂ්ඨයන්ගේ ඉරණම වෙනස්ය.

යේසුස්වහන්සේ පොහොසත් මිනිසෙක් හා ඔහුගේ දොරටුව ළඟ සිඟමන් යදිමින් සිටි ලාසරස් නම් හිඟන මනුෂ්‍යයෙකුගේ කතාව ඇසුරින් මරණින් පසුව සිදුවන දෑ එළිදරව් කර දුන්සේක.

> **තවද හිඟන්නා නැසී, දේවදූතයන් විසින් ආබ්‍රහම්ගේ ළපැත්තට ගෙනයන ලද්දේය. ධනවතාත් නැසී, තැන්පත් කරන ලද්දේය.**
> **ඔහු හේඩීසියෙහි වධවිඳිමින් ඇස් ඔසවා, ආබ්‍රහම් සහ ඔහුගේ ළපැත්තේ හුන් ලාසරුස් ද දුර සිට දැක, මොරගසා: පියවූ ආබ්‍රහම් මට කරුණාකොට තමාගේ ඇඟිල්ලේ අග දියේ ගලා මාගේ දිව සිසිල් කරන්ට ලාසරුස් එවුව මැනව: මක්නිසාද මම මේ ගිනි දැලෙහි වේදනා විඳිමියි කීවේය.**
> **නුමුත් ආබ්‍රහම් කියනුයේ: පුත්‍රය, නුඹේ ජීවිතයේදී නුඹේ යහපත් දේ නුඹට ලැබුණු බවත් එලෙසම ලාසරුස්ට අයහපත් දේ ලැබුණු බවත් සිහිකරපන්න. නුමුත් දැන් ඔහු මෙහි සැනසී ඉඳියි. නුඹ වේදනා විඳින්නෙහිය.**

**මේ සියල්ල ඇර, මෙහෙන් නුඹලා ළඟට යන්ටත් ඔහෙන් අප ළඟට එන්ටත් කැමති වුවන්ට බැරි වන ලෙස අපටත් නුඹලාටත් අතරෙහි මහත් කුහරයක් පිහිටා තිබේයයි කීවේය. (ලූක් 16:22-26)**

මරණයෙහිදී අපගේ සිරුර නැවතත් පොළොවට හැරී යයි.

**මක්නිසාද නුඹ දූවිලිය, දූවිල්ලට හැරී යන්නෙහිය. (උත්පත්ති 3:19 )**

මිනිසාගේ ප්‍රාණය හා ආත්මය අලුත් පැවැත්මක් සඳහා සදාකාලයට ඇතුළු වේ. මෙහිදී එක් එක් පුද්ගලයා හට පුද්ගලභාවයක්, හඳුනාගැනීමට හැකියාවක්, වර්තමාන තත්වය පිළිබඳ දැනුමක් පවතී. ධර්මිෂ්ඨයාගේ ආත්මයට අත්වන ඉරණම දුෂ්ඨයාගේ ආත්මයට අත්වන ඉරණමට වඩා වෙනස්ය. ලාසරුස් හා පොහොසත් මිනිසා යන දෙදෙනාම හෙබ්‍රෙව් භාෂාවෙන් “ෂෙයෝලය” නමින්ද ග්‍රීක භාෂාවෙන් “හේදීසිය” යන නමින්ද හඳුන්වන ස්ථානයකට ගියහ (පරණ ගිවිසුම - මුලින්ම වැඩි කොටසක් ලියන ලද්දේ හෙබ්‍රෙව් භාෂාවෙනි. අලුත් ගිවිසුම ලියා ඇත්තේ ග්‍රීක භාෂාවෙනි).

එහෙත් මෙම මනුෂ්‍යයන් දෙදෙනාගේ ඉරණම එකිනෙකාගෙන් වෙනස් විය. පොහොසත් මිනිසා වද වේදනා පිරි පාතාලය නම් ස්ථානයක සිටියේය. ලාසරස් විවේක ස්ථානයක විය. මෙම ස්ථාන දෙක අතර හෙලක් පැවති අතර දෙපස සිටි අයට එය හරහා ගමන් කළ නොහැකි විය.

මෙම හෙල තරණය කළ නොහැකි නම්, එයින් තේරුම් යන්නේ ප්‍රාණයෙහි සදාකාලික ඉරණම මරණයෙන් පසුව වෙනස් කළ නොහැකි බවය. එබැවින් මළවුන් උදෙසා යාච්ඤා කිරීම පලක් නැත. යේසුස්වහන්සේව තම ජීවිතයෙහි මිදුම්කරු ලෙස පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම තීරණය කළ යුත්තේ ජීවත්ව සිටියදීමය. එම තීරණය මත ඔබගේ ඉරණම අධිෂ්ඨානය වනු ඇත.

මෙලොවින් තුරන්ව ගිය ධර්මිෂ්ඨයන්ගේ ආත්මය යන්නාවූ විවේක ස්ථානයට “ආබ්‍රහම්ගේ ළපැත්ත” ලෙස නම් කෙරේ. එහි අර්ථය නම්, ආබ්‍රහම්ගේ ඇදහිල්ල නම් ආදර්ශය අනුගමනය කළාවූ එනම්, එකම සත්‍යවූ ජීවමාන වූ දෙවියන්වහන්සේට සේවය කළාවූ අය සඳහා වෙන්කරන ලද ස්ථානයක් බවයි.

## යේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසුව

යේසුස්වහන්සේගේ මරණය හා නැවත නැගිටීමට පෙර මිය ගියාවූ ප්‍රාණවලට සිදුවන දේ ලාසරස් හා පොහොසත් මිනිසාගේ කතාවෙන් එළිදරව් වේ. එහෙත් උන්වහන්සේගේ උත්ථානයෙන් පසුව අධර්මිෂ්ඨයන්ගේ ඉරණම එලෙසම පැවති අතර ධර්මිෂ්ඨයන්ගේ ඉරණම වෙනස් විය.

යේසුස්වහන්සේ මිය යන කල උන්වහන්සේ “පියාණනි, ඔබගේ දෑතට මාගේ ආත්මය භාර කරමි”යි පැවසූ සේක. ඉන් අනතුරුව, මරණයෙන් පසු ආත්මයට සිදු වූ දෙය බයිබලය අනාවරණය කරයි. එනම්,

**ඉතින් නැගිටුනසේකැයි කී බැවින් උන්වහන්සේ පොළොවේ පහත් තැන්වලට බැස්ස බවක් මිස වෙන කුමක් හැඟේද?**
**බැස්සාවූ උන්වහන්සේ නම්, සියල්ල පූර්ණ කරන පිණිස සියලු ස්වර්ගවලින් ඉහළට නැගුණාවූ තැනැන්වහන්සේමය. (එපීස 4:9-10)**

යේසුස්වහන්සේගේ මරණයට පෙර, පසුතැවිලි වූ සොරාට යේසුස්වහන්සේ පැවසුයේ,

**“අදම නුඹ මා සමග පාරාදීසයේ සිටින්නෙහිය” කියාය. (ලූක් 23:43)**

යේසුස්වහන්සේගේ ආත්මය සියලු මිය ගියවුන්ගේ ආත්ම පවතින ස්ථානය වන ෂෙයෝලයට බැස ගිය සේක. පළමුව, එතුමා ධර්මිෂ්ඨයන්ගේ ආත්ම පවතින ස්ථානයට ගිය සේක. එය “පාරාදීසය” හෝ “ආබ්‍රහම්ගේ ළපැත්ත” ලෙස නම් කෙරේ.

පාරාදීසයේ සිට යේසුස්වහන්සේ තවදුරටත් ෂෙයෝලයෙහි දුෂ්ඨයන්ට වෙන්කර ඇති ස්ථානයට ගියසේක. යේසුස්වහන්සේ මිනිස් සංහතිය උදෙසා ඉටු කළ සමගිකිරීමේ මිලය ගෙවීමේ සේවය සඳහා මෙය අවශ්‍ය විය. මිනිස් පාපය උදෙසා උන්වහන්සේට ශාරීරික හා ආත්මික වන්දිය ගෙවීමට සිදුවිය. ශාරීරික වන්දිය නම්, ශාරීරික මරණය වේ. ආත්මික වන්දිය නම්,

දෙවියන්වහන්සේගෙන් වෙන් කරනු ලැබීමය. එය ආත්මික මරණය නම් වේ. ෂෙයෝලයේදී යේසුස්වහන්සේ එය අත්විඳි සේක.

ඉන්පසුව යේසුස්වහන්සේගේ ආත්මය ෂෙයෝලයෙන් පිටත් වී නැවත ලෝකයට පැමිණි සේක. එම වේලාවෙහි මෙතෙක් සොහොන් ගැබ තුළ අජීවී ලෙස වැතිර තිබූ එතුමාගේ සිරුර සොහොනින් මරණින් නැවත නැගිට ඔසවනු ලැබිය. එතුමාගේ ශ×රය, ආත්මය හා ප්‍රාණය නැවත එකමුතු වී සම්පූර්ණ පුද්ගලයකු ඇතිවිය. මීට පෙර පරිච්ඡේදයෙහිදී අප ඉගෙන ගත් පරිදි යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට යාමට පෙර මිහිපිට බොහෝ දෙනෙකුට පෙනෙන පරිදි දර්ශනය වූ සේක.

## අලුත් මෝස්තරයක්

යේසුස්වහන්සේගේ මරණයත් නැවත නැගිටීමත් අතරතුර සිදුවුවාවූ කාරණා මගින් ධර්මිෂ්ඨයාගේ ප්‍රාණයෙහි ඉරණම සඳහා අලුත් මෝස්තරයක් පිහිටුවන ලදි. ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානයට පෙර, පිටත්ව ගියාවූ ධර්මිෂ්ඨයන්ගේ ආත්ම පාරාදීසයට ගියෝය. යේසුස්වහන්සේගේ මරණයටත් උත්ථානයටත් පසුව පිටත්ව ගියාවූ ධර්මිෂ්ඨයන්ගේ ආත්ම එක එල්ලේ ක්ෂණයකින්ම දෙවියන්වහන්සේගේ අභිමුවට පැමිණිය හැකි විය. මෙය ස්තේපන්ගේ මරණයෙහි වාර්තාව මගින් සනාථ කර ඇත.

> **නුමුත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණව, ස්වර්ගය දෙස බලා දෙවියන්වහන්සේගේ මහිමයත් දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ යේසුස්වහන්සේ නැගිට සිටිනවාත් දැක:**
> **බලව, ස්වර්ගය විවර වී තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ නැගිට සිටිනවාත් මට පෙනේයයි කීවේය.**
> **ස්වාමිවූ යේසුස්වහන්සේ, මාගේ ආත්මය පිළිගත මැනව කියා ස්තේපන් යාච්ඤා කරද්දී ඔව්හු ඔහුට ගල්ගැසුවෝය.**
> **ඔහු දණින් වැටී: ස්වාමින්වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනවයි මහත් හඬින් මොරගසා කීවේය. ඔහු මෙසේ කියා සැතපුණේය. (ක්‍රියා 7:55-56, 59-60)**

ස්තේපන් මිය යාමට ස්වල්ප මොහොතකට පෙර ඔහු ස්වර්ගයත් දෙවියන්වහන්සේගේ දකුණු පස යේසුස්වහන්සේත් සිටිනු දර්ශනයකින් දුටුවේය. ඔහු ඉන්පසු "ස්වාමිවූ යේසුස්වහන්සේ මාගේ ආත්මය පිළිගත මැනව" යයි පැවසිය. එම වචන වලින් පෙන්නුම් වන්නේ ඔහුගේ මරණයෙන් පසු ඔහුගේ ආත්මය හා ප්‍රාණය ක්ෂණයකින්ම සෘජුවම දෙවියන්වහන්සේ වෙතට ස්වර්ගයට යන බව ඔහු දැන සිටි බවය.

ප්‍රේරිත වූ පාවුල් ද මෙය සනාථ කරයි.

> **අපි ශරීරය නමැති ගෙදර සිටින විට ස්වාමින්වහන්සේගෙන් ඈත්ව සිටින බව දැන ...**
> **එසේය, අපි ධෛර්යවත්ව ශරීරයෙන් ඈත්ව ස්වාමින්වහන්සේ සමග සිටින්ට වඩා කැමති වෙමුව. (2 කොරින්ති 5:6, 8)**

පාවුල් මරණයේ වටිනාකම, මිහිපිට ඔහුට පැවරී ඇති සේවාව ඉටු කිරීම පිණිස ජීවත්ව සිටීමේ වටිනාකම හා සන්සන්දනය කළේය. ශරීරයෙන් බැහැරව සිටීම නම්, ක්‍රිස්තුස්වහන්සේ සමග සිටීම යැයි ඔහු පැවසිය.

> **මක්නිසාද මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා) ය. මරණයද මට ලාභයක්ය.**
> **නුමුත් මාංසයෙහි ජීවත්වීම (මාගේ කොටස නම්), මාගේ වැඩවලින් ප්‍රයෝජන ඇතිනිසා කොයි එක තෝරාගනිම්දැයි නොදනිමි.**
> **මාගේ ආශාව නම්, තුරන්ව ගොස් ක්‍රිස්තුස්වහන්සේ සමග විසීමටය. මක්නිසාද ඒක බොහෝසෙයින් වඩා හොඳය.**
> **නුමුත් මාංසයෙහි සිටීම නුඹලා නිසා වඩා ඕනැකෙරේ. (පිලිප්පි 1:21-24)**

ධර්මිෂ්ඨයාගේ අලුත් ඉරණමට අමතරව, යේසුස්වහන්සේ සියලු මනුෂ්‍යයන්ට අනුගමනය කළ හැකි අලුත් රටාවක් පිහිටවූ සේක.

1. මරණයෙහිදී මිනිසාගේ ආත්මය හා ප්‍රාණය තුරන් වූ ආත්ම තලයට ඇතුලු වේ. ධර්මිෂ්ඨයන් දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඉහළට යනු ඇත. දුෂ්ඨයන් වද වේදනාවේ ස්ථානයට (අපායට) යනු ඇත.

2. උත්ථානය වේලාවෙහිදී ශරීරය මළවුන්ගෙන් නැවතත් ඔසවනු ලැබ ආත්මය හා ප්‍රාණය සමග එකමුතු වනු ඇත.

## මළවුන්ගේ උත්ථානය : පියවර තුන

ප්‍රේරිත වූ පාවුල් මළවුන් උත්ථානය වීම පියවර තුනකින් විස්තර කරදෙයි.

### පළමු පියවර :

පළමුවෙන්ම මළවුන්ගෙන් උත්ථානවීම , යේසුස්වහන්සේගේ උත්ථානය වේ.

**මක්නිසාද ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත්කරනු ලබන්නෝය.**
**නුමුත් එක් එක් අය තම තමාගේම ක්‍රමයෙන්ය. ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලයය. ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී උන්වහන්සේ සන්තක වූයෝ (නැගිටින්නෝ) ය.**
**එවිට කෙළවර පැමිණේ. උන්වහන්සෙ සියලු අධිපතිකම්ද බලයද පරාක්‍රමයද නැති කළ කල්හි, උන්වහන්සේ රාජ්‍යය පියවූ දෙවියන්වහන්සේට භාරදෙනසේක.**
**(1 කොරින්ති 15:22-24)**

පළමුවෙන්ම උත්ථානය නම් යේසුස්වහන්සේගේ උත්ථානයයි. "ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලය" - යන වාක්‍යාංශයෙහි අර්ථය එය වේ. අනාගතයෙහිදී සිදුවන්නාවූ මළවුන්ගෙන් උත්ථානවීම් තව දෙකක් ඇත. ඒවා නම්, ධර්මිෂ්ඨයන් හා දුෂ්ඨයන්ගේ උත්ථානවීම්ය.

**ධර්මිෂ්ඨයන්ගේද අධර්මිෂ්ඨයන්ගේද නැවත - නැගිටීමක් වන්නේ යයි මොවුන් බලාසිටින්නාක් මෙන් මමත් දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටිමි.**
**(ක්‍රියා 24:15)**

බයිබලය මෙම උත්ථානවීම් දෙක ජීවනයෙහි නැවත - නැගිටීම හා විනිශ්චයෙහි නැවත - නැගිටීම ලෙස නම් කරයි.

**සැබවක් සැබවක් නුඹලාට කියමි - දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ හඬ මළවුන්ට ඇසෙන පැය පැමිණෙන්නේය, දැනුත් පැමිණ තිබේ. අසන අය ජීවත්වන්නෝය.**
**මේ ගැන මවිත නොවෙල්ලා. මක්නිසාද, සොහොන් ගෙවල්හි සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ, යහපත්කම් කළාහු ජීවනයේ නැවත - නැගිටීමටත් නපුරුකම් කළාහු විනිශ්චයේ නැවත - නැගිටීමටත් පිටත්ව එන්නෝය. (යොහන් 5:25, 28-29)**

### දෙවන පියවර :

යේසුස්වහන්සේ තම සභාව උදෙසා පොළොවට නැවත පැමිණෙන කල ජීවනයේ උත්ථානය සිදුවනු ඇත. මෙම සිදුවීමෙහිදී යේසුස්වහන්සේ තුළ සත්‍ය ඇදහිලිවතුන් ලෙස දිවිගෙවා මිය ගියාවූ සෑම දෙනම නැවත නැගිටිනු ඇත. මෙය ධර්මිෂ්ඨයන්ගේ නැවත උත්ථානය නොහොත් ජීවනයේ උත්ථානය ලෙස හැඳින්වේ.

පළමු පියවර වූයේ ... යේසුස්වහන්සේගේ උත්ථානයයි.
දෙවන පියවර වනුයේ ... ඇදහිලිවන්තයන්ගේ උත්ථානයයි.

### තුන්වන පියවර :

මළවුන්ගෙන් උත්ථානවීම  තුන්වන පියවර වනුයේ "අවසානය" ලෙස හඳුන්වන උත්ථානයෙනි. මෙය සිදුවන්නේ ක්‍රිස්තුස්වහන්සේ මිහිමත වසර 1000ක් සමාදානයෙන් රජකම් කළ පසුවය. මෙය "අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය" නැතහොත් "විනිශ්චය සඳහා උත්ථානය" නම් වේ.

## සාරාංශගත කිරීම් :

පහත සඳහන් වගුව ඔබ උත්ථානයෙහි අවදි තුන පිළිබඳව ඉගෙන ගත් කාරණා සාරාංශ කොට දක්වයි.

**මළවුන්ගේ උත්ථානය**

පළමු පියවර : යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය
|
දෙවන පියවර : ධර්මිෂ්ඨයන්ගේ උත්ථානය (ජීවනයේ උත්ථානය)
|
තුන්වන පියවර : අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය (විනිශ්චයේ උත්ථානය)

ඔබ දැනටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය පිළිබඳව අධ්‍යයනය කර තිබේ. දැන් ඔබ ධර්මිෂ්ඨයන්ගේ හා අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය අධ්‍යයනය කරනු ඇත.

## ධර්මිෂ්ඨයන්ගේ උත්ථානය

පාවුල් පැවසූ ආකාරයට උත්ථානයෙහි දෙවන අදියර වනුයේ "ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නවුන් සඳහා" වන උත්ථානයයි. එනම්, තමුන්ගේ මළ ක්‍රියා පිළිබඳව පසුතැවිලි වී ඇදහිල්ලෙන් යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත්තාවූ අය වේ. කිතුනුවන්ගේ මෙම උත්ථානය ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමෙහිදී සිදුවන බව පාවුල් පවසයි. ධර්මිෂ්ඨයන්ගේ උත්ථානය නොහොත් ජීවනයේ නැවත නැගිටීම නම් මෙම කරුණ පිළිබඳ අලුත් ගිවිසුමෙහි ඇති ප්‍රධාන කොටස තෙසලෝනික පොතෙහි සඳහන් වේ.

> **තවද සහෝදරයෙනි, බලාපොරොත්තුවක් නැත්තාවූ අන් තැනැත්තන් මෙන් නුඹලා ශෝක නොවන පිණිස සැතපෙන්නන් ගැන නුඹලා නොදැන සිටිනවාට අපි නොකැමැත්තෙමුව.**
> **මක්නිසාද යේසුස්වහන්සේ මැරී නැවත නැගිටුණුසේකැයි අපි අදහමු නම්, එසේම දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ කරණකොටගෙන සැතපී සිටින්නන් උන්වහන්සේ සමග ගෙනෙන සේක.**
> **මක්නිසාද ස්වාමින්වහන්සේගේ ජීම දක්වා ජීවත්ව ඉතුරු වෙන අපි සැතපුණු තැනැත්තන්ට කිසිසේත් ඉස්සර නොවන්නෙමු යයි ස්වාමින්වහන්සේගේ වචනයෙන් අපි නුඹලාට කියමුව.**
> **මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමුකොට නැගිටින්නෝය.**
> **එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එක්විටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව.**
> **ඉන්නිසා, මේ වචන වලින් එකිනෙකා සනසාගනිල්ලා. (1 තෙසලෝනික 4:13-18)**

පාවුල්ගේ මෙම ඉගැන්වීමෙහි පරමාර්ථය වූයේ මියගියාවූ කිතුනුවන් පිළිබඳව ["සැතපී සිටින්නන්"] අනෙක් ඇදහිලිවතුන්ව සැනසීමය. සියලු සත්‍ය ඇදහිලිවතුන් උත්ථාන කරනු ලබන බවට නිසැක කමක් ඔහුගේ පණිවිඩය අපට ලබාදෙයි.

යේසුස්වහන්සේ නැවත පැමිණි කල පොළොවෙහි ඉතා වැදත් සිදුවීම් දෙකක් සිදුවේවි.

1. මීට පෙර මිය ගියාවූ සියලුම ඇදහිලිවතුන් නැවත නැගිටුවනු ලැබ, අලුත් ශරීර ලබා, ඔවුන්ගේ ආත්ම සමග ප්‍රාණ එකතු කරනු ලැබේ.

2. ඒ වන විට පොළොවෙහි ජීවත්ව සිටින්නාවූ සියලු සැබෑ ඇදහිලිවතුන්ගේ භෞමික ශරීර ක්ෂණයකින් වෙනසකට භාජනය වනු ඇත.

ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීමෙහිදී මියගොස් සිට උත්ථාන කරනු ලැබූ සහ ජීවතුන් අතර සිටින්නාවූ ඇදහිලිවන්තයන් දෙගොල්ලන්ම දෙවියන්වහන්සේගේ බලයෙන් පොළොවේ සිට මධ්‍යාකාශයට ඔසවා ගනු ලැබේ. ඔව්හු ස්වාමින්වහන්සේ සමග හා එකිනෙකා සමග නැවත එකතු කරනු ලබන්නෝය. එතැන් පටන් ඔව්හු සදාකාලයට ස්වාමින්වහන්සේ සමග සිටිනු ඇත.

ධර්මිෂ්ඨයන්ගේ උත්ථානය පිළිබඳව අමතර විස්තර සටහනක් එළිදරව් පොත සපයාදෙයි.

> **තවද සිංහාසන දුටිමි, ඔව්හු එහි හිඳ ගත්තෝය. විනිශ්චයද ඔවුන්ට දෙන ලද්දේය. තවද යේසුස්වහන්සේගේ සාක්ෂිය නිසාද දෙවියන්වහන්සේගේ වචනය නිසාද හිස් කපා දමනු ලැබුවන්ගේද මෘගයාටත් උගේ රූපයටවත් නමස්කාර නොකළාවූ උගේ සලකුණ තමන්ගේ නලල් වලත් අත්වලත් නොලැබුවාවූ තැනැත්තන්ගේද ආත්මයන් දුටිමි: ඔව්හු ජීවත්ව ක්‍රිස්තුස්වහන්සේ සමග අවුරුදු දහසක් රජකම් කළෝය.**
> **මළාවූ අනික් අය අවුරුදු දහස කෙළවර වන තුරු ජීවත් නුණෝය. මේ වනාහි පළමුවෙනි නැවත නැගිටීමය.**
> **පළමුවෙනි නැවත නැගිටීමට පංගුකාරකම ඇති තැනැත්තා වාසනාවන්තය ...**
> **(එළිදරව් 20:4-6)**

මෙම ජේදයෙහි විස්තර කර දී ඇත්තේ පීඩා කාලයෙහිදී වේද සාක්ෂිකයන් ලෙස මියගියාවූ ඇදහිලිවතුන්ගේ උත්ථානයයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රාජ්‍යය මිහිපිට පිහිටුවීමට ඉතා ආසන්නයේ ඔව්හු ඔසවනු ලබනු ඇත. මෙම ජේදයෙන් පැහැදිලිවන පරිදි ධර්මිෂ්ඨයන්ගේ උත්ථානයෙන් එනම්, පළමුවන උත්ථානය ලෙස හඳුන්වන සිද්ධියත් සමග ඇදහිලිවතුන් උත්ථාන කිරීම සම්පූර්ණ වනු ඇත.

## ඇදහිලිවතුන් සඳහා අලුත් ශරීර

ඇදහිලිවතුන් හට හිමිවන්නාවූ නව සිරුරු පිළිබඳව බයිබලය යම් කිසි කාරණා එළිදරව් කර දෙයි. එම සිරුර :

### දේව කැමැත්තට අනුකූලව ලැබෙනු ඇත :

> **නුමුත් දෙවියන්වහන්සේ තමන් කැමති වූ හැටියට ඊට කඳක්ද එක එක බීජයට නියම වූ කඳක්ද දෙනසේක. (1 කොරින්ති 15:38)**

### මහිමවත් සිරුරක් :

> **අගෞරවයෙන් යුක්තව වපුරනු ලැබේ; තේජසින් යුක්තව නැගුටුවනු ලැබේ. දුර්වල කමෙන් යුක්තව වපුරනු ලැබේ; බලයෙන් යුක්තව නැගුටුවනු ලැබේ. (1 කොරින්ති 15:43)**

### බලවත් සිරුරක් :

> **ස්වභාවික ශරීරයක්ව වපුරනු ලැබේ; ආත්මික ශරීරයක්ව නැගුටුවනු ලැබේ. ස්වභාවික ශරීරයක් තිබේනම්, ආත්මික ශරීරයක්ද තිබේ. (1 කොරින්ති 15:43 ආ)**

### නොමියන දිරාපත් නොවන සිරුරක් :

එහි අරුත නම්, නව සිරුර කිසිවිට වයසට නොවන දිරාපත් නොවන හෝ මිය නොයන සිරුරක් බවය.

> **මළාහු නොදිරන ස්වභාවෙන් යුක්තව නැගසිටුවනු ලබන්නෝය. අපිද වෙනස් කරනු ලබන්නෙමුව.**
> **මක්නිසාද දිරන සුලු වූ මේ නොදිරන බවට පැමිණෙන්ට ඕනෑය. මරණීය වූ මේක අමරණ භාවයට පැමිණෙන්ට ඕනෑය.**
> **දිරන සුලු වූ මේක නොදිරන භාවයටත් මරණීය වූ මේක අමරණ භාවයටත් පැමිණි කල්හි මරණය ජයෙන් ගිලිනා ලද්දේයයි ලියා තිබෙන වචනය සම්පූර්ණ වේ.**
> **(1 කොරින්ති 15:52-54)**

## නැවත නැගිටි අපගේ ස්වාමින්වහන්සේ සතුවූ සිරුර වැනි සිරුරක් :

**නුමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින සේක්මය. උන්වහන්සේ සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය. (1 කොරින්ති 15:20)**

යේසුස්වහන්සේ පළමුවෙන්ම මළවුන්ගෙන් උත්ථාන වූ සේක. උන්වහන්සේගේ නැවත නැගිටීම ඉදිරියෙහිදී ලැබෙන්නාවූ මහත් අස්වැන්නක ප්‍රථම ඵලය ලෙසට සන්සන්දනය කර ඇත. මෙම මහත් අස්වැන්න නම් ඇදහිලිවතුන්ගේ උත්ථානයයි. අපගේ උත්ථාන වූ සිරුරු ස්වාමින්වහන්සේගේ සිරුර මෙන් වනු ඇත.

**ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන්වහන්සේගේ දරුවෝය, අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශ වී නැත. උන්වහන්සේ ප්‍රකාශ වුනාම අපි උන්වහන්සේට සමාන වන බව දනිමුව. මක්නිසාද උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන්වහන්සේ දකින්නෙමුව. (1 යොහන් 3:2)**

**සියලු දේ පවා තමන්ට යටත් කරන්ට පුළුවන් වූ බලය ලෙස උන්වහන්සේ අපේ පහත්කමේ ශරීර තමන්වහන්සේගේ තේජසේ ශරීරයට සමාන වන පිණිස ඒවා වෙනස් කරනවා ඇත. (පිලිප්පි 3:21)**

## අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය

අවසාන උත්ථානය පාවුල් 1 කොරින්ති 15:24හි විස්තර කර ඇත. ඔහු එය “අවසානය” ලෙසට නම් කර තිබේ. මෙය අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය වේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මිහිපිට වසර 1000ක් රජකම් කර අවසන් වූ පසුව දෙවියන්වහන්සේ තමාගේ සියළුම සතුරන් පරාජය කරන සේක. අවසාන ලෙස පරාජය කරන්නාවූ සතුරා නම්, මරණය වේ. එමගින් ලෝකය උදෙසා දෙවියන්වහන්සේ සැලසුම සම්පූර්ණ වනු ඇත.

**එසේ කළේ කාල වල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකරාශි කරන්ට,**
**තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්නේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)**

එළිදරව් 20 පරිච්ඡේදයෙහි අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය දෙවියන්වහන්සේගේ සැලසුමෙහි ඉතිරි අංශ වලට සම්බන්ධ වන ආකාරය පෙන්වා දෙයි. මෙම ඡේදයෙන් සාතන් දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය බලය අවසන් වරටත් ඩැහැගැනීමට දරන උත්සාහය ප්‍රේරිත වූ යොහන් විස්තර කරයි. මෙය සිදුවනුයේ ක්‍රිස්තුස්වහන්සේගේ දහස් අවුරුදු රජකම් කිරීමෙන් පසුවය.

**අවුරුදු දහස කෙළවර වූ කල සාතන් තමාගේ හිරගෙයින් මුදනු ලැබ,**
**පොළොවේ සතර කොනේ සිටින්නාවූ ගොග් මාගොග් යන ජාතීන් මුළා කරන්ටත් ඔවුන් යුද්ධයට රැස්කරන්ටත් නික්ම එන්නේය. ඔවුන්ගේ ගණන මුහුදේ වැලි මෙන්ය.**
**ඔව්හු පොළොවේ සෑම තැනටම ගොස් ශුද්ධවන්තයන්ගේ අන්දායමද ප්‍රිය වූ නුවරද වටලා ගත්තෝය. එවිට [දෙවියන්වහන්සේ වෙතින්] ස්වර්ගයෙන් ගිනි බැස ඔවුන් විනාශ කෙළේය.**
**ඔවුන් මුළාකළ යක්ෂයා වනාහි මෘගයාද බොරු අනාගතවක්තෘද වසන ගින්නෙන්ද ගෙන්දගම්න්ද යුත් විලට හෙළනු ලැබුවේය: ඔව්හු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:7-10)**

ක්‍රිස්තුස්වහන්සේගේ දහස් අවුරුදු රජකම් කිරීමේ යුගයෙහිදී ලෝක ජාතීන් පාලනය කිරීමේ මූලස්ථානය වනුයේ ජෙරුසලමය. මෙම කාලය මුළුල්ලේ සාතන් හිරකරුවෙකු වනු ඇත. දහස් අවුරුදු රජකම් කිරීමෙන් පසුව සාතන්ව මුදා හරිනු ලබන අතර විජාතීන් අතර අවසාන කැරලි ගැසීමක් සඳහා සෑහෙන පමණ කාලයක් සාතන්ට හිමි වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජෙරුසලමට පහරදීමේ ප්‍රයත්නයක් යොදනු ලැබේ. එවිට දෙවියන්වහන්සේගේ මැදිහත් වීමෙන් අහසින් ගිනි බැස කැරලිකරුවන් පරාජය කරනු ඇත. සාතන් වධ වේදනා විඳින පිණිස සදාකාලික ගින්නට හෙළනු ලැබේ.

## අවසානය සහ සදාකාලය

ඉතිරි වී සිටින්නාවූ සියලු මිය ගියවුන්ගේ අවසාන උත්ථානය යොහන් විස්තර කර දෙයි.

> **තවද මහත් සුදු සිංහාසනයක්ද එහි වැඩහුන් තැනැන්වහන්සේද දුටිමි. උන්වහන්සේගේ අභිමුඛයෙන් අහසත් පොළොවත් පළා ගියේය: ඒවාට ස්ථානයක් සම්බ නුණේය.**
> **මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටුමි. පොත් ද දිගහරිනු ලැබුවේය. ජීවන පොත වන තවත් පොතක් දිගහරිනු ලැබිය. මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය.**
> **සමුද්‍රය එහි උන් මළවුන් පාවා දුන්නේය. ඔව්හු එකිනෙකා තමාගේ ක්‍රියා ලෙස විනිශ්චය කරනු ලැබුවෝය.**
> **මරණයත් පාතාලයත් ගිනිවිලට හෙලන ලද්දේය. මෙය දෙවෙනි මරණය එනම්, ගිනිවිලය.**
> **යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බ වීද ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය.** (එළිදරව් 20:11-15)

## සාරාංශයක් ලෙසින් ...

ක්‍රිස්තුස්වහන්සේගේ දහස් අවුරුදු රජකම් කිරීමේ කාලය ඇරඹීමට පෙර මිය ගිය සියලු සැබෑ ඇදහිලිවතුන් උත්ථානය කරනු ලබනු ඇත. මෙය පළමුවන උත්ථානයයි. එය ධර්මිෂ්ඨයන් සදාකාලික ජීවනය උදෙසා උත්ථාන කරනු ලැබීමය. එබැවින් දහස් අවුරුදු රජකම් කිරීමෙන් පසුව උත්ථාන කරනු ලබනු ඇත්තේ මියගිය අධර්මිෂ්ඨයන් වැඩි ප්‍රමාණයකි. මෙය විනිශ්චය සඳහා අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය වේ. මෙම උත්ථානයන්ට පසුව සිදුවන මහත් සිදුවීමක් පිළිබඳව බයිබලය පවසයි. මෙය සදාකාලික විනිශ්චය ලෙස හඳුන්වන අතර එය අපගේ ඊළඟ පරිච්ඡේදයෙහි විෂය වේ.

විනිශ්චයෙන් පසුව අධර්මිෂ්ඨයන්ගේ ඉරණම වනුයේ ගිනි විලය. එය බයිබලයෙහි "දෙවන මරණය" ලෙස නම් කෙරේ. දුෂ්ඨයෝ දැනටම ශාරීරික මරණය අත්විඳ තිබේ. දැන් ඔව්හු දෙවන මරණය වන දෙවියන්වහන්සේගෙන් සදාකාලික වූ වෙන්වීම අත්දකිනු ඇත. මෙය ආත්මික මරණය නොහොත් දෙවන මරණයයි. ධර්මිෂ්ඨයාගේ ඉරණම නම් සදාකාලිකව දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි කාලය ගෙවීමයි.

## උත්ථානවීමේ පණිවිඩය

උත්ථානවීමේ ධර්මය ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි මූලික වූ පදනමකි. ශුභාරංචි පණිවිඩයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය හා මරණය පමණක් නොව, එතුමාගේ උත්ථානයේ පණිවිඩය ද අන්තර්ගත වේ.

ප්‍රේරිතයෝ යේසුස්වහන්සේගේ උත්ථානය පමණක් නොව මළවුන්ගේ උත්ථානය පිළිබඳවද දේශනා කළහ.

> **යේසුස්වහන්සේ කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටීම ප්‍රකාශ කළ බැවිනුත් අතිශයෙන් කැළඹී ...** (ක්‍රියා 4:2)

> **... මෙසේ කීවේ ඔහු යේසුස්වහන්සේ හා මළවුන්ගෙන් නැගිටීම ප්‍රකාශ කළ බැවින්ය ... මළවුන්ගෙන් නැගිටීම ගැන ඔවුන් ඇසූ කල සමහරු සරදම් කළෝය. සමහරෙක් මේ ගැන අපි නැවතත් නුඹ කියන දේ අසන්නෙමු යයි කීවෝය.** (ක්‍රියා 17:18, 32)

උත්ථානවීමේ පණිවිඩය කෙරෙහි ජනතාව දක්වන්නාවූ විවිධ ප්‍රතිචාර දෙකක් මෙම පදවලින් විදහා දැක්වේ. සමහරු එය විශ්වාස නොකරනු ඇත. අනෙක් අය එම පණිවිඩයට සවන් දෙනු ඇත. ඇදහිලිවතුන් ලෙස අපගේ වගකීම වනුයේ ශුභාරංචි පණිවිඩයේ අංගයක් හැටියට උත්ථානවීමේ පණිවිඩයද අන් අය සමග බෙදාගැනීමය. පාවුල් කළේ එම කාර්යයයි.

> **තවද සහෝදරයෙනි, මම නුඹලාට දේශනා කළාවූ නුඹලා පිළිගත්තාවූ නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි.**

> මා නුඹලාට ප්‍රකාශ කළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහු නම්, කුමන වචන වලින් එය නුඹලාට දේශනා කෙළෙම්දැයි දන්වමි. නැත්නම් නුඹලා නිශ්ඵල ලෙස ඇදහූවහුය.
> ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාර දුනිමි. එනම්, ලියවිලි වල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත් උන්වහන්සේ තැන්පත් කරනු ලැබූ බවත් ලියවිලි ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්, කේපස්ටද පසුව දොළොස්දෙනාටද පෙනුණු බවත්ය.
> ඉන්පසු උන්වහන්සේ එකවිටම පන්සියකට වඩා සහෝදරයන්ට පෙනුණුසේක. ඔවුන්ගෙන් වැඩි දෙනා මේ දක්වා සිටිති. සමහරු සැතපුණෝය.
> ඉන්පසු උන්වහන්සේ යාකොබ්ටද පසුව සියළු ප්‍රේරිතයන්ටද පෙනුණුසේක.
> සියල්ලන්ට පසු, අකලට උපන් තැනැත්තෙක් වැනි වූ මටත් උන්වහන්සේ පෙනුණුසේක. (1 කොරින්ති 15:1-8)

මළවුන්ගෙන් උත්ථානවීමේ ධර්මයෙන් තොරව දේශනා කරන්නාවූ ශුභාරංචිය සම්පූර්ණ නොවේ.

> ඉඳින් ක්‍රිස්තුස්වහන්සේ නැගුටුවනු නොලැබූසේක්නම්, අපගේ දේශනා කිරීම නිශ්ඵලය. නුඹලාගේ ඇදහීමත් නිශ්ඵලය.
> ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට බලාපොරොත්තුව තිබෙන්නේ මේ ජීවිතය ගැන පමණ නම්, අපි සියලුම මනුෂ්‍යයන්ට වඩා අනුකම්පා ලැබිය යුත්තෝය.
> නමුත් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටිනසේක්මය. උන්වහන්සේ සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය. මක්නිසාද මනුෂ්‍යයෙකු කරණකොටගෙන මරණය පැමුණුන බැවින් මනුෂ්‍යයෙකු කරණකොටගෙන මළවුන්ගෙන් නැගිටීමක් පැමුණුණේය.
> මක්නිසාද ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය. (1 කොරින්ති 15:14, 19-22)

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________

________________________________________

2. අනාගත උත්ථානවීම් දෙකෙහි නම් මොනවාද?

____________________ සහ ____________________

3. සියලු මිනිස් ප්‍රාණ වල ඉරණම පිළිබඳව බයිබලය එළිදරව් කර දෙන කාරණා දෙක මොනවාද?

________________________________________

________________________________________

4. පහත සඳහන් ප්‍රකාශන කියවන්න. ප්‍රකාශනය සත්‍යය නම් ස යන්නද අසත්‍යය නම් අ යන්නද ප්‍රකාශනය ඉදිරියෙන් සටහන් කරන්න.

   අ. මිය නොයන්නාවූ අය උත්ථාන වන්නේ නැත __________

   ආ. මිය යන මොහොතේ ධර්මිෂ්ඨව සිටි අයගේ හා දුෂ්ඨව සිටි අයගේ ආත්ම එකිනෙකින් වෙන් කරනු ලැබේ __________

   ඇ. මිය ගිය අය ගැළවෙන පිණිස යාච්ඤා කිරීම වැදගත් වේ __________

   ඈ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා උත්ථානයට පෙර ධර්මිෂ්ඨයන්ගේ ඉරණම දැන් ඉරණමට වඩා වෙනස්ය __________

   ඉ. යේසුස්වහන්සේගේ උත්ථානවීම වැදගත්ය. එහෙත් එය ශුභාරංචියෙහි අංගයක් නොවේ __________

5. උත්ථානයෙහි පණිවිඩය පිළිබඳව ජනතාව දක්වන ප්‍රතිචාර දෙක විදහා දක්වන බයිබල් පද මොනවාද?

________________________________________

________________________________________

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඔබ මෙම පරිච්ඡේදයෙහිදී අධ්‍යනය කළ මළවුන්ගෙන් උත්ථානවීම පිළිබඳ ධර්මයන් මීලඟ පාඩමෙහිදී ඉගෙනීමට නියමිත සදාකාල විනිශ්චය පිළිබඳ ධර්මයන් යන දෙකෙහිම අන්තර්ගත වනුයේ අනාගතයෙහිදී සිදුවන සිදුවීම්ය. දේව වචනයෙහි අනාගත සිදුවීම් කලින් ප්‍රකාශ කොට ඇත. මෙම සිදුවීම් තවමත් සිදුවී නොමැති වුවත් දෙවියන්වහන්සේගේ අනාගත කීම් තුළින් අනාගත සැලසුම් පිළිබඳ දැනුමක් සපයා දී තිබේ.

දේව වචනයෙහි එළිදරව් කර දී නොමැති තව බොහෝ සිදුවීම් අනාගතයෙහි සිදුවනු ඇත. දැනට එළිදරව් කර දී ඇති කරුණු විවිධ බයිබල් සිසුන් විවිධාකාරයෙන් අර්ථකථනය කර දක්වා තිබේ. මනුෂ්‍යයන් විසින් බයිබලීය අනාගතකීම් සඳහා සපයා ඇති සියලුම අර්ථකථන දැනසිටීම අවශ්‍ය නොවේ. මෙම අර්ථකථන බොහෝමයක් කේන්ද්‍ර වී ඇත්තේ කිසියම් අනාගත සිදුවීමක් වටා හෝ එම සිදුවීම ආශ්‍රිත විශේෂ විස්තර වටාය.

කිතුනු ඇදහිල්ලෙහි පදනම සඳහා වැදගත් වනුයේ බයිබලයෙහි අනාගතයෙහිදී සිදුවෙනු ඇතැයි පවසන කාරණා පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඇතිව සිටීමය.

මෙම වැදගත් සිදුවීම් පහතින් සැකිල්ලක් ලෙස ඉදිරිපත් කොට ඇත.

1. ස්වාමින්වහන්සේ ඇදහිලිවන්තයන් උදෙසා නැවත මිහිපිටට පැමිණෙන බව බයිබලය උගන්වයි. යේසුස්වහන්සේ තම ගෝලයන්ට පොරොන්දු වූයේ:

   **... නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි.**
   **මම ගොස් නුඹලාට ස්ථානයක් පිළියෙල කරමි නම්, මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි. (යොහන් 14:2-3)**

   අ. ඔසවාගැනීම: ක්‍රිස්තුස්වහන්සේ ඇදහිලිවතුන් උදෙසා නැවත පැමිණීම පිළිබඳ සවිස්තරාත්මක සටහන ඇතුළත් වනුයේ 1 තෙසලෝනික 4:13-18 දක්වාය. මෙලෙස නැවත පැමිණීමේ සිද්ධිය "ඔසවාගැනීම" ලෙසින් හැඳින්වේ.

   1. ක්‍රිස්තුස්වහන්සේම නැවත පැමිණෙනු ඇත. (16 පදය)

   2. මිය යන විට ඇදහිලිවතුන්ව සිටි අය සිය සොහොන් ගෙවල් වලින් උත්ථාන වනු ඇත. (16 පදය)

   3. එහිදී ඔසවාගැනීමක් එනම්, "යම් පුද්ගලයෙකු එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයකට ගෙන යැමේ ක්‍රියාව"ක් සිදුවේ. ජීවත්ව සිටින ඇදහිලිවතුන් ක්‍රිස්තුස්වහන්සේ හමුවන පිණිස පොළොවෙන් ඔසවා ගනු ඇත. (17 පදය)

   4. එහිදී එතෙක් මිය ගොස් සිටි ඇදහිලිවතුන් හා ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම තෙක් ජීවත්ව සිටි ඇදහිලිවතුන් ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ හා සමග එකතු වනු ඇත. (17 පදය)

   ආ. පීඩා කාලය: බයිබලයෙහි පීඩා කාලය ලෙසට හඳුන්වන ඉතා භයානක කාල පරිච්ඡේදයක් මිහිපිට ඇතිවන බව පවසයි.

   1. පීඩා කාලය මාස 42ක් හෝ දින 1,260ක් පවතී (දානියෙල් 9:24-27).

   2. පීඩා කාලය ඉතා අපහසු කාලයක් වනු ඇත. ලෝකයෙහි ඉතා අපහසු කාල පරිච්ඡේද වරින් වර ඇති වී තිබේ. එහෙත් මහත් පීඩා කාලය, ඒ සියලු අපහසු කාලවලින් වෙන්කර හඳුනාගත හැකි විශේෂ කරුණු තුනක් ඇත. ඒවානම්,

      අ. පළමුව, එය එක් දේශයකට සීමා නොවී ලෝක ව්‍යාප්ත ලෙස ඇතිවේ (එළිදරව් 3:10).
      ආ. මනුෂ්‍යයන් හට ලෝකාන්තිමය ඉතා සමීප බව වැටහෙනු ඇත (එළිදරව් 6:16).

ඈ. මෙවර මුහුණ දීමට සිදුවන කරදරවල තත්වය මින් පෙර කිසිකලෙකටත් වඩා දැඩි දරුණු තත්වයක් වේ (මතෙව් 24:4-14)

3. එහි විස්තර කිරීම: මෙම පීඩා කාලය තුළදී පොළොව මතට දෙවියන්වහන්සේගේ විනිශ්චයන් මාලාවක් පැමිණෙනු ඇත. එම විනිශ්චයන් එළිදරව් 6, 8-9 හා 16 පරිච්ජේදවල සහ මතෙව් 24:4-14 දක්වා විස්තර කොට ඇත.

4. පීඩා කාලයට හේතුව: මනුෂ්‍යයාගේ දුෂ්ඨකමට දඬුවම් ලැබිය යුතුය, සාතන් පරාජය කළ යුතුය, සියලු මනුෂ්‍යයෝ යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේ බවට පිළිගත යුතුය. එමගින් එපිස 1:8-9 දක්වා සඳහන් වන දෙවියන්වහන්සේගේ කාල උදෙසා සැලැස්ම සම්පූර්ණ වනු ඇත.

ඈ. ඔසවාගැනීම සිදුවන කාලය:

සමහරු විශ්වාස කරනුයේ මහත් පීඩා කාලයට පෙර ඔසවාගැනීම සිදුවන බවය. මෙලෙස ඇදහිලිවන්තයන් හට මහත් පීඩා කාලය තුළින් යාමට සිදු නොවනු ඇත. තව සමහරු විශ්වාස කරනුයේ, පීඩා කාලයේ මැද භාගයේදී ඔසවාගැනීම සිදුවන බවය. තවත් සමහරු මහත් පීඩා කාලය අවසානයෙහි ඔසවාගැනීම සිදුවනු ඇතැයි විශ්වාස කරති.

බොහෝ දෙනෙකු අතර පොදු ලෙස අර්ථකථනය කරන්නාවූ මතය නම්, ඔසවාගැනීම මහත් පීඩා කාලය ඇරඹීමට පෙර සිදුවන බවය. දේව වචනයෙහි සපයා ඇති විවිධ අනාගත විස්තර විවිධ අයුරින් අර්ථකථන කිරීම හේතුවෙන් ඔසවාගැනීමේ කාලය සඳහා විවිධ කාල හිමි වී ඇත. මෙහිදී ඉතාමත්ම වැදගත් වන්නේ ඔබ නියත ලෙස සැබෑ කිතුනුවෙකු බව දැනගෙන සිටීම හා ඔසවා ගැනීම සැබවින්ම සිදුවන විට යේසුස්වහන්සේ හා සමග යැමට සූදානම්ව සිටීමය.

ඈ. දහස් අවුරුදු රජකම් කිරීම:

දහස් අවුරුදු රජකම් කිරීම නම්, මහත් පීඩා කාලයට පසුව යේසුස්වහන්සේ පොළොවෙහි ධර්මිෂ්ඨකමින් රජකම් කරන්නාවූ වසර දහසක කාලයයි (සෙකරියා 14:9; දානියෙල් 7:14). මෙම රාජ්‍යයෙහි කේන්ද්‍රස්ථානය ජෙරුසලම් නුවර වේ (යෙසායා 2:3). මෙම දහස් අවුරුදු රජකම් කිරීම අවසාන වනුයේ සාතන් අවසාන වතාවට දෙවියන්වහන්සේට එරෙහිව කැරළි ගැසීමකිනි (එළිදරව් 20:7-9). දෙවියන්වහන්සේ අහසින් ගිනි එවා සියලු සතුරුකම් අවසන් කරනු ඇත. සාතන් සදාකල්ම ගිනි විලට හෙළනු ඇත (එළිදරව් 20:10).

ඉ. විනිශ්චය:

මරණ ලැබූ සියලු ජීවීන් දෙවියන්වහන්සේ විසින් විනිශ්චය කරනු ලැබේ. මෙය සදාකාලික විනිශ්චයෙහි කාලය ලෙසට හැඳින්වේ. එය හෙබ්‍රෙව් පොතෙහි 6:1-3හි සඳහන් වන අත්තිවාරම් ධර්ම වලින් අවසාන ධර්මය වේ. මීලඟ පාඩමෙහිදී අපි විනිශ්චය පිළිබඳව අධ්‍යයනය කරමු. නොඇදහිලිවතුන් ලෙස මිය ගියාවූ සැම පුද්ගලයෙකු=ම විනිශ්චයට මුහුණ දෙන පිණිස මළවුන්ගෙන් උත්ථාන කරනු ලැබේ. ඔව්හු පාපයට පසුතැවිලි නොවූ බැවින් හා යේසුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිනොගත් බැවින් සදාකාල නිරයට ඔව්හු හෙළනු ඇත (එළිදරව් 20:12-15). තම පාප උදෙසා පසුතැවිලි වූ යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත්තාවූ සැබෑ ඇදහිලිවන්තයෝ සදාකාලයම දෙවියන්වහන්සේගේ අභිමුවෙහි ස්වර්ගයෙහි ගෙවනු ඇත (එළිදරව් 21).

# දහවෙනි පරිච්ඡේදය

## සදාකාලික විනිශ්චය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට හැකිවේවි.
- “විනිශ්චය” යන පදය අර්ථ දැක්වීමට හැකිවෙනු ඇත.
- විනිශ්චය අවශ්‍ය මන්ද කියා පැහැදිලි කිරීමට.
- අවසාන විනිශ්චයෙහිදී විනිශ්චය කරන්නේ කවුද කියා හඳුනාගැනීමට.
- අවසාන විනිශ්චයෙහිදී විනිශ්චයට ලක්වනු ඇත්තේ කවුද කියා හඳුනාගැනීමට.
- අවසාන විනිශ්චය පාලනය වන්නාවූ ප්‍රතිපත්ති පැහැදිලි කිරීමට.

**ප්‍රධාන පදය:**

> **මක්නිසාද ස්වාමින්වහන්සේම අපේ විනිශ්චයකාරයාණෝය, ස්වාමින්වහන්සේ අපේ නීතිදායකයාණෝය, ස්වාමින්වහන්සේ අපේ රජ්ජුරුවෝය. (යෙසායා 33:22)**

### හැඳින්වීම

කිතුනු පදනම් අත්තිවාරම් ධර්ම හයෙන් අවසාන ධර්මය නම් සදාකාලික විනිශ්චය වේ.

පැරණි ගිවිසුමෙහි “විනිශ්චය” යන පදය දෙයාකාරයකින් භාවිතා කොට තිබේ. එකක් නම් ආඥා පණත්, සාක්ෂි හා දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පිළිබඳව සඳහනයි. අනෙක මනුෂ්‍යයන් හා ජාතීන් පිළිබඳව දෙවියන්වහන්සේගේ විනිශ්චය සම්බන්ධවය. අළුත් ගිවිසුමෙහි “විනිශ්චය” යන පදය භාවිතා කොට ඇත්තේ මෙහි දෙවනුව සඳහන් අරුතෙන්ය. අප මෙම පරිච්ඡේදයෙහිදී විනිශ්චය යන පදය භාවිතා කරනුයේද එම අර්ථයෙනි.

### අර්ථදැක්වීම

“විනිශ්චය” කිරීම යනු වෙන්කිරීමක් හෝ යම් ආකාරයකින් දෙපාර්ශවයක් අතර වෙනසක් ඇතිකිරීමකි. මෙම ක්‍රියාදාමයෙහිදී නඩු විමසා බැලීම, සාක්ෂි විභාග කිරීම, වැරදිකරුද නිවැරදිකරුද කියා තීරණය කිරීම, එම පාපයට නිසි දඬුවම නියම කිරීම යනාදී කාරණා ඇතුළත් වේ. සදාකාල විනිශ්චය යනු බයිබලයෙහි සඳහන් වන සියලුම ප්‍රාණීන්ගේ සදාකාල ඉරණම තීරණය වන්නාවූ ශ්‍රේෂ්ඨ සහ අවසාන විනිශ්චය වේ.

### විනිශ්චයකාරවරු

**දෙවියන්වහන්සේ විනිශ්චයකරුවාණෝය.**

> **දෙවියන්වහන්සේ අපේ විනිශ්චයකාරයාණෝය. (යෙසායා 32:22)**

> **සියල්ලන්ගේ විනිශ්චයකාර වූ දෙවියන්වහන්සේ (හෙබ්‍රෙව් 12:23)**

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගේ පාපිෂ්ඨ ස්වභාවය විනිශ්චය කරන සේක. මෙහිදී දෙවියන්වහන්සේගේ සැබෑ ආශාව නම් මනුෂ්‍යයා විනිශ්චය කිරීම නොව සියලුදෙනා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමට පැමිණීමය.

**මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිශ්චය කරනු පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය. (යොහන් 3:17)**

**ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලි වෙනවාට මිස කිසිවෙක් විනාශ වෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක. (2 පේතෘස් 3:9)**

දෙවියන්වහන්සේගේ ආශාව නම් සෑම තැන්හි සියලු මනුෂ්‍යයන් පසුතැවිලි වීමය. ඔව්හු තමුන්ගේ පාප උදෙසා පසුතැවිලි නොවේ නම් උන්වහන්සේගේ විනිශ්චය අත් දකිනු ඇත.

**ඉතින් නොදන්නාකමේ කාලවල් දෙවියන්වහන්සේ නොබලා හැරිය නුමුත් සියලු මනුෂ්‍යයන් හට හැම තැන්හි පසුතැවිලි වෙන්ට දැන් අණ කරන සේක.**
**මක්නිසාද තමන්වහන්සේ විසින් පත්කළ මනුෂ්‍යයා ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරවන්ට එක් දවසක් නියම කර තිබේ. (ක්‍රියා 17:30-31)**

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

දෙවියන්වහන්සේ විනිශ්චය කිරීමට ආධිපත්‍යය බලය යේසුස්වහන්සේට දී තිබේ.

**පියාණන්වහන්සේ කවරෙකුවත් විනිශ්චය නොකොට සියලු විනිශ්චයම පුත්‍රයාට දී තිබේ.**
**ඔහු මනුෂ්‍ය පුත්‍රයා (මනුෂ්‍ය පුත්‍රයෙක්) බැවින් විනිශ්චය කරන්ට බලය (බලය යෙදවීමට, ක්‍රියාත්මක කිරීමට) දුන්සේක. (යොහන් 5:23, 27)**

## ශුද්ධවන්තයෝ :

අවසාන විනිශ්චයෙහිදී සැබෑ ඇදහිලිවන්තයෝ ලෝකය විනිශ්චය කිරීමට සහාය දක්වනු ඇත.

**නොහොත් ශුද්ධවන්තයන් ලෝකයා විනිශ්චය කරන බව නොදනිවුද? ඉඳින් නුඹලා විසින් ලෝකයා විනිශ්චය කරනු ලබන්නේ නම්, ඉතා සුළු කාරණා විනිශ්චය කරන්ට නුඹලා නොවටින්නේද?**
**අපි දේවදූතයන් විනිශ්චය කරන්නෙමු යයි නුඹලා දන්නේ නැද්ද? (1 කොරින්ති 6:2-3)**

මෙම පදයෙහි "ශුද්ධවන්තයන්" ලෙස අර්ථවත් කරන්නේ සියලුම සැබෑ ඇදහිලිවතුන්ය. ඔව්හු "ලෝකයා" (අධර්මිෂ්ඨවුන්) විනිශ්චය කිරීමට උපකාර කරනු ඇත.

## විනිශ්චයෙහි ප්‍රමිතිය :

අපි සියලු දෙනාම විනිශ්චයට ලක් කරන්නාවූ ප්‍රමිතිය වනුයේ දේව වචනයයි.

**තවද යමෙක් මාගේ වචන අසා ඒවා නොපවත්වන්නේනම්, මම ඔහු විනිශ්චය නොකරමි. මක්නිසාද මා ආවේ ලෝකයා ගළවන්ට මිස විනිශ්චය කරන්ට නොවේය.**
**මා එපාකොට මාගේ වචන පිළි නොගන්නා විනිශ්චයකරන්නෙක්සිටිනසේක. මා කී වචනයම අන්තිම දවසේදී ඔහු විනිශ්චය කරන්නේය. (යොහන් 12:47-48)**

අප විනිශ්චයට පත් කරනු ඇත්තේ මනුෂ්‍යයගේ ප්‍රමිතින් නීතිමාලා හෝ චාරිත්‍ර චාරිත්‍ර අනුව නොවේ. එසේම නිකායන්වල හෝ සංවිධාන වල නීති රීති අනුවද නොවේ. අප විනිශ්චය කරනු ඇත්තේ දේව වචනයෙහි ස්ථිරසාර ප්‍රමිතියට අනුකූලවය.

**ස්වාමිනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ. (ගීතාවලිය 119:89)**

## විනිශ්චය සඳහා හේතුව

බයිබලය හෙළිදරව් කරදෙනුයේ දේව ආඥාවට විරුද්ධව පාපය, අභක්තිකකම, අධර්මිෂ්ඨකම, අවිශ්වාසය, නපුරුකම හා දුෂ්ඨ ක්‍රියා නිසා විනිශ්චය අවශ්‍ය බවය. මෙම වචන විවිධ වුවද ඒ සියල්ල පාපය සඳහා යොදන වචන වේ.

## දේව ව්‍යවස්ථාවට එරෙහිව පව් කිරීම :

ව්‍යවස්ථාවක් ඇතුව පව් කළාවූ සියල්ලෝ ව්‍යවස්ථාව කරණකොටගෙන විනිශ්චය කරනු ලබන්නෝය. (රෝම 2:12)

## අභක්තිවන්තකම :

නුමුත් දැන් පවතින අහසද පොළොවද එම වචනයෙන් විනිශ්චයෙන් අභක්තිකයන්ගේ විනාශයෙත් දවස දක්වා ඉතුරු කරනු ලැබ, ගින්නෙන් දැවීමට තබා තිබේ. (2 පේතෘස් 3:7)

සියලු අභක්තීන් විසින් අභක්තිවන්ත ලෙස කළාවූ ඔවුන්ගේ සියලු අභක්තික ක්‍රියා ගැනත් අභක්තික පව්කාරයින් විසින් උන්වහන්සේට විරුද්ධව කථාකළාවූ සියලු කර්කස දේ ගැනත් ඔවුන් වරදට පත්කරන්ටද ... (යූදස් 14, 15)

## අධර්මිෂ්ඨකම :

භක්තිවන්තයන් පරීක්ෂාවෙන් ගළවන්ටත් අධර්මිෂ්ඨයන් ... දඬුවම යටතේ විනිශ්චය දවස දක්වා තබන්ටත් ස්වාමින්වහන්සේ දන්නාසේක. (2 පේතෘස් 2:9-10)

## අවිශ්වාසය :

උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිශ්චය කරනු ලැබ සිටියි. (යොහන් 3:18)

## වරද කිරීම :

එබැවින් එක වරදක් කරණකොටගෙන දඬුවමට පත්කිරීම පිණිස විනිශ්චය සියලුම මනුෂ්‍යයන් කෙරෙහි පැමුණුණාක් මෙන්ම ... (රෝම 5:18)

## නපුරු ක්‍රියා :

විනිශ්චය නම් මේය - ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නමුත්, මනුෂයයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය. (යොහන් 3:19)

## දිව්‍යමය විනිශ්චයෙහි ප්‍රතිපත්ති

ලෝකයෙහි විනිශ්චය ප්‍රතිපත්ති ජාතියෙන් ජාතියට වෙනස් විය හැකිය. එසේම එකම රාජ්‍යයක පවා ප්‍රාන්ත වල විනිශ්චයෙහි ප්‍රමිතීන් වෙනස් විය හැකිය. එය සමහරවිට නගරයෙන් නගරයට පවා වෙනස් විය හැකිය. ලෝකයේ විනිශ්චයෙහි හා දඬුවමෙහි ප්‍රතිපත්ති වෙනස් වනුයේ විවිධ මනුෂ්‍යයෝ විවිධ ක්‍රියාවන් විවිධ අයුරින් අර්ථකථනය කරන බැවිනි. කිසියම් සමාජ සංස්කෘතියකට අනුව නිවැරදි ලෙස පිළිගන්නාවූ ක්‍රියාවක් වෙනස් සංස්කෘතියක වැරැද්දක් ලෙස පිළිගත හැකිය. උදාහරණයක් ලෙස අමරිකාවෙහි මස් පිණිස ගවයෙක් ඝාතනය කිරීම දෙස එරට ජනතාව බලන ක්‍රමය ඉන්දියාව වැනි ගවයා දේවත්වයෙන් පුදන රටක ජනතාව ගව ඝාතනය දෙස බලන ක්‍රමයට හාත්පසින්ම වෙනස් විය හැකිය.

මිනිසාගේ විනිශ්චය වෙනස් විය හැක්කේ මිනිසා විනිශ්චය කරන්නාවූ ප්‍රමිතීන් වෙනස් වන බැවිනි. එහෙත්, දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි ප්‍රමිතීන් වෙනස් නොවෙයි. දෙවියන්වහන්සේ විනිශ්චය කරනුයේ ...

## දේව වචනයෙහි පදනම මතය :

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ විනිශ්චයෙහි ප්‍රතිපත්ති දේව වචනයෙහි තහවුරු කොට ඇත.

**ස්වාමීනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ. (ගීතාවලිය 119:89)**

## දැනුමට අනුකූලව :

මනුෂ්‍යයෝ සහ ජාතීන් විනිශ්චය කරනු ලබන්නේ දෙවියන්වහන්සේ පිළිබඳ ඔවුන්ට ලැබුණාවූ දැනුම අනුවය. යේසුස්වහන්සේ පවසා සිටියේ සමහරු සොදොම, ගොමෝරාව, නිනිවය, තීර් හා සීදොන් යන නුවර වලට වඩා බරපතල අන්දමින් විනිශ්චයට ලක් වනු ඇති බවය. ඉහතින් සඳහන් වූයේ පැරණි පිවිසුමෙහි සඳහන් දුෂ්ඨ නුවරවල් වන අතර දෙවියන්වහන්සේ එම නුවරවල් විනිශ්චය කොට දඬුවම් පැමිණවූ සේක.

අළුත් ගිවිසුමෙහි සමහර නුවරවල් කෙරෙහි යේසුස්වහන්සේ වඩා දරුණු විනිශ්චයක් ප්‍රකාශයට පත් කළේ එම නගරවලට දෙවියන්වහන්සේ පිළිබඳ වඩා දැනුමක් තිබූ බැවිනි. යේසුස්වහන්සේම මෙම නුවරවල මෙහෙකර තිබූ අතර මහත් වූ සුවකිරීම් හා මිදීම් එහි උන්වහන්සේ ඉටුකළ සේක. එසේවුවද එම නුවරවල වැසියෝ තවමත් පසුතැවිලි නොවූහ. එබැවින් යේසුස්වහන්සේ අනතුරු අඟවමින්:

**කොරාශින්, තිට දුක්වේ! බෙත්සයිදා තිට දුක්වේ! තොප ඇතුළේ කරන ලද ආශ්චර්ය ක්‍රියා තීර් හා සීදොන් ඇතුළේ කරන ලද්දේ නම්, ඒ නුවරවල් බොහෝ ඉහතදී ගෝණි රෙදි ඇඳ අලුයෙහි ඉඳ පසුතැවිල්ලට පැමිණෙනවා ඇත.**
**එසේවී නුමුත් විනිශ්චය දවසේදී තොපට වඩා තීර්ට සහ සීදොන්ට ඉවසන්ට පහසු වන්නේයයි කියමි.**
**එම්බා කපර්ණවුම, තී ස්වර්ගය දක්වා උසස් කරනු ලබන්නෙහිද? තී පාතාලය දක්වා පහළට හෙළනු ලබන්නෙහිය. තී ඇතුළේ කරන ලද ආශ්චර්ය ක්‍රියා සොදොම් ඇතුළේ කරන ලද්දේ නම්, අද දක්වා ඒක පවතිනවා ඇත.**
**එසේවී නුමුත් විනිශ්චය දවසේදී තිට වඩා සොදොම් රටට ඉවසන්ට පහසු වන්නේයයි කියමියි කීසේක. (මතෙව් 11:21-24)**

**මේ පරම්පරාවට විරුද්ධව විනිශ්චයේදී නැගිට එය වරදට පත්කරන්නෝය. මක්නිසාද යෝනාගේ දේශනා කිරීමෙන් ඔව්හු පසුතැවිලි වූවෝය. බලව, යෝනාට වඩා උතුම් කෙනෙක් මෙහි සිටිති. (මතෙව් 12:41)**

මැවිල්ලේ විස්මිතතාවය තුළින් සියලු මනුෂ්‍යයන් හට දෙවියන්වහන්සේ පිළිබඳ සාමාන්‍ය එළිදරව් වීමක් සපයා දී ඇත.

**මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලික වූ බලය හා දේවිකම මවන ලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනී යන්නේය. (රෝම 1:20)**

දෙවියන්වහන්සේ පිළිබඳව මිනිසාට සපයා ඇති මෙම පොදු සාමාන්‍ය දැනුම මිනිසාගේ විනිශ්චය සඳහා මූලික පදනම වේ. මීට අමතරව දේව වචනයට සවන්දීමට අවස්ථාව ලද දෙවියන්වහන්සේ පිළිබඳ පුළුල් හෙළිදරව්වක් ලද අය දැනුම සම්බන්ධව උසස් ප්‍රමිතියකට අනුව විනිශ්චයට ලක්වනු ඇත.

## තනි තනිව පුද්ගලයන් වශයෙන් :

සෑම පුද්ගලයෙකුම තනි පුද්ගලයෙකු ලෙසට විනිශ්චය කරනු ලැබේ.

**පව්කරන ප්‍රාණයම නසිනවා ඇත. පුත්‍රයා පියාගේ අයුතුකම නොදරන්නේය. පියාද පුත්‍රයාගේ අයුතුකම නොදරන්නේය: ධර්මිෂ්ඨයාගේ ධර්මිෂ්ඨකම ඔහු පිටටත් දුෂ්ටයාගේ දුෂ්ටකම ඔහු පිටටත් පැමිණෙන්නේය. (එසකියෙල් 18:20)**

එක් එක් පුද්ගලයාගේ සදාකාල ඉරණම තීරණය වනුයේ කණ්ඩායම් විනිශ්චයක් පදනම් කරගෙන නොවනු ඇත. එය තනි පුද්ගල විනිශ්චය මත පදනම් වේ.

### සත්‍යයට අනුකූලවය :

පාවුල් ලියුවේ: **... දෙවියන්වහන්සේගේ විනිශ්චය සැබෑවේ ප්‍රකාරයට පවත්නා බව දනිමුව. (රෝම 2:2)**

### පෞද්ගලික හැසිරීම පදනම් කරගෙන :

අපි සෑම කෙනෙකුම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිට අපගේ ක්‍රියාවන් පිළිබඳව විනිශ්චය කරනු ලැබේ. බයිබලය මෙය "ක්‍රියාවන්" වලට අනුව සිදුකරන විනිශ්චය ලෙසට නම් කරයි.

**මක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේදී කළාවූ දේවල එල ඒ දේ යහපත් වුවත් අයහපත් වුවත් කළ දේවල හැටියට ලබන පිණිස අප සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි ප්‍රකාශ වෙන්ට ඕනෑය. (2 කොරින්ති 5:10)**

**... උන්වහන්සේ සියලු මනුෂ්‍යයන්ට තම තමුන්ගේ ක්‍රියා ලෙස විපාක දී ... (රෝම 2:6)**

**... එකිනෙකාගේ ක්‍රියාවේ ප්‍රකාර විනිශ්චය කරන තැනැන්වහන්සේට පියාණෝ කියා ... (1 පේතෘස් 1:17)**

**මළාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියන ලද දේවලින් විනිශ්චය කරනු ලැබුවෝය. (එළිදරව් 20:12)**

මනුෂ්‍යයාගේ "ක්‍රියාවන්" වාර්තා වී ඇති දෙවියන්වහන්සේගේ වාර්තාවට මනුෂ්‍යයෙකු කළාවූ ක්‍රියාවක් පමණක් නොව ඔහුගේ සිතුවිලි හා අභිප්‍රායන්ද ඇතුළත් වේ. දෙවියන්වහන්සේ බලන්නේ පිටස්තර පෙනුම නොව හදවත දෙසටය. (1 සාමුවෙල් 16:7)

### පක්ෂපාතිත්වයෙන් තොරව :

සදාකාල විනිශ්චය කිසිම පක්ෂපාතිකමකින් තොරව සිදුකරනු ඇත. එනම්, කිසිම කෙනෙකුට වැඩි සැලකිලි දැක්වීමකින් තොරවය. මනුෂ්‍යයෝ විනිශ්චය කරනු ලබනුයේ ඔවුන්ගේ වස්තුව, සමාජ ස්ථරය, ජාතිය හෝ අධ්‍යාපනික මට්ටම අනුව නොවේ.

**තවද මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලා ... විනිශ්චය කරන ... පියාණෝ ... (1 පේතෘස් 1:17)**

තරාතිරම් බැලීම යනු කිසියම් පුද්ගලයෙකුගේ බාහිර සාධක වන පෙනුම, සම්බන්ධතා, නිලය, වස්තුව යනාදී කාරණා මගින් විනිශ්චයට බලපෑමක් ඇතිවීමය.

දෙවියන්වහන්සේගේ විනිශ්චයට මෙම කිසිම කරුණකින් බලපෑම් ඇති නොවේ.

**... ඔහුගේ පෙනීම දෙසවත් ශරීරයේ උස දෙසවත් නොබලන්න. මක්නිසාද මම ඔහු එපා කෙළෙම් ... ස්වාමින්වහන්සේ සිත බලන සේකැයි කීසේක. (1 සාමුවෙල් 16:7)**

### ව්‍යවස්ථාවට අනුකූලව :

**... ව්‍යවස්ථාවක් ඇතුව පව්කළාවූ සියල්ලෝම ව්‍යවස්ථාව කරණකොටගෙන විනිශ්චය කරනු ලබන්නෝය. රෝම 2:13)**

## ධර්මිෂ්ඨකම අනුව :

**උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් ලෝකයා විනිශ්චය කරන සේක, අවංකකමින් ජනයන්ට යුක්තිය සලස්වා දෙන සේක. (ගීතාවලිය 9:8)**

**... උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් පොළොවද ස්වකීය සැබෑ කමින් මනුෂ්‍ය වර්ගයන්ද විනිශ්චය කරන සේක. (ගීතාවලිය 96:13)**

**... ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කරවන්ට එක් දවසක් නියම කර තිබේ. (ක්‍රියා 17:31)**

**... දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ වූ විනිශ්චය. (රෝම 2:5)**

**මෙතැන් පටන් ධර්මිෂ්ඨකමේ ඔටුන්න මට තබා තිබේ. එය ධර්මිෂ්ඨ විනිශ්චයකාර වූ ස්වාමින්වහන්සේ ඒ දවසේදී මට දෙනවා ඇත. මට පමණක් නොවේ, උන්වහන්සේගේ ප්‍රකාශ වීමට ආශාව සිටින්නාවූ සියල්ලන්ටද දෙනවා ඇත. (2 තිමෝති 4:8)**

## අරමුණු සහ සිතුවිලි වලට අනුකූලව :

**එහෙයින් ස්වාමින්වහන්සේ එනතුරු කාලයට පළමුවෙන් කිසිවක් විනිශ්චය නොකරල්ලා. උන්වහන්සේ අන්ධකාරයේ සැඟවුණු දේ එළිදරව් කොට, සිත්වල අදහස් ප්‍රකාශ කරන සේක. එවිට එකිනෙකාට තම තමාගේ ප්‍රශංසාව දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නේය. (1 කොරින්ති 4:5)**

**එබැවින් මාගේ ශුභාරංචියේ ප්‍රකාරයට දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා මනුෂ්‍යයන්ගේ රහස් විනිශ්චය කරවන දවසේදී ... (රෝම 2:12)**

# විනිශ්චයෙහි වේලාව

බයිබලය අතීත, වර්තමාන හා අනාගත විනිශ්චයක් ඇති බව පෙන්වා දෙයි.

## අතීත කාල විනිශ්චය :

බයිබලය දෙවියන්වහන්සේගේ අතීත කාල විනිශ්චයන් පිළිබඳ ඉතිහාසයයි. ආදම් සහ ඒවගේ යුගයේ සිට ජාතීන් හා පුද්ගලයින්ව දෙවියන්වහන්සේ විනිශ්චය කළාවූ ආකාරය එහි වාර්තා කර ඇත.

ඇදහිලිවන්තයන් හට ඉතා වැදගත් වන අතීත කාල විනිශ්චයන් දෙකක් බයිබලය වාර්තා කරයි. ඒවා නම්, සාතන් හා ලෝකය විනිශ්චය කිරීමය. දෙවියන්වහන්සේ දැනටම දෙදෙනාටම එරෙහිව විනිශ්චය දී අවසාන වී ඇත. ඔවුන්ට හිමි දඬුවමද නියම කොට අවසානය.

### - සාතන් සහ ඔහුගේ දූතයන් :

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මරණය හා උත්ථානය හේතුකොටගෙන දෙවියන්වහන්සේ සාතන් කෙරෙහි අවසාන විනිශ්චය තීන්දු කොට ප්‍රකාශ කොට තිබේ.

**... ලෝකයේ අධිපතියා (සාතන්) විනිශ්චය කරනු ලැබ සිටී ... (යොහන් 16:11)**

**උන්වහන්සේ (යේසුස්වහන්සේ) තමන් කෙරෙන් අධිපතීන්ද බලයලත්තන්ද (සාතන්ගේ බලවේගයන්) පහකොට, ප්‍රසිද්ධියෙන් ඔවුන් දක්වා ... ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළසේක. (කොලොස්සි 2:15)**

දැනටම දෙවියන්වහන්සේ විසින් සාතන්ව විනිශ්චය කොට අවසානව ඇත. සාතන්ව ලෝකාන්තිමයෙහිදී ගිනි විලට හෙලීමට පෙර තාවකාලිකව යම් යම් ක්‍රියාකාරකම් සඳහා දෙවියන්වහන්සේ ඉඩ දී ඇතත් දැනටම වැරදිකරු ලෙසට දඬුවම නියමකොට අවසන්ය.

සාතන්ගේ දූතයන් එනම්, ස්වර්ගයෙහි තමුන්ට හිමිව තිබූ ස්ථානය හැරදමා සාතන්ගේ කැරළි ගැසීමට එක් වූ දූතයන්ද දැනටම වරදට පත්කරනු ලැබ සිටිති.

> **තමුන්ගේම අධිපතිකමෙහි නොපැවත ස්වකීය වාසස්ථානය අත්හැරියාවූ දේවදූතයන්ද උන්වහන්සේ මහත් දවසේ විනිශ්චය පිණිස අන්ධකාරය යට සදාකාල බැඳුම්වලින් බැඳ තැබූ සේක. (යූදස් 6)**

**- ලෝකය :**

යේසුස්වහන්සේ පැවසුවේ:

> **මේ ලෝකයේ විනිශ්චය දැන්ය ... (යොහන් 12:31)**

ලෝකයෙහි පාපය තිබීම නිසා භෞතික ලෝකය දැනටම දේව විනිශ්චයට ලක්වී වරදට පත්කරනු ලැබ තිබේ. ලෝකය ගින්නෙන් විනාශ වන බව බයිබලය පවසයි.

> **එහෙත් සොරෙකු මෙන් ස්වාමින්වහන්සේගේ දවස පැමිණෙන්නේය. ඒ දවසේදී අහස මහත් ඝෝෂාවකින් පහවන්නේය. මහා භූතයෝද තද උෂ්ණයෙන් නාස්තිවී යන්නෝය. පොළොවද එහි තිබෙන කර්මාන්තද දාලා යන්නෝය. (2 පේතෘස් 3:10)**

## වර්තමාන විනිශ්චය :

තවදුරටත් දිගටම පැවතිගෙන යන්නාවූ වර්තමාන විනිශ්චය පවතී. වර්තමානයෙහි දෙවියන්වහන්සේ ඉදිරියෙහි සියලු මනුෂ්‍යයන් ධර්මිෂ්ඨ හෝ පාපිෂ්ඨ ලෙසට විනිශ්චය කරනු ලබති. වර්තමාන විනිශ්චය පවත්වනුයේ මනුෂ්‍යයා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන තිබේද යන පදනම මතය.

> **උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහා නොගෙන සිටින බැවින් දැනටම විනිශ්චය කරනු ලැබ සිටියි. (යොහන් 3:18)**

නොඇදහිලිවන්තයන් කෙරෙහි දෙවියන්වහන්සේගේ වර්තමාන විනිශ්චය පෙන්නුම් වනුයේ එතුමාගේ උදහසිනි. ඔව්හු සත්‍යයට බාධා කරති.

> **මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින් වලක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවියන්වහන්සේගේ (ශුද්ධ) උදහස ස්වර්ගයෙන් එළිදරව් වී තිබේ. (රෝම 1:18)**

දෙවියන්වහන්සේගේ වර්තමාන විනිශ්චය ඇදහිලිවතුන් කෙරේ ප්‍රේමයෙන් සිදුවේ. ඔව්හු වැරදි කළ විට උන්වහන්සේ ඔවුන්ව නිවැරදි කරවන සේක.

> **මාගේ පුත්‍රය, ස්වාමින්වහන්සේගේ දඬුවම සුළු නොකරන්න. උන්වහන්සේගෙන් තරවටු ලබන කල ක්ලාන්ත නොවන්න.**
> **මක්නිසාද ස්වාමින්වහන්සේ ප්‍රේම කරන අයට උන්වහන්සේ දඬුවම් කරන සේක ...**
> **එහෙත් සියල්ලන් ලබන දඬුවමට නුඹලා පංගුකාරයෝ නොවන්නහුනම්, නුඹලා පුත්‍රයෝ නොව අවජාතකයෝය. (හෙබ්‍රෙව් 12:5,6,8)**

ස්වභාවික පියෙක් තම දරුවන් නිවැරදි කරවන්නාක් මෙන් දෙවියන්වහන්සේ තම දරුවන්ගේ හැසිරීම විනිශ්චය කරන සේක. ඔව්හු පව් කළහොත් ස්වභාවික පියෙක් ඔහුගේ දරුවන් හරිමග යවන්නාක් මෙන් දෙවියන්වහන්සේ තම දරුවන් ප්‍රේමයෙන් නිවැරදි කරන සේක. දෙවියන්වහන්සේ තම දරුවන්ට තරවටු කරනුයේ (නිවැරදි කිරීම) විශේෂ පරමාර්ථයකින් යුක්තවය.

> **කිසි දඬුවමක් ලබන කල ඒක ශෝකයට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත. නුමුත් පසුව එයින් පෙළුනු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල හටගන්නේය.**
> **(හෙබ්‍රෙව් 12:11)**

## අනාගත විනිශ්චය :

පාවුල්, හෙබ්‍රෙව් 6 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් කරන "සදාකාලික විනිශ්චය" නම් මෙම අනාගත විනිශ්චය වේ. සදාකාල විනිශ්චය සිදුවනුයේ මරණින් පසුවය.

> **තවද එක වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක් මෙන්ම ... (හෙබ්‍රෙව් 9:27)**

ඔබ මීට පෙර පාඩමෙහි ඉගෙන ගත් පරිදි කෙනෙකු මියගිය සැනෙන් ඔහු දෙවියන්වහන්සේගේ අභිමුඛයට යනවාද නැත්ද කියා තීරණය වනු ඇත. මරණින් පසුව ධර්මිෂ්ඨයන්ගේ හා අධර්මිෂ්ඨයන්ගේ ඉරණම එකිනෙකින් වෙනස් වේ. එහෙත් ඔවුන්ගේ අවසාන ඉරණම තීරණය වනුයේ ලෝකාන්තිමයෙන් පසුව නැවත නැගිටීමෙහිදීය.

> **දෙවියන්වහන්සේ ඉදිරියෙහිද ජීවත්ව සිටින්නන් සහ මළවුන්ද විනිශ්චය කරන්ට සිටින ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ඉදිරියෙහිද උන්වහන්සේගේ ප්‍රකාශවීම හා උන්වහන්සේගේ රාජ්‍යයේ නාමයෙන් මා විසින් නුඹට අණ කරන්නේ නම්: (2 තිමෝති 4:1)**

> **බලව, සියල්ලන් කෙරෙහි යුක්තිය ඉෂ්ට කරන්ටද සියලු අභක්තින් විසින් අභක්තිවන්ත ලෙස කළාවූ ඔවුන්ගේ සියලු අභක්ති ක්‍රියා ගැන ස්වාමින්වහන්සේ ස්වකීය දසදහස් ගණන් ශුද්ධවන්තයන් සමග ආසේකැයි කීවේය. (යුදස් 14, 15)**

## අවසාන විනිශ්චයෙහි ස්ථාන

අවසාන විනිශ්චය පැවැත්වෙන ස්ථාන තුනකි.

## ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චාසනය :

මෙහිදී විනිශ්චය කරනු ලබනුයේ සියලු සැබෑ ඇදහිලිවතුන්ය.

> **... අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටින්නෙමුව. (රෝම 14:10)**

> **... අපි සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි ප්‍රකාශ වෙන්ට ඕනෑය. (2 කොරින්ති 5:10)**

## උන්වහන්සේගේ මහිමයේ සිංහාසනය :

විනිශ්චයේ දෙවන ස්ථානය හඳුන්වනුයේ "ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයේ සිංහාසනය" ලෙසටය. මෙහිදී විනිශ්චයට ලක් වනුයේ පීඩා කාලය තුළ මිහිපිට රැඳී සිටියවුන්ය. යේසුස්වහන්සේ මිහිපිට දහස් අවුරුදු රජකම් කිරීම පිහිටුවීමට පෙර ධර්මිෂ්ඨයෝ උත්ථාන කරනු ලැබ විනිශ්චයට ලක් කෙරෙනු ඇත.

> **තවද සිංහාසන දුටිමි, ඔව්හු එහි හිඳගත්තෝය. විනිශ්චයද ඔවුන්ට දෙන ලද්දේය. තවද යේසුස්වහන්සේගේ සාක්ෂිය නිසාද දෙවියන්වහන්සේගේ වචනය නිසාද හිස් කපාදමනු ලැබුවන්ගේද මෘගයාටවත් උගේ රූපයටවත් නමස්කාර නොකළාවූ උගේ සලකුණ තමුන්ගේ නළල් වලත් අත් වලත් නොලැබුවාවූ තැනැත්තන්ගේද ආත්මයන් දුටිමි. ඔව්හු ජීවත්ව ක්‍රිස්තුස්වහන්සේ සමග අවුරුදු දහසක් රජකම් කළෝය.**
> **මළාවූ අනික් අය අවුරුදු දහස කෙළවර වන තුරු ජීවත් නුණෝය. (එළිදරව් 20:4-5)**

## මහත් සුදු සිංහාසනය :

විනිශ්චයෙහි අවසාන ස්ථානය වන්නේ "මහත් වූ සුදු සිංහාසනය" නම් ස්ථානයයි. මෙහිදී විනිශ්චය කරනු ලැබෙනුයේ, දහස් අවුරුදු රජකම් කිරීමෙන් පසුව එතෙක් මියගොස් සිටි අය අතරින්

ඉතිරිව සිට උත්ථාන කරනු ලැබූවන්ය (මෙය දෙවන උත්ථානය වන අතර එය අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය නමින් හැඳින්වේ).

මහත් සුදු සිංහාසනයෙහි විනිශ්චය එළිදරව් 20:11-15 දක්වා සඳහන් වී ඇත. අධර්මිෂ්ඨයෝ ඔවුන්ගේ පාපය නිසා විනිශ්චය කරනු ලැබ සාතන් හා සාතන්ගේ දූතයන් සමග ගිනි විලට හෙළනු ලැබේ.

## සදාකාලික විනිශ්චය

අවසාන විනිශ්චයෙහිදී මුහුණ දෙන ජනතාව කොටස් දෙකකි. එනම්, ඇදහිලිවන්තයෝ සහ නොඇදහිලිවන්තයෝය.

**ඇදහිලිවන්තයෝ :**

ඇදහිලිවතුන් ඔවුන්ගේ ක්‍රියා අනුව විනිශ්චය කොට සුදුසු පරිදි විපාක ලබනු ඇත.

> **එහෙයින් අප එක් එක්කෙනා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන්දෙනවා ඇත. (රෝම 14:12)**
>
> **මක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේදී කළාවූ දේවල එල ඒ දේ යහපත් වුවත් අයහපත් වුවත් කළ දේවල හැටියට ලබන පිණිස අප සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි ප්‍රකාශ වෙන්ට ඕනෑය. (2 කොරින්ති 5:10)**

ඇදහිලිවතුන් දෙවියන්වහන්සේගේ වචනයෙහි සඳහන් අත්තිවාරම් මත තම ජීවිත ගොඩ නැංවූ ආකාරය අනුව විනිශ්චය කරනු ඇත.

> **නුමුත් අත්තිවාරම් පිට යමෙක් රන්, රිදී, අනර්ඝ ගල්, ලී, තෘණ ගොඩනගන්නේනම්, එක් එක්කෙනාගේ කර්මාන්තය ප්‍රකාශ වන්නේය. මක්නිසාද එය ගින්නෙන් එළිදරව් වන නිසා ඒ දවස තෙමේ එය ප්‍රකාශ කරන්නේය. එක් එක්කෙනාගේ කර්මාන්තය කොයි ආකාරදැයි ගින්නෙන්ම ඔප්පු වන්නේය.**
> **ඒ පිට ගොඩනැගුවාවූ යම් කෙනෙකුගේ කර්මාන්තය පවතී නම්, ඔහු විපාකයක් ලබන්නේය. යම්කෙනෙකුගේ කර්මාන්තය දැවී යන්නේනම්, ඔහුට අලාභ වන්නේය. නුමුත් ඔහුම ගැළවෙන්නේය. එහෙත් ගිනි මැදින් ගැළවුණාක් මෙන්ය. (1 කොරින්ති 3:12-15)**

ස්වභාවික ලෝකයෙහි දැව, පිදුරු හා ඉපනැලි යන සියල්ල පොළොවෙහි මතුපිට හටගන්නා ද්‍රව්‍ය වේ. ඒවා පහසුවෙන් දැවී යයි. එම ද්‍රව්‍ය නියෝජනය කරනුයේ මනුෂ්‍යයන්ට පෙනෙන පිණිස ඇදහිලිවතුන් කරන්නාවූ ක්‍රියාවන්ය. මෙම ක්‍රියාවල අරමුණ වැරදිය.

රන්, රිදී ගින්නෙන් දැවී නොයයි. ස්වභාවික ලෝකයෙහි මෙම මූලද්‍රව්‍ය මිනිස් දෑසට නොපෙනී පොළොවේ ගැඹුරෙහි හටගනී. එම මූලද්‍රව්‍ය මිනිසුන්ට පෙනෙන පිණිස හා ඔවුන්ගේ ප්‍රශංසාව ලබන පිණිස නොව, සැබෑ නිවැරදි අරමුණකින් සිදු කළාවූ ක්‍රියාවලට උදාහරණයකි. එම ක්‍රියාවන් නිවැරදි අරමුණු වලින් යුක්තව ඉටු කළාවූ කාරණා බැවින් දේව රාජ්‍යයෙහි වටිනාකමින් යුක්ත වේ.

සැබෑ ඇදහිලිවන්තයන්ගේ ක්‍රියා කීකරුකම නමැති පදනම මත විනිශ්චය කරනු ලැබේ. මෙම සත්‍යය පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ මතෙව් 25හි සඳහන් තලෙන්ත උපමාව හා ලූක් 19හි මිල පිළිබඳ උපමාව පැවසූසේක.

මෙම උපමා දෙකෙහිදීම සේවකයන් විනිශ්චය කරනු ලැබුවේ ඔවුන් සතු වූ දේ සම්බන්ධයෙන් ඔවුන් ක්‍රියා කළ අන්දම පදනම් කරගෙනය. ඔවුන් හට තම ස්වාමියා වෙනුවෙන් අරමුදල් ආයෝජනය කිරීමට පැවරිනි. ස්වාමියා හට අකීකරුකම් කළාවූ අය අවිශ්වාසවන්ත ලෙසට විනිශ්චය කරනු ලැබිය.

මෙම උපමාවල මෙන්ම, අපගේ ස්වාමින්වහන්සේ අපට වගකීමක් පවරා ඇත. එම වගකීම මහා නියෝගය ලෙසට හැඳින්වේ.

**එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා.**
**මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක.** (මතෙව් 28:19-20)

දෙවියන්වහන්සේ අපට දී ඇති ශුභාරංචි පණිවිඩය රැගෙන එය ලොව මුළුල්ලේ වෙසෙන ජනතාව සමග බෙදාගෙන එය ප්‍රතියෝජනය කළ යුතු වෙමු. අපි මෙම මහා නියෝගයට කීකරු වීම තුළින් දෙවියන්වහන්සේ අපට දී ඇති දෙය ආයෝජනය කරන අතර වැඩි දියුණු කරමු.

මෙම මහා නියෝගයෙහිදී සමහර ඇදහිලිවතුන් හට අනෙක් අයට වඩා වැඩි වගකීමක් පැවරේ. සමහරු සභාපාලකවරු, ශුභාරංචි ප්‍රකාශකවරු, ගුරුවරු ලෙස කැඳවා තිබේ. එහෙත් නැවත උත්පාදනය ලැබූ සැම ඇදහිලිවන්තයෙකු හටම ලෝකයා වෙත ශුභාරංචිය ගෙනයාමට යම් වගකීමක් තිබේ.

දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ට පවරා දී ඇති මෙම වගකීමට විශ්වාසන්තව සිටියාද යන පදනම මත විනිශ්චයට ලක් කරනු ලැබේ.

**ඇරත් මෙහිදී ගබඩාකාරයන්ගෙන් ඕනෑකරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය.** (1 කොරින්ති 4:2)

ඇදහිලිවතුන් ඔවුන්ගේ හැකියාවන්, අධ්‍යාපනය හෝ ආත්මික දීමනා පදනම් කරගෙන විනිශ්චයට ලක් නොවේ. දෙවියන්වහන්සේ ඔවුන්ට කිරීමට දුන්නාවූ වගකීමට ඔවුන් කීකරුවීම හා විශ්වාසවන්තභාවය දැක්වූ ආකාරය මත විනිශ්චය කරනු ලැබේ. සැබෑ ඇදහිලිවතුන් සඳහා ඇති විනිශ්චය වරදට පත්කිරීමේ විනිශ්චයක් නොවේ. එනම්, සැබෑ ඇදහිලිවන්තයාව සදාකාලික දඬුවමට පත් කළ නොහැකිය. ක්‍රිස්තුස්වහන්සේව පිළිගැනීම හේතුකොටගෙන ඔහු දැනටම ආත්මික මරණයෙන් සදාකාලික ජීවනයට ඇතුළු වී සිටී.

**සැබවක් සැබවක් නුඹලාට කියමි- මාගේ වචනය අසා මා එවූ තැනැන්වහන්සේ අදහන්නාට සදාකාල ජීවනය තිබේ. ඔහු විනිශ්චයට පත් නොව මරණය කෙරෙන් ජීවනයට පැමිණ සිටියි.** (යොහන් 5:24)

සත්‍ය ඇදහිලිවන්තයෙකු නම් තමාගේ පාපයෙන් පසුතැවිලි වී දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම පුද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගැනීම තුළින් පෙන්නුම් කළාවූ තැනැත්තෙකි. ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අළුත් ජීවියෙකු බවට පත්ව එලෙස ජීවත් වූ කෙනෙකි. පාවුල් ස්ථිර කරමින්:

**එහෙයින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නන්ට දැන් දඬුවමට පත්කිරීමක් නැත.** (රෝම 8:1)

පව්කරුවෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණි කල දෙවියන්වහන්සේ ඔහුගේ මීට පෙර පව් පිළිබඳ වාර්තාව මකා දමනසේක. ඇදහිලිවන්තයෙක් පව් කළ විට ඔහු එම පාපය ගැන පසුතැවිලි වී දෙවියන්වහන්සේට එය ප්‍රකාශ කොට පාපොච්චාරණයෙන් පසුව දෙවියන්වහන්සේ එම පාපය මකා දමනු ඇත.

**අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ට උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.** (1 යොහන් 1:9)

## නොඇදහිලිවන්තයෝ :

අධර්මිෂ්ඨයන් ඔවුන්ගේ පාපය අනුව විනිශ්චය කොට දඬුවම් ලබනු ඇත. දෙවියන්වහන්සේ "ජීවනයේ පොත" නම් වාර්තාවක් තබා ඇත. එහි පසුතැවිලි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිගෙන සැබෑ ඇදහිලිවන්තයන් වූ අයගේ නාම ලියා තිබේ. උන්වහන්සේව ප්‍රතික්ෂේප කළාවූ අය ඔවුන්ගේ පාපය අනුව විනිශ්චය කරනු ලැබ සදාකාල දඬුවමට නියම කරනු ඇත. ඔවුන්ගේ නම් ජීවනයේ පොතෙහි සඳහන් නොවේ.

**යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවීද, ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:15)**

ඔබ හැරීම ලැබූ පසු යේසුස්වහන්සේ තුළ නව ජීවියෙකු ලෙස ජීවත් විය යුතු බව ඔබ අවබෝධ කරගත යුතු වේ. ගැළවීම ලැබූ නමුත් පාපයෙහි දිගටම ගැලී සිටීම නිසා පැරණි ජීවිත රටාවට යාමට "පසුබට" වීමට හැකියාවක් තිබේ. බයිබලයෙහි සඳහන් වන පරිදි ඔබගේ නාමය ජීවන පොතෙහි ලියා තැබූ නමුත් ඔබගේම පාපය හේතුවෙන් එම නම මකා දැමීමට හැකි බව සනාථ කරයි.

**එවිට ස්වාමින්වහන්සේ: මට විරුද්ධව පව්කළ කවරෙකු නමුත් මාගේ පොතෙන් මකා දමන්නෙමි. (නික්මයාම 32:33)**

ශුද්ධවූ ජීවිතයක් ගතකිරීමට ඉගෙන ගැනීම ඉතා වැදගත් වනුයේ මේ නිසාය (ස[1]ව සම්පූර්ණත්වය නමින් අවසාන පරිච්ඡේදයෙහිදී අපි මෙම මාතෘකාව අධ්‍යයනය කරමු&. ඔබගේ ජීවිතයෙහි ඇති පාපයෙන් ජයගැනීම තුළින් ඔබගේ නාමය ජීවනයේ පොතෙන් මකා නොදමන බවට ඔබට ස්ථිර විය හැකිය.

**ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ. ඔහුගේ නම ජීවන පොතෙහි කිසිසේත් මකා නොහැර .... (එළිදරව් 3:5)**

## ධර්මිෂ්ඨයන්ගේ ඉරණම

ධර්මිෂ්ඨයෝ දෙවියන්වහන්සේ අභිමුවෙහි සදාකාලයේම ජීවත්වන පිණිස නියම කරනු ලැබ සිටිති. දේව අභිමුඛය ස්වර්ගය නමින් හැඳින්වේ. බයිබලයෙහි මෙය නම් කිහිපයකින් විස්තර කර තිබේ.

### පියාණන්ගේ නිවස :

යේසුස්වහන්සේ මෙය තම පියාණන්ගේ ගෙදර, වාසස්ථානය, විවේක ස්ථානය සහ සහභාගිකම දරණ තැනක් ලෙසට විස්තර කරයි.

**මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය: එසේ නොවුයේ නම්, මා විසින් නුඹලාට නොකියනවා ඇත. (යොහන් 14:2)**

### ස්වර්ගීය රාජ්‍යයක් :

බයිබලය ස්වර්ගීය රටකට සමාන කරයි. ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශය කරා ගමන් කළ අයුරින් අපද එම ස්වර්ග රට කරා ගමන් කරමු.

**නුමුත් ඔව්හු දැන් වඩා උතුම් වූ එනම්, ස්වර්ගීය වූ රටකට ආශා ඇත්තෝය. එබැවින් දෙවියන්වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේ යයි කියනු ලබන්ට ලජ්ජා නොවන සේක. මක්නිසාද උන්වහන්සේ ඔවුන්ට නුවරක් සුදානම් කළ සේක. (හෙබ්‍රෙව් 11:16)**

### නුවරක් :

ස්වර්ගය නුවරකට සමාන කර තිබේ.

**ශුද්ධ නුවර, එනම් අලුත් නුවර යෙරුසලම දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බසිනවා දුටිමි. (එළිදරව් 21:2)**

බයිබලය ස්වර්ගය පිළිබඳව ඉතා අනර්ඝ කාරණා හෙළි කරයි. ස්වර්ගය පහත සඳහන් ආකාර ස්ථානයකි ...

**ශුද්ධවූ :**

> බැටළු පැටවාණන්ගේ ජීවන පොතෙහි ලියන ලද්දවුන් මිස අපවිත්‍ර දෙයක්වත් පිළිකුල් වූ බොරු වූ දෙයක් කරන්නෙක්වත් කිසිසේත් එහි ඇතුල් නොවන්නේය. (එළිදරව් 21:27)

**ප්‍රීතිමත් :**

> උන්වහන්සේ ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිසදමනසේක. මරණය තවත් නොවන්නේය: වැලපීමක් හැඬීමක් වේදනාවක් තවත් නොවන්නේය. (එළිදරව් 21:4)

**අලංකාර :**

> එහි පවුර සූර්යකාන්තිවලින් ගොඩනගා තිබුණේය. නුවරද පවිත්‍ර විදුරු වලට සමාන වූ පවිත්‍ර රන්ය. (එළිදරව් 21:18)

**සේවයෙහි :**

> එබැවින් ඔව්හු දෙවියන්වහන්සේගේ සිංහාසනය ඉදිරියෙහි සිටිති: උන්වහන්සේගේ මාළිගාවේ රෑ දාවල් උන්වහන්සේට සේවය කරති. සිංහාසනයෙහි වැඩ හිඳින තැනැන්වහන්සේ තමන්ගේ මණ්ඩපය ඔවුන්ට උඩින් විදහනසේක. (එළිදරව් 7:15)

**ක්‍රිස්තුස්වහන්සේ සමග රජකම් කරන්නාවූ :**

යේසුස්වහන්සේ පොරොන්දු වූයේ,

> මම ජයගෙන මාගේ පියාණන්වහන්සේ සමග උන්වහන්සේගේ සිංහාසනයෙහි හිඳගත් සේම, ජයගන්නාටත් මාගේ සිංහාසනයෙහි මා සමග ඉඳගන්ට දෙන්නෙමි. (එළිදරව් 3:21)

**නමස්කාරය :**

ස්වර්ගයෙහි සිටින සියලු දෙනා ...

> ... ජීවමාන සත්වයෝ සතර දෙනාද ආමෙන් යයි කීවෝය. වැඩිමහල්ලෝ බිම වැටී නමස්කාර කළෝය. (එළිදරව් 5:14)

**ආලෝකය හා මහිමය :**

> දෙවියන්වහන්සේගේ තේජසින් නුවර ආලෝක වූ බැවින්ද බැටළු පැටවාණන් එහි පහන වන බැවින්ද එහි බැබළීමට සූර්යාවත් චන්ද්‍රයාවත් ඕනෑ නැත. (එළිදරව් 21:23)

**නව දැක්මක් :**

ස්වර්ගයෙහි සිට බලන කල අපට සියළු දෙයම අළුත් මුහුණුවරකින් පෙනෙනු ඇත.

> බලව, මම අලුත් අහසක්ද අලුත් පොළොවක්ද මවමි. පළමු දේ මතක් කරනු ලබන්නේවත් සිහිවෙන්නේවත් නැත. (යෙසායා 65:17)

**දෙවියන්වහන්සේගේ වාසභූමිය:**

> තවද, මෙන්න දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යයන් සමගය. උන්වහන්සේ ඔවුන් සමග වාසය කරන සේක. ඔව්හු උන්වහන්සේගේ සෙනග වන්නෝය. දෙවියන්වහන්සේම ඔවුන් සමග සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක. (එළිදරව් 21:3)

## අධර්මිෂ්ඨයාගේ සදාකාල ඉරණම

අධර්මිෂ්ඨයාගේ සදාකාල ඉරණම වනුයේ අපාය වේ. අපාය පහත සඳහන් ආකාරයේ ස්ථානයකි. එනම්,

### අතිමහත් දුක්විඳීම :

> ඔවුන් මුළා කළ යක්ෂයා වනාහි මෘගයාද බොරු අනාගතවක්තෘද වසන ගින්නෙන්ද ගෙන්දගමින්ද යුත් විලට හෙළනු ලැබුවේය. ඔව්හු සදාකාලේටම දිවා රෑ දෙක්හි වධකරනු ලබති. (එළිදරව් 20:10)

### මතකය හා කනස්සල්ල :

> ඔහු හේඩීසියෙහි වධවිඳිමින්, ඇස් ඔසවා ආබ්‍රහම් සහ ඔහුගේ ළපැත්තේ හුන් ලාසරුස් දුර සිට දැක ...
>
> නුමුත් ආබ්‍රහම් කියනුයේ, පුත්‍රය නුඹේ ජීවිතයේදී නුඹේ යහපත් දෙ නුඹට ලැබුණු බවත් එලෙසම ලාසරුස්ට අයහපත් දේ ලැබුණු බවත් සිහිකරපන්න. නුමුත් දැන් ඔහු මෙහි සැනසී ඉඳියි. නුඹ වේදනා විඳියි. (ලූක් 16:23-25)

### තෘප්තියට නොපැමිණෙන්නාවූ ආශාව :

> ... මොරගසා, පියවූ ආබ්‍රහම් මට කරුණාකොට තමාගේ ඇඟිල්ලේ අග දියේ ගලා මාගේ දිව සිසිල් කරන්ට ලාසරුස් එවුව මැනව. (ලූක් 16:24)

### නිවටකම :

> පොළොවේ ධූලියෙහි සැතපෙන්නන්ගෙන් බොහෝ දෙනෙක් සමහරෙක් සදාකාල ජීවනයටත් සමහරෙක් නින්දාව සහ සදාකාල නිවටකමටත් පිබිද එන්නෝය. (දානියෙල් 12:2)

### දුෂ්ඨ සගයන් :

> නුමුත් භය ඇත්තන්ටත් අවිශ්වාස කරන්නන්ටත් පිළිකුල්ව සිටින්නන්ටත් මිනීමරන්නන්ටත් වේශ්‍යාකම් කරන්නන්ටත් මායාකාරයන්ටත් රූප වඳින්නන්ටත් සියලු බොරුකාරයන්ටත් ගින්නෙනුත් ගෙන්දගමිනුත් දැවෙන විලෙහි තමුන්ගේ කොටස වන්නේය: එය දෙවෙනි මරණය යයි මට කීසේක. (එළිදරව් 21:8)

### බලාපොරොත්තු විරහිත බව :

> දුෂ්ට මනුෂ්‍යයා නසින කල ඔහුගේ බලාපොරොත්තුව නැතිවෙයි. අයුතුකම් කරන්නන්ගේ ප්‍රාර්ථනාවද නැතිවෙයි. (හිතෝපදේශ 11:7)

### සදාකාලික දඬුවම :

අපාය මුලින්ම සූදානම් කරන ලද්දේ සාතන් සහ ඔහුගේ දූතයන්ටය. එහෙත් මිනිසා පව්කිරීම නිසා ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින් මිදීම ලදහොත් මිස සදාකාලය අපායෙහි ගෙවීමට තිරණය විය.

> එවිට උන්වහන්සේ වම්පැත්තේ සිටින්නන්ට කියනසේක්: ශාපලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර තිබෙන සදාකාල ගින්නට පලයල්ලා.
> (මතෙව් 25:41)

දුෂ්ඨයාගේ දඬුවම සදාකාලිකය. එම වචනය බයිබලයෙහි සදාකාල ජීවනය (යොහන් 3:15) හා සදාකාල දෙවිඳු (1 තිමෝති 1:17) විස්තර කිරීමටත් සදාකාල විනිශ්චය (හෙබ්‍රෙව් 6:2) විස්තර කිරීමටත් භාවිතා කොට තිබේ. මින් එකක් හෝ තාවකාලික වේ නම්, අනෙකුත් කරුණු දෙකද තාවකාලික විය යුතුය.

එසේනම්, දෙවියන්වහන්සේ සදාකාලික නම්, සදාකාලින ජීවනය සදාකාලික නම්, අපායෙහි දඬුවමද සදාකාලික බව නිගමනය කිරීමෙන් බැහැර වීමට මගක් නැත. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ව පාතාලයට නොයවන සේක. මනුෂ්‍යයා හට සදාකාලික දඬුවමින් බේරීමට මාර්ගයක් ගැළවීමේ සැලසුම තුළින් දෙවියන්වහන්සේ සපයා දී තිබේ. ඔව්හු විනාශ වනු දැකීමට එතුමා ප්‍රිය නොකරන සේක.

## එසේනම්, අප ජීවත් විය යුතු කෙලෙසද?

ඇදහිලිවතුන් හැටියට සදාකාල විනිශ්චය නම් දේවධර්මය අපගේ ජීවිත වලට බලපෑමක් ඇති කළ යුත්තේ කෙලෙසද?

ප්‍රේරිත වූ පේතෘස් අනාගත විනිශ්චය පිළිබඳව ලිවීමෙහිදී මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයිය.

> **මේ සියල්ල මෙසේ නාස්ති වෙන්ට තිබෙන බැවින් නුඹලා දෙවියන්වහන්සේගේ දවස පැමිණීම බලාසිටිමින්ද ඒ ගැන උනන්දුව ක්‍රියා කරමින්ද සියලු ආකාර ශුද්ධවූ හැසිරීමෙන් ...**
> **ඉන්නිසා ප්‍රේමවන්තයෙනි, නුඹලා මේ දේවල් බලා සිටින බැවින් උන්වහන්සේ ඉදිරියෙහි කැළැල් රහිතව නිදොස්ව සමාදානයෙන් යුක්තව දකිනු ලබන පිණිස උත්සාහ කරපල්ලා.**
> **(2 පේතෘස් 3:11,14)**

ඇදහිලිවන්තයා සදාකාලික විනිශ්චය අවබෝධ කරගැනිම හේතුවෙන් ආත්මික පරිනත බවක් ඇති කරගත යුතුය.

ක්‍රිස්තියානි පරිනතභාවය, පාවුල් "සම්පූර්ණත්වය කරා ළඟාවීම" ලෙසට හඳුන්වයි. මීළඟ පරිච්ඡේදයෙහිදී අපි එම විෂය අධ්‍යයනය කරමු.

## ස්වයං-පරීක්ෂණය

1. පැරණි ගිවිසුමෙහි "විනිශ්චය" යන පදය භාවිතා කර ඇති ක්‍රම දෙක මොනවාද?

______________________________ ______________________________

2. "විනිශ්චය කිරීම" යන පදයෙහි අර්ථය කුමක්ද?

____________________________________________________________

3. විනිශ්චය කිරීමක් අවශ්‍ය මන්ද?

____________________________________________________________

4. සදාකාල විනිශ්චයෙහිදී විනිශ්චය සිදුකරනුයේ කවුරුන්ද?

____________________________________________________________

5. විනිශ්චයට ලක් කරනුයේ කවුරුන්ද?

____________________________________________________________

6. එම කාලයෙහිදී විනිශ්චය කුමන මූලධර්ම මත පදනම් වෙනු ඇතිද?

____________________________________________________________

____________________________________________________________

7. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

____________________________________________________________

____________________________________________________________

8. පහත සඳහන් ප්‍රකාශන සත්‍යය නම් <u>ස</u> යන්නද අසත්‍යය නම් <u>අ</u> යන්නද ප්‍රකාශනය ඉදිරියෙන් සටහන් කරන්න.

   අ. සියළුම කාලවල විනිශ්චය දිගටම සිදුවෙමින් පවතී __________

   ආ. අනාගතයෙහි විශේෂ අවස්ථාවක සිදුවීමට නියමිත විනිශ්චයක් තිබේ __________

   ඇ. අනාගත විනිශ්චය සිදුවන ස්ථානය බයිබලට අපට නොපවසයි __________

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදය විනිශ්චය පිලිබඳ බයිබලයෙහි උගන්වා ඇති විෂය හඳුන්වා දී ඇත. විනිශ්චය යන විෂය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරගැනීම සඳහා පහත සඳහන් බයිබල් කොටස් භාවිතා කරමින් අධ්‍යයනය තවදුරටත් ඉදිරියට ගෙන යන්න.

### විනිශ්චය දෙවියන්වහන්සේගේ ගුණාංගයකි (ලක්ෂණයකි)

ගීතාවලිය 89:14; 97:2; 99:1-5; යෙසායා 28:5-6; 30:18; 61:8; දානියෙල් 4:37

### විනිශ්චය යේසුස්වහන්සේගේ ගුණාංගයකි

ගීතාවලිය 72:2; යෙසායා 9:7; 11:1-5; යොහන් 5:30; 8:15-16, 26

### දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි පරමාර්ථය

ජීවනය ලබාදීමට : ලෙවිකථාව 18:4-5; නෙහෙමියා 9:29; ගීතාවලිය 119:149, 156
එතුමාගේ ජනතාව මුදාගැනීමට : නික්මයාම 6:6; 7:4; යෙසායා 1:27
ස්ථිරව පිහිටුවීමට : 1 ලේකම් 28:7; ගීතාවලිය 37:28; හිතෝපදේශ 2:8; ශෙපනියා 2:3
තරවටු කිරීමට (හරිගැස්සවීමට) : ගීතාවලිය 119:75; යෙරමියා 10:24; හබක්කුක් 1:12
තම සෙනගට උපකාර කිරීමට : ගීතාවලිය 76:8-9; 119:175

### දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි ආශිර්වාද

සුවපහසුව : ගීතාවලිය 119:52
විපාකය : ගීතාවලිය 58:11
උපදෙස් සහ ධර්මිෂ්ඨකම : යෙසායා 26:8-9

### උන්වහන්සේගේ විනිශ්චයට ප්‍රතිචාර නොදැක්වීමේ දඬුවම

මේවා එසකියෙල් 5:6-17; 11:11-12; 14:21; මලාකි 2:1-4; 3:1-6 ට සඳහන් වේ.

### දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි ස්වභාවය

ධර්මිෂ්ඨය : ද්විතිය කථාව 4:8; ගීතාවලිය 19:9; 119:137; යෙරමියා 11:20; 2 තෙසලෝනික 1:4-6; 1 පේතෘස් 2:23; එළිදරව් 15:4; 16:7; 19:2, 11
ප්‍රේමය මත පදනම්ව ඇත : ගීතාවලිය 33:5
සත්‍ය සහ සාධාරණය : ගීතාවලිය 111:7; හිතෝපදේශ 2:9; යෙරමියා 4:2; යොහන් 8:15-16
දුෂ්ඨයන්ට වඩා උසස්ය : ගීතාවලිය 10:5
සදාකාලිකය : ගීතාවලිය 119:160
ශ්‍රේෂ්ඨය : ගීතාවලිය 36:6
නැවුම් කළ : ශෙපනියා 3:15
සොයාගත නොහැකි : රෝම 11:33
එය (අපට) ප්‍රකාශ කරනු ලැබේ : එළිදරව් 15:4

### දෙවියන්වහන්සේ විනිශ්චය කරන පුද්ගලයන්

සියලුම ජනතාව : ගීතාවලිය 7:8; 9:7-8; 96:10; හෙබ්‍රෙව් 12:23; යුදස් 15-16
ධර්මිෂ්ඨයන්ට පීඩා කරන්නන් : ගීතාවලිය 119:84
ධර්මිෂ්ඨයන් : ගීතාවලිය 7:11
අපහාස කරන්නන් : හිතෝපදේශ 19:29
සෑම මනුෂ්‍යයෙකුම : හිතෝපදේශ 29:26
යෞවනයෝ : දේශනාකාරයා 11:9
ජාතීන් : යෙසායා 2:4

නායකයන් : යෙසායා 3:13-14
දුෂ්ඨයන් : ද්විතිය කථාව 7:10-11, යෙරමියා 1:16; හෙබ්‍රෙව් 13:4; යූදස් 15-16
ලෝකය : යොහන් 9:39; 12:31
මේ ලෝකයෙහි අධිපතියා (සාතන්) : යොහන් 16:11; 12:31
සභාවෙන් පිටත සිටින අය (නැති අය) : 1 කොරින්ති 5:13
එතුමාගේ ජනතාව : හෙබ්‍රෙව් 10:30
ගුරුවරු : යාකොබ් 3:1
තරඟා රඳවාගත් අය : යාකොබ් 5:9
සභාව (දෙවියන්වහන්සේගේ ගෘහය) : 1 පේතෘස් 4:17
අන්‍ය ජාතින් : එසකියෙල් 39:21

## දෙවියන්වහන්සේ විනිශ්චය කරන ක්‍රමය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් : යොහන් 5:22, 27
ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් : යොහන් 16:11; එසකියෙල් 36:27
දේවවචනයට අනුකූලව : යොහන් 12:48
එක් එක් පුද්ගලයාගේ ක්‍රියාවට අනුව : 1 පේතෘස් 1:17
එතුමාගේ ඊාසයන් මගින් : එසකියෙල් 44:24; හොෂෙයා 6:5

## දෙවියන්වහන්සේගේ විනිශ්චය කෙරෙහි අපගේ ආකල්පය

අප එය:

ඉගැන්විය යුතුය : එස්රා 7:10; ගිතාවලිය 37:30
පවත්වා ඉටුකළ යුතුය : ද්විතිය කථාව 11:32
දෙවියන්වහන්සේට ඒ ගැන ප්‍රශංසා කළ යුතුය : ගිතාවලිය 48:11; 97:8; 119:7, 62, 164
ආශාවිය යුතුය : ගිතාවලිය 119:20
අප ඉදිරියෙහි තබාගත යුතුය : ගීතාවලිය 119:30
බලාපොරොත්තු විය යුතුය : ගිතාවලිය 119:43
ප්‍රකාශ කළ යුතුය : ගිතාවලිය 119:13
එයින් ඉවත් නොවිය යුතුය : ගිතාවලිය 119:102
බිය විය යුතුය : ගිතාවලිය 119:120
ඒ පිළිබඳව ප්‍රවේසම් විය යුතුය : ගිතාවලිය 35:23
අපව විනිශ්චය කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න : ගිතාවලිය 35:24
එතුමාගේ විනිශ්චයන් දේශනා කළ යුතුය : ක්‍රියා 24:25

## දෙවියන්වහන්සේගේ වර්තමාන විනිශ්චයෙහි පරමාර්ථය

දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ව නිවැරදි කිරීම (තරවටු කිරීම) සඳහා පරමාර්ථය

අපව ශුද්ධ කිරීමට : හෙබ්‍රෙව් 12:10
අපගේ ජිවිතයෙහි ධර්මිෂ්ඨකම ගෙන එන පිණිස : හෙබ්‍රෙව් 12:11
ජිවනය ගෙනෙන පිණිස : හෙබ්‍රෙව් 12:9; හිතෝපදේශ 15:31
ආත්මයාණන්ගේ මඟපෙන්වීම සඳහා අපව සූදානම් කිරීමට : හිතෝපදේශ 1:23
ගෞරවය ගෙන ඒමට : හිතෝපදේශ 13:18
ප්‍රඥාව ගෙනෙන පිණිස : හිතෝපදේශ 15:5, 32
දේව භය ඉගැන්වීමට : හිතෝපදේශ 15:33
අපව සම්පූර්ණ කිරීමට : කොලොස්සි 1:28; 2 තිමෝති 3:16-17
අපට ඉවසීම ඉගැන්වීමට : 1 පේතෘස් 2:20
වරදකාරිත්වයෙන් මගහරින පිණිස : 1 කොරින්ති 11:32
පසුතැවිල්ලට ගෙන එන පිණිස : එළිදරව් 3:19; රෝම 2:4
අපව නිවැරදි කරන පිණිස : යෙරමියා 10:24

## තරවටු ලැබීමට හේතු

පාපය හා පසුබට වීම : යෙරමියා 2:19; යොහන් 3:20; 16:8; 2 පේතෘස් 2:16
වැරදි : 1 පේතෘස් 2:20
අවිශ්වාසය : රෝම 11:20
අකීකරුකම : ලූක් 12:47-48
පුද්ගලයන්ට ගෞරව කිරීම : යෝබ් 13:10

## තරවටුව වළක්වා ගත හැකි ක්‍රමය

1 කොරින්ති 11:31-32 [ස්වයං-සෝදිසිය]; රෝම 11:22; පිලිප්පි 2:12-16

### තරවටුවෙහි මට්ටම්

දෙවියන්වහන්සේ අපගේ ජීවිත වල තරවටු කිරීම රටාවකට අනුව සිදුකරන සේක. එය සරල ලෙස අවවාද කිරීමකින් පටන්ගෙන වඩා දැඩි හික්මවීමක්, දඬුවමක් කරා විහිදී යා හැකිය (හෙබ්‍රෙව් 12:11)

### දොස් පැවරීම :

වැරැද්දක් නිවැරදි කිරීමට, වැරදි ප්‍රකාශනයක් සෑදීම, උපදෙස් දීම හෝ නිවැරදි කිරීම දෙවියන්වහන්සේ අපට කථාකොට අප ජීවිතයෙහි ඇති වැරදි පෙන්වා දෙන සේක. ඒ පිළිබඳව තරවටු කරන සේක. යෙසායා 11:4; ගීතාවලිය 50:21; 141:5; හිතෝපදේශ 1:23; එපීස 5:13; 2 තිමෝති 3:16

### තදින් දොස් පැවරීම :

තදින් තරවටු කිරීම හෝ දඬුවම් කිරීම අපට තරවටු කරන විට එයට සවන් දීමට අසමත් වුවහොත් දෙවියන්වහන්සේ වඩා දැඩි ලෙස ක්‍රියාකරනු ඇත. හෙබ්‍රෙව් 12:5; එළිදරව් 3:19; ගීතාවලිය 6:1; ද්විතිය කථාව 28:20

### උදහස :

අපහට තදින් තරවටු කරනු ලැබූ පසුවත් තවදුරටත් අපගේ පාපිෂ්ඨ මාර්ග වලම දිගටම රැඳී සිටිමින් දෙවියන්වහන්සේගෙන් නිවැරදි කිරීම ප්‍රතික්ෂේප කළහොත් අප පිට එතුමාගේ උදහස පැමිණිය හැකිය. රෝම 2:8-9

### දුක් පීඩා :

දෙවියන්වහන්සේගේ උදහස දුක් පීඩා තුළින් හෙළි විය හැකිය. එය මූල්‍යමය, භාණ්ඩමය හෝ ශාරීරික දුකක්, ගැහැටක් විය හැකිය (මෙයින් කියවෙන්නේ සියලුම දුක් පීඩා දේව විනිශ්චය නිසාම වේ කියා නොවේ). රෝම 2:9; ගීතාවලිය 119:75; ද්විතිය කථාව 28:15-47; ලෙවී කථාව 26:14-39; ආමොස් 4:6-13

### ප්‍රතික්ෂේපය :

තරවටු කිරීමෙන් යම්කිසිවෙකු පසුතැවීමට යොමුකළ නොහැකි වූ කල දෙවියන්වහන්සේගේ විනිශ්චයෙහි අවසාන පියවර ලෙස යන්නාවූ ක්‍රියාව මෙයයි. හෙබ්‍රෙව් 6:4-6; 10:26-31; යෙරමියා 14:11-12; 2 පේතෘස් 2:20; 1 යොහන් 5:16; හිතෝපදේශ 1:25-32; 5:1-23; 15:10; 29:1

## තරවටු කිරීමෙහි ප්‍රතිඵලය

දෙවියන්වහන්සේගේ තරවටු කිරීමේ පරමාර්ථය වනුයේ අපව නැවත එතුමා වෙතට හරවා ගැනීමය. හොෂෙයා 6:1

# එකොළොස්වෙනි පරිච්ඡේදය

## සර්ව සම්පූර්ණත්වය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට .
- "සර්ව සම්පූර්ණත්වය" අර්ථ දැක්වීමට.
- ඇදහිලිවතුන් සඳහා සම්පූර්ණත්වයෙහි උදාහරණය හඳුනාගැනීමට.
- ඇදහිලිවතුන් සඳහා සම්පූර්ණත්වයෙහි ප්‍රමිතීන් නම් කිරීමට.
- ආරම්භක සහ වර්ධනය වන්නාවූ සම්පූර්ණත්වය අතර වෙනස හඳුනාගැනීමට.
- සම්පූර්ණත්ව ක්‍රියාදාමයෙහි සාධක නම් කිරීමට.

**ප්‍රධාන පදය:**

> **එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන් නුඹලාත් සම්පූර්ණව සිටින්න. (මතෙව් 5:48)**

### හැඳින්වීම

ලෝකයෙහි යහපත් ගෙඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා හොඳ අත්තිවාරමක් අවශ්‍ය වන්නාක් මෙන්, හොඳ ආත්මික අත්තිවාරමක් ඇදහිලිවන්තයා සතුවීම වැදගත්ය. ගොඩනගන්නන් දෙදෙනාගේ උපමාව තුළින් ඔබ ඔබගේ ආත්මික අත්තිවාරම දේව වචනය මත පිහිටවිය යුතු බව ඉගෙන ගත්තෙහිය.

හෙබ්‍රෙව් 6:1-3 දක්වා එළිදරව් කරන පරිදි ක්‍රිස්තියානි ඇදහිල්ලෙහි  අත්තිවාරම් නම්:

- මළ ක්‍රියාවලින් පසුතැවීම
- දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
- බව්තීස්මය පිළිබඳ දේව ධර්මය
- අත් තැබීම
- මළවුන්ගේ උත්ථානය
- සදාකාලික විනිශ්චය

ඔබගේ ආත්මික ජීවිතය ගොඩනැගිය යුතු දේව වදනයෙහි මූලික දේව ධර්ම පෙන්වා දෙන අත්තිවාරම් මේවාය. මින් එකිනෙක මීට පෙර පාඩම් වලදී අධ්‍යයනය කළෙමු.

### සම්පූර්ණත්වය කරා

අපගේ ආත්මික ජීවිතය ගොඩනගා ගැනීමට අවශ්‍ය අමතර පියවරක් පාවුල් හෙබ්‍රෙව් 6:1-3 දක්වා අපට සපයයි.

> **... ඉගැන්වීමද නැමැති අත්තිවාරමක් නැවත නොතබා ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර සම්පූර්ණවීමට පැමිණෙමු. (හෙබ්‍රෙව් 6:2)**

මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීම, බව්තීස්ම කිරීම්, අත්තැබීම, මළවුන්ගේ උත්ථානය, සදාකාල විනිශ්චය යන සියලුම ධර්ම ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා වේ.

කිතුනුවන් අතර අන්තවාදී බවින් යුත් අන්ත දෙකක් දක්නට ඇත. එකක් නම්, ඔව්හු මනා ලෙස දේව වචනය දන්නා නුමුත් එදිනෙදා ජීවිතයෙහිදී එම දැනුම භාවිතා නොකරන කණ්ඩායමකි. අනෙක් අන්තවාදී කණ්ඩායම නම්, අත්දැකීම් අවධාරණය කරන නමුත් මූලික ධර්ම නොදන්නාවූ කිතුනු කණ්ඩායමකි. දේව ධර්මය මෙන්ම අත්දැකීම්ද වැදගත්ය. නිසියාකාරව දේව ධර්මය

අවබෝධ කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙසට අත්දැකීම් ඇතිවේ. එහෙත් දේව ධර්මය මත පදනම් නොවූ අත්දැකීම් එතරම් විශ්වාස කටයුතු නොවේ.

ඔබ හෙබ්‍රෙව් 6:1-3 සඳහන් මූලික දේව ධර්ම අවබෝධ කරගැනීම පමණක් නොසෑහේ: ඒවා අත්දැකිය යුතුය. මෙසේ ඔබ එම ධර්ම ඉගෙන ගෙන ඒ මත ජීවිතය අත්දැකීමෙන් අනතුරුව "සම්පූර්ණත්වය කරා ළංවීමට" ඉගෙන ගත යුතුය. අපගේ මෙම පරිච්ජේදයෙහි අරමුණ එයයි.

## අර්ථ දැක්වීම

"සම්පූර්ණත්වය" යන පදයෙහි අර්ථය අවසන් කිරීම, නිමවීම, පරිණතවීම යනුයි. බයිබලය ආත්මිකව පරිණත වූ ඇදහිලිවන්තයෙකු හැඳින්වීමට "පරිණත" යන පදයට වඩා "සම්පූර්ණ" යන පදය ඒ අර්ථයෙන් යොදාගෙන ඇත. "සම්පූර්ණ" කිතුනුවෙකු නම් ආත්මික පරිනත භාවය ළඟාකරගත්තෙකි. එනම්, ඔහුගේ ශරීරය, ප්‍රාණය හා ආත්මය ශුද්ධාත්මයාණන්ගේ පාලනයට යටත් කරන ලද කෙනෙකි.

"සම්පූර්ණත්වය" යන වචනය බයිබලයෙහි භාවිතා කර ඇති "පවිත්‍ර කරනු ලැබීම" හෝ "කැපකරන ලද" යන වචනය හා බොහෝ සමානය. "පවිත්‍ර කරනු ලැබීම" යනු ශුද්ධ භාවයයි: "කැප කරන ලද" යනු ධර්මිෂ්ඨකම උදෙසා වෙන් කරන ලද යනුයි.

## භයානක කම් දෙකක්

සම්පූර්ණත්වය කරා අවධානය යොමු නොකොට ආත්මික අත්තිවාරම් කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමේ අනතුරුදායක තත්ව දෙකක පවති.

1. එක අනතුරුදායක තත්වයක් නම් හොඳ අත්තිවාරම් හෙළන නමුත් ආත්මික පරිනතභාවයකට ළඟා නොවීමය.

2. අනෙක් අනතුර නම්, වැරදි ආත්මික අත්තිවාරමක් මත සර්ව සම්පූර්ණත්වයේ "අති විශේෂ ආකෘතියක්" ගොඩනැගීමට උත්සාහ දැරීමය.

## අත්තිවාරම සම්පූර්ණ කිරීම

අත්තිවාරමක් යනු සම්පූර්ණ කරන ලද ගොඩනැගිල්ලක් නොවේ. එම අත්තිවාරම මත සුපිරි ආකෘතියක් ගොඩනැගිය යුතුය. සාමාන්‍යයෙන් ගොඩනැගිල්ලක මතුපිටින් පියවි ඇසින් දැකිය හැක්කේ අත්තිවාරමට උඩින් පිහිටන සුපිරි ආකෘතිය වේ. ඇදහිලිවන්තයාගේ අවසාන ඉලක්කය යහපත් ආත්මික අත්තිවාරමක් දැමීම පමණක් නොවේ.

> **අත්තිවාරමක් දමා නිමකරන්ට බැරි වූ විට ඒ දකින සියල්ලෝ මේ මනුෂ්‍යයා ගොඩනගන්ට පටන්ගත් නුමුත් නිම කරන්ට ඔහුට බැරි විය කියා ඔහුට සරදම් කරන්ට පටන් ගත්තෝය. (ලූක් 14:29-30)**

බොහෝ මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේ සමග ගමන අරඹති. ඔව්හු ශුභාරංචිය අසා, මළ ක්‍රියාවලින් පසුතැවිලි වී දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල රඳවති. එහෙත් එතැනින් ඔබ්බට වර්ධනය නොවෙති. ඔව්හු කිසිවිටක තමුන්ගේ ආත්මික අත්තිවාරම සම්පූර්ණ කොට සම්පූර්ණත්වය කරා යොමු නොවෙති.

බාගෙට දැමූ අත්තිවාරමක් මත ස්වභාවික ලෝකයෙහි ගොඩනැගිල්ලක් නියමාකාරයෙන් ඉදිකළ නොහැකිය. බාගෙට දැමූ අත්තිවාරමක් මත ඔබ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට උත්සාහා දැරුවහොත් පීඩනය යටතේ එම ගොඩනැගිල්ල කඩා වැටෙනු නියතය. ඔබ පළමුකොට අත්තිවාරම සම්පූර්ණ කොට ඉන්පසුව ගොඩනැගිල්ල ඉදි කළ යුතුය.

තමාගේ ආත්මික අත්තිවාරම සම්පූර්ණ කර නොගත් ඇදහිලිවතුන් හට පීඩනය යටතේ ක්‍රියාත්මක වීමට අපහසු වනු ඇත. ඔව්හු ආත්මිකව "ඉහළ පහළ යන" ජීවිත ගත කරනු ඇත. ඔවුන්ගේ ආත්මික ගොඩනැගිල්ල ජීවිත කුණාටු වලට ඔරොත්ත= නොදෙනු ඇත. ඔවුන්ගේ ආත්මික

අත්තිවාරම අසම්පූර්ණ බැවින් ඔවුන්ට සම්පූර්ණත්වය කරා (ආත්මික පරිණතභාවය) ළඟාවිය නොහැකිය.

## සුපිරි ආකෘතිය ඉදිකිරීම

ස්වභාවික ලෝකයෙහි අත්තිවාරමක් පමණක් දැමීම එතරම් ප්‍රයෝජනවත් නොවේ. එම අත්තිවාරම මත ඉදිකළ ගොඩනැගිල්ල දිනක නිවසක්, කාර්යාලයක් හෝ පාසලක් යනාදි ලෙස ප්‍රයෝජනයට ගනු ලැබේ. සමහර මනුෂ්‍යයන් ආත්මිකව නොමේරූ බොළඳ තත්වයෙහි පසුවීමට හේතුව නම්, ඔව්හු හොඳ ආත්මික අත්තිවාරමක් හෙලූ නමුත් ඒ මත ගොඩනැගිල්ලක් ඉදිකර සම්පූර්ණත්වය කරා ළං නොවීමය.

පාවලු මෙම නොමේරූ ඇදහිලිවතුන් පිළිබඳව මෙසේ පවසයි.

> **මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව තිබියදීත් දෙවියන්වහන්සේගේ වාක්‍ය වල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ. නුඹලාට දෑඩි ආහාර නොව කිරි ඕනෑකරන අයව සිටින්නෝය.**
> **ඉතින් කිරි බොන හැමදෙනම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නමුත් දෑඩි ආහාර ඕනෑවන්නේ යහපත සහ අයහපත විමසා බලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණු වූ ඉන්ද්‍රියයන් ඇති සම්පූර්ණ වූ තැනැත්තන්ටය. (හෙබ්‍රෙව් 5:12-14)**

පාවුල්තුමා කොරින්තියේ ඇදහිලිවතුන්ට පැවසුවේ මේ වන විට ඔව්හු අන් අයට ශුභාරංචිය ඉගැන්විය යුතු බවය. ඒ වෙනුවට තවමත් ඔවුන්ට දෙවියන්වහන්සේගේ ප්‍රතිපත්තිවල මූලික කරුණු (පදනම්) ඉගැන්විය යුතුව පැවතිනි. මෙවන් අය කිරි පමණක් බීමට හැකි ළදරුවන්ට සමාන කෙරේ. "කිරි" යන්නෙන් ඔහු අදහස් කළේ දෙවියන්වහන්සේගේ කාරණා වල මූලික කරුණුය.

කිරි ඉතා සෞඛ්‍ය සම්පන්න ආහාරයකි, එමගින් වර්ධනය ගෙන දෙන බව සැබෑය. එහෙත් බිළිඳෙකු කිරි වල සිට ඝන ආහාර අනුභවයට එළැඹෙන කාලයක් ඇත.

> **උන්වහන්සේගේ දැනගැන්ම උගන්වන්නේ කාටද? පණිවිඩය තේරුම් කර දෙන්නේ කාටද? කිරි වැරුවන්ට සහ තනෙන් වෙන් වුණ දරුවන්ටද? (යෙසායා 28:9)**

ස්වභාවික ලෝකයෙහි බිළිඳෙකු නිසියාකාර වැඩීමට නම්, කිරි වැරීම කළ යුතුය: ආත්මික ජීවිතයෙහිද්ද එය එලෙසම විය යුතුය. ඇදහිලිවතුන් ආත්මික අත්තිවාරම් වලින් පටන්ගෙන ඉන් ඔබ්බට ගොස් ආත්මික පරිණත භාවය (සම්පූර්ණත්වය) කරා ළඟා විය යුතුය. ආත්මිකව පරිණත වූ ඇදහිලිවතුන්ට දේව වචනයෙහි කිරි පමණක් නොව මස් වැනි ආහාරද භුක්ති විඳිය හැකිය.

## සම්පූර්ණත්වය කරා කැඳවීම

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ව සම්පූර්ණත්වය කරා කැඳවූසේක.

> **එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන් නුඹලාත් සම්පූර්ණව සිටින්න. (මතෙව් 5:48)**

මෙම සම්පූර්ණත්වය දේව අභිමුඛය පිළිබිඹු කරයි.

> **මෙසේ කළේ මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත් ... (යොහන් 17:23)**

එමගින් ආත්මික පරිණතභාවය ඇති වේ.

> **සහෝදරයෙනි, නුඹලා බුද්ධිය සම්බන්ධයෙන් ළමයි නොවෙල්ලා. බුද්ධියෙන් පුරුෂයෝ වෙයල්ලා. (1 කොරින්ති 14:20)**

සම්පූර්ණත්වය මුල් කාලීන සභාවෙහි පැවති ඉලක්කයකි. පාවුල් මේ ගැන ලියුවේ,

**නුඹලාගේ සම්පූර්ණ වීම සඳහා අපි යාච්ඤා කරමුව. ඉතින් සහෝදරයෙනි,**

**... සම්පූර්ණ වෙයල්ලා ... (2 කොරින්ති 13:9, 11)**

පෞද්ගලිකව සම්පූර්ණ වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි අනෙකුත් සියලුම සාමාජිකයන් සමග නියමාකාරයෙන් සම්බන්ධ වී පැවතීමකට ගෙන එයි.

**නුඹලා සියල්ලන් විසින් එකම දේ කථාකරන හැටියටද නුඹලා අතරෙහි භේද නැතිව එක සිතින් හා එක කල්පනාවෙන් එකඟව සම්පූර්ණව සිටින හැටියටද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නුඹලාගෙන් ඉල්ලමි. (1 කොරින්ති 1:10)**

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි  බෙදීම්, ආත්මික නොමේරූකමෙහි ප්‍රතිඵලයකි.

## සම්පූර්ණත්වයහෙි උදාහරණය

ඇදහිලිවන්තයා හට සම්පූර්ණත්වය සඳහා ඇති උදාහරණය නම් යේසුස්වහන්සේය.

**එසේය, ඊට නුඹලා කැඳවනු ලැබුවහුය. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධ විඳ නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක.**
**(1 පේතෘස් 2:21)**

**කුමක් හෙයින්ද යමෙකු නිසාත් යමෙකු කරණකොටගෙනත් සියල්ල පවත්වන්නේද, ඒ තැනැන්වහන්සේ විසින් බොහෝ පුත්‍රයන් තේජසට ගෙනයන කල ඔවුන්ගේ ගැළවීමේ කතෘන්වහන්සේ දුක්විඳීම කරණකොටගෙන සම්පූර්ණ කරන්ට යුතු වූයේය. (හෙබ්‍රෙව් 2:10)**

**මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ, ... තමන්වහන්සේට කීකරු වන්නාවූ සියල්ලන්ටම සදාකාල ගැළවීමේ කතෘ වූසේක. (හෙබ්‍රෙව් 5:9)**

දෙවියන්වහන්සේ සැලසුම් කර ඇත්තේ සියලු ඇදහිලිවන්තයෝ අපගේ ආදර්ශය වන යේසුස්වහන්සේගේ සම්පූර්ණත්වයට සමාන වීමටය (එවැනි ආකාරයට පත්වීමටය).

**මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුලා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමාන වෙන්ට පූර්වයෙන් නියම කළ සේක. (රෝම 8:29)**

## සම්පූර්ණත්වයේ ප්‍රමිතිය

ඇදහිලිවන්තයන්ගේ සම්පූර්ණත්වය මැන බලන ප්‍රමිතිය වනුයේ දේව වචනයයි. යේසුස්වහන්සේගේ සම්පූර්ණත්වය සඳහා ආදර්ශය වන්නේ උන්වහන්සේ දේව වචනයට සම්පූර්ණයෙන්ම අනුකූල වූ අතරම දේව වචනයෙහි දෘශ්‍යමාන එළිදරව්වද වූ බැවිනි. දෙවියන්වහන්සේ අපගේ ජීවිත හැසිරවීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් දේව වචනයෙහි ඉදිරිපත් කොට තිබේ. උන්වහන්සේ පළමුවෙන් දුන්නාවූ ප්‍රමිති මාලාව “ව්‍යවස්ථාව” ලෙස හැඳින්වෙන අතර එය පැරණි ගිවිසුමෙහි මුල් පොත් පහේ සඳහන් වේ.

පරණ ගිවිසුම් ඉතිහාසයෙහි වැඩිපුර පෙන්නුම් වන්නේ මනුෂ්‍යයා හට දේව නියමයන් පැවැත්වීමට නොහැකි වූ ආකාරය වේ. මනුෂ්‍යයා හට ඔහුගේම උත්සාහයෙන් දේව නියමයන් පැවැත්වීමට නොහැකි බව දෙවියන්වහන්සේ දැන සිටි සේක. එහෙත් නීති රීති මාලාවක් දීමට දෙවියන්වහන්සේට යම් විශේෂ පරමාර්ථයක් තිබිණි. නීති මාලාව දීමෙහි එක් පරමාර්ථයක් නම්, මනුෂ්‍යයා හට ඔහුගේ පාපිෂ්ඨ තත්වය පෙන්වා දීමය. තවත් පරමාර්ථයක් නම්, තමාගේම උත්සාහයෙන් මිනිසාට ධර්මිෂ්ඨ වීමට නොහැකි බව පෙන්වා දීමටය.

**කුමක් හෙයින්ද ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසිම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු නොලබන්නේය. මක්නිසාද ව්‍යවස්ථාව කරණකොටගෙන පාපය දැනගැනීම වේ. (රෝම 3:20)**

දෙවියන්වහන්සේ අපව මෙම බලාපොරොත්තු විරහිත තත්වයෙන් හැර ගියේ නැත. ව්‍යවස්ථාව තුළින් උන්වහන්සේ මෙසියස්වහන්සේව පොරොන්දු වූ සේක.

**මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹ සමාන අනාගතවක්තෘ කෙනෙකු ඔවුන්ට නැගුටුවා දී මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි. ඔහුට අණකරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේය. මාගේ නාමයෙන් ඔහු කථා කරන කල මාගේ වචන වලට ඇහුම්කන් නොදෙන කිසිවෙක් ඇද්ද මම ඔහුගෙන් පළිගන්නෙමි. (ද්විතිය කථාව 18:18-19)**

ප්‍රේරිත වූ පේතෘස් ක්‍රියා 3:22-26හි යේසුස්වහන්සේ හට මෙම වචනම භාවිතා කරමින් උපුටා දැක්වීය.

පැරණි ගිවිසුමට අනුව දෙවියන්වහන්සේ පාපය උදෙසා විවිධාකාර පූජාවන් අපේක්ෂා කළ සේක. එහෙත් යේසුස්වහන්සේ සියලු මනුෂ්‍යයන්ගේ පාප උදෙසා එතුමාගේ ජිවිතය පූජා කළ පසුව පැරණි ගිවිසුමේ පූජාවන් තවත් අවශ්‍ය නොවිය.

**මක්නිසාද ව්‍යවස්ථාව මතු පැමිණෙන යහපත් දේවල ජායා ... ඔවුන් අවුරුදු පතා නිතර ඔප්පු කරන ඒ පූජාවලින් ළඟා වෙන්නන් සම්පූර්ණ කරන්ට කිසිකලෙක නුපුළුවන ...
මක්නිසාද උන්වහන්සේ පිරිසිදු කරනු ලබන්නන් එක පූජාවකින් සැම කලටම සම්පූර්ණ කළ සේක. (හෙබ්‍රෙව් 10:1, 14)**

ව්‍යවස්ථාවෙහි පරමාර්ථය පහත සඳහන් වචන වලින් සාරාංශ කොට දැක්වේ.

**එසේ වී නුමුත් අදහන්නන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කළ ඇදහිල්ලෙන් වූ පොරොන්දුව දෙනු ලබන පිණිස ලියවිල්ල සියල්ලන්ම පාපය යට වසා තැබුවේය.
නුමුත් එළිදරව් වෙන්ට තිබුණු ඇදහිම පිණිස ඒ ඇදහිම පැමිණෙන්ට පළමුවෙන් අපි හිර අඩස්සි වී ව්‍යවස්ථාව යටතේ ආරක්ෂා කරනු ලැබුවෙමුව.
මෙසේ අපි ඇදහිල්ල කරණකොටගෙන ධර්මිෂ්ඨ කරනු ලබන පිණිස ව්‍යවස්ථාව අප ක්‍රිස්තුස්වහන්සේ ළඟට පමුණුවන අපේ ගුරුවරයෙක් වී තිබේ. (ගලාති 3:22-24)**

මනුෂ්‍යයා හට තම උත්සාහයෙන් ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේගේ ප්‍රමිතින් ඉෂ්ඨ කළ නොහැකි විය. ව්‍යවස්ථාව ගැළවුම්කරුවෙකුගේ අවශ්‍යතාවය පෙන්වා දුන් අතර මනුෂ්‍යයාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට යොමු කරවිය. ඔබ සම්පූර්ණත්වයට පත්වනුයේ ක්‍රිස්තුස්වහන්සේ තුළින් මිස ඔබගේම ස්ව-උත්සාහය නිසා නොවේ.

**මෙසේ ව්‍යවස්ථාව කරණකොටගෙන කිසිවෙක් සම්පූර්ණ නොවූ බැවින් පළමු තිබුණ ආඥාවේ දුර්වලකම හා නිෂ්ප්‍රයෝජන කම නිසා ඒක අවලංගු කිරීමද වඩා යහපත් බලාපොරොත්තුවක් (ක්‍රිස්තුස්වහන්සේ) පැමිණවීමද සිද්ධ වේ. (හෙබ්‍රෙව් 7:18-19)**

## සම්පූර්ණත්වයට පැමිණීමෙහි මට්ටම්

සම්පූර්ණත්වයට පැමිණීමෙහි මට්ටම් දෙකක් පවති.

### මූලික සම්පූර්ණ වීම :

1 කොරින්ති 1:2 හි පාවුල් ඇදහිලිවන්තයන් "ශුද්ධවතුන්" ලෙසට ආමන්ත්‍රණය කරයි. එනම්, "පවිත්‍ර කරනු ලැබුවන්" යන අරුත ඇතිවය. එහෙත් එම ලිපියෙහිදීම පාවුල් ඔවුන්ගේ පාප පිළිබඳව ඔවුන්ව නිවැරදි කිරීමකට ලක්කරයි. ඔව්හු ක්‍රිස්තුස්වහන්සේ තුළ පවිත්‍ර කරනු ලැබූ ඇදහිලිවතුන් වූහ. එනමුත් ඔවුන්ගෙන් සමහරු තමුන්ගේ එදිනෙදා හැසිරීමෙහිදී නියමාකාරයෙන් ජිවත් නොවූහ.

මෙම ඇදහිලිවන්තයෝ මූලික සම්පූර්ණත්වය ලබා සිටියහ. මළ ක්‍රියාවලින් මුදාගැනීමේ ක්‍රියාව තුළින් ඔව්හු තම පාපයට සමාව ලබා සිටියහ. එම පාපවලට සදහටම සමාව හිමිවිය (හෙබ්‍රෙව්

10:14). ඔව්හු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත් අවස්ථාවෙහි මූලික සම්පූර්ණත්වය හිමි කරගත්හ. එහෙත් මෙම කිතුනුවෝ සර්ව සම්පූර්ණත්වය කරා ගොස් නොමැත. ඔව්හු පාපයෙහි “පරණ මනුෂ්‍යයා” ඉවත ලෑම දිගටම පවත්වාගෙන ගොස් නොමැත.

> **මින්මතු අපි පායට සේවය නොකරන ලෙස පාප ශරීරය නැති වන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසන ලද බව දනිමුව. (රෝම 6:6)**

දෙවියන්වහන්සේ වෙතට හැරීම ලැබූ පසුව පාපයෙහි දිගටම ජීවත්වීම නුසුදුසු බව පාවුල් ඔවුන්ට ප්‍රකාශ කෙළේය.

> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම්, ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය. මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ අලුත් ජීවිතයක් ගතකළ යුතුය. තවදුරටත් පාපයෙහි හැසිරීම වැරදිය. පාවුල් ප්‍රකාශ කෙළේ:

> **තවද අපි දෙවියන්වහන්සේ සමග හවුල් වැඩකරන්නෝව නුඹලා උන්වහන්සේගේ අනුග්‍රහය නිෂ්ප්‍රයෝජනයේ නොලබන ලෙස ඉල්ලා සිටිමුව.**
> **මක්නිසා පිළිගත යුතුවූ කාලයකදී නුඹට ඇහුම්කන් දුනිමි. ගැළවීමේ දවසකදී නුඹට පිහිට වුණෙමියි ...**
> **බොහෝ ඉවසීමෙන්ද පීඩා වලින්ද හිඟකම් වලින්ද විපත්ති වලින්ද (රෝම 6:1, 2, 4)**

අප සම්පූර්ණත්වය කරා ළඟා විය යුතුය.

## ව¹ධනය වන්නාවූ සම්පූර්ණත්වය :

ගැළවීම ලබන මොහොතේ ඔබට හිමිවන මූලික සම්පූර්ණත්වය ශුද්ධකමේ ව¹ධනය වන්නාවූ සම්පූර්ණත්වයෙහි ආරම්භය වේ. ගැළවීමෙන් පසුව ඔබ ක්‍රිස්තුස්වහන්සේ තුළ අළුත් ජීවිතයක් ගෙවිය යුතුය.

> **මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි: එසේවී නුමුත් මම ජීවත් වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස්වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මමට ප්‍රේම කළාවූ ම උදෙසා තමන්ම පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි. (ගලාති 2:20)**

පාවුල් තමාගේම ජීවිතයෙහි ව¹ධනය වන්නාවූ සම්පූර්ණත්වය පිළිබඳ විස්තර කරයි.

> **මම දැනටම ලබාගෙන සිටිනවාවත් දැනටම සම්පූර්ණ වී සිටිනවාවත් නොවේ. නුමුත් යමක් පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ මා අල්ලාගත් සේක්ද, ඒක අල්ලා ගන්ට වීර්ය කරමින් මමත් දුවගෙන යමි. (පිලිප්පි 3:12)**

පාවුල් තවමත් සර්ව සම්පූර්ණත්වයට ළඟා වී නොතිබුණි. එය ඔහුගේ ඉලක්කය විය. වෙනත් පරිච්ඡේදයකදී සම්පූර්ණත්වය හිමි කරගැනීම සඳහා ඔහුගේ පොරබැදීම ඔහු විස්තර කරයි.

> **මක්නිසාද මම කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා තුළ තිබෙන කැමති දේ නොව මා ද්වේෂ කරන දේය. ඉඳින් මම අකමැති එක කරම් නම්, ව්‍යවස්ථාව යහපත් බව ඒත්තු ගනිමි.**
> **එහෙයින් එය කරන්නේ මා නොව, මා තුළ වාසය කරන පාපයය.**
> **මක්නිසාද මා තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. මක්නිසාද කැමැත්ත මට ඇත්තේය. නුමුත් යහපත් දෙය කිරීම මට නැත්තේය.**
> **මක්නිසාද මම කැමති යහපත නොකර අකමැති නපුර කරමි. ඉඳින් මම කැමති නැති දේ කරම් නම්, ඒක කරන්නේ මා නොව, මා තුළ වාසය කරන පාපයය.**
> **එබැවින් යහපත කරන්ට කැමති වූ මා හට නපුර තිබීම යන ව්‍යවස්ථාව ඇති බව මට පෙනේ.**

**මක්නිසාද අභ්‍යන්තර මනුෂ්‍යයාගේ ප්‍රකාරයට මම දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට ප්‍රිය වෙමි. නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධ කරන්නාවූ මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල් කමට පමුණුවන්නාවූ අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ. (රෝම 7:15-23)**

පාවුල් හට දෙවියන්වහන්සේගේ ප්‍රමිතීන්ට අනුව ජීවත් වීමට අවශ්‍ය විය. එහෙත් තමාගේ (මාංශයෙන්) තනිවම මෙම ඉලක්කයට ළඟාවිය නොහැකි බව ඔහු අවබෝධ කරගත්තේය. ඔහු තුළ ඔහුගේ මාංශයන් ආත්මයත් අතර නිරන්තර සටනක් පැවතිය.

ඔහුගේ ආත්මය දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව පැවැත්වීමට කැමති විය (22 පදය). ඔහුගේ මාංසය පාපයට ආශා විය. එබැවින් සම්පූර්ණත්වය ළඟා කරගත හැකි එකම ක්‍රමය නම් ක්‍රිස්තුස්වහන්සේ තුළින් බව ඔහු සොයාගත්තේය.

**ඉඳින් ක්‍රිස්තුස්වහන්සේ තුළ නුඹලා සිටිනසේක්නම්, පාපය නිසා ශරීරය මැරී තිබෙන නමුත් ධර්මිෂ්ඨකම නිසා ආත්මය ජීවත්වෙයි.**
**තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ, ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරනසේක් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනැන්වහන්සේ නුඹලා තුළෙහි වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත් කරන සේක.**
**... නමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා නසනවා නම් ජීවත්වෙනවා ඇත. (රෝම 8:10, 11, 13)**

ඔබගේ මාංශයෙහි දුෂ්ඨ ආශාවන් ජයගෙන දෙවියන්වහන්සේගේ ප්‍රමිතීන්ට අනුව ජීවත්විය හැක්කේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් තුළින් පමණකි. අප නොකළ යුතු දේ අපගේ මාංශය හේතුවෙන් සිදුකළහොත් නැවත සම්පූර්ණත්වයට හැරී ඒමට දෙවියන්වහන්සේ මාර්ගයක් සපයා දී ඇත.

**අපේ පාපවල් කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:9)**

ඔබ ඔබගේම ශක්තියෙන් මෙම අළුත් ජීවිතය ගත කිරීමට උත්සාහ කිරීමට අවශ්‍ය නොවේ. ඔබ "දෙවියන්වහන්සේගේ පුත්‍රයා තුළ ඇති ඇදහිල්ල" හේතුවෙන් ජීවත්වන්න. ඔබ අසමත් වූ සැමවිටම දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාපොච්චාරණය කොට, පව් සමාව ඉල්ලා සිටීමෙන් නැවතත් ඔබහට සම්පූර්ණත්වය කරා පැමිණිය හැකිය.

ඔබ නැවත උත්පාදනය ලැබූ කල ස්වභාවික ලොවෙහි අළුත උපන් බිළඳෙකු වැනිය. ඔබට ආත්මිකව ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත. ඔබ ඉගෙන ගන්නා අතරතුර අත් වැරදි සිදුවිය හැකිය. එවිට ඔබ ඔබගේ පාපය කියා සිට දෙවියන්වහන්සේගෙන් සමාව ඉල්ලූ විට එතුමා ඔබට සමාව දෙනු ඇත.

ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ ඔබගේ සතුරා වන සාතන් සමග පොරබදයි. මෙය ඔබගේ මනසෙහි ඔබ අවට ඇති වාතාවරණය අනුව හටගන්නාවූ සටනකි. සමහර අවස්ථාවකදී ඔබ සටනින් සතුරාට පැරදීමට හැකිය. එනමුත් ඉන් අදහස් වන්නේ සතුරා යුද්ධයෙන් ජයගත් බව නොවේ. ඔබ තාවකාලිකව පරාජයට පත්විය හැකිය. එහෙත් ඔබ ඔබගේ පාපය පාපොච්චාරණය කොට නැවතත් සම්පූර්ණත්වය කරා ළඟාවීමට නැගිට ධර්මිෂ්ඨ ලෙස ජීවිතය ගෙන යා හැකිය.

මීට පෙර පාඩමකදී ඔබ ඉගෙන ගත් පරිදි යේසුස්වහන්සේ දැනටමත් සාතන් විනිශ්චය කොට අවසානය. කල්වාරියේදී යේසුස්වහන්සේ සාතන්ව පරාජය කළ සේක. එබැවින් ඔබ තුළ ඇති දෙවියන්වහන්සේගේ බලය සතුරාගේ බලයට වඩා ශ්‍රේෂ්ඨය.

**... ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනැන්වහන්සේ උතුම් බැවින්, ... (1 යොහන් 4:4)**

ඔබ සම්පූර්ණත්වය කරා ගෙනයන්නේ මිනිස් ප්‍රයත්නයෙන් නොව, එතුමාගේ බලයෙහි ශක්තියෙනි. සම්පූර්ණත්වය කරා යන ගමන ස්වයං-සංවර්ධන වැඩ සටහනක් නොවේ. එය ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇදහිල්ල හේතුවෙන් අළුත් මිනිසෙකු ලෙස ජීවත්වීමට ඉගෙන ගැනීමකි.

## සම්පූර්ණත්ව ක්‍රියාදාමය

ඔබ ජීවිතයෙහි සම්පූර්ණත්ව ක්‍රියාදාමය ඉටුවීමට පහත සඳහන් කාරණා අවශ්‍ය වේ.

### යහපත් අත්තිවාරමක් :

ඔබ මෙම පාඩමාලාවෙහි ඉගෙන ගත් පරිදි, සම්පූර්ණත්වය කරා ළඟාවීමට නම් යහපත් ආත්මික අත්තිවාරමක් අවශ්‍ය වේ (හෙබ්‍රෙව් 6:1-3).

### දේව වචනයට ප්‍රතිචාර දැක්වීම :

දේව වචනයෙහි එක් පරමාර්ථයක් නම්, ඔබගේ වැරදි නිවැරදි කිරීමය. මෙමගින් සම්පූර්ණත්වය හිමි කර ගත හැකිය.

> **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

දේව වචනය නිකරුණේ අධ්‍යයනය කිරීම ඔබව සම්පූර්ණත්වය කරා යොමු නොකරනු ඇත. ඔබ දේව වචනයට පෞද්ගලිකව ප්‍රතිචාර දැක්විය යුතුය.

> **එහෙයින් සියලු කිලුටුකමද අධික දුෂ්ඨකමද පහකොට නුඹලාගේ ප්‍රාණ ගළවන්ට පුළුවන් වූ පිහිටුවන ලද වචනය මෘදුකමින් යුක්තව පිළිගනිල්ලා.**
> **නුමුත් නුඹලාම රවටා ගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙයල්ලා.**
> **මක්නිසාද යමෙක් වචනය අසන නුමුත් එය පිළිපදින්නේ නැත්නම් ඔහු කැඩපතකින් තමාගේ ස්වභාවික මුහුණ බලන මනුෂ්‍යයෙකුට සමානය.**
> **මක්නිසාද ඔහු තමාම බලාගනිමින් සිට අහක්ව ගිය කල, තමා කෙබඳු මනුෂ්‍යයෙක්ව සිටියේදැයි එවේලෙහිම මතක නැති කරයි.**
> **නමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගෙන මතක නැති කරන අසන්නෙක් නොවී, ක්‍රියා කරන කෙනෙක්ව, එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ ක්‍රියාකිරීමෙහිදී ආශිර්වාද ලබන්නේය. (යාකොබ් 1:21-25)**

ඔබ දේව ආඥාව දෙස බැලීම පමණක් නොසෑහේ. එහි රැඳී සිට, ඒ අනුව ජීවත් විය යුතුය. ඔබ දේව වචනය කෙරෙහි පෞද්ගලික ප්‍රයත්නයක් දරා සියළු ආකාර "දුෂ්ඨකමද කිලුටුකමද" ඉවත දැමිය යුතුය. දේව වචනයට අනුව ක්‍රියාකිරීම ඔබගේ ගැළවීම ස්ථිර කර දෙයි.

> **අප විසින් උන්වහන්සේගේ අසා තිබෙන්නාවූ නුඹලාට දන්වන්නාවූ පණිවිඩය නම්, දෙවියන්වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය.**
> **(1 යොහන් 2:5)**

### යාච්ඤාව :

යාච්ඤාවෙහි ප්‍රතිඵලයක් ලෙසට සම්පූර්ණත්වය හිමිවේ.

> **... නුඹලා දෙවියන්වහන්සේගේ මුළු කැමැත්තෙහි සම්පූර්ණව නිසැකව සිටින පිණිස ඔහු යාච්ඤා වලින් නුඹලා ගැන නිතරම වීර්ය කරන්නේය. (කොලොස්සි 4:12)**

### කැපවීම :

> **එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකි වූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ.**

**නුඹලා මේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම්, යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)**

ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේට කැපකිරීම මගින් ඔබ හට සර්ව සම්පූර්ණ දේව කැමැත්ත දැනගත හැකිය. කැපවීම යනු වෙන් කොට තැබීමය. ඔබ දෙවියන්වහන්සේට කැප වූ කල ලෝකයෙහි ප්‍රමිතීන්ට අනුකූලතාවය දැක්වීමට ප්‍රතික්ෂේප කරනු ඇත. ඒ වෙනුවට දේව වචනයෙහි ප්‍රමිතීන්ට අනුකූලවීමට ඔබ තෝරාගනු ඇත.

## ශුද්ධාත්මයාණන්ගේ දීමනා :

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා වල එක් පරමාර්ථයක් නම්, ඔබගේ ජීවිතයෙහි සම්පූර්ණත්ව ක්‍රියාදාමයට සහාය දැක්වීමය. මින් පෙර පරිච්ඡේදයකදී ඔබ ඉගෙන ගත් පරිදි දෙවියන්වහන්සේ සභාවට සේවා දීමනා සපයා දී ඇත්තේ:

**එසේ දුන්නේ ඇදහීමෙහිද දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතු කමටත් සම්පූර්ණ පුරුෂකමටත් ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙන තෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය. (එපීස 4:12-13)**

## ස්ථාපිත සේවාවන්ට යටත්වීම :

දෙවියන්වහන්සේ සම්පූර්ණත්ව ක්‍රියාදාමයෙහිදී ආත්මික නායකයන් යොදා ගන්නා සේක. දෙවියන්වහන්සේ සභාවෙහි නායකත්වය කෙරෙහි පත්කොට ඇති ආධිපත්‍ය බලය දරන අය හට ඔබ යටත් විය යුතුය. "ස්ථාපිත" සේවාවන්ට යටත්වීම යනු තමුන්ගේ සේවාවන් දේව වචනයට අනුකූලව ඉටුකර ඇති බවට ඔප්පු කොට පෙන්වා ඇති ආත්මික නායකත්වයට යටත්වීම යන්නය. ඇදහිලිවන්තයා සම්පූර්ණත්වය කරා ගෙනයාමේ ක්‍රියාදාමයෙහි ආත්මික නායකයාගේ ක්‍රියා කලාපය පාවුල්තුමා එළිදරව් කර දෙයි.

**නුඹලාගේ මුහුණ දකින පිණිසද නුඹලාගේ ඇදහිල්ලේ අඩුකම් සම්පූර්ණ කරන පිණිසද අපි රෑ දාවල් ඉතා අධික ලෙස යාච්ඤා කරමුව. (1 තෙසලෝනික 3:10)**

**අපි නම් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියලු මනුෂ්‍යයන් සම්පූර්ණ කොට ඔප්පු කරන පිණිස සියලු මනුෂ්‍යයන්ට දැනමුතුකම් දෙමින්ද සියලු ආකාර ප්‍රඥාවෙන් උගන්වමින්ද උන්වහන්සේ ප්‍රකාශ කරමුව. (කොලොස්සි 1:28)**

**නුඹලා දෙවියන්වහන්සේගේ මුළු කැමැත්තෙහි සම්පූර්ණවීම නිසැකව සිටින පිණිස ඔහු යාච්ඤා වලින් නුඹලා ගැන නිතරම වීර්ය කරන්නේය. (කොලොස්සි 4:12)**

**... තවද නුඹලාගේ සම්පූර්ණවීම සඳහා අපි යාච්ඤා කරමුව. (2 කොරින්ති 13:9)**

## දුක් විඳීම :

දුක් විඳීමට කවුරුවත් කැමති නැත. නමුත් ඇදහිලිවන්තයා හට දුක් විඳීමට සිදුවන කල එහි සුබදායී අරමුණක් ගැබ් වී තිබිය හැකිය. දුක් විඳීම සම්පූර්ණත්වය ගෙනදෙයි.

**එවිට ක්‍රිස්තුස්වහන්සේ තුළ තමන්ගේ සදාකාල තේජසට නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ දෙවියන්වහන්සේට නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු, නුඹලා සම්පූර්ණ කර, ස්ථිර කර, ශක්තිමත් කර පිහිටුවන සේක. (1 පේතෘස් 5:10)**

දුක් විඳින කාලය තුළ ඉවසිලිවන්තව සිටීම සම්පූර්ණත්වය ගෙන දෙයි.

**නුමුත් නුඹලා කිසිවකින් අඩුව නොසිට සියලු ආකාරයෙන්ම සම්පූර්ණව සිටින පිණිස ක්ෂාන්ති ගුණය සම්පූර්ණ ලෙස ක්‍රියා කෙරේවා. (යාකොබ් 1:4)**

## ස්වයං-පාලනය :

සම්පූර්ණත්ව ක්‍රියාදාමයෙහි කොටසක් නම් (ආත්ම දමනය) ස්වයං-පාලනය ඉගෙන ගැනීමය. අපට පවසා ඇත්තේ ...

> **මාංශයේද ආත්මයේද සියලු කිලුටුකම් වලින් අපම පවිත්‍ර කරගනිමින් දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව ශුද්ධකම සම්පූර්ණ කරගනිමු.** (2 කොරින්ති 7:1)

පාලනය කිරීමට ඉතාමත් අපහසු දෙයක් නම් දිවය. නමුත් දිව පාලනය කිරීමට ඉගෙනීමට ඔබගේ මුළු ජීවිතය පාලනය සඳහා රහසයි.

> **යමෙක් වචනයන් නොපැකිලේ නම්, ඔහු මුළු ශරීරය දමනය කරන්ට පුළුවන් සම්පූර්ණ මනුෂ්‍යයෙක්ය.** (යාකොබ් 3:2)

## ආත්මික නිවැරදි කරවීමට ප්‍රතිචාර දැක්වීම :

පරිණත ඇදහිලිවතුන්ගෙන් ලැබෙන්නාවූ නිවැරදි කිරීම් භාරගැනීමද සම්පූර්ණත්ව ක්‍රියාදාමයෙහි අංගයකි.

> **සහෝදරයෙනි, මනුෂ්‍යයෙක් යම් වරදකට අසු වුණත් ආත්මික වූ නුඹලා මෘදුකමේ ආත්මයෙන් යුක්තව එබඳු කෙනෙකු හරවා ගනිල්ලා. නුඹත් පරීක්ෂාවට නොපැමිණෙන පිණිස බලාගනින්න.** (ගලාති 6:1)

එවැනි නිවැරදි කිරීම් සඳහා සුදුසු ලෙස ඔබ ප්‍රතිචාර දැක්වීමෙන් සම්පූර්ණත්වය කරා ඔබව නැවත ගෙන යනු ඇත.

### සාරාංශය

ආත්මික පරිණතභාවය නම් දෙවියන්වහන්සේගේ ප්‍රියමනාප භාවය වැඩිපුර ලබාගැනීමක් නොවේ. එසේම එයින් ගැළවීමේ ක්‍රියාව අසම්පූර්ණ එකක් බව හෝ අදහස් නොකරයි. එමගින් ඔබ හට ස්වර්ගයට ඇතුළු වීමට ප්‍රවේශයක්ද ලබා නොදෙයි. මන්ද එය ඔබට ක්‍රිස්තුස්වහන්සේගේ මරණය තුළින් හිමි වී තිබීමය. ඔබ දෙවියන්වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ කරනු ලැබුවේ යේසුස්වහන්සේ කරණකොටගෙනය. ඔබ ගැළවීම ලැබුවේ උන්වහන්සේ තුළිනි. සවර්ගයට ඇතුළු වීමට පොරොන්දුව හිමි වුයේද උන්වහන්සේ තුළිනි.

සම්පූර්ණත්වය ප්‍රමිතින් සමූහයක් පවත්වා ගැනීමෙන් පමණක් අත්පත් කරගත නොහැකිය. සමහර විට කිසියම් පුද්ගලයෙකු හට බාහිරයෙන් ඔහු ආත්මික බව පෙනෙන ලෙස ප්‍රමිතීන් රැකගැනීමේ හැකියාව තිබේ. එහෙත් අභ්‍යන්තරයෙන් ආත්මික නොවිය හැකි හෝ ගැළවීම පවා ලබා නැති විය හැකිය.

ආත්මික පරිණතභාවය ඔබට කෙසේ හැඟේද යන කරුණ මත රඳා නොපවතී. එසේම වසර ගණනාවක් තිතුබැතියෙකු වී සිටීම නිසා හෝ ක්‍රිස්තියානි සේවයෙහි යෙදී සිටීම නිසා එය ඇති නොවේ. කිතුනු පරිණතභාවය ලැබෙන්නේ (සම්පූර්ණත්වය) ආත්මික දැනුම හා එම දැනුම අදාළ කරගැනීම වැඩි කරගැනීමෙනි. ආත්මික දැනුම වැඩි කරගත හැක්කේ දේව වචනය අධ්‍යයනය තුලිනි.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණත්වයට ක්‍රියාදාමය අවබෝධ කරගැනීමට සහ අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආඥා වටහාගැනීමට ඔබට හැකියාව ලැබේ. ඔබ ඉගෙන ගත් කාරණා පෞද්ගලිකව ජීවිතයට අදාළ කරගැනීම තුළින් හා දෙවියන්වහන්සේගෙන් ලැබෙන සහයෝගයෙහි බලය තුළින් ඔබ ආත්මික පරිණතභාවයට යොමු වනු ඇත.

**සම්පූර්ණත්වයට පැමිණීම**
(ආත්මික පරිණතභාවය)

දේව වචනය අධ්‍යයනය කිරීම

|

යොමු කරවනුයේ

|

ආත්මික දැනුම වැඩි කර ගැනීමට

|

දෙවියන්වහන්සේගේ බලයෙන් යුතුව අදාළ කරගත් විට

|

යොමු වනුයේ

|

ආත්මික පරිණතභාවයට (සම්පූර්ණත්වය)

## අවසාන කරමින් ...

අපි, අපගේ කිතුනු ඇදහිල්ලෙහි අත්තිවාරම් නම් පාඩම් මාලවෙහි අවසානයට ළඟ වී සිටිමු. එනමුත් සැබවින්ම ඔබ මෙම පාඩමාලාව සම්පූර්ණ කොට අවසන් නැත. පාවුල් පැවසූ ආකාරයට ඔබ දැන් ...

**... සම්පූර්ණත්වය කරා ළඟා විය යුතුය. (හෙබ්‍රෙව් 6:2)**

මෙම පාඩම් සෑම එකකම ආරම්භයෙහිදී එම පාඩමෙන් අපේක්ෂිත අරමුණු සඳහන් වී තිබුණි. එක් එක් පරිච්ජේදයක් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එළඹිය යුතු වූ ඉලක්ක එම අරමුණු විය. ඔබගේ ජීවිතයෙහි ඊළඟ පරිච්ජේදය සඳහා ඉලක්කය වනුයේ සම්පූර්ණත්වය වේ.

**... තවද නුඹලාගේ සම්පූර්ණ වීම සඳහා අප යාච්ඤා කරමුව. (2 කොරින්ති 13:9)**

## ස්වයං-පරීක්ෂණය

1. "සම්පූර්ණත්වය" අර්ථ දක්වන්න.

2. ඇදහිලිවන්තයා හට සම්පූර්ණත්වය උදෙසා සිටින ආදර්ශය කවුද?

3. මූලික සම්පූර්ණ කිරීම අර්ථ දක්වන්න.

4. වර්ධනය වන්නාවූ සම්පූර්ණත්වය යන්නෙහි තේරුම කුමක්ද?

5. සම්පූර්ණත්වයේ ක්‍රියාදාමයට ඇතුළත් සාධක 9 ක් නම් කරන්න.

6. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

7. පහත සඳහන් ප්‍රකාශන සත්‍යය නම් <u>ස</u> යන්නද අසත්‍යය නම් <u>අ</u> යන්නද ප්‍රකාශනය ඉදිරියෙන් ලියන්න.

   අ. ආත්මික පරිණතභාවය කෙනෙකු කිතුබැතියෙකු ලෙස ගෙවූ වසර ගණන මත රඳා පවතී ______________

   ආ. ව$^1$ධනය වන්නාවූ පවිත්‍ර කිරීම යන්නෙන් ගැළවීම අසම්පූර්ණ ක්‍රියාවක් සේ පෙන්නුම් නොකරයි ______________

   ඇ. බොහෝ කිතුනු ක්‍රියාකාරකම් ආත්මිකව පරිණත වීමට ඔබට උපකාරී වෙයි ______________

   ඇ. සම්පූර්ණත්වය පැමිණෙන්ගේ ආත්මික දැනුම වැඩිවීමෙන් හා එම දැනුම පෞද්ගලිකව අදාළ කරගැනීම තුළිනි _______________

8. ඇදහිලිවන්තයන් සඳහා සම්පූර්ණත්වයෙහි ප්‍රමිතිය කුමක්ද?

_______________________________________________________________________________

_______________________________________________________________________________

_______________________________________________________________________________

(මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදය අවසානයෙහි පිළිතුරු සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

සම්පූර්ණත්වය පිළිබඳ ඔබගේ අධ්‍යයනය පහත සඳහන් බයිබල් පද ආශ්‍රයෙන් තවදුරටත් ඉදිරියට ගෙන යන්න.

## නව ගිවිසුමෙන් උපුටාගත් පාඨ

### සම්පූර්ණ වන පිණිස දුන් ආඥා :

මතෙව් 5:48
යොහන් 17:23
1 කොරින්ති 1:10
2 කොරින්ති 7:1; 13:9, 11
කොලොස්සි 4:12
හෙබ්‍රෙව් 6:1; 13:21
යාකොබ් 1:4

### සම්පූර්ණත්වය වළක්වාලන කාරණා :

ලූක් 8:14
ගලාති 3:3
පිලිප්පි 3:15
හෙබ්‍රෙව් 7:11, 19; 9:9; 10:1

### සම්පූර්ණවීම සඳහා ඇති හේතු :

යොහන් 17:23
රෝම 12:2
කොලොස්සි 4:12
2 තිමෝති 3:16-17
යාකොබ් 1:4; 2:22; 3:2
1 යොහන් 2:5

### අප සම්පූර්ණ වන ක්‍රමය :

මතෙව් 19:21
ලූක් 6:40
2 කොරින්ති 7:1; 12:9
ගලාති 3:3
එපීස 4:12-13
පිලිප්පි 3:12, 15
කොලොස්සි 1:28; 3:14
2 තිමෝති 3:16-17
හෙබ්‍රෙව් 2:10; 7:11
යාකොබ් 1:4, 17, 25; 2:22; 3:2
1 පේතෘස් 5:10
1 යොහන් 2:5; 4:12; 4:17-18

## පරණ ගිවිසුමෙන් උපුටාගත් පාඨ

ආබ්‍රහම් දෙවියන්වහන්සේ ඉදිරියෙහි සම්පූර්ණව සිටිය යුතු විය : උත්පත්ති 17:1

යෙසායා දෙවියන්වහන්සේ ඉදිරියෙහි සම්පූර්ණ විය : යෙසායා 38:3

අප උදෙසා දෙවියන්වහන්සේගේ මාර්ගය සම්පූර්ණය : 2 සාමුවෙල් 22:31

1 සහ 2 රාජාවලිය පොත් කියවන්න. ඉශ්‍රායෙල් පාලනය කළාවූ දුෂ්ඨ රජවරු විස්තර කිරීමේදී "ඔහුගේ සිත සම්පූර්ණ නොවීය" යන වාක්‍යාංගය යොදා ඇති බව ඔබ දකීවි. ඔබ මෙම කතාන්දර කියවාගෙන යන අතර ඔවුන්ගේ හදවත සම්පූර්ණ නොවූයේ මන්ද කියාත් මෙලෙස සම්පූර්ණ නොවීමේ ප්‍රතිඵලය කුමක්ද කියාත් සලකා බලන්න.

## ගීතාවලියෙහි සම්පූර්ණත්වය පිළිබඳ සඳහන් දේ

සම්පූර්ණත්වය පිළිබඳ දාවිත් පැවසූ දේ අධ්‍යයනය කරන්න.

දෙවියන්වහන්සේගේ මාර්ගය සම්පූර්ණය : ගීතාවලිය 18:30, 32
දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණය : ගීතාවලිය 19:7
සම්පූර්ණ මිනිසාගේ අවසානය සාමයයි : ගීතාවලිය 37:37
අපි දෙවියන්වහන්සේ ඉදිරියෙහි සම්පූර්ණ ලෙස හැසිරිය යුතු වෙමු : ගීතාවලිය 101:2, 6

# උප ග්‍රන්ථය

*"ඇදහිල්ලෙහි අත්තිවාරම්"* නව ඇදහිලිවතුන් හට ඉතා වැදගත් අධ්‍යයනයකි. එමගින් ආත්මික පරිණතභාවය සඳහා නියමිත අත්තිවාරම දැමීමට අවශ්‍ය යේසුස්වහන්සේගෙ මූලික ඉගැන්වීම් සපයා දෙයි (හෙබ්‍රෙව් 6:1-3).

නව ඇදහිලිවතුන් ස්වභාවික ලෝකයෙහි අළුත උපන් බිළිඳුන් මෙන්ය. අපි අළුත උපන් බිළිඳෙකු රැගෙන, දොර ළඟට ගෙනගොස්, "අපි සති දෙක තුනකින් ඔයාව හොයලා බලන්නම්කෝ" කියන්නේ නැත. එනමුත් සභාවෙහි සාමාන්‍යයෙන් සිදුවන්නේ මෙයයි. බොහෝ අළුත උපන් කිතු බැතියෝ ආත්මිකව මියැදෙන්නේද මේ නිසාය. මනුෂ්‍යයන්ගේ ප්‍රාණ උදෙසා ඔබට ඇති වගකීම ඔවුන්ව අල්තාරය වෙතට ගෙනගොස් පසුතැවිලිවීමේ යාච්ඥාව ඔවුන් කල පසුව අවසන් නොවේ. අළුත් කිතුබැතියාව අල්තාරයේ සිට සභාව වෙතට රැගෙන යාම ඔබගේ වගකීම වේ.

අළුත් ඇදහිලිවන්තයෙක් නුහුරු පරිසරයකට ප්‍රවේශ වී සිටී. ඔහු දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි නැවත උත්පාදනය ලබා සිටී (යොහන් 3:3-7). අප කතා කරන භාෂාව ඔහු මෙතෙක් කිසි දිනක අසා පුරුදු භාෂාවක් නොවේ. අපගේ වචන මාලාවේ ඇදහිල්ල, පසුතැවිලිවීම, බව්තිස්මය, විනිශ්චය යනාදී අළුත් වචන තිබේ. අපි ඒවා ඔවුන්ට පැහැදිලි කර දිය යුතුය. ඔහු අළුත් රාජ්‍යයෙහි භාෂාව පමණක් ඉගෙන ගැනීම නොසෑහේ. එම රාජ්‍යයෙහි ජීවත් වීමෙහි මූලික ප්‍රතිපත්තිද ඉගෙන ගත යුතුය.

සෑම අළුත් කිතුබැතියෙකු හටම පරිණත කිතුනුවෙකුගේ පෞද්ගලික රැකවරණය, පෝෂණය අවශ්‍ය වේ. ස්වභාවික ලෝකයෙහි අළුත උපන් බිළිඳෙකු සුරකින අයුරින් ඔහුව සුරැකීමට කෙනෙකු අවශ්‍ය වේ. බිළිඳෙකු උපන් මොහොතේ අන් කවර අවස්ථාවකටත් වඩා දැඩි රැකවරණයක් අවශ්‍ය වේ. එම නිසා අළුත උපන් ඇදහිලිවතුන් හට නියමිත රැකවරණය, පෝෂණය සැපයීමට පහත සඳහන් උපදෙස් මාලාව පිළිපදින්න.

## පළමු පියවර :

කෙනෙකු ශුභාරංචි පණිවිඩයට ප්‍රතිචාර දක්වා, පසුතැවිලි වී යේසුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගෙන පැය 24 ඇතුළත පරිණත කිතුනුවෙකු ඔහු සමග පෞද්ගලිකව සම්බන්ධතාවයක් ඇති කරගත යුතුය.

නව ඇදහිලිවන්තයා සමහරවිට ජීවත්වන පරිසරය එතරම් සුබවාදී නොවන, දිවුරන, ශාප කරන අශීලාචාර කතාබහ කෙරෙන, පාපිෂ්ඨ ක්‍රියාවල යෙදෙන පරිසරයක් විය හැකිය. පරිණත කිතුනුවෙකු ඔහු හමුවීම මගින් ඔහුට දිරිගැන්වීමක් ලැබෙන අතර ඔහු ගැන යමෙකු සලකන බවත් තමා උදෙසා කෙනෙකු යාච්ඥා කරන බවත් ඔහු දැනගනී. මෙසේ පළමුවරට ඔහු හමුවීමේ අරමුණ වනුයේ:

- ඔහු ගැන සලකන කිතුණු මිත්‍රයෙක් ඔහුට සිටින බව ඔහුට දැනගැනීමට සැලැස්වීම.
- ඔහුට තිබිය හැකි ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට.
- ඔහුට තිබිය හැකි පෞද්ගලික අවශ්‍යතා පිළිබඳව යාච්ඥා කිරීමට.
- ඔහුව දෙවෙනි පියවරෙහි විස්තර කර ඇති "ඇදහිල්ලේ අත්තිවාරම් " පාඩමාලාවට ඇතුළත් කරගැනීම සඳහා.

## දෙවන පියවර :

අප මෙම පාඩමාලාවෙහිදී අවධාරණය කරදුන් පරිදි යේසුස්වහන්සේ හා මුල් කාලීන සභාව නවක ඇදහිලිවන්තයා හට දිගටම ඉගැන්වීම රටාවක් කරගෙන තිබුණි. නවක ඇදහිලිවන්තයා හට යේසුස්වහන්සේගේ ඉගැන්වීමෙහි මුල් අත්තිවාරම් ඉගැන්වීමට මෙම "ඇදහිල්ලේ අත්තිවාරම් " පාඩමාලාව උපයෝගී කරගත හැකිය. මෙය කළ හැකි ක්‍රම දෙකකි.

පළමු ක්‍රමය: අළුත් ඇදහිලිවතුන් සඳහා "ඇදහිල්ලේ අත්තිවාරම් " පන්තියක් සාදන්න. මෙයට පරිණත කිතුනුවෙකු ඉගැන්විය යුතුය. සභාවෙහි වරින් වර නැවත නැවතත් මෙම පාඩම් ඉගැන්විය යුතුය.

සෑම අළුත් ඇදහිලිවන්තයෙකුම මෙම පන්තියට ඇතුළත් කළ යුතුය. ඔහුට එක පාඩමක් අතපසු වුවහොත් ගුරුවරයා පෞද්ගලිකව ඔහු හමුවී එම පාඩම ඔහු සමග ඉගැන්වීමට අවස්ථාවක් සකසා ගත යුතුය.

මෙම ක්‍රමයෙහි ඇති ප්‍රයෝජනය නම්, අළුත් කිතුනුවා අනෙකුත් අළුත් කිතුනුවන් සමග එකට ඉගෙන ගැනීමය. ඔව්හු එක හා සමාන ආත්මික මට්ටමකින් යුත් එක හා සමාන අවශ්‍යතා හා ප්‍රශ්න ඇති කණ්ඩායමක් සමග ඉගෙනීමට අවස්ථාව ලබති.

නැතහොත් ...

දෙවන ක්‍රමය: සෑම අළුත් ඇදහිලිවන්තයෙකු සඳහාම එක් පරිණත කිතුනුවෙකු යොදවන්න. මෙසේ සතියකට වතාවක් පරිණත කිතුනුවා අළුත් ඇදහිලිවන්තයා හා සමග “ඇදහිල්ලේ අත්තිවාරම් ” පාඩම් මාලාව අධ්‍යයනය සඳහා එකමුතු වනු ඇත.

මෙම ක්‍රමයෙහි ඇති වාසිය නම්, අළුත් ඇදහිලිවන්තයා හට ඔහුගේම වේගයෙන් වර්ධනය වීමට ඉඩ සැපයීමය. ඔහු තමාට හැකි වේගයෙන් හෝ සීඝ්‍රතාවයෙන් පාඩම් අවසන් කළ හැකිය. අළුත් ඇදහිලිවන්තයා හා පරිණත කිතුනුවා අතර වඩා හොඳ සම්බන්ධතාවයක් පිහිටුවාගැනීමටත් ප්‍රශ්න වලට පිළිතුරු ලබාගැනීමටත් වැඩි ඉඩකමක් සැපයෙයි. ඔහුට ආත්මික ප්‍රශ්න, ගැටළු, අවශ්‍යතා හා උපදේශනය සඳහා තම ගුරුතුමා වෙතට යොමුවිය හැකිය.

තනි තනිව මෙලෙස ඉගැන්වීමේදී පිරිමි - පිරිමින්ට ඉගැන්වීමද කාන්තාවන් - කාන්තාවන්ට ඉගැන්වීමද කළ යුතුය. උගන්වන්නාවූ සෑම ගුරුවරයෙකුම “ඇදහිල්ලේ අත්තිවාරම් ” පාඩමාලාව පළමුව ඉගෙන ගෙන අවසන් කර තිබිය යුතුය. අළුත් ඇදහිලිවතුන්ව සුරැකීම සඳහා වගකීම දැරීමට කැපවී සිටිය යුතුය.

## තුන්වන පියවර :

අළුත් ඇදහිලිවන්තයාව දිනපතා යාච්ඤාවට හා බයිබල් අධ්‍යයනයට යොමු කරවන්න. ඔහු යාච්ඤා කිරීමට හා බයිබල් අධ්‍යයනය කිරීමට දන්නවා යැයි ඔබ සිතන්න එපා. මේ කරුණ සඳහා මූලික උපදෙස් සපයා දෙන්න. හාවස්ට්ටයිම් ජාත්‍යයන්තරයේ “නිර්මාණශීලි බයිබල් අධ්‍යයන ක්‍රම” නම් පාඩමාලාවක් දියත් කොට ඇත. නම් පාඩමාලාවක්ද ඇත.

## හතරවන පියවර :

අළුත් ඇදහිලිවන්තයෝ ආත්මිකව සූදානම් වූ විට වතුර බව්තිස්මය හා ශුද්ධාත්ම බව්තිස්මය අත්දැකීමට මගපෙන්විය යුතුය. සමහරු මේ දෙකම එකම දින අත්දැකිය හැකිය. සමහරු ඔවුන්ගේ හැරීමේ සිට සතියකින් හෝ මාසයකින් අත්දැකිය හැකිය. තවත් සමහරුන්ට මේ අත්දැකීම සඳහා සූදානම් වීමට වැඩිපුර කාලයක් අවශ්‍ය විය හැකිය. ඔබ කණ්ඩායමක් ලෙසට අළුත් ඇදහිලිවතුන්ට උගන්වනවා නම්, මුළු කණ්ඩායම සූදානම් වන තුරු සූදානම් වී සිටින කෙනෙකු වළක්වාගෙන සිටින්නට එපා. එක් එක්කෙනා ආත්මිකව හැකි අයුරින් වර්ධනය වීමට ඉඩ සලසන්න.

## පස්වන පියවර :

අළුත් ඇදහිලිවන්තයා හට ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි එනම්, සභාවෙහි තමාට හිමි තැන සොයා ගැනීමට උපකාර කරන්න. ඔහුට තමාගේ ආත්මික දීමනා සොයා ගැනීමට මගපෙන්වන්න. හාවස්ට්ටයිම් ජාත්‍යයන්තරයේ “ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය” නම් පොත ඔබට මේ සඳහා උපකාරී වේ. ඔහුට අනෙක=ත් ඇදහිලිවතුන් සමග ශුභාරංචි පණිවිඩය අන්‍යයන් වෙත රැගෙන යාමට අභියෝග කරන්න. “ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම” නම් පාඩමාලාව මේ සඳහා භාවිතා කළ හැකිය. මෙම අභියෝගය ඉදිරිපත් කිරීමට “ලෝකය උදෙසා බයිබලිය දැක්මක් වර්ධනය කරගැනීම” නම් පාඩමාලාව උපයෝගි කරගත හැකිය.

**මතක තබාගන්න : ඔබගේ ඉලක්කය නම්, අළුත් ඇදහිලිවන්තයාව ක්‍රියාකාරී, ඵල දරන සාමාජිකයෙකු ලෙස සභාවට අනුයුක්ත කිරීමය. ඔහු ආත්මික (පරිණතභාවයට) සම්පූර්ණත්වයට ළඟා විය හැකි කෙනෙකු කිරීමය.**

# ස්වයං-පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය :

1. ඒ නිසා මළ ක්‍රියාවල් ගැන පසුතැවිලි වීමද, දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීමද, බව්තිස්ම කිරීම් ගැනත් අත්තැබීම ගැනත් මළවුන්ගේ නැගිටීම ගැනත් සදාකාල විනිශ්චය ගැනත් ඉගැන්වීමද, නැමැති අත්තිවාරමක් නැවත නොතබා ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර සම්පූර්ණ වීමට පැමිණෙමු. දෙවියන්වහන්සේ ඉඩදෙන සේක් නම්, අපි එසේ කරන්නෙමුව. (හෙබ්‍රෙව් 6:1-3)

2. - මළ ක්‍රියාවලින් පසුතැවිලි වීම
   - දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල
   - බව්තිස්මය
   - අත් තැබීම
   - මළවුන්ගෙන් උත්ථානය
   - සදාකාලික විනිශ්චය

3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම මත පදනම් වූ නිසියාකාර ආත්මික අත්තිවාරමක්.

4. ලූක් 6:47 බලන්න.

   1. මා ළඟට ඇවිත් ...
   2. මාගේ වචන අසා ...
   3. ඒවා පවත්වන අය ...

5. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

## දෙවන පරිච්ඡේදය :

1. මක්නිසාද සියල්ලෝම පව්කොට දේව මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)

2. මළ ක්‍රියාවලින් පසුතැවිලිවීම නම්, අභ්‍යන්තරයෙන් මනසෙහි සිදුවන්නාවූ වෙනසක ප්‍රතිඵලයක් ලෙස බාහිරයෙන් පාපයෙන් හැරීම හා දෙවියන්වහන්සේත් ධර්මිෂ්ඨකමත් වෙතට හැරීම සිදුවීමකි.

3. - පාපය - නපුර
   - දුෂ්ඨකම - අපරාධය
   - අධර්මිෂ්ඨභාවය - අදේවභක්තික
   - අපරාධය - අකීකරුකම
   - අනවසරයෙන් ඇතුළුවීම

4. සියල්ලෝම පව්කරුවෝ වෙති. (රෝම 5:12)

5. ලුසිෆර් (සාතන්) ස්වර්ගයෙහි දෙවියන්වහන්සේට එරෙහිව කැරලි ගැසීම තුළින් පාපය ආරම්භ කෙළේය. සාතන්ව ස්වර්ගයෙන් නෙරපා පොළොවට හෙළනු ලැබීය. ඔහු පොළොවෙහි මුල් පුරුෂයා හා ස්ත්‍රියව පාපයට පෙළඹවීය. මේ හේතුවෙන් පාපය හා පාපයෙහි දඬුවම සියලුම මනුෂ්‍යයන් වෙත පවරන ලදි.

6. යූදස් (මතෙව් 27:3-4) සහ ඒසව් (හෙබ්‍රෙව් 12:17)

## තුන්වන පරිච්ඡේදය :

1. - දෙවියන්වහන්සේ අණකර තිබේ.
   - ආත්මික මරණය වැළැක්වීම සඳහා එය අවශ්‍ය වේ.
   - සදාකාල ජීවනය සඳහා එය අවශ්‍ය වේ.
   - පව්සමාව සඳහා එය අවශ්‍ය වේ.
   - දේවරාජ්‍යයට ඇතුළු වීම සඳහා එය අවශ්‍ය වේ.
   - එය සියලු දෙනා උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්තය.
   - යේසුස්වහන්සේ මෙලොව පැමිණීමට හේතුව එයයි.

2. - දෙවියන්වහන්සේගේ යහපත්කම
   - දේශනාකිරීම
   - ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීම
   - පිය වූ දෙවියන්වහන්සේ
   - තරවටුව
   - දේවභක්තික ශෝකය

3. දෙවියන්වහන්සේ වෙතට හැරීම යනු වැරදි දෙයින් ඉවතට හැරී හරි දෙය දෙසට යොමුවීමය.

4. අකිකරු පුත්‍රයා පියවූ දෙවියන්වහන්සේගෙන් හා ස්වර්ගය වූ තම නිවසින් බැහැරව ගිය පාපිෂ්ඨ මිනිසා වැනිය. මෙම යෞවනයා තමා සිටින පාපිෂ්ඨ තත්වය වටහාගත් කල, තමාගේ පියාගේ නිවසට හැරී යාමටත් තමාගේ පාපයට සමාව ඉල්ලීමටත් තීරණය කළේය. මෙය පසුතැවිල්ලයි. යෞවනයා තමාගේ පරණ ජීවිතය අත්හැර අළුත් ජීවිතයක් ආරම්භ කරන තුරු තම පියාගේ නිවසට හැරී ගියේය. මෙය හැරීම ලැබීමයි.

5. පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් පසුතැවිලිවීමට කැඳවන්ට මම නාවෙමි. (ලූක් 5:32)

6. ඇදහිල්ල, බව්තීස්මය, ක්‍රියා (ඵල), දෙවියන්වහන්සේ වෙතට හැරීම

7. ඔව්

8. පරිච්ඡේදයෙහි අනුමාතෘකා බලන්න. මේ සියල්ල කිතුනුවන් පසුතැවිලිවීමට අවශ්‍ය බව පෙන්වා දෙයි.

9. ධර්මිෂ්ඨකරනු ලැබීම නම් දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිවැරදි ස්ථානගත කිරීමකි. නිවැරදි සම්බන්ධතාවයක් දැරීමකි. මෙය කළහැක්කේ මළ ක්‍රියාවලින් පසුතැවිලි වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ සපයා දී ඇති ගැළවීමේ සැලසුම පිළිගැනීමෙනි.

10. පසුතැවිලි වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පාපයෙහි හා එහි වන්දියෙහි ජීවිතයකින් ගැළවීමට ලැබීම.

## හතරවන පරිච්ඡේදය :

1. ඇදහිල්ල නම් යමක් විශ්වාස කොට, යම් දෙයක් කෙරෙහි නිසැක කමක් ඇතිව සිටීමය. ඇදහිල්ල නම්, අනාගතයෙහි පොරොන්දු වී ඇති දෑ සත්‍ය බවත් නොපෙනෙන දේවල් සැබෑ බව නිසැක ලෙස පිළිගැනීමය (හෙබ්‍රෙව් 11:1).

2. ස්වාභාවික ඇදහිල්ල : ස්ථායී ලෙසට ඔප්පු වී ඇති දේවල් කෙරෙහි ස්වභාවික විශ්වාසය
   මුදනු ලැබීම් ඇදහිල්ල : දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල සත්‍ය පසුතැවිලිවීම හා මුසු වීම.
   පවිත්‍ර කරන්නාවූ ඇදහිල්ල :දෙවියන්වහන්සේ වෙතට හැරීම ලැබීමෙන් පසුව ඔබට ශුද්ධ ජීවිතයක් ගෙවීමට උපකාරී වේ.
   ආරක්ෂක ඇදහිල්ල : සාතන්ට එරෙහිව ආරක්ෂා වීමට ආත්මික ආයුධයකි.

3. ගැළවීම සඳහා මෙය අවශ්‍ය වේ. එයින් තොරව දෙවියන්වහන්සේ ප්‍රසන්න කළ නොහැකිය.

4. දේව වචනය ඇසීමෙනි. රෝම 10:17

5. නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය. (හෙබ්‍රෙව් 11:6)

6. - ඔහුට වචනය ඇසිණි.
- ඔහු වචනය විශ්වාස කළේය.
- ඔහුගේ බලාපොරොත්තු රහිත තත්වයෙන් හැරුණි.
- ඔහු දෙවියන්වහන්සේගේ පොරොන්දුව සැබෑ ලෙස පිළිගත්තේය.

7. ඇදහිල්ල නම් ඔබට තවම පෙනෙන්නට නැති දෙයක් දෑනටම හිමි වී ඇති බවට නිසැක කමින් විශ්වාස කිරීමෙහි ආකල්පයකි. බලාපොරොත්තුව නම් අනාගතයෙහි ලැබීමට තිබෙන දෙයක් පිළිබඳ ආශාවක් හෝ අපේක්ෂාවේ ආකල්පයකි.

8. "හේතු ඵල වාදයෙන්" උගන්වන්නේ මනුෂ්‍යයා හට තම මනස, තර්කය හා අධිෂ්ඨානය ප්‍රයෝජනයට ගෙන සියලු ගැටළු වලින් ජයගත හැකි බවය. මෙම ඉගැන්වීම් මනුෂ්‍යයා කේන්ද්‍රය කොටගෙන දෙවියන්වහන්සේ මත නොව මිනිසා මත රැඳෙන ආකාරයෙන් ගොඩ නැගී ඇත. එහෙත් ඇදහිල්ල දෙවියන්වහන්සේ කේන්ද්‍ර කරගෙන මිස මිනිසා කේන්ද්‍රකොටගෙන නොවේ. එය දෙවියන්වහන්සේගේ දීමනාවක් මිස ස්වයං උත්සාහයෙන් නිපදවන්නක් නොවේ.

9. ඇදහිල්ල නම් ඔබ විශ්වාස කරන දේය. ක්‍රියා නම් ඔබ කරන දේය.

10. "දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල" නම් දෙවියන්වහන්සේ කෙරෙහි ඔබගේ ආකල්පයයි. එය ඇදහිල්ලේ මිස කැරළිකාරකමේ හෝ බයේ දෙයක් නොවේ.

## පස්වන පරිච්ඡේදය :

1. මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තීස්ම කරමි. නමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය. මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද නුඹලා බව්තීස්ම කරන සේක. (මතෙව් 3:11)

2. බයිබලයෙහි භාවිතා කොට ඇති "බව්තීස්මය" යන පදයෙහි අර්ථය නම් යමක සම්පූර්ණයෙන්ම ගිල්වීම හෝ එබීමය.

3. එය අභ්‍යන්තරයෙහි සිදු වූ වෙනස බාහිරයෙන් ප්‍රකාශ කර දැක්වීමකි.

4. - උපදෙස් දීම
- පසුතැවිලිවීම
- විශ්වාසය
- දෙවියන්වහන්සේ කෙරෙහි යහපත් හෘද සාක්ෂිය

5. - ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විඳීමේ බව්තීස්මය
- යොහන්ගේ බව්තීස්මය
- ක්‍රිස්තියානි බව්තීස්මය
- ශුද්ධාත්මයාණන් තුළ බව්තීස්මය

6. ඔව්හු උපදෙස් ලබා ඇදහිල්ල ප්‍රකාශ කළ සැනින්.

7. ක්‍රියා 19:1-5

8. නැත.

9. බව්තීස්මය යන්නෙහි අර්ථය තේරුම්ගැනීමට හා අවශ්‍යතා සපුරාලීමට හැකි වයස මත තීරණය වේ.

10. අ. අසත්‍යය. ආ. සත්‍යය ඇ. සත්‍යය

## හයවන පරිච්ඡේදය :

1. ඔබගේ ලැයිස්තුව හයවන පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති කරුණු හා සසඳා බලන්න.

2. - පසුතැවිලිව බව්තීස්මය ලබන්න - එය ඔබ උදෙසා විශ්වාස කරන්න
   - ආශා වන්න - එය දීමනාවක් ලෙස පිළිගන්න
   - අනෙක් ඇදහිලිවතුන්ගේ යාච්ඤාව ඉල්ලා සිටින්න - දෙවියන්වහන්සේට අවනත වන්න

3. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යොරුසලමෙහි ද මුළු යුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)

4. කතාකරන පුද්ගලයා නොදන්නා භාෂාවකින් කතාකිරීම.

5. කිතුනුවා ශුභාරංචියෙහි ප්‍රබල සාක්ෂිකරුවෙකු කිරීමට (ක්‍රියා 1:8).

6. ශුද්ධාත්ම ඵල, ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ගුණාංග දැකීමට ලැබීම ගැන පවසයි.

7. ගලාති 5:22-23

   - ප්‍රේමය
   - ප්‍රීතිය
   - සමාදානය
   - ඉවසිලිවන්තකම
   - කරුණාවන්තකම
   - මෘදුකම
   - යහපත්කම
   - ඇදහිල්ල
   - පමණදැන ක්‍රියාකිරීම

8. - ශුද්ධවන්තයින්ගේ සම්පූර්ණ කිරීම සඳහා
   - සේවයෙහි ක්‍රියාව ව්‍යාප්ත කිරීම සඳහා
   - ක්‍රිස්තුස්වහන්සේව උසස් කිරීමට සභාව දිරිගැන්වීමට.

9. ස්වාමින්වහන්සේ සභාවෙහි සමහර පරමාර්ථ ඉටුකිරීම සඳහා සේවා දීමනා දුන්සේක. එම පරමාර්ථ තවම ඉටු වී නොමැත. එබැවින් උන්වහන්සේ එම දීමනා දීමට හේතු වූ පරමාර්ථ ඉටුවන තුරු එම දීමනා කිසිවක් නැවත ඉවත් කරන්නේ නැත.

10. - සෑම කිතුනුවෙකුට හැරීම ලැබීමේදී ශුද්ධාත්මයාණන්වහන්සේ ලැබේ.
    - සියලුම දෙනා අන්‍ය භාෂාවකින් කථා නොකළ බව බයිබලය පවසයි.
    - හය
    - එය හැඟීම්බර අත්දැකීමකි.

11. නැත.

## හත්වන පරිච්ඡේදය :

1. - එප්‍රායිම් සහ මනස්සේ පිට ඉශ්‍රායෙල්
   - ලෙවිවරු පිට ඉශ්‍රායෙල් ජනතාව
   - මෝසෙස් ජෝෂුවාව පිහිටුවමින් - අණ දෙමින්

2. - අධිස්වභාවික සලකුණු
   - ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය
   - ආත්මික දීමනා මුදා හැරීම
   - ක්‍රිස්තියානි සේවයට අණ ලැබීම
   - ළදරු කැපකිරීම

3. එහෙයින් ඔවුහු ස්වාමීන්වහන්සේ තුළ නිර්භීතලෙස කථා කරමින් බොහෝ කලක් නැවති සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් හාස්කම්ද පුදුමද කරවමින් ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දරු සේක. (ක්‍රියා 14:3)

4. මාර්ක් 16:17-18

5. අත්තැබීම නම් ක්‍රියාවෙහිදී එක් පුද්ගලයෙකු නියත ආත්මික පරමාර්ථයකින් යුක්තව අනෙක් පුද්ගලයාගේ සිරුර මත තම දෑත් හෙළයි. සාමාන්‍යයෙන් මෙය හා සමග යාච්ඤාවක් හා අනාගත වාක්‍යයක් සම්බන්ධ වේ.

6. - ඇදහිලිවන්තයෝ
   - ප්‍රේරිතවරු හා ගෝලයේ
   - වැඩිමහල්ලෝ

7. අ. අසත්‍යය  ආ. සත්‍යය  ඇ. අසත්‍යය.  ඈ. අසත්‍යය  ඉ. සත්‍යය  ඊ. අසත්‍යය

## අටවන පරිච්ඡේදය :

1. යේසුස්වහන්සේ: නැවත නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත් වන්නේය. ජීවත්ව සිටින කවුරු නුමුත් මා කෙරෙහි අදහන්නේද ඔහු කිසි කලෙකත් නොනසින්නේය. (යොහන් 11:25-26)

2. උත්ථානය නා් එසවීමක් හෝ නැගුටුවීමකි. එනම්, මළවුන්ගෙන් නැගිටීමට හෝ නැගුටුවීමට සැලැසීමය.

3. අතීත කාල: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීම

   වර්තමාන කාල: යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින ඇදහිලිවන්තයෝ ආත්මික නැවත නැගිටීම

   අනාගත කාල: සොහොන් ගෙවල්වල සිටින සියලු දෙනාගේ අනාගත නැවත නැගිටීම

4. - ක්‍රියා 2:30-31
   - මතෙව් 28:1, 5-7
   - 1 කොරින්ති 15:5-8
   - යොහන් 20:19

5. ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන නොවූ සේක් නම්, අපගේ දේශනා කිරීමද ඇදහිල්ලද නිරර්ථකය (1 කොරින්ති 15:13-14). සත්‍ය ඇදහිලිවන්තයෙකු වීම සඳහා මළවුන්ගේ උත්ථානය විශ්වාස කළ යුතු වේ (රෝම 10:9; 1 කොරින්ති 15:1-4). උත්ථානවීම යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව සනාථ කරයි (රෝම 1:4). මවන ලද සියලු ජීවින්ට ඉහළින් සිටින බවද ස්ථිර කරයි (එපීස 1:20-23). එසේම ඇදහිලිවතුන් ධර්මිෂ්ඨ කරනු ලැබූ බවද (රෝම 4:25) මරණය පරාජය වූ බවද (හෙබ්‍රෙව් 2:14) සනාථ කරයි.

උන්වහන්සේ නැවත නැගිට් බැවින් අපද යම් දිනක නැවත නැගිටින බවත් අළුත් සිරුරු හිමි වන බවත් දනිමු (1 කොරින්ති 15:51-52; පිලිප්පි 3:21).

6. මෙහි තේරුම් නම් වරක් ආත්මිකව පාපය නිසා මැරී සිටි අය දැන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ආත්මිකව ජීවනයට පත් වී සිටින බවය (එපීස 2:1, 5).

7. - පාපයට මිය යාම එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජිවිතය
   - අළුත් ස්වාමියෙක්
   - ජීවිතයට අළුත් පරමාර්ථයක්

8. වතුර තුළ ක්‍රිස්තියානි බව්තීස්මය හා ඇදහිලිවන්තයාගේ අළුත් ජීවිතය.

## නවවන පරිච්ඡේදය :

1. මක්නිසාද ස්වාමින්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නාසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවු අය පළමුකොට නැගිටින්නෝය. එවිට ජිවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව. (1 තෙසලෝනික 4:16-17)

2. ධර්මිෂ්ඨයන්ගේ උත්ථානය සහ අධර්මිෂ්ඨයන්ගේ උත්ථානය

3. මළවුන්ගෙන් උත්ථාන කිරීම සියල්ලෝම අත්දකිනු ඇත. සියල්ලෝම සදාකාලික විනිශ්වය අත්දකිනු ඇත.

4. අ. සත්‍යය  ආ. සත්‍යය  ඇ. අසත්‍යය  ඈ. සත්‍යය  ඉ. අසත්‍යය

5. ක්‍රියා 17:13, 32

## දහවන පරිච්ඡේදය :

1. දෙවියන්වහන්සේගේ ආඥා, සාක්ෂිවලට හා ව්‍යවස්ථාව යොමුවීම. මනුෂ්‍යයන් උදෙසාත් ජාතීන් උදෙසාත් දෙවියන්වහන්සේගේ විනිශ්වය සොයා බැලීමට.

2. “විනිශ්වය” යන වචනයෙහි අර්ථය නම් වෙන් කිරීම හෝ එකිනෙකා අතර ඇති වෙනස පෙන්වා දීමය. මෙයට අයත් වන කාරණා නම්, නඩු විභාගයක් පැවැත්වීම, සාක්ෂි විමසා බැලීම, නිර්දෝෂී හෝ වරදකරු බව තීරණය කිරීම හා පාපයට වන්දි නියම කිරීමය.

3. විනිශ්වය අවශ්‍ය වන්නේ පාපය නිසාය.

4. දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ සහ ශුද්ධවන්තයෝ

5. සියලුම ප්‍රාණයන්

6. දේව වචනය
   දැනුමට අනුව
   තනි තනිව (පෞද්ගලිකව)
   සත්‍යයට අනුව
   පෞද්ගලික හැසිරීම පදනම් කරගෙන
   පක්ෂපාතිත්වයෙන් තොරව
   ව්‍යවස්ථාවට අනුව
   ධර්මිෂ්ඨකම අනුව
   අරමුණු සහ සිතුවිලි වලට අනුව

7. මක්නිසාද ස්වාමින්වහන්සේ අපගේ විනිශ්චයකරුවාණෝය, නීති සම්පාදකයා ය, එතුමා අපේ රජ ය (යෙසායා 33:22).

8. අ. සත්‍යය ආ. සත්‍යය ඇ. අසත්‍යය

## එකොළොස්වන පරිච්ජේදය :

1. සම්පූර්ණත්වය යන පදයෙහි අර්ථය නම් නිම කිරීම, අවසන් කිරීම හා පරිනත වීමය. සම්පූර්ණ වූ කිතුබැතියෙකු නම් ආත්මික පරිනතභාවය හිමිකරගත්තෙකි. එනම්, ඔහුගේ ශරීරය, ප්‍රාණය හා ආත්මය ශුද්ධාත්මයාණන්ගේ පාලනය යටතට ගෙනා පුද්ගලයෙකි.

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

3. මූලික සම්පූර්ණත්වය නම් ඔබ පසුතැවිලිවී ක්‍රිස්තුස් යේසුස්වහන්සේව ගැළවුම්කරු ලෙස පිළිගත් කල ඔබගේ සියලුම පැරණි පාප වලට සමාව ලබාගැනීමය.

4. වර්ධනය වන්නාවූ සම්පූර්ණත්වය නම්, ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ගැළවීම ලැබූ මොහොතේ හිමි වූ මූලික සම්පූර්ණත්වයට පසුව දිගටම ක්‍රමයෙන් දියුණු වෙමින් පවතින්නාවූ සම්පූර්ණවීමේ ක්‍රියා දාමයයි.

5.
- යහපත් අත්තිවාරමක්
- දේව වචනයට ප්‍රතිචාරය
- යාච්ඤාව
- කැපකිරීම
- ශුද්ධාත්ම දීමනා
- ස්ථාපිත සේවාවන්ට යටත්වීම
- දුක් විඳීම
- ස්වයං-පාලනය
- නිවැරදි කිරීම් වලට ප්‍රතිචාරය

6. එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන් නුඹලාත් සම්පූර්ණව සිටින්න. (මතෙව් 5:48)

7. අ. අසත්‍යය ආ. සත්‍යය ඇ. අසත්‍යය ඈ. සත්‍යය

8. දේව වචනය